# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
## *கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு*
# Ministry of Agriculture, Livestock, Land and Irrigation

**කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ**

***கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரிவு***

**Agriculture and Livestock Divisions**

# 2025

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

වෙළුම - **I**

*தொகுதி - I*

**Volume - I**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2025

## වැය ශීර්ෂ අංක - 118

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

### කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ

නො.80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2025

# වැය ශීර්ෂ අංක - 118

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය (2024.11.25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2412/08 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය)**

*i.) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය - ගරු කේ. ඩී. ලාල් කාන්ත මැතිතුමා*

*ii.) නියෝජ්‍ය අමාත්‍යවරුන්*

- *කෘෂිකර්ම හා පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය - ගරු නාමල් කරුණාරත්න මැතිතුමා*
- *ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය - ගරු අරවින්ද සෙනරත් විතාරණ මැතිතුමා*

*iii.) අමාත්‍යාංශ ලේකම් - ඩී. පී. වික්‍රමසිංහ මහතා*


| | |
|---|---|
| දුරකථන (පොදු) | 011-2034300 |
| ෆැක්ස් | 011-2868910 |
| විද්‍යුත් තැපැල | info@agrimin.gov.lk |
| වෙබ් අඩවිය | www.agrimin.gov.lk |

## අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය……………………………9 - 10

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක……...11 - 113

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය……………………………………114 - 147

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක…………………...……………………………148 - 149

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය………...150 - 152

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ…………………………………………………...153 - 164

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව……………………………………………………….165 - 172

## හැඳින්වීම

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, 2024 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කර ඇත. ක්‍රියාත්මක වීමේ / සේවා ලබාදීමේ පහසුව උදෙසා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ලෙස අංශ හතරක් යටතේ ක්‍රියාත්මක වේ.

මෙම වාර්තාව තුළ කෘෂිකර්ම සහ පශු සම්පත් යන අංශ විසින් සහ එම අංශ යටතේ ඇති ආයතන විසින් සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්වල 2025.12.31 දින දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය පමණක් ඇතුළත් කර ඇත.

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශවලට අදාළ කාර්යය හා කර්තව්‍යයන් (2024 නොවැම්බර් මස 25 වැනි දින අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව)**

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග විෂයයන්ට සහ අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. රටේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම
5. ප්‍රමිතියෙන් යුත් කෘෂිකාර්මික නිෂ්පාදන තුළින් ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ආහාර ලබාදීම සහතික කිරීම
6. දේශීය වශයෙන් ඵලදායී ලෙස වගාකළ හැකි ආහාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම
7. ආනයනික භෝග සඳහා සුදුසු ආදේශක භෝග දේශීයව වගා කිරීම දිරිමත් කිරීම
8. අපනයන කෘෂි ගම්මාන ප්‍රවර්ධනය කිරීම
9. තත්කාලීන කෘෂිකර්ම දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම
10. තොග පවත්වා ගැනීම් හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම
11. භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
12. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම
13. සාම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම
14. තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම
15. රසායනික පලිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව යෙදීම නියාමනය කිරීම
16. කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන්නන් සඳහා වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම
17. සැපයුම් දාමය ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහතික කිරීම

18. දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම
19. ප්‍රමිතියෙන් යුතු බීජ හා පැලෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම
20. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම
21. කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන, ගොවි සමූපකාර සහ ගොවි සමාගම් (farmer-administered co-operatives and farmer companies) ප්‍රචලිත කිරීම
22. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නගාසිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
23. කාබනික පොහොර භාවිතය සහ  වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැඩසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම
24. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම
25. නියමිත ප්‍රමිතියෙන් යුත් රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම
26. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම
27. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමට පත්වන ආකාරයේ සාධාරණ මිල ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
28. අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම
29. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම
30. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක්  හඳුන්වා දීම
31. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික  අංශය දිරිමත් කිරීම
32. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය
33. දේශීය නිෂ්පාදනය වැඩිකිරීම තුළින් ආහාර භෝග ආනයනය අවම කිරීම
34. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම
35. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු
36. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
37. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායනය කටයුතු
38. විවිධ භූගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ සංවර්ධනය දිරි ගැන්වීම
39. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම
40. මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපොළවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය  ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම
41. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා  පුළුල් කිරීම
42. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය
43. සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රට තුළ වගා කිරීම සඳහා කටයුතු කිරීම
44. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය
45. ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
46. සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා**

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
4. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය
7. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
8. වී අලෙවි මණ්ඩලය
9. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
10. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
11. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය)
12. ජාතික පොහොර ලේකම් කාර්යාලය
13. ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්
14. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)
15. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්
16. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
17. සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ මගින් ක්‍රියාත්මක කරන අණපනත්**

1. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)
2. ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)
3. ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)
4. ගස් හෙලීම (පාලන කිරීම) පනත (1951 අංක 9)
5. බීජ වී පනත (2003 අංක 22)
6. පස් සංරක්ෂණ පනත (1996 අංක 24)
7. වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)
8. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)
9. කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)
10. රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1972 අංක11)
11. පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)
12. පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)
13. පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)
14. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 15)
15. සත්ත්ව රෝග පනත (1992 අංක 59)
16. සත්ත්ව ආහාර පනත (1986 අංක 15)
17. සත්ත්ව පනත (1958 අංක 29)
18. පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)
19. අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත (1992 අංක 46)
20. වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

## කෘෂිකර්ම අංශය සහ පශු සම්පත් අංශය

- **දැක්ම**

ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක්

- **මෙහෙවර**

ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයන් බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම.

- **අරමුණු**

1. ආහාර හා ආශ්‍රිත කෘෂි භෝග විෂයයෙහි ප්‍රතිපත්තිමය සහාය සැපයීම
2. ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කිරීම
3. කෘෂි නිෂ්පාදන සඳහා ස්ථාවර මිලක් පවත්වා ගැනීම
4. වී මිල දී ගැනීමේ හා වෙළෙඳපොල වැඩසටහන් කාර්යක්ෂම කළමනාකරණය
5. ව්‍යාපෘති නිසි කලට ක්‍රියාත්මක කිරීම
6. තෝරාගත් භෝගවල නිෂ්පාදනය ඉහළ නැංවීම
7. කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම
8. විදේශ අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යෙදවීම
9. සේවාලාභීන්ට මිත්‍රශීලී හා ප්‍රතිඵල අරමුණු කරගත් පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
10. සමස්ත රාජ්‍ය අංශය තුළ ඵලදායී කළමනාකරණයක් ඇති කිරීම

- **අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු තිරසාර සංවර්ධන අරමුණු**

1. අරමුණ 2 - සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
2. අරමුණ 5 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.
3. අරමුණ 12 - තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - සාරාංශය

වැය ශීර්ෂ අංක 118 යටතේ කෘෂිකර්ම සහ පශු සම්පත් අංශවල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 101,780.00 | 102,877.31 | 65,919.12 | 64 |
| 2 | පුනරාවර්තන | 51,639.00 | 53,473.00 | 52,585.81 | 98 |
| | **සමස්ත අයවැය** | **153,419.00** | **156,350.31** | **118,504.93** | **76** |

**කෘෂිකර්ම අංශය - ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන** | | | | |
| 1. | පොහොර සහනාධාර වැඩසටහන | 35,000.00 | 36,840.00 | 36,815.17 | 100 |
| 2. | පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය (ණය පොලී ගෙවීම) | 2,005.00 | 1,685.00 | 1,443.21 | 86 |
| | **ප්‍රාග්ධන** | | | | |
| 1. | ආහාර සුරක්ෂිතතාවය සඳහා විශේෂ වැඩසටහන සහ තාක්ෂණය | 550.00 | 550.00 | 370.14 | 67 |
| 2. | අතිරේක භෝග වගා වැඩසටහන | 150.00 | 150.00 | 96.91 | 65 |
| 3. | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම විශ්ව විද්‍යාල සමග ක්‍රියාත්මක කිරීම | 56.00 | 56.00 | 43.78 | 78 |
| 4. | බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය | 1,500.00 | 1,500.00 | 626.00 | 42 |
| 5. | ආරක්ෂිත වී තොගයක් පවත්වා ගෙන යාම | 6,000.00 | 8,000.00 | 6,202.87 | 78 |
| 6. | කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය (පිටු අංක 14 බලන්න) | 500.00 | 379.33 | 113.19 | 30 |
| 7. | පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය (ණය මූලධන ගෙවීම) | 8,664.00 | 8,784.67 | 8,784.28 | 100 |
| | ***උප එකතුව - i*** | **17,420.00** | **19,420.00** | **16,237.17** | **84** |
| | **විදේශාධාර ව්‍යාපෘති** | | | | |
| 1. | දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය (CSIAP) (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 8,775.00 | 8,765.00 | 5,439.08 | 62 |
| 2. | කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) - IFAD | 3,470.00 | 3,470.00 | 2,500.22 | 72 |
| 3. | කෘෂිකාර්මික අංශය නවීකරණ කිරීමේ ව්‍යාපෘතිය (ASMP) - (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 1,250.00 | 3,042.30 | 2,867.08 | 94 |
| 4. | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන (SARP) | 5,947.00 | 2,546.00 | 1,198.49 | 47 |
| 5. | ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය | 30.00 | 40.00 | 20.70 | 52 |
| 6. | කොළඹ - කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත් වැඩියාව හා ප්‍රතිසංස්කරණය | - | 6.24 | 2.63 | 42 |
| 7. | බීජ සකස් කිරීමේ යන්ත්‍ර උපකරණ 4ක්, එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයෙන් පරිත්‍යාග ලෙස ලැබීම නිසා ගෙවිය යුතු බදු ගෙවීම සඳහා අමතර ප්‍රතිපාදන වෙන්කර ගැනීම | | 90.07 | 90.07 | 100 |
| | ***උප එකතුව - ii*** | **19,472.00** | **17,959.61** | **12,118.27** | **67** |
| | **අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන** | | | | |
| 1. | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 38.00 | 38.00 | 23.86 | 63 |
| 2. | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 33.00 | 33.00 | 19.50 | 59 |
| 3. | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 338.00 | 338.00 | 268.00 | 79 |
| 4. | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 75.00 | 75.00 | 48.18 | 64 |

| අ/ අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| | ***උප එකතුව - iii*** | **484.00** | **484.00** | **359.54** | **74** |
| | **මුළු එකතුව - (i+ii+iii)** | **37,376.00** | **37,863.61** | **28,714.98** | **76** |

**පශු සම්පත් අංශය - ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1. | සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය | 69.00 | 51.95 | 75 |
| 2. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය(යටිතල පහසුකම් සංවර්ධනය) | 150.00 | 83.80 | 56 |
| 3. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධනය සහායන්) | 100.00 | 83.99 | 84 |
| 4. | එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (සංවර්ධනය සහායන්) | 91.85 | 69.92 | 76 |
| 5. | එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (යටිතල පහසුකම් සංවර්ධනය) | 108.15 | 18.87 | 17 |
| | **මුළු එකතුව** | **519.00** | **308.53** | **59** |

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ජාතික ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සහ තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය අනුව ගෝලීය සංවර්ධන අභිමතාර්ථ (තිරසර සංවර්ධන අරමුණු) සාක්ෂාත් කරගැනීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සංවර්ධන අරමුණු මෙහෙයවා ඇත.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයට 2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් සඳහා අංක 118 වැය ශීර්ෂය යටතේ වෙන් කර තිබූ මුළු මුදල රු.මි. 37,863.61 ක් වන අතර පශු සම්පත් අංශය සඳහා වෙන් කර තිබූ මුළු මුදල රු.මි. 519.00 කි. එමෙන්ම, පුනරාවර්තන වැඩසටහනක් වන පොහොර සහනාධාර වැඩසටහන සඳහා 2025 වසර වෙනුවෙන් රු.මි. 36,840.00 ක මුදලක් වෙන් කර තිබුණි.

ඒ අනුව, 2025 වර්ෂයේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් අතර ආහාර සුරක්ෂිතතාව සඳහා වූ විශේෂිත වැඩසටහන සඳහා රු.මි. 640.00 ක් ද, අතිරේක බෝග වගා වැඩසටහන වෙනුවෙන් රු.මි. 150.00 ක් ද, විශ්ව විද්‍යාල සමඟ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම විශ්ව විද්‍යාල සමග ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 56.00 ක් ද, බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය ලෙස රු.මි. 1,500.00 ක් ද, ආරක්ෂිත වී තොගයක් පවත්වා ගෙන යාම සඳහා රු.මි. 8,000.00 ක් ද, කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය සඳහා රු.මි. 379.33 ක් ද, පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය ගෙවීම සඳහා රු.මි. 8,784.67 ක් වෙන් කර ඇත. තවද, විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති සමස්ත ප්‍රතිපාදනය රු. මි. 17,959.61 ක් වේ.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයට අනුබද්ධ ආයතන වන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය සඳහා රු.මි. 38.00 ක් ද, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය සඳහා රු.මි. 33.00 ක් ද, ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය සඳහා රු.මි. 338.00 ක් ද, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සඳහා රු.මි. 75.00 ක් ද ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කර ඇත.

මීට අමතරව, ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ හා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ පොහොර සහනාධාරය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් වී සඳහා අවශ්‍ය පොහොර ගොවියාට නොමිලේ ලබා දීම සහ අනෙකුත් බෝග සඳහා අවශ්‍ය පොහොර සහන මිලකට ලබා දීමට කටයුතු කර ඇත.

පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමෙහිලා ප්‍රමුඛ වන පශු සම්පත් සංවර්ධන අංශය දේශීය නැවුම් කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමේ ඉලක්කය ප්‍රමුඛව දේශීය කිරි නිෂ්පාදකයා ශක්තිමත් කරමින් දේශීය කිරි කර්මාන්තය නැංවීම මෙන්ම එළු, කුකුළු, සූකර ඇතුළු අනෙකුත් උප අංශ සංවර්ධනය කර තත්ත්වයෙන් උසස් ගුණාත්මක සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය හා පරිසර හිතකාමී ලෙස සත්ත්ව පාලනයේ යෙදීම දිරිගැන්වීම උදෙසා දේශීය සහ විදේශීය අරමුදලින් මූල්‍යනය වන විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, 2025 වසරේ සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය සඳහා රු.මි. 69.00 ක් ද, සුළු හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා රු.මි. 250.00 ක් ද, එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා රු.මි. 200.00 ක් ද වෙන් කර තිබුණි.

## සංවිධාන සටහන - කෘෂිකර්ම අංශය



## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

### වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

### i.) ආහාර සුරක්ෂිතතාවය සඳහා විශේෂ වැඩසටහන සහ තාක්ෂණය
### වැය ශීර්ෂ අංක 118-2-03-020-2202

ආහාර සුරක්ෂිතතාව සඳහා වූ විශේෂ වැඩසටහන යටතේ 2025 අයවැය මඟින් රු.මි. 550.00 ක් වෙන් කරන ලදි. එම මුදලින් රු.මි. 370.14 ක් වියදම ලෙස වාර්තා වේ.

i.) ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ තාක්ෂණික ප්‍රවර්ධනය.
ii.) කෘෂිකර්ම පද්ධතිවල ඉහළ නිෂ්පාදනමය හා කාර්යක්ෂමතාවය සහතික කිරීම.
iii.) කෘෂිකාර්මික ව්‍යවසායකයන් සහ තිරසාර වෙළඳපල ප්‍රවර්ධනය කිරීම.
iv.) ප්‍රශස්ත ඉඩම් කළමනාකරණයට පහසුකම් සැලසීම.
v.) කෘෂිකාර්මික පිළිවෙත් නිසි ලෙස කළමනාකරණයට පහසුකම් සැලසීම.
vi.) කෘෂිකර්මාන්තයට අදාළ මෙහෙයුම් පරිසර හිතකාමී ලෙස ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම.
vii.) ව්‍යවසායකත්වයට සහ ආර්ථික වර්ධනය සඳහා ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම.
viii.) කෘෂිකාර්මික පර්යේෂණ හා දැනුම කළමනාකරණය කිරීමට සහය වීම.

මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා හඳුනාගත් විශේෂිත බෝගවල (ක්ෂේත්‍ර බෝග, අල බෝග, එළවළු බෝග) නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම, කෘෂිකර්මය සඳහා උසස් තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම, කෘෂි පාදක කර්මාන්ත ප්‍රවර්ධනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය, ජල කළමනාකරණය, දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා වන බෝග ආරක්ෂණ වැඩ පිළිවෙල, කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු, කෘෂිකර්ම නවෝත්පාදනය සහ පසු අස්වනු කළමනාකරණය යන ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය (කෘෂිකර්ම අංශය), දිස්ත්‍රික් ලේකම් කාර්යාල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය, වී අලෙවි මණ්ඩලය, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යන ආයතන මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබිණ. ව්‍යාපෘතිවල ප්‍රගති අධීක්ෂණ කටයුතු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබීය.

| අ/අ | ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 1 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය (කෘෂිකර්ම අංශය) | 10 | 550.00 | 370.14 | 94 |
| 2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල (14 ක් මඟින්) | 56 | | | |
| 3 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 60 | | | |
| 4 | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 07 | | | |
| 5 | වී අලෙවි මණ්ඩලය | 02 | | | |
| 6 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 01 | | | |
| 7 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 01 | | | |
| 8 | ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය) | 01 | | | |
| 9 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 06 | | | |
| 10 | කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ණය වැඩසටහන | 01 | | | |

ඡායාරූප අංක 01 - 02

## ii.) අතිරේක භෝග වගා වැඩසටහන
### වැය ශීර්ෂ අංක 118-2-03-071-2202

නිෂ්පාදන සාධකවල ප්‍රධාන සාධකයක් වන භූමියයෙහි හිඟතාවය හේතු කොටගෙන වගා කරන ලද අස්වැන්නේ ඵලදායිතාව උපරිම කර ගැනීමේ අරමුණ උදෙසා අමතර කන්න සඳහා අතිරේක භෝග වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

මෙයට අමතරව ප්‍රාදේශීය වශයෙන් පවතින විභතාවයන් මත ව්‍යාප්ත වී පවතින අතිරේක භෝග වගාවන් හඳුනා ගෙන ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමත් එමඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමට දායකත්වය ලබා ගැනීම වෙනුවෙන් වගා කරුවන් දිරිගැන්වීම මෙහි තවත් අරමුණක් වේ.

මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂයේ ජාතික අයවැය මඟින් රු.මි. 150.00 ක් වෙන් වූ අතර, එමඟින් උඳු, මුං, කව්පි, රටකජු යන අතිරේක භෝග ප්‍රවර්ධනය කිරීම සඳහා බීජ සහනාධාර ලබා දීම වගාවේ විභවතාව අනුව දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික්ක 11 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. මේ සඳහා රු.මි. 125.87 ක මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කළ අතර, මූල්‍ය ප්‍රගතිය රු.මි. 96.91ක් වේ.

| **බෝගය** | **ක්‍රියාත්මක දිස්ත්‍රික්කය** | **බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)** | **ආවරණය වූ අක්කර ප්‍රමාණය** |
|---|---|---|---|
| උඳු | කිලිනොච්චිය | 692.50 | 69.25 |
| උඳු | යාපනය | 2,810.00 | 281 |
| **එකතුව** | | **3,502.50** | **350.25** |
| මුං | කිලිනොච්චිය | 845.00 | 84.50 |
| මුං | යාපනය | 1,000.00 | 100 |
| මුං | කුරුණෑගල | 3,248.00 | 324.8 |
| මුං | පොළොන්නරුව | 1,324.75 | 266.25 |
| මුං | මොණරාගල | 4,085.00 | 408.5 |
| මුං | මුලතිව් | 2,113.75 | 422.75 |
| මුං | මඩකලපුව | 5,332.50 | 533.25 |
| මුං | අම්පාර | 1,972.00 | 209.8 |
| මුං | හම්බන්තොට | 49,917.00 | 9566 |
| මුං | ත්‍රිකුණාමලය | 2,676.50 | 267 |
| **එකතුව** | | **72,514.50** | **12182.85** |
| රටකජු | පුත්තලම | 6,551.00 | 163.78 |
| රටකජු | මඩකලපුව | 3,550.00 | 133.75 |
| **එකතුව** | | **10,101.00** | **297.53** |
| කව්පි | මඩකලපුව | 5,277.00 | 527.75 |
| **එකතුව** | | **5,277.00** | **527.75** |

උඳු වගාව යාපනය සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වූ අතර, බෙදා දුන් බීජ ප්‍රමාණය කි.ග්‍රෑ. 3,502.50 ක් වේ. ආවරණය වූ බිම් ප්‍රමාණය අක්කර 350.25 ක් වේ.

මුං වගාව දිස්ත්‍රික්ක 10 ක ක්‍රියාත්මක වූ අතර, බෙදා දුන් බීජ ප්‍රමාණය කි.ග්‍රෑ. 72,514.50 ක් වේ. ආවරණය වූ බිම් ප්‍රමාණය අක්කර 12,182.85 ක් වේ.

රටකජු වගාව පුත්තලම, මඩකලපුව යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වූ අතර, බෙදා දුන් බීජ ප්‍රමාණය කි.ග්‍රෑ. 10,101.00 ක් වේ. ආවරණය වූ බිම් ප්‍රමාණය අක්කර 297.53 ක් වේ.

කව්පි වගාව මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ අතර, බෙදා දුන් බීජ ප්‍රමාණය කි.ග්‍රෑ. 5,277.00 ක් වේ. ආවරණය වූ බිම් ප්‍රමාණය අක්කර 527.75 ක් වේ.

ඡායාරූප අංක 03

**iii.) ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම විශ්ව විද්‍යාල සමග ක්‍රියාත්මක කිරීම**
**වැය ශීර්ෂ අංක 118-2-03-026-2507 (SLCARP)**

ආයතනය යටතේ දක්වා ඇත (පිටු අංක 67 - 69).

**iv.) බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය**
**වැය ශීර්ෂ අංක 118-2-03-043-2202**

ආයතනය යටතේ දක්වා ඇත (පිටු අංක 64 - 66).

**v.) ආරක්ෂිත වී තොගයක් පවත්වාගෙන යාම**
**වැය ශීර්ෂ අංක 118-2-03-094-2509**

අතිගරු ජනාධිපතිතුමා විසින් 2025 වර්ෂය සඳහා 2025.02.17 දින ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා මගින් වී අලෙවි මණ්ඩලය විසින් ප්‍රමාණවත් ආරක්ෂක වී තොගයක් පවත්වා ගැනිම සඳහා රු.මි. 6,000.00 ක් වෙන් කර ඇත. ඊට අමතරව, 2025 වර්ෂය තුළදී තවත් රු. මි. 2,000.00 ක ප්‍රමාණයක් මෙම වැඩසටහන සඳහා ලබා දී ඇත. ඒ අනුව, මෙම වැඩසටහන සඳහා වෙන් කර තිබූ සමස්ත සංශෝධිත ප්‍රතිපාදන ප්‍රමාණය රු. මි. 8,000.00 කි.

වී මිලෙහි නිරන්තරයෙන් පවතින අස්ථායීතාවයෙන් මිදිම සඳහා සහ වෙළෙඳපොලේ සහල් ඉල්ලුම සහ සැපයුම සීමා කිරිමේදී ඊට ඔරොත්තු දීමේ පියවරක් ලෙසත් 2024/2025 මහ කන්නයේ සිට ප්‍රමාණවත් ආරක්ෂණ තොගයක් පවත්වා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, වෙළඳපොලේ වී සහ සහල් තොග එකතු කිරීම සහ ගබඩා කිරිම නියාමනය කිරීම සඳහා නියාමන රාමුවක් සකස් කර ඇත.

මෙම වැඩසටහනෙහි 2025.12.31 දිනට වියදම රු.මි. 6,202.88 කි. එය ප්‍රතිශතයක් ලෙස 78% කි.

**vi.) කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය**
**වැය ශීර්ෂ අංක 118-2-03-095-2202**

කෘෂිකර්මාන්තය හා පශු සම්පත් ක්ෂේත්‍ර පදනම් කර ගත් ව්‍යාපාර ආරම්භ කිරිම, සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ සඳහා 2025 වර්ෂයේ අයවැය යෝජනා මගින් රු. මි. 500.00 ක් වෙන් කර ඇත. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාවයක් වන තරුණ ව්‍යවසායකයින් 50,000 ක් බිහි කිරීමේ එක් ක්‍රමවේදයක් සඳහා මෙම ව්‍යාපෘතිය සෘජු දායකත්වයක් ලබා දේ.

**ව්‍යාපෘතියෙහි මූලික අරමුණු**

i.) 2025 දී අවම වශයෙන් කෘෂිකාර්මික ව්‍යවසායකින් 100 ක් නිර්මාණය කිරිම සඳහා උපරිම වශයෙන් රු. මි. 05.00 ක් දක්වා වූ වාර්ෂිකව 4% ක පොලියක් සහිත මූල්‍ය පහසුකම් ලබා දීම.

ii.) අගය එකතු කළ සහ නව්‍ය කෘෂිකාර්මික සහ පශු සම්පත් නිෂ්පාදන වැඩි කිරිම සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල අපනයන පරිමාව වැඩි කිරිම.

iii.) ව්‍යාපෘතියේ සෘජු ප්‍රතිලාභින්ගේ ආදායම් මට්ටම වැඩි කිරිම.

කෘෂිකාර්මික බෝග හා ධාන්‍ය වර්ග ආශ්‍රිත වගා කිරීමේ, වගා ආරක්ෂිත උපකරණ ඇතුළුව අනෙකුත් කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීමේ, දේශීය කෘෂි නිෂ්පාදන පාදක කොට ආහාර සැකසීමේ කර්මාන්ත, අපනයනය ප්‍රමුඛ කොටගත් කුඩා හා මධ්‍යම පරිමාණ කෘෂිකර්මික ව්‍යාපෘති, කෘෂිකර්මාන්තය ආශ්‍රිත අගය එකතු කිරීමේ ව්‍යාපෘති සහ පශු සම්පත් ආශ්‍රිත ව්‍යාපෘති මේ යටතේ මූල්‍යනය කෙරේ.

මෙම සහනදායි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම ලංකා බැංකුව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන යන බැංකු හරහා සිදුකරනු ලැබීය.

**ප්‍රගතිය**

2025.12.31 දිනට ප්‍රතිලාභින් 41 ක් සඳහා රු.මි. 113.19 ක ණය මුදල් ප්‍රමාණයක් ලබා දී ඇත.

## වැය ශීර්ෂ අංක 118 පුනරාවර්තන වියදම් යටතේ සිදුකරන ලද ප්‍රධාන වැඩසටහනෙහි ප්‍රගතිය

### 1. පොහොර සහනාධාර වැඩසටහන

| විස්තරය | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පොහොර සහනාධාර වැඩසටහන | 36,840.00 | 36,815.17 | 100 |

<table>
<tr><th>විස්තරය</th><th>2025 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන</th><th></th><th>වියදම් කළ මුදල (රු)</th><th>මූල්‍ය ප්‍රගතිය (%)</th><th>බිම් ප්‍රමාණය (හෙක්)</th><th>ප්‍රතිලාභීන් ගණන</th></tr>
<tr><td>2024/25 මහ කන්නය</td><td>10,000.00</td><td></td><td>9,233.95</td><td>92.34</td><td>271,188.57</td><td>528,644</td></tr>
<tr><td rowspan="2">2025 යල කන්නය</td><td rowspan="2">13,523.00</td><td>වී</td><td>13,288.17</td><td rowspan="2">99.84</td><td>531,956.08</td><td>884,816</td></tr>
<tr><td>වෙනත් ක්ෂේත්‍ර බෝග</td><td>212.71</td><td>14,180.63</td><td>48,870</td></tr>
<tr><td>2025/26 මහ කන්නය</td><td>13,266.00</td><td></td><td>13,218.22</td><td>99.64</td><td>676,580.24</td><td>1,024,132</td></tr>
<tr><td>මුළු එකතුව</td><td>36,789.00</td><td></td><td>35,953.04</td><td>97.73</td><td>1,493,905.53</td><td>2,486,462</td></tr>
</table>

මූලාශ්‍රය - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

# 2025 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය

## 01. කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (ASMP)

### 1.1. හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර, මෙම වර්ෂයේ අයවැය මගින් වෙන් කළ සංශෝධිත ප්‍රතිපාදනය වන රු. මි. 3,042.30 ක මුදල නිරවුල් නොකළ බිල්පත් ගෙවීම සහ ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාර්යයන් සඳහා යොදවා ඇත.

2025.12.31 දින වන විට මූල්‍ය ප්‍රගතිය රු.මි. 2,867.08 වේ.

## 02. දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය (CSIAP)

### 2.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද දේශගුණික අවදානම්වලට ලක්විය හැකි කලාපවල කුඩා ඉඩම් හිමි ගොවි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ වාරි කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අරමුණ ඇතිව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලෝක බැංකු මූල්‍ය සහයෝගීතාව ඇතිව දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය 2019 ජූනි මස සිට ක්‍රියාත්මක කරනු ලබයි. දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික ක්‍රම සහ තාක්ෂණය භාවිත කරමින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ඉලක්කගත කුඩා ගොවි නිෂ්පාදන ප්‍රජාව සඳහා වෙළඳපල ප්‍රවේශය වැඩි දියුණු කිරීම තුළින් මෙම අරමුණ සාක්ෂාත් කරගනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ කාලසීමාව 2025.12.31 දිනෙන් අවසන් විය.

### 2.2. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මි. 37,014 *(USD 1 = Rs. 300)*

| # | ව්‍යාපාති සංරචකය | රු.මි. |
|---|---|---|
| 1 | කෘෂිකර්ම නිෂ්පාදනය සහ අලෙවිකරණය | 7,800.00 |
| 2 | කෘෂිකර්මාන්තය සඳහා ජලය | 21,900.00 |
| 3 | ව්‍යාපෘති කළමනාකරණය | 1,800.00 |
| 4 | හදිසි අවශ්‍යතා සඳහා ප්‍රතිචාර | 4,014.00 |
| ප්‍රජා දායකත්වය නොමැතිව ඇස්තමේන්තුව | | 35,514.00 |
| ප්‍රජා දායකත්වය | | 1,500.00 |
| **සමස්ත ව්‍යාපෘති ඇස්තමේන්තුව** | | **37,014.00** |

### 2.3. ක්‍රියාත්මක ප්‍රදේශ:

ශ්‍රී ලංකාවේ උතුරු පළාත (කිලිනොච්චිය සහ මුලතිව්), නැගෙනහිර පළාත (මඩකළපුව, අම්පාර සහ ත්‍රිකුණාමලය), උතුරුමැද පළාත (අනුරාධපුර සහ පොළොන්නරුව), වයඹ පළාත (කුරුණෑගල සහ පුත්තලම), දකුණු පළාත (හම්බන්තොට) සහ ඌව පළාත (මොණරාගල) යන පළාත් 6 ආවරණය වන පරිදි පරිපාලන දිස්ත්‍රික්ක 11ක දේශගුණික විපර්යාසයන්හි බලපෑම නිසා අවදානමට ලක්වන තෝරාගත් ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

### 2.4. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන්කළ මුදල (රු.මි.) | සංශෝධිත ප්‍රතිපාදන | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන | 8,775.00 | 8,765.00 | 5,439.08 | 62 |

## 2.5. භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති සැලැස්මට අනුව භෞතික ප්‍රගතිය 93% ක් ළගා කරගනිමින් ව්‍යාපෘතිය 2025.12.31 දිනෙන් අවසන් විය.

| සංරචකය | අරමුණ | ක්‍රියාකාරකම | 2025 වසරේ ප්‍රගතිය |
|---|---|---|---|
| 1. **කෘෂිකාර්මික නිෂ්පාදනය හා අලෙවිකරණය** | දේශගුණික සුහුරු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් අනුගමනය කිරීම සහ ගොවිපල ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම තුළින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ බෝග විවිධාංගීකරණය | <u>**කෘෂි නිෂ්පාදනය :**</u><br>- දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම භාවිතයන් තුළින් අතරමැදි කන්නය-1 වගා කිරීමේ වැඩසටහන | - 2025 වසරේදී අතරමැදි කන්නය-1 සදහා හෙක්.579ක් වගා කර එමගින් මෙ.ටො.556 ක නිෂ්පාදනයක් ලබා ඇත. ප්‍රධාන වශයෙන් මුං ඇට කව්පි සහ කොමඩු වගාවට අවධානය යොමු වී ඇති අතර, පිළවෙලින් මෙ.ටො. 168, 112 සහ 125ක නිෂ්පාදනයක් ලබා ඇත. අතරමැදි කන්න වගා කිරීමෙන් අතිරේක ආදායමක් මෙන් ම පරිභෝජන අවශ්‍යතා ද සපුරා ගත හැකි නිසා ගොවීන් ගේ වැඩි නැඹුරුවක් දක්නට ඇත. |
| | | - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම භාවිතයන් තුළින් යල කන්නය වගා කිරීමේ වැඩසටහන | - 2025 යල කන්නයට හෙක්.1860ක් වගා කර නිෂ්පාදනය මෙ.ටො.5572ක් ලබා ඇත. ප්‍රධාන වශයෙන් හෙක්. 114ක වී වගාවෙන් මෙ.ටො.646ක්, බඩඉරිඟු හෙක්. 500කින් මෙ.ටො.2224ක්, මුංඇට හෙක්. 400කින් මෙ.ටො.454ක්, කව්පි හෙක්.229කින් මෙ.ටො. 223ක් සහ රටකජු හෙක්.267කින් මෙ.ටො.439ක් ලෙස අස්වනු ලබා ඇත. |
| | | - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම භාවිතයන් තුළින් අතරමැදි කන්නය-2 වගා කිරීමේ වැඩසටහන | - 2025 අතරමැදි කන්නය-2 සදහා හෙක්.1236ක් වගා කරන ලදී. එමගින් මෙ.ටො.638ක නිෂ්පාදනයක් ලබා ගෙන ඇත මෙහිදී ගොවීන් ප්‍රධාන වශයෙන් මුං ඇට සහ කව්පි වගාව කෙරෙහි යොමු වී ඇත. මුං ඇට හෙක්. 1108කින් මෙ.ටො. 401ක් සහ කව්පි හෙක්. 112කින් මෙ.ටො. 112ක නිෂ්පාදනයක් සිදුකර ඇත. අතරමැදි කන්න වගා කිරීමෙන් ලැබෙන අතිරේක ආදායමත් පරිභෝජන අවශ්‍යතා සපුරාලීමත් නිසා ගොවීන්ගේ වැඩි නැඹුරුවක් දක්නට ඇත. |
| | | - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මය භාවිතයන් තුළින් 2025/26 මහ-කන්නය වගා කිරීමේ වැඩසටහන | - 2025/2026 මහා කන්නයට හෙක් 1502ක වගාවන් සිදු කර ඇත. ඉඩම් හෙක්ටයාර 548ක වී , 242ක බඩඉරිඟු, 234ක මුංඇට, 112ක කව්පි, 203ක රටකජු සහ 129ක උඳු වගාවන් මෙම කන්නයේදී ප්‍රධාන වශයෙන් සිදුකර ඇත. |
| | | - අනුරාධපුර තිරප්පනේ දේශගුණ සුහුරු ගොවිපල පුහුණු පාසල හරහා සිදු කරන පුහුණු කටයුතු | - 2025 වසර තුළ දී දේශගුණ සුහුරු ගොවිපල පුහුණු සැසි තුළින් සැලසුම්ගත පුහුණු සැසිවාර 44ක් සම්පූර්ණ කර ඇත. පුහුණුවීම් ලබා ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 954කි. න්‍යායාත්මක සහ ප්‍රායෝගික වශයෙන් පුහුණුව ලබා දෙන අතර, එම දැනුම තම අසල්වැසි ගොවි ප්‍රජාව වෙත ලබා දීම අපේක්ෂිතයි. ව්‍යාපාතිය අවසන් නිසා මෙම පුහුණු පාසල උතුරුමැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. මෙහි පුහුණුවන්නන් සඳහා නේවාසික ස්ථානයක් ද ව්‍යාපෘතිය මගින් ගොඩනංවා ඇත. |
| | | - තෝරාගත් නිලධාරීන් සහ ගොවීන් සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්මය සහ කෘෂි තාක්ෂණය පිළිබඳ පුහුණු පැවැත්වීම | - තෝරාගත් නිලධාරීන් හා ගොවීන් සඳහා පුහුණු වැඩසහන් 422ක් පවත්වා ඇත. සහභාගී වූ සංඛ්‍යාව 11,209කි. දේශගුණ සුහුරු වාරි කෘෂි පිළිවෙත් හා තාක්ෂණික දැනුම මෙහිදී ලබාදේ. පුහුණුව ලත් කෘෂි පහසුකාරකවරුන් සහ කෘෂි උපදේශකවරුන් විසින් මෙම පුහුණු සැසි පවත්වනු ලබයි. |
| | | - කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය | - 2025 වසර තුළ මේ වෙනුවෙන් මුදල් වෙන්කර නැත. නමුත් කොම්පෝස්ට් පොහොර නිපදවීමට ගොවි ප්‍රජාව යොමු කර අදාළ යෙදවුම් හා පුහුණුව ලබාදී ඇති නිසා, ප්‍රජාව විසින් නිපදවා ඇති පොහොර ප්‍රමාණය මෙ.ටො. 3410කි. ගෙවතු වගා සඳහා මෙම පොහොර භාවිත කරනු ලබයි. |
| | | - දේශගුණ සුහුරු වාණිජ ගෙවතු වගා සංවර්ධන වැඩසටහන | - 2025 වසරේදී වාණිජ ගෙවතු වගා සංවර්ධන වැඩසටහන යටතේ ගෙවතු 1000ක් හඳුනාගෙන (ප්‍රතිලාභී ගොවීන් 1000ක්) අදාළ පුහුණුව සහ කෘෂි උපකරණ සපයා දී ඇත. ගෙවතු වගාව තුළින් වාණිජමය වශයෙන් ප්‍රතිලාභ ලබා |

| සංරචකය | අරමුණ | ක්‍රියාකාරකම | 2025 වසරේ ප්‍රගතිය |
|---|---|---|---|
| | | | ගැනීම අරමුණු කර ඇත. |
| | | - දේශගුණ සුහුරු ආදර්ශ ගම්මාන වැඩ සටහන | - 2025 වසරේදී ආරම්භ වු මෙම වැඩ සටහන තුළින් ගම් 30ක් සඳහා අවශ්‍ය පහසුකම් සපයා වගා ආදර්ශන 241ක් පිහිටුවා ඇත. මෙම ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් 42ක් පවත්වා ඇති අතර 441 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත. |
| | | - කෘෂි ළිං ප්‍රතිසංස්කරණය කිරීම | - 2025 වසරේදී කෘෂි ළිං 198ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත. මෑතදී ඇති වූ සුළි කුණාටුව සහ ගංවතුර හේතුවෙන් ප්‍රතිසංස්කරණ කටයුතු පුමද වීමක් සිදු විය. මෙම වැඩසටහන යටතේ ගොවීන් ගේ වගාවන් සඳහා අවශ්‍ය ජල අවශ්‍යතාව සපුරා ගැනීමට කටයුතු කර ඇත |
| | | - සූර්යබල වගා ආරක්ෂිත වැටවල් ස්ථාපිත කිරීම | - වගා-කන්නයන් තුළ භාවිත කළ හැකි සූර්යබලයෙන් ක්‍රියාාත්මක කෙරෙන කි/මී 1000ක් පමණ හඳුනාගත් ගොවි බිම් ආවරණය කෙරෙන වගා ආරක්ෂිත වැටවල් ලබා දී ඇත. මෙමගින් වගාවන් ආරක්ෂා වීම, අස්වනු වැඩිවීම, නිෂ්පාදන ආදායම වැඩිවීම දක්නට තිබේ. |
| | | - දේශගුණ සුහුරු කෘෂිකර්ම ඒකකයක් අමාත්‍යාංශය තුළ පිහිටුවීම | - දේශගුණ සුහුරු කෘෂිකර්ම ඒකකයක් අදාළ කාර්යාලීය උපකරණ සහිතව අමාත්‍යාංශය තුළ ස්ථාපිත කර ඇත. |
| | | **<u>1.2: කෘෂි අලෙවිකරණය</u>** | |
| | | - නිෂ්පාදන සමිති සහ නිෂ්පාදන සංගම් පිහිටුවා ඒවායේ ධාරිතා සංවර්ධනය කිරීම | -පිහිටුවා ඇති ගොවි නිෂ්පාදන සමිති 544ක් සහ නිෂ්පාදන සමාගම් 45ක් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙමින් පවතී. වසර තුළ පුහුණු වැඩ සටහන් 78ක් පවත්වා ඇත. |
| | | - නිෂ්පාදන සමිති හා සංගම් වෙළඳපොළ සමඟ සම්බන්ධ කිරීම | -නිෂ්පාදන සමිති වෙළෙඳපොල හා සම්බන්ධ කිරීම යටතේ කීල්ස්, කාර්ගිල්ස්, ගෝල්ඩන් ෆුඩ්, මැලිබන්, ප්‍රීමා ආදි ප්‍රධාන වෙළඳ ව්‍යාපාර වෙත කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම දිරිගන්වා ඇත. |
| | | - ගොවි ව්‍යාපාර පුහුණු පාසල වැඩසටහන | -ගොවි ව්‍යාපාර පුහුණු පාසල තුළින් මොඩියුල 12කින් යුත් පුහුණු සැසි මෙහෙයවීමට පුහුණුව ලත් පුහුණුකරුවන් වෙතින් මෙම වසර තුළදී 4800ක් පුහුණුව ලබා තිබේ. |
| | | - පසු අස්වනු තාක්ෂණ, අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | -පසු අස්වනු කළමනාකරණය හා අලෙවිකරණය සම්බන්ධ පුහුණු වැඩ සටහන් පවත්වනු ලබයි. |
| | | - මධ්‍යම පරිමාණ ධාන්‍ය ගබඩාවක් මුලතිව් දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීම | -මුලතිව් දිස්ත්‍රික්කයට මධ්‍යම ප්‍රමාණයේ ගබඩාවක් (මෙ.ටො. 1000ක්) ඉදිකර ගොවීන්ගේ අස්වනු සුරක්ෂිතතාව තහවුරු කර ඇත. |
| | | - නිෂ්පාදන සමිති වෙත Tarpaulin Sheets ලබා දීම | -ගොවීන්ට තම අස්වනු වියලා ගැනීම පහසු කිරීම සඳහා නිෂ්පාදන සමාගම් වෙත Tarpaulin Sheets ව්‍යාපෘතිය මගින් දී ඇත. මේ වන විට Tarpaulin Sheets 2800ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක පළාත් වෙනුවෙන් සපයා ඇත. |
| 2. **කෘෂි කර්මාන්තය සඳහා ජලය** | - දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සහ අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සැලසුම් සැපයීම. | **2.1 වාරි පද්ධති ප්‍රතිසංස්කරණය**: | |
| | | - අදියර-2 සඳහා ප්‍රතිසංස්කරණය කිරීමට වාරි පද්ධති හඳුනා ගැනීම සහ මූලික කටයුතු ආරම්භ කිරීම | - 2025 දී , අදියර-2 ප්‍රතිසංස්කරණය සඳහා වාරිමාර්ග පද්ධති 177ක් හඳුනා ගත් අතර, වසර අවසන් වන විට පද්ධති 105ක ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත.<br>- තවත් 29ක් 95% වඩා නිම වී ඇත. ඉතිරි 43, 75% වඩා වැඩියෙන් නිම කර ඇත. |
| | | - වාරි ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | - 2025 වසරට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තෝරාගත් වාරි ඇලමාර්ග 145කින් 94ක් වසර අවසන් වන විට සම්පූර්ණයෙන් නිම කර ඉතිරි ඇල මාර්ග නිම වීමට ආසන්නව පැවතින. |
| | | - කෘෂිකාර්මික මාර්ග | - කෘෂි මාර්ග 55ක් ප්‍රතිසංස්කරණය සඳහා හඳුනාගෙන ඉන් 42ක් වැඩනිම කර ඇත. |

| සංරචකය | අරමුණ | ක්‍රියාකාරකම | 2025 වසරේ ප්‍රගතිය |
|---|---|---|---|
| | | ප්‍රතිසංස්-කරණය කිරීම | |
| | | **2.2 වාරි පද්ධති මෙහෙයුම් සහ නඩත්තුව:** | |
| | ● ඉදිකරන ලද යටිතල පහසුකම් අදාළ රාජ්‍ය ආයතන හා ජනතාව ඒකාබද්ධව නඩත්තු හා මෙහෙයුම් සිදු කිරීමට පහසුකම් සැපයීම | - මෙහෙයුම් හා නඩත්තුව, සහ ජල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | - ව්‍යාපෘති දිස්ත්‍රික්ක 11 ආවරණය වන පරිදි පුහුණු වැඩ සටහන් 469ක් පවත්වා ඇත. |
| | | - ගොවි සමාගම් වෙත අදාළ අත් පොත් සහ දත්ත සටහන් කිරීමේ පොත් ලබා දීම | - අත්පොත්/වාර්තා සටහන් පොත් 5200ක් ගොවීන් වෙත ලබා දී ඇත. |
| | | - ගොවි සංවිධානවල ධාරිතා සංවර්ධනය | - ගොවි සංවිධාන සඳහා ජල කළමනාකරණ පුහුණු 150ක් පවත්වා ඇත. |
| | | - තෝරාගත් කලාප තුළ එල්ලංගා කළමනාකරණ කමිටු 61ක් පිහිටුවීම | - එල්ලංගා කළමනාකරණ කමිටු 61ක් පිහිටුවා ඇත. |
| | | - එල්ලංගා කළමනාකරණ සැලසුම් 61ක් සකස් කිරීම හා ඒවායේ හඳුනාගත් ක්‍රියාකාරකම් උප ව්‍යාපෘතීන් ලෙස ක්‍රියාත්මක කිරීම | - ජල පෝෂක ප්‍රදේශවල වෘක්ෂලතා ආරක්ෂා කිරීමට සහ පාංශු ඛාදනය හා වැව් රොන්මඩ වැලැක්වීම පිණිස එල්ලංගා කළමනාකරණ කමිටු හරහා උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට එල්ලංගා කළමනාකරණ සැලසුම් 59ක් සකස් කර ඇත. එම සැලසුම්වල ඇති තෝරාගත් කෙටිකාලීන ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත. |
| | | - වඩා ඵලදායි ජල කළමනාකරණයක් පිණිස ලේසර් තාක්ෂණය භාවිතයෙන් කුඹුරු මට්ටම් කිරීමට ගොවීන් යොමු කරවීම | - ලේසර් තාක්ෂණය භාවිතයෙන් කුඹුරු මට්ටම් කිරීම පිළිබඳ දැනුවත් කිරීම් කර එම ක්‍රමවේදය යොදා හෙක්. 26.5ක වගා කටයුතු සිදු කර ඇත. |
| | | - ලේසර් තාක්ෂණය යොදා ගන්නා උපකරණ පද්ධතියක් ප්‍රසම්පාදනය කර ගැනීම | - ලේසර් තාක්ෂණය යොදා ගන්නා උපකරණ පද්ධතියක් මිළදී ගෙන එම උපකරණ පද්ධති 2 උතුරු සහ වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේනතු වෙත පවරා ඇත. |
| | | - ඒකාන්තරීය තෙත් සහ වියළි ක්‍රම භාවිතයෙන් කාර්යක්ෂම ජල කළමනාකරණය | - ඒකාන්තරීය තෙත් සහ වියළි ක්‍රම භාවිතයෙන් කාර්යක්ෂම ජල කළමනාකරණය පිළිබඳ ගොවීන් දැනුවත් කර එම අදාළ උපකරණ 11,900 සපයා දී ඇත. |
| | | - වර්ෂා මාන උපකරණ සවි කිරීම, ජල සැපයුම මනින මිනුම් උපකරණ සවි කිරීම | - වර්ෂා මාන උපකරණ ලබා දීම සහ ජල සැපයුම මනින මිණුම් උපකරණ ලබා දී ඇත. |
| | | - සොරොව්ව අසල මීටර 5ක දිගින් කොන්ක්‍රීට් ආස්තරයක් සහ අවශ්‍ය පාලන පද්ධතියක් මගින් ජල කළමනාකරණය | - කාර්යක්ෂම ජල කළමනාකරණය පිණිස සොරොව්ව අසල මීටර 5ක දිගින් කොන්ක්‍රීට් ආස්තරයක් සහ අවශ්‍ය පාලන පද්ධතියක් පිහිටුවීම. |
| | | | - ව්‍යාපාතිය අපේක්ෂිත ජල භාවිත කාර්යක්ෂමතාව (Water Use Efficiency - WUE) 30% දක්වා වැඩි කිරීම මැනීම කන්න මට්ටමින් සිදු කර ඇති අතර 2023 යල කන්නය 2023/24 මහ කන්නය සහ 2024 යල කන්නය , 2024/25 මහ කන්නය සහ 2025 යල කන්නය වෙන වෙනම පිළිවෙලින් වැව් 26, 25, 48, 50 සහ 50 බැගින් නියමු ව්‍යාපෘති වශයෙන් WUE මැනීම සිදු කර ඇත. ඒ අනුව WUE සාමාන්‍ය අගය පිළිවෙලින් 23%, 22%, 21%, 36% සහ 38% ලෙස ප්‍රගතියක් පෙන්නුම් කරයි. |

| සංරචකය | අරමුණ | ක්‍රියාකාරකම | 2025 වසරේ ප්‍රගතිය |
|---|---|---|---|
| 3. ව්‍යාපෘති කළමනාකරණය | ජාතික හා පළාත් මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් කාර්යක්ෂම ලෙස සම්බන්ධීකරණය කරමින් සමස්ත ව්‍යාපෘති කළමනාකරණයේ ගුණාත්මක බව සහතික කිරීම | - තොරතුරු, අධ්‍යාපන, සන්නිවේදන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම<br>- ව්‍යාපෘති නියාමන හා අගැයීම් කටයුතු සිදු කිරීම<br>- ජාතික, සහ පළාත් මට්මටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>- කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කිරීම | - තොරතුරු, අධ්‍යාපන, සන්නිවේදන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යයි. මේ වසර තුළ වැඩසටහන් 195ක් පවත්වා ඇත.<br>- අධීක්ෂණ සහ අගැයීම් යටතේ අධීක්ෂණ චාරිකා අඛණ්ඩව සිදු කර ඒ තුළින් හඳුනා ගත් සාර්ථක සිද්ධීන් වාර්තා කරනු ලබයි. 2025 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කර ඇත. මාසික හා කාර්තු ප්‍රගති වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.<br>- අදාළ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඇත.<br>- කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කර අවසන් වී ඇති අතර, මේ වන විට දත්ත ඇතුළත් කරමින් පවතී. 90%ත් පමණ දත්ත යාවත්කාලීන කර ඇත. |

ඡායාරූප අංක 04 - 05

## 03. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP)

### 3.1. හැඳින්වීම

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) ඇ. ඩො. මි. 105.00 ක මුළු පිරිවැයක් සහිත වසර හයක ව්‍යාපෘතියක් ලෙස 2017 දී ආරම්භ කරන ලදී. එසේ වුවද, කොවිඩ් වසංගතය සහ මෑතකාලීන ආර්ථික අර්බුදයේ බලපෑම සැලකිල්ලට ගනිමින් මෙම වැඩසටහන සඳහා තවත් වසර දෙකක දිගුවක් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා රජය (GOSL), කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD), පෞද්ගලික අංශය (කෘෂි ව්‍යාපාර සමාගම්), කුඩා වතු හිමියන්, සහභාගීත්ව මූල්‍ය ආයතන (PFIs) ඒකාබද්ධව දියත් වන මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ කුඩා පරිමාණයේ කෘෂි ව්‍යවසායකයින් 57,500 ක් වෙළඳපොල වෙත සම්බන්ධ කිරීමෙන් ඔවුන්ගේ ආදායම ඉහල නැංවීමත් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර වැඩිදියුණු කිරීමත් වේ. මෙම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික සබැඳියාව සමඟ කෘෂි ව්‍යවසායකයින් සඳහා ලබා දෙන අඛණ්ඩ පුහුණුව තුළින් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණික දැනුම ලබා දීමෙන් වඩාත් හොඳ වෙළඳපොළක් හඳුන්වා දීමට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

### 3.2. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන්කළ මුදල (රු. මි.) | වියදම් කල මුදල (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| සංවර්ධන වැඩසටහන් | 3,470.00 | 2,504.00 | 72 |

### 3.3. භෞතික ප්‍රගතිය

වැඩසටහන ආරම්භයේ සිට පුද්ගලික කෘෂි ව්‍යාපාරික ආයතන සහ ගොවි නිෂ්පාදක සංවිධානවල සහයෝගීතාවයෙන් කිරි නිෂ්පාදන, කුළුබඩු, ධාන්‍ය සහ රනිල කුලයට අයත් බෝග, තේ, මල් වගාව සහ එළවළු වැනි ප්‍රධාන කෘෂිකාර්මික අංශ ආවරණය කරමින් 4P (රාජ්‍ය, පුද්ගලික හා නිෂ්පාදක හවුල්කාරිත්ව) ව්‍යාපෘති 39 ක් ස්ථාපිත කිරීමට මෙම ව්‍යාපෘතිය සමත් වී ඇත.

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩ සටහන (SAPP) 2025 වසර තුලදී නව ප්‍රතිලාභීන් 3,499 ක් සිය ප්‍රතිලාභී ලැයිස්තුවට එක්කරගෙන ඇති අතර ඒ අනුව 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 50,526

දෙනෙක් සමස්ත වැඩසටහන තුලින් ප්‍රතිලාභ ලබා ඇත. මෙය සමස්ත ව්‍යාපෘති ඉලක්කය වන කෘෂි ව්‍යවසායකයින් 57,500 න් සියයට 87.87 ක ප්‍රතිශතයක්වේ.

එම සංඛ්‍යාවට 4P අගයදාම ආකෘතිය යටතේ දැනට ඉලක්ක කර ඇති ප්‍රතිලාභීන් 43,000 කින් 39,462 දෙනෙකුද (91.8%), තරුණ කෘෂි ව්‍යවසායකයින් නඟා සිටුවීමේ (YED) වැඩසටහන යටතේ ඉලක්ක කර ඇති ප්‍රතිලාභීන් 2,500 කින් SAPP තරුණ ප්‍රතිලාභීන් 3,850 දෙනෙකුද (154%), ආදායම් උත්පාදන (IG) ණය යෝජනා ක්‍රමය හරහා ප්‍රතිලාභීන් 7,214 දෙනෙකුද ප්‍රතිලාභ ලබා ඇත.

තවද, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) විසින් රේඛීය ආයතනවල සහය ඇතිව ඇළ සහ කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය වැනි ගොවිපලින් බැහැර කෘෂි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති 98 න් 2025 දෙසැම්බර් වන විට ව්‍යාපෘතීන් 87 ක් සාර්ථකව අවසන් කර ඇති අතර මේ වන විට මෙම ඉදිකිරීම් සඳහා රු. මි. 268.00 ක රාජ්‍ය ආයෝජනයක් සිදු කර ඇත.

මීට අමතරව ගොවි නිෂ්පාදක සංවිධාන වඩාත් තිරසාර ව්‍යාපාරික ආයතන බවට පත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් සපයනු ලබන ආයතනික ශක්තිමත් කිරීමේ (IS) සේවා යටතේ මේ වන විට ක්‍රියාකාරකම් 11 ක් අවශ්‍ය ප්‍රතිදානයන් සහිතව සම්පූර්ණ කර ඇති අතර 2025 වසර තුළ ක්‍රියාත්මක වෙමින් පවතින තවත් එවැනි IS සේවා 11 ක් 2026 වර්ෂය තුළ අවසන් කිරීමට නියමිත අතර දැනට මෙම සංරචකය යටතේ රු. මි. 148.00 කට වැඩි ප්‍රගතියක් ලබාගෙන ඇත.

සමස්ත කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සඳහා IFAD ප්‍රතිපාදන ඉලක්කය වන ඇ.ඩො.මි. 54.40 න් ඇ.ඩො.මි. 44.40 ක් ආයෝජනය කර 82% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගෙන ඇත. ප්‍රතිලාභීන් සහ ප්‍රවර්ධකයින්ගෙන් වැඩසටහන සඳහා තවදුරටත් දායකත්වය රු. මි. 16.60 කි. GoSL, IFAD සහ දායකත්ව ඉලක්කය වන රු. මි. 105.00 න් 2025 දෙසැම්බර් වන විට රු. මි. 79.53 ක (76%) ප්‍රගතියක් ලබා ඇත.

අනුරාධපුර නිදැලි කුකුළු පාලන ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට ව්‍යාපෘතියේ ණය ලබා ගැනීම සඳහා ඒ පිළිබඳ දැනුවත් කිරීමේ, බැංකු ගිණුම් විවෘත කිරීම, ණය අයදුම්පත්‍ර ලබා දීම 2025/12/18 දින රඹෑව වහමල්ගොල්ලෑව ග්‍රාමයේ දී සිදුකරන ලදී. බැංකු නිලධාරීන් ප්‍රතිලාභීන් ඉදිකල කුකුළු නිවාස නිරීක්ෂණය කිරීම ද සිදුකරන ලදී. මේ සඳහා ප්‍රතිලාභීන් 40 දෙනෙකු සහභාගි විය.

මාතර කඹුරුපිටිය උත්සාහය කුරුළු වගා කිරීමේ සමිතියේ දෙවන අදියරේ ණය ලබාදීමේ කටයුතු පිළිබඳ දැනුවත් කිරිම ඊරියතොට ප්‍රජා ශාලාව, ඇල්ලෙවෙල අශ්වත්තාරාමය සහ පිටවල්ගමුව නිග්‍රෝදාරාමය යන ස්ථානවලදි 2025 දෙසැම්බර් මස සිදු විය. මෙම කටයුතු සඳහා වැඩ සටහනේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, අගයදාම නියෝජ්‍ය කළමණාකරු, අගයදාම සජීවීකාරක සහ හක්මන සහ කඹුරුපිටිය මහජන බැංකු නිලධාරින්, ප්‍රාදේශිය සංවර්ධන බැංකු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සහ කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරි මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි.

ආණමඩුව මිල්කො කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයට අනුබද්ධ ආණමඩුව හා ආඩිගම-පෙරියමඩුව යන ප්‍රදේශයන්හි මිල්කො කාණ්ඩ 01 සහ 02 සඳහා අයත් කිරි ගොවි මහත්ම මහත්මීන්ගේ ඉදිවෙමින් පවතින ගවමඩු, තෘණ වගාවන් ආදී ක්‍රියාකාරකම් ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය උපදේශක විසින් 2025-12-19 වන දින නිරීක්ෂණය කරමින් ගොවීන් හට අදහස් හා උපදෙස් ලබා දෙමින් සිදු කළ නිරීක්ෂණ චාරිකාවට ආණමඩුව මිල්කො ක්ෂේත්‍ර නිලධාරී සහ අගයදාම සජීවීකාරක සහභාගීත්වය ලබා දී ඇත.

මීට අමතරව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන මගින් ප්‍රතිලාභීන් වෙත බොහෝ පුහුණු අවස්ථාවන් සලසනු ලබන අතර ඒ තුළින් 2025 වර්ෂය තුළදී ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව ලබාදෙන

පුහුණුව යටතේ ප්‍රතිලාභීන් 2,591 දෙනකුටද, පරිසරය හා දේශගුණය පිළිබඳව පුහුණුව ප්‍රතිලාභීන් 2,538 දෙනකුටද, පෝෂණ පුහුණුව ප්‍රතිලාභීන් 1,878 දෙනෙකුටද, මූල්‍ය සාක්ෂරතා පුහුණුව ප්‍රතිලාභීන් 2,637 දෙනෙකුට සහ ව්‍යවසාය පුහුණුව තරුණ ප්‍රතිලාභීන් 295 දෙනෙකුටද ලබාදී ඇත.

ඡායාරූප අංක 06 – 08

## 04. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ ව්‍යාපෘතිය (SARP)

### 4.1. හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පුත්තලම, කුරුණෑගල, මාතලේ, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම යන වියළි කලාපීය දිස්ත්‍රික්ක 06 ද එම දිස්ත්‍රික්ක අයත්වන මල්වතු ඔය, දැදුරු ඔය සහ මී ඔය යන ගංගාවල පෝෂක ප්‍රදේශවල පිහිටි එල්ලංගා පද්ධතිද පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වේ. මෙමගින් ගොවිපළ වාණිජකරණය ප්‍රවර්ධනය කරන අතරම, කුඩා පරිමාණ ගොවි පවුල් 40,000ක් හෝ පුද්ගලයන් 148,000ක් සඳහා දේශගුණික විපර්යාස මගින් ඇති කරන ලද අභියෝගවලට තිරසර විසඳුම් ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වන්නේ දේශගුණික විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සේවා සපයනු ලබන ආයතනවල හා ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ හැකියා සංවර්ධනය සහ තෝරාගත් යටිතල පහසුකම් අළුතින් ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමයි. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතිය මගින් ඇ.ඩො.මි. 82.00 ක් ආයෝජනය කිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘති කාලසීමාව වසර 06 වේ.

### 4.2. 2025.12.31 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන් කළ මුදල (රු.මි.) | සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන | 5,947.00 | 2,546.00 | 1,374.20 | 54 |

* 2025 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල රු. මි. 5,947.00 ක් වුවද පසුව මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්මේ සිදු කරන ලද සංශෝධනයන් අනුව එම මුදල රු. මි. 2,546.00 ක් දක්වා සංශෝධනය විය.

### 4.3. භෞතික ප්‍රගතිය

#### 4.3.1. වැව් ප්‍රතිසංස්කරණ කටයුතු

ව්‍යාපෘතිය මඟින් වැව් 260ක් ප්‍රතිසංස්කරණ කිරීමට නියමිතය. ඒ අනුව පළමු අදියර යටතේ වැව් 171ක් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. එම පළමු අදියර යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට යෝජිත වැව් 171 න් වැව් 149ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් පිරිනමා ඇත. මේ වන විට ඒ අතුරින් වැව් 35 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබේ.

ඡායාරූප අංක 09

#### 4.3.2. අගයදාම සංවර්ධනය සඳහා සැපයුම් මාර්ග ඉදි කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය පෞද්ගලික හා නිෂ්පාදන හවුල්කාරීත්ව ව්‍යාපාර කටයුතු සඳහා මෙන්ම අස්වැන්න වෙළඳපොළ වෙත ගෙන යාම සඳහා සඳහා අවශ්‍ය යටිතල පහසුකමක් ලෙස සැපයුම් මාර්ග ඉදි කිරීම සිදු කරනු ලබයි. මේ සඳහා 2025 වර්ෂය සඳහා වෙන්කළ මුදල රු. මි. 91.47 කි. මේ යටතේ

දිස්ත්‍රික් 6 ආවරණය වන පරිදි කිලෝමීටර් 266 ක දිගකින් යුත් මාර්ග සංවර්ධනය කිරීම මේ වන විට ආරම්භ කර ඇත. මෙම ඉදිකිරීමේ කටයුතු දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා සිදු කෙරේ.

### 4.3.3. ජල පෝෂක ප්‍රදේශ තුළ නැවත වන වගා කිරීම

මෙමඟින් 2025 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කරනු ලබන වැව්වලට අයත් ජල පෝෂක ප්‍රදේශවල (හෙක්ටයාර් 160) නැවත වන වගා ස්ථාපනය කිරීමට සැලසුම් කරන ලදී. ඒ යටතේ, මී, කුඹුක්, කළුවර සහ කරඳ යන ශාක වර්ග රෝපණය කිරීම සඳහා රු. මි. 28.95 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. ඒ අනුව, එම දෙපාර්තමේන්තුව මඟින් අනුරාධපුර, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කවල හඳුනාගත් ජල පෝෂක ප්‍රදේශවල හෙක්ටයාර් 562 ක ප්‍රමාණයෙන් හෙක්ටයාර් 408 වන වගා කටයුතු සිදු කර ඇත.

ඡායාරූප අංක 10

### 4.3.4. මිරිදිය මත්ස්‍ය වගාව

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා මිරිදිය මත්ස්‍ය වගාව ව්‍යාප්ත කිරීම සිදුකරයි. මෙම ව්‍යාපෘතිය වැව් 163 ආවරණය කරමින් සිදුකිරීමට සැලසුම් කර ඇති අතර මිරිදිය මත්ස්‍ය වගාව කටයුතු ආරම්භ කරන ලද වැව් 09ක අස්වැන්න නෙලීමේ කටයුතුද මේ වන විට අවසන් කර ඇත. මෙම වැව් වව්නියාව, පුත්තලම, කුරුණෑගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල පිහිටා ඇත. මෙය ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් සිදු කෙරේ.

ඡායාරූප අංක 11

### 4.3.5. ගර්කින් වගා ව්‍යාපෘතිය

විදේශ වෙළඳපොළ වෙත අගය එකතු කළ ගර්කින් නිෂ්පාදන අපනයනය කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වෙමින් රාජ්‍ය පෞද්ගලික හා නිෂ්පාදන හවුල්කාරීත්ව වැඩසටහන් යටතේ සිදු කරන ව්‍යාපෘතියකි. රයිට්සෙල් වොල්කර් සමාගම සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘති වටිනාකම රු. මි. 256.72 කි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පෞද්ගලික හවුල්කාරී ආයතනය සමඟ ගිවිසුම්ගතව ඉදිරි කටයුතු සිදුකරගෙන යනු ලබයි. ප්‍රතිලාභීන් තෝරාගෙන ඔවුන් සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වා අවසන්ව ඇත. මෙම ව්‍යාපෘතිය අනුරාධපුර සහ වව්නියාව දිස්ත්‍රික්වල තෝරාගත් ප්‍රතිලාභීන් 1000 දෙනෙක් සඳහා ක්‍රියාත්මක වේ.

### 4.3.6. නිදැලි කුකුළු පාලනය

මෙම ව්‍යාපෘතිය වව්නියාව, පුත්තලම, කුරුණෑගල. අනුරාධපුරය, මන්නාරම සහ මාතලේ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාවට නංවන ලදී. මෙහි පළමු අදියර යටතේ තෝරාගත් ගොවි පවුල් 550 ක් සහ දෙවන අදියර යටතේ තවත් ගොවි පවුල් 550ක් සඳහා කුකුළු පැටවුන් සහ කුකුළු කූඩු ඇතුළු අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය අඩු ආදායම්ලාභීන් කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කර ඇත. මෙමඟින් පවුල්වල පෝෂණ අවශ්‍යතා සහ පවුලේ ආදායම ඉහල නැංවීම අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුළු මුදල රු. මි. 54.38 කි.

### 4.3.7. පැණි බඩ ඉරිඟු ව්‍යාපෘතිය

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ ව්‍යාපෘතියේ රාජ්‍ය පෞද්ගලික හා නිෂ්පාදන හවුල්කාරීත්ව වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනකි. මෙම ව්‍යාපෘතිය රිච්මාර්ක් හෝල්ඩින් ආයතනයේ හවුල්කාරීත්වයෙන් ක්‍රියාත්මක වේ. එම ආයතනය මගින් ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය පුහුණුව සහ අස්වනු මිළදී ගැනීම සිදු කරනු ලබයි. ව්‍යාපෘතිය මඟින් උපකරණ සහ පුහුණුව සපයනු ලබයි. ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රතිලාභීන් ගණන 300 ක් වන අතර අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ගොවීන් 150 ක් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 150 ක් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන අවසන් කර ඇත. මේ වන විට මෙම

ව්‍යාපෘතියට අදාළව මූලික දැනුවත් කිරීමේ කටයුතු සිදු කර තිබේ. මේ සඳහා ව්‍යාපෘතියේ දායකත්වය රු. මි. 92.75 කි.

ඡායාරූප අංක 12

### 4.3.8. කිරි ගව පාලන ව්‍යාපෘතිය

කිරි ගව පාලන ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හා නිෂ්පාදන හවුල්කාරීත්ව වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන මෙම වැඩසටහන පැල්වත්ත කිරි සමාගම සමඟ හවුල්කාරීව පවත්වනු ලබයි. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභින් සඳහා අවශ්‍ය පුහුණුව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ ව්‍යාපෘතිය සහ ඉහත පෞද්ගලික ආයතනය එක්ව ලබාදෙනු ලබයි. ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලබන ප්‍රතිලාභින් ගණන 1000ක් වන අතර මේ වන විට ඔවුන් තෝරාගෙන අවසන් කර ඇත. කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර සහ මාතලේ යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. ව්‍යාපෘති වටිනාකම රු. මි. 592.63 කි.

ඡායාරූප අංක 13

## 05. ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය

### 5.1. හැඳින්වීම

ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP), කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා රජය (එක්සත් ජනපද ඩොලර් මිලියන 3) සහ ලෝක බැංකුව (එක්සත් ජනපද ඩොලර් මිලියන 100 සහ පුද්ගලික අංශය මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 17) එක්ව අරමුදල් සපයනු ලබයි. සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 120 ක් වන අතර, ගොවිපලේ සිට පාරිභෝගිකයා දක්වා වන අගයදාමය තුල හඳුනාගත් ගැටළු සඳහා පිළියම් සෙවීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා වැවිලි යන ක්ෂේත්‍රයන්හි නියුතු කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යවසායකයින්ට සහය වීමට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර සහ වතු වගා උප–ක්ෂේත්‍රයන්හි කුඩා හා මධ්‍ය පරිමාණ හිමිකම් දරන්නන්ට සහාය ලබාදීමට සැලසුම් කර ඇති අතර, ගොවිපලෙන් පාරිභෝගිකයා දක්වා වූ වටිනාකම් දාමයේ හඳුනාගත් හිස්තැන් (lapses) විසඳීමට ඉලක්ක කර ඇත. මෙම ව්‍යාපෘතියේ තවත් එක් අරමුණක් වන්නේ එල්ලංගා පද්ධතිවල ආයතනික කළමනාකරණය ශක්තිමත් කිරීම, ජල භාවිත කාර්යක්ෂමතාව සහ කෘෂි ඵලදායීතාව වැඩිදියුණු කිරීම, කාලගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන කෘෂිකර්ම ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ කෘෂිකර්ම හා ජලසම්පාදන අංශ අතර සම්බන්ධීකරණය වැඩි කිරීම සහ, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තීරණ ගැනීම වැඩිදියුණු කිරීම සඳහා මහජන දත්තවල ලබාගත හැකිභාවය සහ ගුණාත්මකභාවය වැඩි කිරීමයි.

මෙම ව්‍යාපෘතිය කෘෂි–දේශගුණික අවදානම් සහ ආර්ථික අස්ථාවරතාව හේතුවෙන් උණුසුම් කලාප (hotspots) ලෙස හඳුනාගත් දේශගුණයට අතිශයින් සංවේදී දිස්ත්‍රික්ක 12ක් ඉලක්ක කරයි. එම දිස්ත්‍රික්ක නම් යාපනය, කිලිනොච්චි, මුලතිව්, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, මොනරාගල, හම්බන්තොට වේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශයන්හි පදිංචි කෘෂි ආහාර නිෂ්පාදකයන්ගේ ඵලදායිතාව, තරඟකාරීත්වය සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම මෙම පස් අවුරුදු ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන අතර ව්‍යාපෘති කාලසීමාව 2025 සැප්තැම්බර් 08 වන දින සිට 2030 ජූනි 30 වන දින දක්වා වේ.

### 5.2. මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | 118-02-03-093-2509-(12) (ක්‍රියාකාරි මූල්‍යකරන) | 30.00 | 14.27 | 48% |
| 2 | 118-02-03-093-2509-(17) (Additional Budget Line) | 10.00 | 06.43 | 64% |

### 5.3. සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

- ව්‍යාපෘති සැලැස්ම අනුමත කර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.
- කෘෂි අගය දාමය සංවර්ධනය සඳහා ව්‍යාපාරික යෝජනා කැඳවීම EOI ආකෘතිය සකස් කර ඇත.
- ක්‍රියාත්මක කිරීම සඳහා සහාය සපයන ආයතනය (ISF) සඳහා TOR අවසන් කර ලෝක බැංකුවේ STEP පද්ධතියට උඩුගත කර ඇත.
- 2026 ජනවාරි මාසය තුළ ව්‍යාපාරික යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පාර්ශවකරුවන් සහ මූල්‍ය ආයතන නිල වශයෙන් දැනුම් දීමට නියමිතය.
- කුරුණෑගල (3) සහ ත්‍රිකුණාමලය (9) දිස්ත්‍රික්කවල ජලාශ 12ක් සඳහා ESRs, EMPs, SSRs සහ SMPs සම්පූර්ණ කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ක්‍රියාත්මක කිරීම 2026 වසරේදී සිදුකෙරේ.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජලාශ 3ක් සඳහා ESRs, EMPs, SSRs සහ SMPs සම්පූර්ණ කර ඇත.

ඡායාරූප අංක 14

## 06. කොළඹ - කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත් වැඩියාව හා ප්‍රතිසංස්කරණය (JICA)

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතියට (International Plant Protection Convention – IPPC) අත්සන් කර ඇති රටක් වන අතර, එම සම්මුතියට අනුකූලව ශාක, ශාකමය කොටස් සහ කෘෂි නිෂ්පාදන නියමිත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගතව ආනයනය හා අපනයනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී ලංකාවේ ශාක නිරෝධායන විෂය පථය යටතේ සිදු කරනු ලබයි. මෙම කාර්යභාරය හරහා රට තුළ ශාක රෝග හා කෘමි පළිබෝධ ආක්‍රමණ වැළැක්වීම මෙන්ම, ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනවල විශ්වසනීයතාව සහ තරඟකාරිත්වය වර්ධනය කිරීම අරමුණු කර ගෙන ඇත. එසේම, ගොවීන්ගේ දරිද්‍රතාවය අවම කිරීම, කෘෂි නිෂ්පාදන අපනයනය හරහා විදේශ මුදල් ඉපයීම ඉහළ නැංවීම සහ ජාත්‍යන්තර වෙළඳපල සමඟ සාර්ථක සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම යන පරමාර්ථ පදනම් කරගනිමින්, ශාක නිරෝධායන කාර්යයන් වඩාත් නිවැරදිව, කාර්යක්ෂමව සහ ප්‍රමිතියට අනුකූලව ඉටු කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව, ආනයන හා අපනයන කටයුතු ජාත්‍යන්තර වෙළඳපල සමඟ සම්බන්ධීකරණය කිරීමේදී භාණ්ඩවල ප්‍රමිතීන් වඩාත් නිවැරදිව හඳුනා ගැනීමට ඇති හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා, ශාක නිරෝධායන සේවයේ භාවිතා වන උපකරණ අලුත් වැඩියා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම අරමුණු කරගනිමින්, ජපන් රජය විසින් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) හරහා රු. මි. 259.60 ක ආධාර මුදලක් 2017 වර්ෂයේදී ලබාදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂයේදී නිම කිරීමට නියමිත වූ අතර, එම කාලය වන විට ව්‍යාපෘතිය සඳහා රු. මි. 253.36 ක මුදලක් වියදම් කර තිබුණි. ඒ අනුව, මුළු ව්‍යාපෘති මුදලෙන් රු. මි. 6.24 ක මුදලක් ඉතිරි වී ඇති අතර, එම ඉතිරි මුදලෙන් රු. මි. 2.63 ක පමණ මුදලක් 2025 වර්ෂය අවසන් වන විට වියදම් කර ඇත. ඉතිරි වන රු. මි. 3.31 ක පමණ මුදල 2026 වර්ෂයේ ඉදිරි වැඩ කටයුතු සඳහා වියදම් කිරීමට

නියමිත අතර, එම කටයුතු අවසන් වීමෙන් පසු මෙම ව්‍යාපෘතියේ සියලුම ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට නියමිතව ඇත.

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1. | කොළඹ-කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත්වැඩියාව හා ප්‍රතිස්ථාපනය කිරිම (JICA) | 6.24 | 2.63 | 42 |

07. බීජ සකස් කිරීමේ යන්ත්‍ර උපකරණ 4ක්, එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයෙන් පරිත්‍යාග ලෙස ලැබීම නිසා ගෙවිය යුතු බදු ගෙවීම සඳහා රු. මි. 90.07 ක අමතර ප්‍රතිපාදන වෙන්කර ගෙන ඇත. එම සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයම වියදම් කර ඇති අතර මූල්‍ය ප්‍රගතිය 100% ක් වේ.

## කෘෂිකර්ම අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

## 01. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA)

### 1.1. ඉදිරි දැක්ම
ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

### 1.2. මෙහෙවර
නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත් කර ගැනීම.

### 1.3. අරමුණු
- ආහාර බෝග වගාවේ නිෂ්පාදන විභවයන් වැඩිදියුණු කිරීම.
- තිරසාර ගොවිතැන සුරක්ෂිත කරලීම.
- ශ්‍රම සහ ඉඩම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- කෘෂිකර්මාන්තයේ නියැලි සියළු පාර්ශව බලගැන්වීම.
- කෘෂිකර්මාන්තය තුල මානව සම්පතෙහි ශක්‍යතාවය වර්ධනය කිරීම.
- පාර්ශවකරුවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍යවල සුලභතාවය සහතික කරලිම.
- ඉඩම් සහ ජල සම්පත ප්‍රශස්ත මට්ටමෙන් භාවිත කිරීම.
- සැලසුම්, ප්‍රතිපත්ති තීරණ සහ ප්‍රතිපත්ති මඟපෙන්වීම් සැපයීම.
- බීජ සහ රෝපණ ද්‍රව්‍ය මෙන්ම කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිතීන් සුරක්ෂිත කරලීම.
- හානිකර විදේශීය විශේෂවලින් දේශීය ශාක විශේෂ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- කෘෂි නිෂ්පාදන තුලින් විදේශ විනිමය වැඩිකිරිම සඳහා නීරෝගී ශාක සහ ශාක නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැපයීම.
- පළිබෝධනාශකවල අයහපත් බලපෑම්වලින් මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- පැළෑටි ජාන සම්පත් තිරසාර ලෙස භාවිතයට ගැනීම පිළිබඳ සහතික වීම.

### 1.4. කාර්යයන්
- පර්යේෂණ මඟින් උචිත නව ප්‍රභේද හා කෘෂි තාක්ෂණයන් ජනනය කිරීම.
- නව දියුණු කෘෂි තාක්ෂණය ගොවි ප්‍රජාව අතර ව්‍යාප්ත කිරීම.
- උසස් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම.
- පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම.
- බීජ පනත, පැළෑටි සංරක්ෂණ පනත, පළිබෝධ නාශක පාලන පනත සහ පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මික අධ්‍යාපනය තුළින් කෘෂිකර්මය පිළිබඳ ජාතික වෘත්තීය පුහුණු (NVQ) 5 හා 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන යාම, ගොවීන් සහ නිලධාරීන්ගේ හැකියා වර්ධනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.

### 1.5. ආයතනය මගින් ළඟා කරගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු:

අරමුණ 2: සාගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය සහ වැඩිදියුණු පෝෂණය සාක්ෂාත් කරගැනීම, සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය

### 1.6. මූල්‍ය ප්‍රගතිය (වැය ශීර්ෂ අංක 285)

| විස්තරය | වෙන්කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 4,669.53 | 3,323.39 | 71 |
| පුනරාවර්තන | 7,386.00 | 7,109.23 | 96 |

### 1.7. කෘෂිකර්ම දෙපාර්තමේන්තු (285) වැය ශීර්ෂය යටතේ ඇති විශේෂ ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය

**වී**

- නව වී ප්‍රභේද 3ක් වන AT 13-1532 දී (මාස 3, රතු අතරමැදි–මධ්‍යම ධාන්‍ය), AT 13-3791 (මාස 3½, රතු, දිගු සිහින් ධාන්‍ය) සහ BG 16-2022 (මාස 3½, කෙටි–රවුම්, සුදු බීජාවරණයක් සහිත ධාන්‍ය) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රභේද නිකුත් කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා තෝරා ගන්නා ලදී.
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂා වැඩසටහන (NCRVT) යටතේ, බහු ස්ථාන ඇගයීම්වලින් පසු BG 21-18, BG 21-21, BG 15-1027 සහ AT 18-1322 යන වැඩිදියුණු කරන ලද වී ආර හතරක් ප්රභේද අනුවර්තිතා පරීක්ෂණ සඳහා ද, කළු–දම් පැහැති බීජාවරණයක් සහිත වී ආරක් වන AT 21-1088, විශාල පරිමාණ ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂණ සඳහා ද තෝරා ගන්නා ලදී.
- AT 309, BG 381, BW 272-6b සහ AT 21-1088 යන වී වර්ගවලින් ලබාගත් පිටි 30%ක් දක්වා භාවිතා කර, සාම්ප්‍රදායික යෝගට්වලට සමාන ප්‍රෝටීන් හා මේද මට්ටම් ඇතුළත් ක්‍රියාකාරී යෝගට් නිපදවන ලදී.
- දුඹුරු පැළ කීඩෑවා සහ සුදු කීඩෑවා පාලනය සඳහා ඩිනොටෙෆියුරාන් (Dinotefuran) 1% GR සැලකිය යුතු ලෙස ඵලදායී බව හඳුනාගන්නා ලදී.
- වී වගාවේ රළු තෘණ, පුළුල් පත්‍ර තෘණ සහ වල් වී පාලනය සඳහා ඵලදායී වල් නාශක හඳුනා ගන්නා ලදී.
- වල් නාශක හයක්, ඒකාන්තර තෙත් කිරීම හා වියළීමේ (AWD) ක්‍රමය සමඟ ඒකාබද්ධ කර භාවිතය *Blyxa octandra* (දිය හවරිය) පාලනය සඳහා ඵලදායී බව හඳුනා ගන්නා ලදී.

**වෙනත් ක්ෂේත්‍ර බෝග**

- සෙන්ටිමීටර 40 සිට 50 දක්වා උසකින් කපා තෝර පරිප්පු (Pigeon pea) අස්වනු නෙලීමේ කාලය සහ ශ්‍රම අවශ්‍යතාවය අනුව අතින් නෙලීම සාපේක්ෂව ඵලදායී බව සොයා ගන්නා ලදී.
- මුං ඇටවල තද බීජ ප්‍රතිශතය අඩු කිරීම සඳහා උණු වතුර ප්‍රතිකාරය (100°C උෂ්ණත්වයේ මිනිත්තු 2ක්), පරිභෝජනය සහ රෝපණය යන අරමුණු දෙකටම ඵලදායී ක්‍රමයක් ලෙස හඳුනා ගන්නා ලදී.
- රටකජු වගාවේ *Aspergillus* ආසාදනය සඳහා වඩාත් තීරණාත්මක කාල පරිච්ඡේදය අස්වැන්න නෙලීමේ සිට ගබඩා කිරීමේ අවධිය ලෙස හඳුනාගෙන ඇත. ‘ලංකා ජම්බෝ’ ප්‍රභේදය රසායනාගාර සහ ක්ෂේත්‍ර තත්වයන් යටතේ *Aspergillus* මගින් දූෂණය වීමට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරන ලදී.
- ළූණු වල දම් පැහැති ලප සහ මිරිස් වල ඇන්ත්‍රැක්නෝස් පාලනය සඳහා ඵලදායී දිලීර නාශක හඳුනා ගන්නා ලදී.

- රසායනාගාර තත්වයන් යටතේ ශාක බැක්ටීරියා රෝග කාරක පාලනය කිරීම සඳහා *Ocimum sanctum* වෙතින් ෆීනෝලික් බහුල සාරය ලබා ගැනීම සඳහා වඩාත් ඵලදායී නිස්සාරණ ක්‍රමය සහ ද්‍රාවකය මෙතනෝල් සමඟ සොක්ස්ලෙට් නිස්සාරණය ලෙස හඳුනා ගන්නා ලදී.
- විශාල බීජ සහිත රටකජු සඳහා ජෛව අඟුරු පාදක නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් මිශ්‍රිත වැඩිදියුණු කරන ලද පෝෂක පෙත්තක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පොහොර මිශ්‍රණයට සමාන ප්‍රතිඵල ලබාදෙන බව හඳුනා ගන්නා ලදී.
- විශේෂ පොහොර පරීක්ෂණ වැඩසටහන යටතේ පොහොර නිෂ්පාදන විසිහතරක් ඇගයීමට ලක් කරන ලද අතර බඩ ඉරිඟු වගාව සඳහා "බයෝශක්ති" නිෂ්පාදනය නිර්දේශ කරන ලදී.
- බඩ ඉරිඟු වගාව සඳහා ඩ්‍රෝන ආධාරයෙන් වල් නාශක යෙදීම සඳහා මාර්ගෝපදේශ සකස් කරන ලදී. බෝග ස්ථාපිත කිරීමෙන් දින 10-15 කට පසු හෙක්ටයාරයකට මිලි ලීටර් 1,250 ක අනුපාතයකින් නිකොසල්ෆියුරෝන් 40 g/l OD යෙදීම නිර්දේශ කරන ලදී.
- බඩ ඉරිඟු වගාවේ ප්‍රධාන පළිබෝධ කළමනාකරණය සඳහා ඩ්‍රෝන යානා පාදක කරගත් කෘමිනාශක යෙදීමේ මාර්ගෝපදේශ සකස් කරන ලද අතර ඵලදායී කෘමිනාශක හඳුනා ගන්නා ලදී.

**උද්‍යාන බෝග**

**i. එළවළු**

- විවෘත පරාගනය කරන ලද බණ්ඩක්කා ආර 1ක්, තෝර පරිප්පු ආර 3ක්, සෝයා බෝංචි ආර 3ක් සහ කරල් සහ කොළ යන දෙකටම සුදුසු මුරුංගා ආර 3ක් නිපදවන ලද අතර ඒවා සාමාන්‍ය වගාව සඳහා නිකුත් කිරීමට පෙර ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂණ යටතේ පවතී.
- බණ්ඩක්කා (MI5) ඇතුළු එළවළු වර්ග කිහිපයක අභිජනන බීජ නිෂ්පාදනය කරන ලදී; මෑ (ගන්නෝරුව A9 - 19.05 kg; BS1 - 3 kg), රාබු (බීරළු - 760 g), කරවිල (මාතලේ ග්‍රීන් - 9 kg; තින්නවෙලි සුදු - 4 kg), පිපිඤ්ඤා (HORDI Cu4 - 2 kg), බෝංචි (කැකුළු - 114 kg) සහ දඹල (SLS 44 - 8.15 kg).
- ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂණ සඳහා වැල් බෝංචි වර්ග දෙකක් (PB 55 සහ PB 177) නම් කරන ලදී.
- බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී නව ආරක්ෂිත කෘෂිකර්ම තාක්ෂණයන් පිළිබඳ ක්ෂේත්‍ර දිනයක් පවත්වන ලදී.
- තක්කාලි, කැප්සිකම් සහ වැටකොළු ඇතුළු දෙමුහුන් එළවළු බෝග සඳහා ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි-පාරිසරික කලාපවලට ගැලපෙන පරිදි පෝෂක කළමනාකරණ පැකේජ සහ බණ්ඩක්කා, බටු, වැටකොළු සහ කැප්සිකම්වල පොහොර පද්ධති සඳහා පෝෂක කළමනාකරණ පැකේජ සකස් කරන ලදී.
- මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ආරක්ෂිත ගෘහ නවයක සුදු මැස්සන්, පැළ මැක්කන්, මයිටාවන්, කුඩිත්තන්, පත්‍ර කණිනන් සහ පිටි මකුණන් ඉලක්ක කරගත් ජෛව පාලන කාරක භාවිතා කරමින් ආරක්ෂිත නිවාස සඳහා පළිබෝධ කළමනාකරණ පැකේජයක් හඳුන්වා දුන් අතර ගොවීන්ගේ ඉල්ලීම පරිදි ආසන්න වශයෙන් ගොවීන් 1,200 කට ජෛව පාලන කාරක නිකුත් කරන ලදී.
- ඌන භාවිත එළවළු සහ අල බෝගවල නව රෝග හඳුනාගෙන රෝග සඳහා ඵලදායී පාලන ක්‍රම සංවර්ධනය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා නිවර්තන අල බෝග - බතල, අර්තාපල් (*Coleus rotundifollius*), වැල් අල විශේෂ, කිරි අල විශේෂ සහ මඤ්ඤොක්කා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ.
  - වල්පිට, උල්පතගම, අඹේපුස්ස සහ තෙලිජ්ජවිල යන තෝරාගත් රජයේ බීජ ගොවිපලවල අල බෝග සඳහා මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ඒකක ස්ථාපිත කර බතල, මඤ්ඤොක්කා, වැල් අල,

කිරි අල සහ ඉන්නල සඳහා විශාල ප්‍රමාණයක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම අරමුණු කර ගනිමින් ක්ෂේත්‍ර ස්ථාපනය කරන ලදී.

- අල බෝගවලට බලපාන ප්‍රධාන පළිබෝධ සහ රෝග හඳුනා ගැනීම සහ පාලන උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර සහ පැළ ගෘහ තුළ අත්හදා බැලීම් සිදු කරමින් පවතින අතර ගොවි ක්ෂේත්‍ර 12ක් නිරීක්ෂණ කර සුදුසු පාලන උපදෙස් ලබා දෙන ලදී.
- ගොවි ක්ෂේත්‍ර මට්ටමින් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අන්තර් පළාත් බල ප්‍රදේශ හයක ගොවීන් 364 ක් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින් ලෙස තෝරාගෙන, රෝපණ ද්‍රව්‍ය ලබාදීම හෝ ඒ සඳහා සහනාධාර ලබා දීම සිදු කරන ලදී.
- වන සතුන්ගෙන් වන හානිය අවම කර වගා ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ආරක්ෂිත වැටවල් අන්තර් පළාත් බල ප්‍රදේශවල ගොවීන් සඳහා 240ක් ද, පර්යේෂණ ආයතන සඳහා 100 ක් ද ලබා දෙන ලදී. මූලික රෝපණ ද්‍රව්‍ය සැපයීම මඟින් අන්තර් පළාත් බල ප්‍රදේශවල අල බෝග වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 36කින් වැඩි කර ඇත.
- ගෙවතු මට්ටමින් අල බෝග නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සබරගමුව පළාතේ නිවාස 221කට බතල දඬු කැබලි සහ හසලක, අනුරාධපුර සහ මොණරාගල ප්‍රදේශවල ගෙවතු සඳහා වැල් අල රෝපණ ද්‍රව්‍ය බෙදා දෙන ලදී.

**ii. පලතුරු**

- වියළි කලාපයට අනුකූල අලිගැට පේර ආර 1ක් සහ බෙලි ආර 1ක් ප්‍රභේද නිකුත් කිරීමේ කමිටුවට යෝජනා කිරීම සඳහා තෝරා ගන්නා ලදී.
- විදේශීය කොමඩු ප්‍රභේද දෙකක් (නෙක්ටාර් සහ ඇවටාර්) පරීක්ෂා කර සාමාන්‍ය වගාව සඳහා නිර්දේශ කරන ලදී.
- අඹ, ටැංජරීන්, දිවුල් සහ කොස් වැනි වාණිජ පලතුරු වතු සාර්ථකව ස්ථාපිත කරන ලද අතර පලතුරු ජෛව විවිධත්ව උද්‍යානයක් ස්ථාපිත කිරීම සඳහා හෙක්ටයාර 10 ක භූමි ප්‍රදේශයක් සංවර්ධනය කරන ලදී.
- මල්බෙරි ප්‍රභේදයක් සහ ජබොටිකාබා (Jaboticaba) ප්‍රභේදයක් හඳුන්වා දෙන ලදී.
- අලිගැට පේර එකතුන් 15ක් ක්ෂේත්‍ර ඇගයීමට ලක්ව ඇති අතර, ඉන් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් 3ක් හඳුනාගෙන ඇත. අනුවර්තිතා පරීක්ෂණ සහ බහු-ස්ථාන අත්හදා බැලීම් ආරම්භ කරන ලදී.
- බලාපොරොත්තු තැබිය හැකි දූරියන් දෙමුහුන් හතරක් සහ දෙහි එකතුන් 3ක් හඳුනාගෙන ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදී.
- සති දෙකකට වරක් ආසාදිත කොළ ඉවත් කිරීම, දින 21 කට වරක් ටෙබුකොනසෝල් (250 g/l EW හෝ 1 ml/l) සහ මාස දෙකකට වරක් පසට කැල්සියම් නයිට්‍රේට් (ශාකයකට 50 g) යෙදීම කෙසෙල් කහ සිගටෝකා රෝගය පාලනය කිරීම සඳහා ඵලදායී බව සොයා ගන්නා ලදී.
- පැෂන් ෆෲට් වල වෛරස් රෝග දෙකක් වන වුඩිනස් වෛරසය (PWV) සහ ශ්‍රී ලාංකික පැෂන් ෆෲට් මොට්ල් වෛරසය (PFMoV) රෝග ලක්ෂණ මත පදනම්ව අනුමාන වශයෙන් හඳුනාගෙන ඇත.
- ඩ්‍රැගන් ෆෲට් වල කඳ ලප සහ කඳ පිළිකා රෝග පාලනය කිරීම සඳහා ඒකාබද්ධ රෝග කළමනාකරණ පැකේජයක් සකස් කරන ලදී.
- ආසාදිත කෙසෙල් පැල තාප පිරියම් කිරීම ($55^0$C හි මිනිත්තු 30ක් සහ $60^0$C හි විනාඩි 15ක්) භාවිතා කරමින් කෙසෙල් පොකුරු මුදුන් වෛරස් රහිත රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණ ප්‍රොටෝකෝලයක් සකස් කරන ලදී.

- රෝගවලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ප්‍රොටෝකෝල දෙකක් සකස් කරන ලදී: අලිගැට පේර ('පොලොක්' ප්‍රභේදය) පත්‍ර අග්‍රය රෝපණය මගින් සහ මිදි බීජ රෝපණය මගින්.
- 2% ගුවා ගම් සහ 6% මී ඉටි අඩංගු ආහාරයට ගත හැකි ආලේපනයක් යෙදීමේදී හොරණ පැපොල් දෙමුහුම් කල් තබාගත හැකි කාලය දින 10 කින් වැඩි වන බව සොයා ගන්නා ලදී.
- ජම්බෝ සහ හොරණ ගෝල්ඩ් පැෂන් ෆෘට් ප්‍රභේද සඳහා සුදුසු අස්වනු නෙලීමේ අවධීන් එල දැරීමෙන් පසු පිළිවෙලින් දින 100–110 සහ දින 85–90 ලෙස හඳුනා ගන්නා ලදී.
- කෙසෙල් පේළි දෙකක් සමඟ අන්නාසි පේළි තුනක් (ශාක පරතරය සෙ.මී. 20) සිටුවීමෙන් නදී ඇඹුල් කෙසෙල් සමඟ අන්නාසි සාර්ථකව අතුරු බෝගයක් ලෙස වගා කිරීමට හැකි බව හඳුනා ගන්නා ලදී.
- මොරිෂස් සහ MD 2 යන අන්නාසි ප්‍රභේදවල කිරුළ කොටස් කිරීම මගින් එක් කිරුළකින් පැළ 12ක් දක්වා සාර්ථකව ලබා ගත හැකි බව පෙන්නුම් කළ අතර, ඒවායේ වර්ධනය සහ අස්වැන්න දැනට ඇගයීමට ලක් කෙරේ.
- තෙත් කලාපයේ රඹුටන් වල කන්නයට පෙර මල් පිපීම වැළැක්වීම, තුඩ කප්පාදු කිරීම මගින් ශාකමය වර්ධනය ඇති කිරීම, පොහොර මාත්‍රා දෙකක් යෙදීම සහ තෙතමන ආතති තත්වයන් සැපයීම මගින් අවාරයේ මල් පිපීම හටගැනීම උත්තේජනය වන බව සොයා ගන්නා ලදී.
- කප්පාදු කරන කාලය, පොහොර යෙදීම සහ ප්රේරිත මල් හටගැන්වීම වැනි වෙනස්කම් හරහා වසර පුරා අඹ ගෙඩි හට ගැනීම කළමනාකරණය කළ හැකි බව හඳුනා ගන්නා ලදී.
- මුල් කාලීනව ස්ථාපිත කරන ලද බහු වාර්ෂික පලතුරු ගස් විශේෂ සමඟ අක්කර 20 ක් ආවරණය වන කෘෂි වන වගා පද්ධතියක් සාර්ථකව පිහිටුවන ලදී.

**ස්වභාවික සම්පත් කළමනාකරණය**

- C-SUCSeS (Consortium for Scaling up Climate Smart Agriculture in South East Asia) ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී.
- බෝගවල ජල අවශ්‍යතාවයන් (Crop Water Requirements) සහ ජල භාවිතයේ කාර්යක්ෂමතාව (Water Use Efficiency) පිළිබඳ අත්පොත් ප්‍රකාශයට පත් කරන ලදී.
- 2008 දී ප්‍රකාශයට පත් කරන ලද විශේෂ පාංශු සංරක්ෂණ ප්‍රදේශවලට ඇතුළත් නොවූ ප්‍රදේශවල පාංශු සංරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.
- ආසියානු පාංශු හවුල්කාරිත්වයේ සහ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) සහාය ඇතිව 'පාංශු පාලන විශ්ලේෂණය: ශ්‍රී ලංකාව' ප්‍රකාශයට පත් කරන ලදී.
- GCF–නකල්ස් ව්‍යාපෘතිය යටතේ නකල්ස් කලාපයේ පන්විල, දන්කන්ද සහ පිටවල ප්‍රදේශවල සාර්ථක පාංශු සංරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.
- ප්‍රධාන කෘෂිකර්ම විද්‍යාඥ (ස්වභාවික සම්පත් කළමනාකරණ) ආචාර්ය එස්.එස්. සේනානායක මිය, විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ ජනාධිපති සම්මානය දිනා ගන්නා ලදී.

**සමාජ ආර්ථික සහ සැලසුම්**

- එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) සහයෝගයෙන් මධ්‍යගත, වෙබ් පාදක කෘෂිකාර්මික දත්ත වේදිකාවක් ලෙස CROPIX (Crop Resources Optimizing Operations through Precise Information Exchange System) සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදී.
- 2024 යල කන්නය සඳහා වගා පිරිවැය (Cost of Cultivation - COC) වාර්තා මාර්ගගතව ප්‍රකාශයට පත් කරන ලද අතර 2024/25 මහ කන්න වාර්තාව බෙදාහැරීම සඳහා නිම කරන ලදී. 2025 යල කන්නය සඳහා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම සම්පූර්ණ කරන ලදී.

- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කැඳවන ලද ආහාර ප්‍රතිපත්ති සම්බන්ධීකරණ රැස්වීම් 23කට කම්ටු පත්‍රිකා 30කට අධික ප්‍රමාණයක් ලබා දුන් අතර 'දිට්වා' සුළි කුණාටුව ඇතුළු දේශගුණික කම්පන අතරතුර කඩිනම් ආහාර සුරක්ෂිතතා තක්සේරු වාර්තා ලබා දෙන ලදී.
- ප්‍රධාන ආහාර බෝග සඳහා වෙළඳපල ප්‍රවණතා, මිල ගණන් සහ අලෙවිකරණ ලාභාංශ පිළිබඳ කාලෝචිත විශ්ලේෂණයන් සිදුකරන ලද අතර සෘතුමය රටා, වෙළඳ ප්‍රවණතා සහ ආපදා බලපෑම් ඇතුළුව මිල උච්චාවචනයන්ට හේතු වන සාධක හඳුනාගන්නා ලදී.
- AgStat වෙළුම XXII – 2025, කාර්තුමය Crop Watch සහ Vegi Watch ප්‍රකාශයට පත්කරන ලදී.
- ප්‍රධාන දත්ත පරතරයක් පියවමින්, ක්ෂේත්‍ර බෝගවල අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා රට පුරා බෝග අස්වනු සමීක්ෂණ සිදු කරන ලදී.
- ලෝක බැංකුව අරමුදල් සපයන IRDCRP ව්‍යාපෘති යෝජනාව සම්බන්ධීකරණය කරන ලද අතර සහ ව්‍යාපෘතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සහ ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම සිදුකරන ලදී.

**කෘෂිකර්ම ව්‍යාප්තිය සහ පුහුණුව**

බෝග නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**i. මිරිස්**

මිරිස් බෝගයේ නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම සඳහා MICHHY1 දෙමුහුම් බීජ කිලෝග්‍රෑම් 67.265ක් මිලදී ගෙන අන්තර් පළාත් ප්‍රදේශවල ගොවීන්හට නොමිලේ ලබා දෙන ලද අතර ගෙවතු මට්ටමින් වියළි මිරිස් නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා නොමිලේ ගොවින් වෙත වගා මලු 250,000 ක් ලබා දෙන ලදි . නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීමට අවශ්‍ය ජල සම්පාදන පහසුකම් සැපයීම සඳහා 50% ගොවි දායකත්වය යටතේ ජල පොම්ප 74ක් අන්තර් පළාත් ප්‍රදේශවල ගොවීන් හට ලබා දෙන ලදී. මිරිස් වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීමට අවශ්‍ය නව තාක්ෂණය ගොවින් අතරට ගෙනයාම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් 50ක්, ක්ෂේත්‍ර දින 4ක් සහ ක්ෂේත්‍ර චාරිකා 2ක් අන්තර් පළාත් ප්‍රදේශ වල පවත්වා ඇති අතර අස්වනු සමීක්ෂණ 13ක් පවත්වා ඇත.

**ii. ලොකු ළූණු**

<u>ලොකු ළූණු නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම</u>

ඉහළ අස්වැන්නක් ලබා දෙන තාක්ෂණික පැකේජය ප්‍රවර්ධනය කිරීම මඟින් උසස් තත්ත්වයේ ලොකු ළූණු බල්බ නිෂ්පාදනය ට අවශ්‍ය ජල සම්පාදන පහසුකම් සැපයීම සඳහා 50% ගොවි දායකත්වය යටතේ අක්කර ¼ බිංදු ජල සම්පාදන ඒකක 115 ක් ස්ථාපනය කරන ලද අතර එම තාක්ෂණික පැකේජයේ ප්‍රධාන අංගයක් වන කාබනික ද්‍රව්‍ය භාවිතය දිරිමත් කිරීම සඳහා ඒකකයකට රු. 10,000 ක සහනාධාර ලබා දෙමින් නිෂ්පාදන ඒකක 219 ක් ස්ථාපිත කරන ලද අතර එම ඒකක සඳහා ගුණාත්මක බීජ මිලදී ගැනීම සඳහා ද රු: 10,000ක සහනාධාර ලබා දෙන ලදී. නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය දිරිමත් කිරීම සඳහා ගලෙන්බිඳුණුවැව "ශක්ති" සහ "මොඩර්න් ඇග්‍රෝ " යන ලොකු ළූණු නිෂ්පාදන සමිති 2ක සඳහා පාත්ති සැකසීම සඳහා යන්ත්‍ර 2ක් ලබා දෙන ලදී.

<u>සහතික කළ සත්‍ය බීජ නිෂ්පාදනය වැඩි කිරීම</u>

– කොන්ත්‍රාත් ගොවීන් ලෙස සම්මත මව් බල්බ නිෂ්පාදනය කිරීමට ගොවීන් පෙළඹවීම සඳහා බිම් සැකසීමට රු:15,000ක හා බෝගය මනා ලෙස නඩත්තු කිරීම වෙනුවෙන් රු; 10,000ක සහනාධාර ලබා දී නිෂ්පාදන එකක 30ක් ස්ථාපිත කරන ලදී. සහතික කළ මව් බල්බ ගබඩා කර තබා ගනිමින් සත්‍ය බීජ නිෂ්පාදනයට යොදා ගැනීම වෙනුවෙන් මව් බල්බ කිලෝග්‍රෑම් 30,000 සඳහා

කිලෝග්‍රෑමයකට රු. 150 බැගින් වූ සහනාධාර මුදලක් ගොවීන් 600 දෙනෙකුට ලබා දී සත්‍ය බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොලිතින් සහ මල් ආධාරක දැල් නිෂ්පාදන ඒකක 300ක් සඳහා 50% ගොවි දායකත්වය යටතේ ලබා දී සත්‍ය බීජ නිෂ්පාදනය දිරි ගන්වන ලදී.

– අහිතකර දේශගුණික තත්ත්වයන් යටතේ සත්‍ය බීජ නිෂ්පාදනය කිරීම සඳහා 50% ක ගොවි දායකත්වයක් යටතේ තාවකාලික වැසි ආවරණ 400 ක් සහ කුඩා ප්‍රමාණයේ වැසි ආවරණ 105 ක් ඉදිකරන ලදී. ධාරිතා වර්ධනය අරමුණු කරගෙන ගොවීන් සහ නිලධාරීන් සඳහා පුහුණුවීම් 10 ක් සම්පූර්ණ කරන ලද අතර අස්වනු සමීක්ෂණ 4ක් පවත්වන ලදි.

### iii. බඩ ඉරිඟු

<u>අධි ඝනත්ව ක්‍රමය යටතේ දේශීය බඩ ඉරිඟු ප්‍රභේදවල බීජ නිෂ්පාදනය වැඩි කිරීම සහ ප්‍රචලිත කිරීම</u>

බීජ නිපදවන සමුපකාර සමිති, ගොවි සංවිධාන සහ හමුදා කඳවුරු ගොවිපල සඳහා මා පිය ආර නොමිළේ ලබා දෙමින් අක්කර 150 ක භූමි ප්‍රමාණයක දේශීය දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය කරන ලද අතර තෙතමන මාපාංක 4ක් බකමූණ හරිත බීජ නිෂ්පාදන සමිතියට සහ අනුරාධපුර බීජ නිෂ්පාදන සමුපකාර සමිතියට ලබා දෙන ලදි.

<u>අධි ඝනත්ව ක්‍රමය යටතේ දේශීය බඩ ඉරිඟු ප්‍රභේද වගාව ගොවීන් අතර ප්‍රචලිත කිරීම</u>

දේශීය දෙමුහුන් බඩ ඉරිඟු බීජ ප්‍රභේද ප්‍රචලිත කිරීම සඳහා අධිඝනත්ව ක්‍රමය භාවිතා කරමින් අක්කර 11,455 ක වගා ආදර්ශන පවත්වන ලද අතර ඒ සඳහා අවශ්‍ය බීජ සහ ප්‍රවාහන පහසුකම් නොමිළේ ලබා දෙන ලදී. ගොවි පුහුණු 206 ක් පවත්වන ලද අතර දැනුවත් කිරීම් සඳහා පෝස්ටර් 3,000 ක් මුද්‍රණය කරන ලද අතර අස්වනු සමීක්ෂණ 10ක් පවත්වා ඇත.

### iv. අර්තාපල්

<u>$G_0$ බීජ නිෂ්පාදනය මිලියන 9 දක්වා වැඩි කිරීම</u>

පවතින දැල් ගෘහ යටතේ කුඩා ආකන්ද (mini tubers) නිෂ්පාදනය සඳහා ඇල්බට් ද්‍රාවණය මිලදී ගෙන ඇති අතර හරිතාගාර 22ක් සඳහා මීදුම් කාරක පද්ධති (fogging systems) ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ ටෙන්ඩර් කැඳවන ලදී

<u>ගොවි ක්ෂේත්‍රවල බීජ අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3000 සිට 10,000 දක්වා වැඩි කිරීම</u>

ගොවීන්ගේ ස්වයං බීජ නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින්, $G_0$ බීජ 1,141,300 ක් සහ මූලික බීජ මෙට්‍රික් ටොන් 25 ක්, 50% සහනාධාර පදනම යටතේ ගොවීන් වෙත බෙදා හැර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සීතාඑළිය බීජ ගොවිපලේ ගොවීන් සඳහා කුලී පදනම මත අල බීජ මෙට්‍රික් ටොන් 50 ක් සඳහා ගබඩා පහසුකම් සපයා ඇති අතර එම ගබඩාව සඳහා කුඩ (Crates) 6,000ක් මිලදී ගෙන ඇත.

<u>අර්තාපල් වගා භූමි ප්‍රමාණය හෙක්.7000 දක්වා වැඩි කිරීම.</u>

යාපනය සහ මහනුවර ප්‍රදේශවල ගොවීන් අතර G1 බීජ කිලෝග්‍රෑම් 1,746ක් සහ නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවල ගොවීන්ට සහතික අර්තාපල් බීජ මෙට්‍රික් ටොන් 25 ක්, 50% ගොවි දායකත්වය යටතේ සපයා නව ප්‍රදේශවලට වගාව ව්‍යාප්ත කිරීම දිරිමත් කරන ලදී.

<u>නිෂ්පාදන ඵලදායිතාවය හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 18 සිට 22 දක්වා වැඩි කිරීම</u>

ගොවීන් 500ක් සඳහා 50% ගොවි දායකත්වය යටතේ සැපයීම සඳහා බෝග ආරක්ෂණ නයිලෝන් දැල් 3,400ක් මිලදී ගෙන ඇත.

## v. මුං

- ස්වයං-බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා 50% ගොවි දායකත්වය යටතේ ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 8,266.75ක් ලබා දී හෙක්ටයාර 413ක් ආවරණය කරමින්, ක්ෂේත්‍ර ආදර්ශණ පවත්වා ඇති අතර අතරමැද කන්නයේ වගා වපසරිය වැඩි කිරීම සඳහා 50% ගොවි දායකත්වය යටතේ බීජ කිලෝග්‍රෑම් 11,567ක් ලබා දී හෙක්ටයාර 462ක් ආවරණය කරමින් නව වගා ප්‍රදේශවල ආදර්ශණ පවත්වා ඇත.
- මුං බෝගයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ ආදර්ශණ සඳහා බීජ කිලෝග්‍රෑම් 2,448.05ක් සහ අවශ්‍ය කෘෂි රසායනික ද්‍රව්‍ය ලබා දී ඇත. ක්ෂේත්‍ර ස්ථාපන පිරිවැය අඩු කිරීමේ අරමුණින් බීජ වප්කර 75ක් ව්‍යාප්ති පුහුණු මධ්‍යස්ථානයට හා ගොවි සංවිධාන සඳහා නොමිලේ ලබා දී ඇති අතර, ගොවි සමිති සහ බීජ නිෂ්පාදන සමිති වෙත නොමිලේ ලබාදීම සඳහා පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර 4 ක් ගොවිපල යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කර ඇත.
- වන සත්ත්ව හානිය පාලනය කිරීම සඳහා 50% සහනාධාර යටතේ සූර්ය බලයෙන් ක්‍රියාත්මක විදුලි ශක්ති ජනක යන්ත්‍ර (Solar Electric Energizers) 124ක් ගොවීන්ට ලබා දී ඇති අතර 50% සහනාධාර යටතේ ත්‍රිත්ව ස්ථර මලු 2,850ක් බෙදා දී ප්‍රශස්ත පරිදි ගබඩා කිරීම ප්‍රවර්ධනය කර ඇති අතර මුං ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන 3ක් (mung bean temper, snack and meat) හඳුනාගෙන ඇත.

## vi. උඳු

ස්වයං බීජ නිෂ්පාදනය මඟින් උඳු නිෂ්පාදන ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා සහතික කළ / ලියාපදිංචි කළ උඳු බීජ කිලෝග්‍රෑම් 12,522 ක් ගොවීන් වෙත නොමිලේ ලබා දී හෙක්ටයාර 500 ක වගාව ස්ථාපිත කරන ලදී. වන සත්ව හානි පාලනය කිරීම සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක විදුලි ශක්ති ජනක යන්ත්‍ර (solar powered energizers) ඒකක 61ක් 50% ගොවි දායකත්වය යටතේ ගොවි කණ්ඩායම් සඳහා ලබා දෙන ලද අතර අන්තර් පළාත් පොළොන්නරුව, හසලක සහ අනුරාධපුර ප්‍රදේශවල ගොවි පුහුණු වැඩසටහන් 15ක් පවත්වන ලදි.

## vii. කව්පි

කව්පි බීජ නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා හසලක, අම්පාර, අනුරාධපුර, මොනරාගල සහ පොළොන්නරුව යන ප්‍රදේශවල ගොවීන් හට ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 3691 ක් නොමිලේ සපයන ලද අතර හෙක්ටයාර 147 ක වගාව ස්ථාපිත කරන ලදී. ගොවි ක්ෂේත්‍රවල කව්පි නිෂ්පාදන තාක්ෂණ පැකේජය සඳහා වූ ආදර්ශන 50ක් සඳහා ජල සම්පාදන පහසුකම් සැපයීමට අවශ්‍ය ඇල්කතීන් බට 50% ගොවි දායකත්වය යටතේ ලබා දීම පිණිස මිලදී ගන්නා ලද අතර තාක්ෂණ පැකේජය සඳහා වූ ආදර්ශන 10ක් නිම කර ඇත. අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, හම්බන්තොට, මොනරාගල සහ රත්නපුර දිස්ත්‍රික්කවල නව තාක්ෂණයන් පිළිබඳ ගොවි පුහුණු 22 ක් සහ අගය එකතු කිරීම පිළිබඳ පුහුණු 2 ක් පවත්වන ලදී.

## viii. රට කජු

රටකජු ජම්බෝ ප්‍රභේදයේ ගුණාත්මක සහතික බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ලියාපදිංචි බීජ මෙට්‍රික් ටොන් 1.8ක් ගොවීන්හට නොමිලේ ලබා දී ඇත. අභිජනන බීජ නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් කරදියනාරු ප්‍රාදේශීය පර්යේෂණ ස්ථානයේ නළ ළිඳ සහ විදුලි වැට ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

## ix. සෝයා

සෝයා බීජ නිෂ්පාදනය සඳහා මහවැලි H කලාපයේ ගොවීන් අතර බීජ කිලෝග්‍රෑම් 1,700ක් මිලදී ගෙන නොමිලේ බෙදාහැර ඇත.

### x. කුරක්කන්
ගොවීන් හට නොමිලේ සහතික බීජ ලබා දී අන්තර් පළාත් හා පළාත් බල ප්‍රදේශ තුළ මහා වාරි හා සුළු වාරි තත්ත්ව යටතේ කුඹුරු සහ ගොඩ ඉඩම් හෙක්ටයාර 340ක නව ප්‍රදේශ වල වගාව ව්‍යාප්ත කිරීම සිදු කරන ලද අතර හෙක්ටයාර 40ක පැල සිටුවීම ප්‍රචලිත කරණ ලදි . ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් 34ක් පවත්වා ඇත.

### xi. රතු ළූණු
සත්‍ය බීජ නිෂ්පාදනය සහ බීජ බල්බ නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සඳහා ඒකකයක් සඳහා රු. 50,000ක් වටිනා යෙදවුම් ලබා දී ගොවි ක්ෂේත්‍රවල සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතනවල සත්‍ය බීජ නිෂ්පාදන ඒකක 100 ක් සහ බීජ බල්බ නිෂ්පාදන එකක 144 ස්ථාපනය කරන ලදි . ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මොනරාගල අන්තර් පළාත් බල ප්‍රදේශය තුල 25% ගොවි දායකත්වය යටතේ රතු ළූණු බල්බ ගබඩා කුටි තුනක් ඉදිකිරීම සාර්ථකව අවසන් කර ඇති අතර එම බල ප්‍රදේශය තුළ ගොවි ක්ෂේත්‍රවල සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පුහුණු ආයතනවල රතු ළූණු වගාව සඳහා විසිරුම් ජල සම්පාදන පද්ධති 10ක් ස්ථාපිත කර ඇත.

### xii. තල
- නව වැඩිදියුණු කරන ලද ප්‍රභේදවල උසස් තත්ත්වයේ බීජ සුලබතාවය වැඩි කිරීම සඳහා ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 962.5ක් ගොවීන්හට නොමිලේ ලබා දී ස්වයං-බීජ නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අස්වැන්නේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් 50% සහනාධාර යටතේ ගොවීන් 265 දෙනෙක් සඳහා කමත් අතුරණු 265 ක් ලබා දෙන ලදී.
- තල තෙල් නිස්සාරණය සහ තල ආශ්‍රිත රසකැවිලි නිෂ්පාදනය සඳහා තෙල් නිස්සාරණ යන්ත්‍රයක්, තල ගුලි සකස් කිරීමේ යන්ත්‍ර 04ක්, විදුලි වියළන යන්ත්‍රයක් සහ මළ නොබැඳෙන වානේ තැටි 10 ක්, 50% සහනාධාර යටතේ ගොවීන්හට ලබා දී අගය දාම සංවර්ධනයට පහසුකම් සලසන ලද අතර ගොවීන් 436 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩසටහන් 10ක් මොණරාගල අන්තර් පළාත් සහ හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශවල පවත්වන ලදී.

- වී නිෂ්පාදනය සංවර්ධනය කිරීම සඳහා අන්තර් පළාත් ප්‍රදේශ 6 ක ගොවීන් අතර සහතික කළ බීජ වී කිලෝග්‍රෑම් 9,685 ක් සහ ලියාපදිංචි බීජ වී කිලෝග්‍රෑම් 626 ක් බෙදා දෙන ලදී. ඊට අමතරව, වී සඳහා නව තාක්ෂණ පැකේජය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වී නිෂ්පාදන යාය වැඩසටහන් 263 ක් පවත්වන ලදී.
- 2025 වර්ෂය තුළ, NVQ 6 මට්ටමේ කෘෂිකර්ම විද්‍යාලවල සිසුන් 522 ක් කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDAPT) ද, NVQ 5 මට්ටමේ කෘෂිකර්ම විද්‍යාලවල සිසුන් 311 ක් කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDAPT) ද හදාරමින් සිටින ලදී.
- කෘෂිකර්ම විද්‍යාල සංවර්ධන වැඩසටහන යටතේ 2025 වසර තුළ රු. මි. 297ක ප්‍රතිපාදන යොදමින් සිසුන්ගේ යටිතල පහසුකම් සහ ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කර ඇත.
- 2025 ඔක්තෝබර් මාසයේ පැවති ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේදී ජාතික/ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සාර්ථකව නිම කළ සිසුන් සඳහා සහතික 502 ක් නිකුත් කරන ලදී.
- 2025 වසර තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා මිනිස් දින 11,172ක ද, අනෙකුත් ආයතනවල නිලධාරීන් සඳහා මිනිස් දින 1,275ක ද, ගොවීන් සඳහා මිනිස් දින 7,550 ක ද, නිලධාරීන් සහ ගොවීන් සඳහා මිනිස් දින 25,694ක ද පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආහාර සුරක්ෂිතතාව සහ වෙළඳපල ප්‍රමිතීන්ට අනුකූල වීම වැඩිදියුණු කිරීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SL GAP) සහතික 668 ක් නිකුත් කරන ලදී.
- කෘෂිකාර්මික අංශයේ ව්‍යාපාරික කුසලතා වැඩි දියුණු කිරීම සහ ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා කෘෂි ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් හතක් (07) පවත්වන ලදී.

**කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදනය**

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දීම සහ මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මධ්‍යම පළාතේ රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය වාර්තාකරුවන් සඳහා මාධ්‍ය සාකච්ඡාවක් සංවිධානය කරන ලදී.
- කෘෂිකාර්මික තාක්ෂණයන් ප්‍රචාරය කිරීම සඳහා රූපවාහිනිය හරහා වැඩසටහන් 97ක් සහ ITN වසන්තම් හරහා දෙමළ රූපවාහිනී වැඩසටහන් 50ක් විකාශනය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන ගැටළු ආමන්ත්‍රණය කරමින් විශේෂ වීඩියෝ වැඩසටහන් 40ක් සහ වාණිජ කෙටි පණිවිඩ 16ක් නිෂ්පාදනය කරන ලදී.
- වගාකරුවන්ට වහාම දැනුම් දීම සඳහා, කෙටි කෘෂිකාර්මික අනතුරු ඇඟවීමේ පණිවිඩ 273ක් නිෂ්පාදනය කර YouTube වෙත උඩුගත කරන ලදී.
- සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම ගුවන් විදුලි වැඩසටහන් 1,698ක් සහ කෙටි පණිවිඩ 862ක් නිෂ්පාදනය කරන ලදී. කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු සේවාවන් වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා කෘෂි වෙබ් රේඩියෝව (www.krushiradio.lk) සජීවීව විකාශනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.
- විද්‍යුත් මාධ්‍ය වෙත ප්‍රවේශයක් නොමැති ග්‍රාමීය ගොවීන්ට සහ සාමාන්‍ය ජනතාවට කෘෂිකාර්මික තාක්ෂණයන් ප්‍රචාරය කිරීම සඳහා පොත් සහ අනෙකුත් ප්‍රකාශන - පිටපත් 70,132ක්; පත්‍රිකා - පිටපත් 363,600ක්; පෝස්ටර් - පිටපත් 25,100ක්; සහ බීජ ලේබල් - පිටපත් 130,000ක් නිර්මාණය කර ප්‍රකාශයට පත් කරන ලදී.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඩිජිටල් පරිවර්තනයට සහාය වීම සඳහා, වැඩිදියුණු කළ රාජ්‍ය සේවා සැපයීම, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, ඩිජිටල් අන්තර්ගත කළමනාකරණය සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, උසස් තොරතුරු හා තාක්ෂණ මූලපිරීම් ක්‍රියාත්මක කරන ලදී.
- ගන්නොරුව සහ බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානවලින් දේශීය නරඹන්නන් 106,866 ක් සහ විදේශීය නරඹන්නන් 1,361 ක් හරහා රු. 14,365,484.83 ක ආදායමක් උපයන ලදී.
- ප්‍රදර්ශන තුනක් පවත්වන ලද අතර කෘෂිකාර්මික තාක්ෂණයන් මහජනතාවට සජීවීව නිරූපණය කිරීම සඳහා විශේෂ ක්‍රියාකාරී සිදුවීම් 04 ක් සමඟ ප්‍රදර්ශන ස්ථාන 04 ක් නිර්මාණය කර සකස් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවගේ එදිනෙදා කෘෂිකාර්මික ගැටළු විසඳීම සඳහා 1920 ගොවි උපදේශන සේවාව හරහා විමසුම් 59,209ක් සඳහා ද, තැපැල් මගින් විමසුම් 88ක් සඳහා ද, විද්‍යුත් තැපැල මගින් විමසුම් 78ක් සඳහා ද පිළිතුරු ලබාදෙන ලදී.
- විවිධ මාධ්‍යවල (පොත්, පත්‍රිකා, සඟරා, පෝස්ටර්, පත්‍රිකා ලිපි, වෙබ් ලිපි, වීඩියෝ වැඩසටහන්, ශ්‍රව්‍ය වැඩසටහන් ආදිය) බෝග තොරතුරු වලින් සමන්විත "කෘෂි ඊ-පුස්තකාලය" සෙවුම් පහසුකමක් සහිත වෙබ් වේදිකාවක් ලෙස සංවර්ධනය කර ඇත.
- කෘෂිකාර්මික සන්නිවේදනයේ මාධ්‍ය සම්බන්ධීකාරකවරුන්ගේ කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා දින දෙකක ප්‍රායෝගික වැඩමුළුවක් පවත්වන ලද අතර, එහිදී ජනමාධ්‍ය භාවිතය සඳහා වීඩියෝ අන්තර්ගතයන් සහ කෙටි ගුවන් විදුලි ක්ලිප් නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- ශ්‍රී ලංකාවේ ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර CABI PlantwisePlus ඩිජිටල් මෙවලම් ප්‍රවර්ධනය කිරීම සඳහා CABI සමඟ සහයෝගයෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

**බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය**

- දිට්වා සුළි කුණාටුවෙන් පසු ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සඳහා දිවයින පුරා ගෙවතු එළවළු බීජ පැකට් 245,210ක් බෙදා හරින ලදී.
- කාලෝචිතව වගාවන් යථා තත්ත්වයට පත් කිරීම සහතික කරමින් දිට්වා ගංවතුරෙන් හානි වූ කුඹුරුවල නැවත වැපිරීම සඳහා බීජ වී සැපයීම සම්බන්ධීකරණය කරන ලදී.
- ඒකාබද්ධ උත්සාහයන් තුළින්, ගුණාත්මකභාවය සහතික කළ බීජ වී නිෂ්පාදනය 18% දක්වා වැඩි විය. මෙම ජයග්‍රහණය මත පදනම්ව, 2028 යල කන්නය වන විට සහතික කළ බීජ වී නිෂ්පාදනය 25% දක්වා වැඩි කිරීමේ අරමුණින් 2025/26 මහ කන්නයේ සිට වැඩසටහනක් ආරම්භ කරන ලදී. 2025 දී ලියාපදිංචි කළ මුළු බීජ වී නිෂ්පාදනය බුසල් 133,500ක් වූ අතර එය ජාතික අවශ්‍යතාවයෙන් ආසන්න වශයෙන් 82% ක් සපුරාලයි.
- ජාතික වී නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා "පුනරුදයට අරුණළු කෘෂි+" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද යාය 500 වැඩසටහන සඳහා බීජ වී සැපයීම සිදුකරන ලදී.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු එක්ව සීතාඑළිය බීජ ගබඩා සංකීර්ණයේ ශීතාගාර පහසුකම් මගින් ගොවීන් විසින් නිෂ්පාදනය කරන ලද බීජ මෙට්‍රික් ටොන් 150 ක් ගබඩා කරන ලදී.
- 2025 දී, සීතාඑළිය හරිතාගාර සංකීර්ණය තුළ $G_0$ බීජ අර්තාපල් අල මිලියන 3.49ක් නිපදවමින් එහි ඉහළම නිෂ්පාදනය ලබා ගන්නා ලදී.
- KOPIA ව්‍යාපෘතිය යටතේ, දෙමුහුන් මිරිස් නිෂ්පාදනය සඳහා පොලි ගෘහ 20ක් ඉදිකරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2025 දී දෙමුහුන් මිරිස් බීජ කිලෝග්‍රෑම් 280කට වඩා නිෂ්පාදනය කරන ලදී.
- 2025 දී අතරමැදි කන්නයේ දී මුං බීජ කිලෝග්‍රෑම් 98,000 ක් පමණ නිකුත් කරමින් පෙර වසරේ සැපයුම මෙන් දෙගුණයකටත් වඩා ප්‍රමාණයක් සපයන ලදී.

**බීජ සහතිකකරණය සහ ශාක ආරක්ෂණය**

- **බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම**

– 2018 සිට 2025 දක්වා කාලය තුළ වාර්ෂිකව සාම්පල ලබා ගත් වැඩිම බීජ වී ප්‍රමාණය, එනම් මෙට්‍රික් ටොන් 17,767ක් වාර්තා විය.
– 2022 දී ආර්ථික අර්බුදය හේතුවෙන් පැල 752,514 දක්වා අඩු වූ ලේබල් කරන ලද පලතුරු පැල ප්‍රමාණය 2025 දී 948,292 දක්වා වැඩි විය.
– 2003 අංක 22 දරන බීජ පනත යටතේ විමර්ශනය කරන ලද පැමිණිලි 42ක් අතරින්, සනාථ කරන ලද පැමිණිලි 2ක් සම්බන්ධයෙන් පීඩාවට පත් ගොවීන්ට රු. 7,240,000.00 ක වන්දි මුදලක් ගෙවීමට නියම කරන ලදී.

- **ශාක ආරක්ෂණය**

– දිස්ත්‍රික්ක 12 කට ජාතික පළිබෝධ නිරීක්ෂණ පද්ධතියේ (NPSS) නවීකරණය කරන ලද යෙදුම හඳුන්වා දෙන ලදී.
– ඉල් මැස්සන් සහ පළතුරු මැස්සන් විශේෂ සහ ඒවායේ දිවයින පුරා ව්‍යාප්ති රටාව හඳුනා ගන්නා ලදී.
– ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කිරීම සහ ශ්‍රී ලංකාවේ IAS ව්‍යාප්තිය හඳුනාගෙන සිතියම්ගත කිරීම සඳහා ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ (IAS) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හයක් සහ IAS සිතියම්කරණ වැඩසටහන් හයක් (06) සාර්ථකව පවත්වන ලදී.

– ජෛව පාලන මධ්‍යස්ථාන 10ක් බෝම්බුවල, හංසයාපාලම, මහකනදරාව සහ රාජාංගනය යන ප්‍රදේශවල ස්ථාපිත කරන ලදී.
– ප්‍රධාන බඩ ඉරිඟු වගා කරන ප්‍රදේශවල සේනා දළඹුවාගේ ස්වභාවික සතුරන් 11 දෙනෙකු හඳුනා ගන්නා ලදී.
– 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත යටතේ බලයලත් නිලධාරීන් 200 දෙනෙකු නම් කරන ලදී.

- **පළිබෝධනාශක නියාමනය**

– අනුමත කාණ්ඩ යටතේ පළිබෝධනාශක නිෂ්පාදන 31ක් (කෘෂි රසායන 10ක් සහ තවත් 21ක්) අලුතින් ලියාපදිංචි කරන ලදී.
– කෘෂිකාර්මික, ගෘහස්ථ මහජන සෞඛ්‍ය සහ කාර්මික පළිබෝධනාශක ඇතුළු පළිබෝධනාශක නිෂ්පාදන 200ක් ලියාපදිංචි කර බලපත්‍ර ලබා දෙන ලදී.
– නව පළිබෝධනාශක අලෙවිසැල් 195ක් සඳහා බලපත්‍ර ලබා දී ඇති අතර පළිබෝධනාශක අලෙවිසැල් බලපත්‍ර 1,733ක් අලුත් කර ඇත.
– කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායකයින් 470 දෙනෙකු පුහුණු කරන ලද අතර 305 දෙනෙකු සහතික කරන ලදී.
– 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතට අනුව නව පළිබෝධ පාලන සේවා සපයන්නන් 15ක් ලියාපදිංචි කරන ලද අතර ලියාපදිංචි පළිබෝධ පාලන සේවා සපයන්නන් 76 දෙනෙකුගේ බලපත්‍ර අලුත් කරන ලදී.
– නීති විරෝධී පළිබෝධනාශක සම්බන්ධ උල්ලංඝනයන්ට එරෙහිව පරීක්ෂණ/ වැටලීම් 45ක් සිදු කරන ලද අතර නීතිමය ක්‍රියාමාර්ග 8ක් ආරම්භ කරන ලදී.
– ඩ්‍රෝන/UAS සහාය ඇතිව කෘෂිකාර්මික යෙදවුම් යෙදීම සඳහා මාර්ගෝපදේශයක් යාවත්කාලීන කරන ලද අතර සහල් සහ බඩ ඉරිඟු වගාව සඳහා තාවකාලික පළිබෝධනාශක නිර්දේශ නිකුත් කරන ලදී.
– පළිබෝධනාශක ආනයන බලපත්‍ර 973ක් නිකුත් කරන ලදී.
– පළිබෝධනාශක අත්පොතෙහි එළවළු බෝග කොටස පරිවර්තනය කර, යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කරන ලදී.

- **ශාක ජාන සම්පත් සංරක්ෂණය**

ක්ෂේත්‍ර ගවේෂණ මෙහෙයුම් සහ විවිධ පර්යේෂණ ආයතන සමඟ සහයෝගීතාවයෙන්, බෝග ප්‍රවේශයන් 473ක් සහ ඒවායේ වන දර්ශ එකතු කරන ලදී.
– 2025 දී, ජාන බැංකුව තුළ නව ප්‍රවේශයන් 228 ක් සංරක්ෂණය කරන ලද අතර, 2025 අවසන් වන විට ජාන බැංකුවේ මුළු ප්‍රවේශයන් 17,770 දක්වා ගෙන එනු ලැබීය.
– මන්දගාමී වර්ධන තත්ත්වයන් යටතේ සාම්පල 421ක් සංරක්ෂණය කර ඇත. මේවාට බතල එකතුන් 132ක්, අර්තාපල් එකතුන් 25ක්, දේශීය අල වර්ග 217ක්, ඉන්නල එකතුන් 26ක් සහ කෙසෙල් එකතුන් 21ක් ඇතුළත් වේ.
– කෘෂිකාර්මික පර්යේෂණ සහ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් ශාක ජාන සම්පත් තිරසාර කළමනාකරණය සහ භාවිතය සඳහා ක්‍රියාකාරීව දායක වීමේ අරමුණින්, විවිධ බෝග නියෝජනය කරන ප්‍රවේශයන් 697ක් ඉල්ලීම මත පර්යේෂකයින්, ගොවීන් සහ විශ්ව විද්‍යාල වෙත බෙදා දෙන ලදී.

- **ශාක නිරෝධායනය**

– කොළඹ වරාය ගොඩනැගිල්ලේ නියැදි පරීක්ෂණ නිරෝධායන ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

- කොළඹ වරායේ සහ කටුනායක ගුවන්තොටුපළේ නව රසායනාගාර උපකරණ මිලදී ගෙන රසායනාගාර ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.
- කන්කසන්තුරේ වරාය පරිශ්‍රය තුළ ස්ථාපිත ශාක නිරෝධායන ඒකකයේ (තොටුපළ සේවා සඳහා) නිරෝධායන කටයුතු සිදු කරන ලදී.
- ශාක නිරෝධායන කටයුතු පිළිබඳව නිලධාරීන්, ආනයනකරුවන්, අපනයනකරුවන් සහ ධූමකාරකයින් පුහුණු කරන ලදී.
- ශාක නිරෝධායන සේවාවට (ශාක නිරෝධායන තොරතුරු සහ කළමනාකරණ පද්ධතිය - PQIMS) අදාළ සේවාවන් ස්වයංක්‍රීය කිරීම ආරම්භ කර සමාලෝචනය කරන ලදී.
- යුරෝපීය සංගමයේ රටවල් 27 ක් ඇතුළුව රටවල් 36 ක් සඳහා ඉලෙක්ට්‍රොනික ශාක සනීපාරක්ෂක සහතික (e-Phyto) නිකුත් කරන ලදී.
- JICA ව්‍යාපෘතිය සහ ජපන් ව්‍යාපෘති-නොවන ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ ජාතික ශාක නිරෝධායන රසායනාගාර, ශාක නිරෝධායන ඒකක සහ විමධ්‍යගත නිරෝධායන ඒකක සඳහා රසායනාගාර සහ අනෙකුත් උපකරණ ලබාගන්නා ලදී.
- 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත සඳහා රෙගුලාසි සකස් කර නීති කෙටුම්පත්කරු වෙත යොමු කර ඇත.
- ඕස්ට්‍රේලියානු ධූමකරණ ප්‍රතීතන යෝජනා ක්‍රමය (AFAS) ඒකාබද්ධ පද්ධති සමාලෝචනය (JSR) 2025 සාර්ථකව නිම කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නිරෝධායන සහ පූර්ව නැව්ගත කිරීමේ අරමුණු සඳහා මෙතිල් බ්‍රෝමයිඩ් අඩු කිරීමේ අරමුණින්, කප්රා කුරුමිණියා (*Trogoderma granarium*) හඳුනාගැනීමේ සමීක්ෂණය සඳහා වූ අවබෝධතා ගිවිසුමක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික ශාක නිරෝධායන සේවය සහ ජාතික ඕසෝන් ඒකකය අතර අත්සන් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ගබඩා කළ ධාන්‍ය පළිබෝධ පාලනය සඳහා ක්ෂණික PHIo-R පොස්ෆීන් උත්පාදක යන්ත්‍රය භාවිතයෙන් යොදන ලද ඇලුමිනියම් පොස්ෆයිඩ් (77.5%) කැටිතිවල කාර්යක්ෂමතා අත්හදා බැලීම DTW සමාගම සමඟ සාර්ථකව නිම කරන ලද අතර, නිර්දේශ නිකුත් කිරීමට සූදානම්ය.
- ජපානයට අපනයනය කරන තොග වෛරසයෙන් තොර බව සහතික කිරීම සඳහා රෝග විනිශ්චය ප්‍රොටෝකෝලයක් සංවර්ධනය කිරීමෙන් පසුව තක්කාලි කොළ කොඩවීමේ නව දිල්ලි වෛරසය (ToLCNDV) සඳහා පරීක්ෂණ ආරම්භ කරන ලදී.
- ජාතික ශාක නිරෝධායන සේවයේ ශාක ව්‍යාධි විද්‍යා අංශය විසින් සිදු කරන ලද පර්යේෂණ සඳහා කෘෂිකර්ම පර්යේෂණයේ විශිෂ්ටත්වය සඳහා ජාතික සම්මානයක් ලබා ගන්නා ලදී.

**1.8. ආහාර සුරක්ෂිතතාව සඳහා වූ විශේෂිත වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

- **2025.12.31 දිනට ප්‍රගතිය**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ 118-02-03-020-2202 වැය ශීර්ෂය යටතේ 2025 වර්ෂය තුළ ආහාර සුරක්ෂිතතාව සඳහා වූ විශේෂිත වැඩසටහන සඳහා රු. මි. 275.83 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2025.12.31 දිනට වියදම රු. මි. 208.89 කි. එමෙන්ම, 2024 වර්ෂයේ බැඳීම් සඳහා රු. මි. 4.97 ක මුදලක් ගෙවා ඇත. මේ යටතේ රජයේ පහත සඳහන් උපාය මාර්ගික ප්‍රමුඛතා ආවරණය වන ලෙස ව්‍යාපෘති 54 ක් මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

i.) ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා කෘෂිකාර්මික යෙදවුම් හා තාක්ෂණික ප්‍රවර්ධනය.
ii.) කෘෂිකර්ම පද්ධතිවල ඉහල නිෂ්පාදනමය හා කාර්යක්ෂමතාවය සහතික කිරීම.
iii.) කෘෂිකාර්මික ව්‍යවසායකයන් සහ තිරසාර වෙළඳපල ප්‍රවර්ධනය කිරීම.
iv.) කෘෂිකාර්මික හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ ඉඩම් විද්‍යාත්මකව සංවර්ධනය කර තිරසර ඉඩම් පරිහරණය සකස් කිරීම.
v.) කෘෂිකාර්මික පිළිවෙත් නිසි ලෙස කළමනාකරණයට පහසුකම් සැලසීම.
vi.) කෘෂිකර්මාන්තයට අදාළ මෙහෙයුම් පරිසර හිතකාමී ලෙස මෙහෙය වීම.
vii.) ව්‍යවසායකත්වයට සහ ආර්ථික වර්ධනය සඳහා ගොවීන් සවිබල ගැන්වීම.
viii.) කෘෂිකාර්මික පර්යේෂණ හා දැනුම කළමනාකරණය කිරීම.
ix.) ආනයනික බෝග සඳහා සුදුසු ආදේශන බෝග වගා කිරීම සහ දිරිමත් කිරීම.
x.) කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ගබඩා, ශීතාගාර සැකසීම.

ඉහත ප්‍රමුඛතා ආවරණය වන ලෙස ක්ෂේත්‍ර බෝග ප්‍රවර්ධනය, මී මැසි පාලනය, දේශගුණික සුහුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම, කෘෂි කර්මාන්තය ආශ්‍රිත ව්‍යාප්ති සේවා වැඩි දියුණු කිරීම, යහපත් කෘෂි කාර්මික පිළිවෙත් හඳුන්වා දීම. රජයේ බීජ ගොවිපල වැඩි දියුණු කිරීම, පංශු සංරක්ෂන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම, පලතුරු බෝගයන්ගේ අපනයන විභවයන් වර්ධනය කිරීම, කෘෂි යෙදවුම් වලට අදාළ නවීන තාක්ෂණය හඳුන්වා දීම, කෘමි උවදුරු හා රෝග පාලනය සඳහා වන නවීන ක්‍රමවේද හඳුන්වාදීම වැනි ව්‍යාපෘති 54 ක් දැනට ක්‍රියාත්මක වේ.

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

ඡායාරූප අංක 15 - 30

## 02. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (DAD)

### 2.1. දෙපාර්තමේන්තුව පිළිබඳ කෙටි හැඳින්වීම

ශ්‍රී ලාංකීය ගොවිජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 1957 ඔක්තෝම්බර් 01 වන දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ එතෙක් පැවති ආහාර දෙපාර්තමේන්තුව අහෝසි කරමිනි. 1958 අංක 01 දරණ කුඹුරු ඉඩම් පනතින් බල ගන්වන ලද මෙම දෙපාර්තමේන්තුව මේ වන විට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ක්‍රියාත්මක වේ.

### 2.2. දැක්ම

ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා සියළු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර සංවර්ධනය

### 2.3. මෙහෙවර

ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය සහ සියළුම කෘෂිකාර්මික ඉඩම්වලින් ප්‍රශස්ථ ඵලදායිතාව ලබාගත හැකිවන පරිදි වන ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ සේවාවන් සැකසීම හා කාලානුරූපව පවත්වාගෙන යාම

### 2.4. අරමුණු

- රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාළ විධි විධාන සැලැස්වීම.
- කෘෂිකාර්මික ඉඩම් හිමියන්, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන්ගේ (අඳ ගොවීන් සහ වගා කරුවන්) වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන විධි විධාන ක්‍රියාත්මක කිරීම සහ කෘෂි ඉඩම් කළමණාකරණය.
- ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන ලියා පදිංචි කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ නියෝග සෑදීම සහ එම විධි විධාන ක්‍රියාත්මක වීම තහවුරු කිරීම. ගොවිජන සංවර්ධන සභා ස්ථාපිත කිරීම සහ ඒවායේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම සහ අධීක්ෂණය යන ආයතනික සංවර්ධන කටයුතු.
- ජල කළමනාකරණය හා වාරි මාර්ග කළමනාකරණය

### 2.5. කාර්යයන්

- දිවයින පුරා පවත්නා සෑම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයකටම අදාළව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන සහ අඳගොවි නාමලේඛනය පිළියෙල කර සංශෝධනය හා ප්‍රතිශෝධනය කර පවත්වාගෙන යාම සහ සියළුම කෘෂිකාර්මික ඉඩම් කළමනාකරණය.
- ගොවිජන විනිශ්චය සභා සහ සමාලෝචන මණ්ඩල කටයුතු පවත්වාගෙන යාම හා එමඟින් කෘෂිකාර්මික ඉඩම් වලට අදාළ අඳ ගොවි ගැටළු සහ වෙනත් ගොවි ආරවුල් විසඳීම සඳහා කටයුතු කිරීම.
- සුළු වාරි කර්මාන්ත සහ ජල ප්‍රභවයන්ගේ ඵලදායීතාවය, ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණයට අදාළ වන විධි විධාන ක්‍රියාත්මක කිරීම හා සියළුම සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම.
- ගොවිජන සංවර්ධන පනත උල්ලංගනය කරමින් ක්‍රියාත්මක වන පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම හා රජයේ ප්‍රතිපත්ති සහ කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.

- ආයතනික සංවර්ධනය යටතේ දිවයින පුරා පිහිටි ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල 25ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන 566 ක් හා ගොවි බැංකු 560 ක කටයුතු පවත්වා ගෙනයාම මගින් ගොවීන් වෙත සේවා සැපයීමේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාම.

### 2.6. ආයතනය මගින් ළඟා කරගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු

- **අරමුණ 02.** සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.

### 2.7. මූල්‍ය ප්‍රගතිය

| අ/අ | විස්තරය | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 4,256.00 | 2,505.89 | 62 |
| 2 | පුනරාවර්තන | 12,154.08 | 12,053.29 | 98 |

### 2.8. භෞතික ප්‍රගතිය

- **ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල අළුත්වැඩියාව**

ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් 281-1-1-0-2001 වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි. 30 ක ප්‍රතිපාදන යටතේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාල 14ක ව්‍යාපෘති 25ක් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘති 20ක අළුත්වැඩියා කටයුතු අවසන් කරන ලදී. 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 19.45කි. භෞතික ප්‍රගතිය 80% කි.
ඡායාරූප අංක 31

- **ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල වාහන අළුත්වැඩියාව**

වාහන කාර්යක්ෂමව භාවිතයට ගත හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයේ පවතින වාහන අළුත්වැඩියාව සඳහා 281-1-1-0-2003 වැය ශීර්ෂය යටතේ රු.මි. 25.00ක් වෙන් කරන ලදී 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 25.00කි. භෞතික ප්‍රගතිය 100% කි.

දිස්ත්‍රික් කාර්යාලවල පවතින වාහන අළුත්වැඩියාව සඳහා 281-2-2-0-2003 වැය ශීර්ෂය යටතේ රු.මි. 38.00 ක් වෙන් කරන ලදි. 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 25.70 කි. භෞතික ප්‍රගතිය 67% කි.

- **ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අවශ්‍යතා.**

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල සේවය කරන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් 281-1-1-0-2102 වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද රු.මි. 51.10 ක ප්‍රතිපාදන යටතේ ප්‍රධාන කාර්යාලයේ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අවශ්‍යතා මිලදී ගන්නා ලදී. මේ සඳහා 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 42.85කි. භෞතික ප්‍රගතිය 84% කි.

දිස්ත්‍රික් කාර්යාලවල ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අවශ්‍යතා සඳහා 281-2-2-0-2102 වැය ශීර්ෂය යටතේ රු.මි. 24.70 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 24.28කි. භෞතික ප්‍රගතිය 100% කි.

- **පුහුණු හා හැකියා වර්ධනය**

ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වල සේවය කරන නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම හා කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් 281-1-1-0-2401 වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු. මි. 10.00 ක ප්‍රතිපාදන යටතේ පුහුණු වැඩසටහන් 10 ක් ක්‍රියාත්මක කරන ලද අතර 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 9.60 කි. භෞතික ප්‍රගතිය 70% කි.

- **ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියාව**

ගොවිජන සේවා මධ්‍යස්ථාන වල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් සහ පොහොර ගබඩා ධාරිතාවය වැඩි කිරීමේ අරමුණින් 281-2-2-0-2001 වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි.400 ක ප්‍රතිපාදන යටතේ ප්‍රධාන කාර්යාලය, ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියා කටයුතු 126ක් ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපෘති 107ක වැඩ අවසන් කරන ලදී. 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 308.46කි. භෞතික ප්‍රගතිය 85% කි.
ඡායාරූප අංක 32

- **යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව හා අත්පත් කර ගැනීම.**

භාවිතයට ගත හැකි කෘෂි යන්ත්‍රෝපකරණ නඩත්තුව හා නව කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා 281-2-2-0-2002 වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුදල රු.මි. 72.00 කි. පුරෝකථනය කරන ලද ඉතිරි කිරීමේ ප්‍රාග්ධනය (2025.07.29 දිනැති fert/pl/03/progress/2025 ලිපියට අනුව) රුමි. 32.00 කි. කෘෂි යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව සඳහා 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 16.46කි. භෞතික ප්‍රගතිය 68% කි. 281-2-2-0-2103 යටතේ වෙන් කරන ලද රු.මි. 8.00 ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නව යන්ත්‍ර මිලදී ගැනීම් වැඩසටහන ක්‍රියාත්මක කර නොමැත.

- **මධ්‍යස්ථාන නව ඉදිකිරීම**

ගොවිජන සේවා මධ්‍යස්ථාන වල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් 281-2-2-0-2104 වැයශීර්ෂය සඳහා වෙන් කල මුදල රු.මි. 100කි. මේ යටතේ 2024 වර්ෂයේ බැඳීම් ව්‍යාපෘති 1ක් ඇතුළුව නව ව්‍යාපෘති 16ක් ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපෘති 9ක වැඩ අවසන් කරන ලදී. 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 33.74 කි භෞතික ප්‍රගතිය 55% කි.

- **සුළු වාරි මාර්ග සංවර්ධනය හා පුරන් කුඹුරු අස්වැද්දීම (ඉඩම් හා ඉඩම් සංවර්ධනය)**

| ක්‍රියාකාරකම | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| අත්හැරදමන ලද වැව් ප්‍රතිසංස්කරණය. | 215.00 | 95.07 | ව්‍යාපෘති 18ක් ක්‍රියාත්මක කර ඇත. එයින් ව්‍යාපෘති 6ක් වැඩ අවසන්. ව්‍යාපෘති 8ක් ක්‍රියාත්මක කරමින් පවතී. ව්‍යාපෘති 4ක් අවලංගු කර ඇත |
| ක්‍රියාකාරී සුළු වාරිමාර්ගවල සුළු අලුත්වැඩියා සිදු කිරීම. (Kickstart) | 335.00 | 269.22 | ව්‍යාපෘති 820ක් ක්‍රියාත්මක කර ඇත. එයින් ව්‍යාපෘති 734ක් වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘති 84ක්‍රියාත්මක කරමින් පවතී. ව්‍යාපෘති 2ක් අවලංගු කර ඇත. |
| ගංවතුරෙන් හානියට පත් සුළුවාරි මාර්ගවල යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය හා විශේෂ ගංවතුර හානි ව්‍යාපෘතිය | 660.00 | 415.39 | ව්‍යාපෘති 278ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 230ක් වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘති 47ක් ක්‍රියාත්මක කරමින් පවතී. ව්‍යාපෘති 1ක් අවලංගු කර ඇත |
| සුළු වාරිමාර්ග වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණය | 660.00 | 391.97 | ව්‍යාපෘති 245ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 204ක් වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘති 38 ක් ක්‍රියාත්මක කරමින් පවතී ව්‍යාපෘති 3ක් අවලංගු කර ඇත |
| කෘෂිමාර්ග ප්‍රතිසංස්කරණය | 315.00 | 242.27 | ව්‍යාපෘති 168ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 139ක් වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘති 28ක් ක්‍රියාත්මක කරමින් පවතී. ව්‍යාපෘති 1ක් අවලංගු කර ඇත |
| ක්ෂුද්‍රවාරි පද්ධති ස්ථාපනය කිරීම | 15.00 | 14.15 | ව්‍යාපෘතිය වැඩ අවසන් කර ඇත. |
| පැරෂුට් වගාව ප්‍රවර්ධනය | 163.00 | 0.00 | අවස්ථා දෙකකදී ප්‍රසම්පාදන කටයුතු සිදු කලද පිරිවිතරයන්ට අනුකූලව කිසිදු ආයතනයක් ලංසු ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක නොවීය |
| වැව් වල මිරිදිය මතස්‍යයන් වගාව ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 6.30 | 6.27 | ව්‍යාපෘතිය වැඩ අවසන් කර ඇත. |
| "එකමිටට ගොවිබිමට ජාතික වැඩසටහන" | 392.50 | 148.14 | ව්‍යාපෘති 53ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති 47ක් වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘති 5ක් ක්‍රියාත්මක කරමින් පවතී. ව්‍යාපෘති 1ක් අවලංගු කර ඇත |
| සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කැවන්ඩිස් කෙසෙල් වගාකිරීමේ සමූහ ගොවිපල | 50.00 | 24.77 | බිම් සැකසීම, වගාළිං ප්‍රතිසංස්කරණය, අලිවැට සැකසීම, solarpump, වතුර ටැංකියක් ස්ථාපනය සහ කෙසෙල් බීජ මිලදී ගැනීම් අවසන් කර ඇත. |
| 2024 වර්ෂයේ අතැතිබිල් පියවීම | 220.00 | 218.07 | අතැති බිල් පියවා අවසන් කර ඇත. |
| 2024 වර්ෂයේ බැදීම් ව්‍යාපෘති | 170.00 | 119.94 | ව්‍යාපෘති 157ක් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘති සියල්ල වැඩ අවසන් කර ඇත. |
| ව්‍යාපෘති ආධාරක පිරිවැය | 48.20 | 31.10 | |
| ඉතිරි ප්‍රතිපාදන | 250.00 | 0.00 | පුරෝකථනය කරන ලද ඉතිරි කිරීමේ ප්‍රාග්ධනය (2025.07.29 දිනැති fert/pl/03/progress/2025 ලිපියට අනුව) |
| **එකතුව** | **3,500.00** | **1,976.36** | 2025.12.31 දිනට අතැතිබිල් ලෙස රු.මි. 207.50 ක් හා 2026 වර්ෂය සඳහා බැදීම් ලෙස රු.මි. 530.00ක් වාර්තා වී ඇත. |
| **උපයෝජනය නොවූ ප්‍රතිපාදන** | | **536.14** | 2025.12.31 දිනට වියදම, අතැතිබිල්, බැදීම් සහ භාණ්ඩාගාරය වෙත පවරන ලද රු.මි. 250.00 ප්‍රතිපාදන අඩුකල පසු ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය |

- **බෝග විවිධාංගීකරණය.**

මෙම වැය ශීර්ෂය යටතේ 2025 වර්ෂයේ අතරමැදි කලාපය තුළ ජල කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා තෝරාගත් වැව් සංවර්ධනය කිරීමේ ආදර්ශ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මුදල රු. මි. 50.00 කි.

මේ යටතේ ආදර්ශ වැව් 12 ක් සංවර්ධනය කරන ලද අතර 2025.12.31 දිනට වැය කළ මුදල රු.මි. 21.85 කි. 2026 වර්ෂයේ බැඳීම් ලෙස රු.මි. 17.85 ක් වාර්තා කර ඇත. භෞතික ප්‍රගතිය 50% කි.

## 2.9. අවසන් ඉලක්ක ලගා කර ගැනීමට නොහැකි වූ හේතු

2025 වර්ෂයේ නොවැම්බර් මස අග භාගයේ දිට්වා සුළි කුණාටුවෙන් ස්වභාවික ආපදා තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති බොහොමයක වැඩ අවසන් අදියරේ තිබුණ අතර වැඩ අවසන් කර තිබූ ව්‍යාපෘතීන්හි මැනුම් පත්‍ර සකස් කිරීමට තාක්ෂණ නිලධාරීන්ට නොහැකි වීම නිසාත්, ඇතැම් වැඩ අවසන් කර තිබූ ව්‍යාපෘති අවසන් ගෙවීම් සිදු කිරීමට පෙර ආපදාවෙන් හානියට පත්වූ නිසාත් ඉලක්කගත ව්‍යාපෘති සියල්ල වැඩ අවසන් නොවූ අතර අපේක්ෂා කල සියළු මුදල් උපයෝජනය කිරීමට නොහැකි විය.

## 2.10. ඉදිරි ඉලක්ක ජයගැනීමට සිදු කරනු ලබන යෝජනා

2026 වසරේ පලමු කාර්තුව තුල සියළු අතැති බිල් ගෙවීම් කිරීමට හා ජූනි මාසයට පෙර සියළු බැඳීම් ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට කාලසටහනකට අනුව කටයුතු කිරීම.

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

## 03. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 3.1. දැක්ම
කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදනයෙන් විශිෂ්ටත්වය

### 3.2. මෙහෙවර
වැඩි විදේශ විනිමයක් ඉපයීමත් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජයීය සංවර්ධනයත් පෙරදැරිකර ගනිමින්, පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන්නා වූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

### 3.3. අරමුණු
අපනයන පරිමාව වැඩිකිරීම හා නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය උසස් කිරීම තුළින් ඉහළ විදේශ විනිමය ඉපයීමක් සඳහා අපනයන කෘෂිබෝග අංශය සංවර්ධනය කිරීම.

### 3.4. කාර්යයන්
- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය.
- බෝග සංවර්ධනය, බෝග වගාව, බෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින්යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීම.
- බෝග නිෂ්පාදනය, ඵලදායිතා වර්ධනය හා ගුණාත්මකභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය ප්‍රවර්ධනය.
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමණාකරණය ප්‍රවර්ධනය.
- කාබනික වගාව ප්‍රවර්ධනය.
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම.
- අපනයන කෘෂි බෝග නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයින් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම.
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම.
- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම.
- තාක්ෂණික ආදර්ශණ පවත්වාගෙන යාම.

### 3.5. ආයතනය මඟින් ළඟා කර ගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු -
- 2.4.1.1. - ඵලදායී හා තිරසර කෘෂිකර්මාන්තය යටතේ අපනයන කෘෂි වගාවන්ගෙන් ආවරණය වන භූමි ප්‍රමාණය
- 2.5.1.1 - මධ්‍යකාලීන හෝ දිගු කාලීන සංරක්ෂණ පහසුකම් තුලින් සුරක්ෂිත කර ඇති ආහාර හා කෘෂිකර්මාන්තය සඳහා වන ශාක හා සත්ව ජාන සම්පත් සංඛ්‍යාව (අපනයන කෘෂිකාර්මික බෝග ප්‍රවේණි සම්පත් සංඛ්‍යාව)

- 9.5.1.1 - අපනයන කෘෂිකර්ම අංශය සඳහා පර්යේෂණ හා සංවර්ධන වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස
- 9.5.2.1 - නව සොයා ගැනීම් සහ ඉදිරියට යන පර්යේෂණ ගණන
- 17.11.1.1 - විදේශීය වෙළඳපොළ සඳහා වන දේශීය දායකත්වයේ කෘෂි අංශයෙන් අපනයන කෘෂිකර්ම අංශයේ කොටස

### 3.6. මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 1,621.00 | 871.65 | 54 |
| 2 | පුනරාවර්තන | 1,101.00 | 1,026.08 | 93 |

2025 වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.මි. 1,621.00 තුළ අයවැය කතාවෙන් ලබා දෙන ලද රු.මි. 250.00 ඇතුළත් වේ. ඉන් රු.මි. 100.00 ක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහ රු.මි. 150.00 ක් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත වෙන් වී ඇත.

### 3.7. භෞතික ප්‍රගතිය

දෙපාර්තමේන්තුවට අදාළව ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන වැඩසටහන් සඳහා රු.මි. 1,000.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2025 වර්ෂය සඳහා වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රු.මි. 737.43 ක මූල්‍ය වියදමක් ලඟාකර ගැනීමට 2025 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට හැකි විය.

එම වැඩසටහන් මහනුවර, නුවරඑළිය, බදුල්ල, ගම්පහ, කොළඹ, කළුතර, හම්බන්තොට, මාතලේ, මාතර, පොළොන්නරුව, අම්පාර, අනුරාධපුර, රත්නපුර, මොණරාගල, කෑගල්ල, ගාල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්ක ආශ්‍රිතව සිදුකරන ලද අතර සමස්තයක් ලෙස මෙම සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් 89,023 ක් සම්බන්ධ වී ඇත.

දෙපාර්තමේන්තුවට අදාළව සමස්ත සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් වෙන් වශයෙන් වෙන්කළ ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- **අපනයන කෘෂි භෝග සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය**

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 1.1 අපනයන කෘෂි බෝග නව වගා ප්‍රවර්ධන වැඩසටහන | 306.20<br>(පැළ ලබාදීම - 133.57<br>මූල්‍ය සහනාධාර - 172.63) | 235.97 | මෙම වැඩසටහන යටතේ සම්පූර්ණ හෙක්ටයාර 1046.53 ක් සඳහා පැළ ලබා දී ඇති අතර සහනාධාර යටතේ සම්පූර්ණ හෙක්ටයාර 478.88ක් සඳහා මූල්‍යාධාර ලබා දී ඇත.<br>• පුවක් - වැඩසටහන යටතේ හෙක්ටයාර් 28.93 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 2.55 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• එනසාල් - වැඩසටහන යටතේ හෙක්ටයාර් 34.06 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 1.6 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• එනසාල් දඬු - වැඩසටහන යටතේ හෙක්ටයාර් 0.75 සඳහා දඬු ලබාදි ඇත.<br>• සිට්‍රොනෙල්ලා - වැඩසටහන යටතේ හෙක්ටයාර් 0.75 සඳහා පැළ ලබාදි ඇත.<br>• කරාබු - වැඩසටහන් යටතේ හෙක්ටයාර් 27.50 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 3.10 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• කොකෝවා - වැඩසටහන යටතේ හෙක්ටයාර් 72.64 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 2.3 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• කෝපි (අරබිකා) - වැඩසටහන යටතේ හෙක්ටයාර් 277.86 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 27.12 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• කෝපි(රොබස්ටා) - වැඩසටහන යටතේ හෙක්ටයාර් 38.36 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 3.85 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• ගොරකා - සහනාධාර යටතේ හෙක්ටයාර් 0.10 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• ලෙමන්ග්‍රාස් - වැඩසටහන යටතේ හෙක්ටයාර් 0.10 සඳහා පැළ ලබාදි ඇත.<br>• සාදික්කා - වැඩසටහන යටතේ හෙක්ටයාර් 36.52 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 0.60 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත<br>• ගම්මිරිස් - වැඩසටහන යටතේ හෙක්ටයාර් 513.90 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 53.36 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත<br>• වැනිලා පැළ - වැඩසටහන යටතේ හෙක්ටයාර් 1.10 සඳහා පැළ ලබාදි ඇත<br>• වැනිලා වැල් - වැඩසටහන යටතේ හෙක්ටයාර් 11.95 සඳහා වැල් ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 5.82 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත<br>• බුලත්(වැල්) - .සහනාධාර යටතේ හෙක්ටයාර් 0.10 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත<br>• ඉඟුරු - සහනාධාර යටතේ හෙක්ටයාර් 217.60 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත<br>• කහ - සහනාධාර යටතේ හෙක්ටයාර් 160.88 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත. |
| 1.2. කුඩා පරිමාණ වගා ප්‍රවර්ධන වැඩසටහන | 108.81 | 105.22 | වගාවන් සඳහා පැළ 1,915,400 ලබා දී ඇත.<br>• බුලත්(පැළ) - 6,598<br>• බුලත්(වැල්) - 129,778<br>• එනසාල්(පැළ) - 206,361<br>• එනසාල් (දඬු) - 9,826<br>• කොකෝවා පැළ - 15,690<br>• කෝපි (අරබිකා) පැළ- 275,945 |

| | | | |
|---|---|---|---|
| | | | • කෝපි(රොබස්ටා) පැළ- 91,119<br>• කරාබු පැළ- 24,079<br>• ගොරකා පැළ - 26,115<br>• සාදික්කා පැළ - 24,384<br>• ගම්මිරිස් පැළ - 1,037,941<br>• වැනිලා(පැල) - 2,671<br>• වැනිලා (වැල්) - 64,901 |
| 1.3 අපනයන කෘෂිබෝග ප්‍රවර්ධන වැඩසටහන | 0.96 | 0.39 | • ගම්මිරිස් පැළ- 7,763<br>• කෝපි (රොබස්ටා) පැළ- 413<br>• කෝපි(ඇරබිකා) පැළ - 90<br>• එනසාල් පැළ - 265<br>(සම්පූර්ණ පැළ 8,531 ක් නිකුත් කර ඇත.) |
| 1.4 පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන | 176.88 | 181.82 | පැළ 3,827,256 නිකුත් කර ඇත |
| 2.1 බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම | 1.50 | 0.71 | • පුවක්(බීජ) - 120,000,<br>• සාදික්කා(බීජ) - 8,500<br>මිළදී ගෙන ඇත. |
| 2.2 පැළ නිෂ්පාදනය සඳහා යෙදවුම් මිළදී ගැනීම. | 6.30 | 5.90 | 8*5 පොලිතින් බෑග් - 1,050,500<br>10*7 පොලිතින් බෑග් - 57,500<br>බදුන් මාධ්‍ය ඒකක - 225 ක් (කියුබ්)මිලදිගෙනඇත. |
| 2.3 දැල් ගෘහ, ජල සම්පාදන හා අනෙකුත් පහසුකම් සංවර්ධනය | 8.00 | 6.12 | බදුන් මාධ්‍ය ඒකක 275 ක් (කියුබ්) මිලදි ගෙන ඇත. |
| 2.4 ගොවිබිම් කළමනාකරණය සඳහා යෙදවුම් මිළදී ගැනීම. | 2.50 | 0.17 | යන්ත්‍ර අලුත්වැඩියාව සහ තණකොළ කපන යන්ත්‍ර 05 ක් මිලදී ගැනීම |
| 2.5 පෞද්ගලික තවාන් සංවර්ධනය | 74.67 (මූල්‍ය සහනාධාර) | 23.25 | මව් ශාක උද්‍යාන ස්ථාපිත කිරිම - 13<br>දැල් ගෘහ ඉදිකිරිම - 36<br>නෙට් හවුස් අලුත්වැඩියා කිරිම - 33<br>තාවකාලික සෙවන දැල් ගෘහ - 61<br>ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරිම - 12 |
| 2.6 ගොවිපල ඉඩම් කළමණාකරණය සඳහා යෙදවුම් මිලදි ගැනීම. | 2.60 | 0.02 | යූරියා - 24KG,<br>ERP - 30 KG<br>MOP - 20KG |
| 3.1 භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන | 63.29<br>(පැළ ලබාදීම - 11.51<br>මූල්‍ය සහනාධාර - 51.77) | 42.62 | වැඩසටහන යටතේ සම්පූර්ණ හෙක්ටයාර 674.79 ක් සඳහා පැළ ලබා දී ඇති අතර සහනාධාර යටතේ සම්පූර්ණ හෙක්ටයාර 506.03 ක් සඳහා මුල්‍යාධාර ලබා දී ඇත.<br>• ගම්මිරිස් - වැඩසටහන යටතේ හෙක්ටයාර් 646.79 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 330.13 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• කෝපි (අරබිකා) - වැඩසටහන යටතේ හෙක්ටයාර් 18.8 සඳහා පැළ ලබාදි ඇත.<br>• කොකෝවා - වැඩසටහන යටතේ හෙක්ටයාර් 7 සඳහා පැළ ලබාදි ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 168.6 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | • කරාබු - වැඩසටහන යටතේ හෙක්ටයාර් 2.5 සඳහා පැළ ලබාදී ඇත. සහනාධාර යටතේ හෙක්ටයාර් 6.15 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත.<br>• සාදික්කා - සහනාධාර යටතේ හෙක්ටයාර් 1.15 සඳහා මූල්‍යාධාර ලබාදී ඇත. |
| 3.2 පළිබෝධ හා වගා හානි වැළැක්වීමේ උපාංග/පද්ධති ලබා දීමේ වැඩසටහන | 5.35 (මූල්‍ය සහනාධාර) | 3.57 | ඒකක 33 ක් සම්පූර්ණ කර ඇත |
| 3.3 ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීමේ වැඩසටහන | 5.86 (මූල්‍ය සහනාධාර) | 3.13 | ඒකක 24 ක් සම්පූර්ණ කර ඇත |
| 3.4. ශාක ආරක්ෂණ වැඩසටහන | 5.00 (වැඩසටහන) | - | 41 KG 200G මිළදී ගෙන ඇත. |
| 4.1 කාබනික සහ කෘෂි කාර්මික පිළිවෙත් (GAP) කෘෂි ප්‍රමිති සහතික ලත් වගාවන් ප්‍රවර්ධන වැඩසටහන | | - | GMP සහතික- 01 නිකුත් කර ඇත. |
| 4.2 උචිත තාක්ෂණය භාවිතයෙන් අපනයන කෘෂි බෝග ගුණාත්මය වැඩි දියුණු කිරීම | 124.02 (මූල්‍ය සහනාධාර) | 87.67 | උපකරණ - 1011<br>මධ්‍යස්ථාන - 12 ලබා දී ඇත. |
| 4.3 අලෙවි ප්‍රවර්ධන වැඩසටහන | 5.00 | - | වැඩසටහන් - 01 (කෝපි දිනය) පවත්වා ඇත. |
| 4.4.යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම / සහතිකරණය | 18.56 (මූල්‍ය සහනාධාර) | - | අයදුම්පත් 04 ක් ලැබී ඇත. |
| 4.5 පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන | 5.00 | - | - |
| 5.1 ජන මාධ්‍ය හා ප්‍රදර්ශන හරහා අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය | 35.50 | 17.02 | රූපවාහිනි වැඩසටහන් - 50, ගුවන් විදුලි වැඩසටහන් - 103<br>වෙනත් වැඩසටහන් - 53, ප්‍රදර්ශන - 04<br>පුවත්පත් දැන්වීම් - 01, මුද්‍රිත මාධ්‍ය - 01<br>සන්නිවේදන උපකරණ - 01 ක්<br>මිළදී ගෙන ඇත. |
| 6.1 අපනයන කෘෂිකාර්මික භෝග පාර්ශ්වකරුවන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන | 9.41 | 6.72 | ගොවි පුහුණු වැඩසටහන් - 3087 ක් සම්පූර්ණ කර ඇත.<br>ප්‍රතිලාභින් 74,604 ක් සහභාගි වී ඇත.<br>ක්ෂේත්‍ර වැඩසටහන් 469 ක් පවත්වා ඇත.<br>ප්‍රතිලාභින් 11,308 ක් සහභාගි වී ඇත. |
| 6.2 සේවා සංස්කරණ පුහුණු වැඩසටහන් | 3.60 | 1.03 | පුහුණු වැඩසටහන් 59 ක් පවත්වා ඇත. |
| 6.3.ඩිජිටල් ව්‍යාපෘති වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම | 1.00 | - | - |

- **අපනයන කෘෂිභෝග සංවර්ධන වැඩසටහනේ සහ අපනයන කෘෂි භෝග පර්යේෂණ හා සමෝධානික රෝග පලිබෝධ පාලන ව්‍යාපෘතියේ (2002, 2003, 2102, 2103, 2401, 2001, 2104, 2105, 2506 සහ 2507 වැය ශීර්ෂයන්ට අදාළව) 2025.12.31 දිනට ප්‍රගතිය**

| වැඩසටහන ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම (2002) | 7.50 | 1.84 | පරිසනක - 05, මුද්‍රණ යන්ත්‍ර - 02<br>ප්‍රොජෙක්ටර් - 01 ,ඡායා පිටපත් යන්ත්‍ර - 10<br>ජල මෝටර - 01, ඩෙස්ක්ටොප් පරිගණක - 02<br>ලැප්ටොප් බැටරි - 01, වායු සමීකරණ යන්ත්‍ර - 02<br>ශීතකරණ - 01 ,උදුන - 01<br>ජෙල්ඩහාල් ඒකක - 01, ලැමිනර් තට්ටු - 01<br>ජෙනරේටර් - 02, කෝපි පල්පර් - 01<br>කෝපි වියළන යන්ත්‍ර - 01, ජල පොම්ප - 01<br>අළුත්වැඩියා කර ඇත. |
| වාහන අළුත්වැඩියාව (2003) | 15.00 | 11.10 | වාහන 60 ක් අලුත්වැඩියා කර ඇත.<br>බැටරි 05 ක් මිලදි ගෙන ඇත.<br>ට්‍රැක්ටර් 01 අලුත්වැඩියා කර ඇත.<br>ටයර් 05 ක් මිලදි ගෙන ඇත. |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (2102) | 20.00 | 9.35 | පොත් රාක්ක - 01, වයිෆයි ඇඩැප්ටර - 01<br>ලැප්ටොප් පරිගණක - 11 ,ඩෙස්ක්ටොප් - 29<br>කැරකෙන පුටු - 30 ,සිලිං පංකා - 02<br>පෙඩෙස්ටල් පංකා - 12, බිත්ති පංකා - 08<br>මේස විදුලි පංකා - 02, දොර 2 ගොණු කබඩ් -15<br>ලොකර් 4 ගොණු කැබිනට් -11, සම්මන්ත්‍රණ මේස - 02<br>සම්මන්ත්‍රණ පුටු - 20, කර්යාල මේස - 20<br>ආරක්ෂිත කබඩ් - 01, ඡායා පිටපත් යන්ත්‍ර - 02<br>ප්‍රොජෙක්ටර් - 01, UPS - 39<br>කාර්යාල පරිමාණ - 01, බාකෝඩ් යන්ත්ර - 01<br>තීරු කේත ස්කැනර් - 01, ස්මාර්ට් පුවරු - 01<br>පිරිසිදු කිරිමේ යන්ත්ර - 01, මුද්‍රණ යන්ත්‍ර - 02<br>විධායක මේස - 01,විධායක පුටු - 02<br>පුටු - 01,පුස්තකාල කබඩ් - 02<br>පරිගණක පුටු - 03,වෙලඳසැල් රාක්ක - 01<br>වානේ කබඩ් - 01,වීදුරු දොර කබඩ් - 01<br>නාම පුවරු - 18<br>මිලදී ගෙන ඇත. |
| කාර්යාලයීය උපකරණ මිලදීගැනීම (2103) | 7.50 | 4.45 | මුද්‍රණ යන්ත්‍ර - 08, AC යන්ත්‍ර - 06,<br>ප්‍රොජෙක්ටර් - 03, මයික්‍රොපොන - 04,<br>FAX යන්ත්‍ර - 02 , තණකොල කපන යන්ත්‍ර - 05,<br>බහුමාධ්‍ය තිර - 01, ස්කැනර් යන්ත්‍ර - 02, |

| | | | |
|---|---|---|---|
| | | | ටේබල් මයික්‍රොපොන - 05, ජල පිල්ටර් - 01,<br>බිත්ති ප්‍රොජෙක්ටර් තිර - 01, ඡායා පිටපත් - 02,<br>මෙවලම් කට්ටල - 02<br>කුඩා රොටේටර් - 01,<br>මිල දී ගෙන ඇත. |
| කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන (2401) | 1.00 | 0.99 | නිලධාරීන් 511 ක් සඳහා පුහුණු ලබාදී ඇත. |
| • **අපනයන කෘෂි භෝග පර්යේෂණ හා සමෝධානික රෝග පලිබෝධ පාලන ව්‍යාපෘතිය** | | | |
| පර්යේෂණ හා සංවර්ධන සහාය වැඩසටහන් | 10.00 | 6.80 | පර්යේෂණ අවශ්‍යතාවයන් 30 ක් ඉටුකර ඇත. |

- **අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතියේ ප්‍රගතිය**

| | | | |
|---|---|---|---|
| Enterpreneurship Development and Export Market Access Programme | 100.00 | 0.93 | ව්‍යාපෘතියට අදාළ මූලික කටයුතු සිදුකර ඇත. |

- ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්ට අදාළව 2001 වැය ශීර්ෂය යටතේ ව්‍යාපෘති 51 ක් පදනම්කොට ගෙන 81% ක්ද ,
- 2104 වැය ශීර්ෂය යටතේව්‍යාපෘති 25 ක් පදනම්කොට ගෙන 24% ක්ද ,
- 2105 වැය ශීර්ෂය යටතේව්‍යාපෘති 50 ක් පදනම්කොට ගෙන 27% ක්ද ,
- 2506 වැය ශීර්ෂය යටතේ ව්‍යාපෘති 22 ක් පදනම්කොට ගෙන 33% ක්ද ,
- 2507 වැය ශීර්ෂය යටතේව්‍යාපෘති 51 පදනම්කොට ගෙන 72% ක්ද

වශයෙන් භෞතික ප්‍රගතියක් 2025.12.31 දිනට වාර්තා කර ඇත.

ඡායාරූප අංක 33 - 34

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

## 04. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

අංක 2458/65 දරණ 2025 ඔක්තෝම්බර් 18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතට ඇතුළත් කර ඇත.

### 4.1. දැක්ම

ලංකා කුරුඳු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අපනයන-අභිමුඛ වැවිලි බෝගය ලෙස ස්ථානගත කිරීම

### 4.2. මෙහෙවර

තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම, තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම යන උපායමාර්ගික මුලපිරීම් තුළින් ජාතික ආර්ථිකයට ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ දායකත්වය ශක්තිමත් කිරීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම

### 4.3. අරමුණු

- නිෂ්පාදන පද්ධති නවීකරණය, පසු අස්වනු කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, සහ සමූහ ව්‍යාපාර ශක්තිමත් කිරීම තුළින් කුරුඳු නිෂ්පාදනය, වගා බිමේ ඵලදායීතාව සහ ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීම
- ඉහළ වටිනාකම සහිත සහ අධි මිල වෙළඳපොළවලට ප්‍රවේශ වීම අරමුණු කර ගනිමින් අගය එකතු කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය සහ නව්‍යකරණය මඟින් කුරුඳු කර්මාන්තයේ වේගවත් පරිවර්තනයක් සිදු කිරීම.
- පවතින කුරුඳු අපනයන වෙළඳපොළවල ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය ශක්තිමත් කිරීමට සමගාමීව නව කලාපීය සහ ගෝලීය වෙළඳපොළවලට ප්‍රවේශය පුළුල් කිරීම.
- ගෝලීය තිරසාරත්ව, කාබනික සහ ගුණාත්මක භාවය සහතික කිරීමේ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ පරිසර හිතකාමී කුරුඳු කර්මාන්තයක් ස්ථාපිත කිරීම.
- කුරුඳු කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සඵලදායී පාලනය, සම්බන්ධීකරණය සහ දැනුම උත්පාදනයට සහාය වන ආයතනික සහ ප්‍රතිපත්තිමය පරිසරයක් නිර්මාණය කිරීම.

### 4.4. ප්‍රධාන කාර්යයන්

- සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ වැවිලි අංශය තුළ කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම.
- කුරුඳු භෝගයට අදාළව භෝග වැඩිදියුණු කිරීම, පාංශු හා ශාක පෝෂක කළමනාකරණය, ශාක ආරක්ෂණය, පසු අස්වනු තාක්ෂණය සහ සමස්ත වගා කළමනාකරණය සම්බන්ධ බහුවිධ පර්යේෂණ සිදු කිරීම.
- කුරුඳු වගාවේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ප්‍රවර්ධනය කිරීම.
- කුරුඳු භූගෝලීය දර්ශක (GI) සහතිකකරණයට අදාළ විගණන කටයුතු සිදු කිරීම.
- කුරුඳු සහ කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සඳහා අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කුරුඳු වගාව හා කර්මාන්තය සම්බන්ධ දත්ත පද්ධති පවත්වා ගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- කුරුඳු වගාව, සැකසුම සහ නිෂ්පාදනය සම්බන්ධ ව්‍යාප්ති සහ උපදේශන සේවාවන් සැපයීම.
- කුරුඳු වගාව, සැකසුම සහ වෙළඳාමට සම්බන්ධ පාර්ශ්වකරුවන් පුහුණු කිරීම.
- කුරුඳු වගා ආරක්ෂණය සහ පාංශු පෝෂක කළමනාකරණය සම්බන්ධ උපදේශන සේවාවන් සැපයීම.
- කුරුඳු නිෂ්පාදනයට අදාළ විද්‍යාගාර පරීක්ෂණ සේවාවන් පවත්වා ගෙන යාම.
- කුරුඳු සංවර්ධනය සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පුද්ගලික ආයතන සමග අන්තර්-ආයතන සම්බන්ධතා පවත්වා ගෙන යාම.
- කුරුඳු භෝගයට අදාළ ජාන සම්පත් එක්රැස් කිරීම, සංරක්ෂණය, පවත්වා ගෙන යාම සහ ඇගයීම.

### 4.5. ආයතනය මඟින් ළඟා කරගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු (SDGs)

- තිරසාර සංවර්ධන ඉලක්ක 1 – සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

කුරුඳු කර්මාන්තය ආශ්‍රිත පාර්ශ්වකරුවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශය වර්ධනය කිරීම මඟින් දරිද්‍රතාවය අවම කිරීම.

- තිරසාර සංවර්ධන ඉලක්ක 2 – කුසගින්න තුරන් කිරීම

තිරසාර කෘෂිකාර්මික භාවිතයන් සහ ඵලදායීතාව වර්ධනය කිරීම මඟින් කුරුඳු වගා ප්‍රදේශවල ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම.

- තිරසාර සංවර්ධන ඉලක්ක 8 – සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

රැකියා අවස්ථා නිර්මාණය කිරීම, නිපුණතා වැඩිදියුණු කිරීම සහ අපනයන-අභිමුඛ කුරුඳු කර්මාන්තය හරහා ජාතික ආර්ථිකයට දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

- තිරසාර සංවර්ධන ඉලක්ක 13 – දේශගුණික ක්‍රියාකාරකම්

කුරුඳු වගාවට දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීම සඳහා දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දෙන, තිරසාර වගා පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

- තිරසාර සංවර්ධන ඉලක්ක 15 – ගොඩබිම මත ජීවය කුරුඳු වගාවට අදාළ ඉඩම් හා පරිසර පද්ධති තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම.

### 4.6. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 406.00 | 189.40 | 47 |
| පුනරාවර්තන | 141.00 | 126.60 | 90 |

### 4.7. භෞතික ප්‍රගතිය

2025 වර්ෂය තුළ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්ම ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින්, වගාකරුවන්ට සෘජු සහාය සැපයීම, ඵලදායීතාවය ඉහළ නැංවීම, පුහුණු හා ව්‍යාප්ති සේවාවන් පුළුල් කිරීම සහ වෙළඳපොළ අභිමුඛ සංවර්ධනය ප්‍රමුඛ කර ගනිමින් කටයුතු කර ඇත. මෙම මැදිහත්වීම් හරහා කුරුඳු නිෂ්පාදනය, වගාකරුවන්ගේ ආදායම සහ ග්‍රාමීය ජීවනෝපාය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමට දෙපාර්තමේන්තුව දායක වී ඇත.

#### i. වගාකරුවන්ට සහාය සහ ක්ෂේත්‍ර මට්ටමේ සංවර්ධන මැදිහත්වීම්

2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අවධානය යොමු වූයේ වගාකරුවන්ට සෘජු සහාය සැපයීම වෙතයි. ලංකා සත්‍ය කුරුඳු කර්මාන්තය පුනරුත්ථාපනය සඳහා වගාකරුවන්ට සහාය දෙන පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන යටතේ වගා භූමි පුළුල් කිරීම, පවතින වගා නැවත ශක්තිමත් කිරීම සහ භූමි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පුළුල් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

නව වගා ප්‍රවර්ධන වැඩසටහන් දිස්ත්‍රික්ක 14ක ක්‍රියාත්මක කරමින්, හෙක්ටයාර් 565.56 ක භූමි ප්‍රමාණයක් ආවරණය කර ඇති අතර, වගාකරුවන් 1,871 දෙනෙකුට ප්‍රතිලාභ ලැබී ඇත. මෙහිදී කුරුඳු පැළ මිලියන 5.08 ක් රු. මි. 62.66 ක දායකත්වයකින් බෙදා හැර ඇත.

එයට සමගාමීව, භූමි ඵලදායීතාවය ඉහළ නැංවීමේ (gap filling) වැඩසටහන් දිස්ත්‍රික්ක 8ක, හෙක්ටයාර් 331.91 ක ක්‍රියාත්මක කරමින්, වගාකරුවන් 557 දෙනෙකුට කුරුඳු පැළ 369,401 ක් රු. මි. 25.29 ක වියදමකින් ලබා දී ඇත.

කුරුඳු වගාකරුවන්ට සහාය වීම උදෙසා ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාත්මක කරන ලද ඉහත වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂයේ පැවැති ජාතික කුරුඳු නිෂ්පාදනය වන මෙ.ටො. 24,900 ක් වූ ප්‍රමාණය මෙ.ටො. 26,000 ක් දක්වා වැඩි වී ඇත. ඒ අනුව, වගාකරුවන්ට කුරුඳු කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා ලැබුනු සාමාන්‍ය මිල 2024 වර්ෂයේ පැවති රු. 3,600.00 සිට 2025 වර්ෂය අවසාන වන විට රු. 4,000.00 දක්වා ඉහළ ගොස් ඇත.

### ii. ව්‍යාප්ති, උපදේශන සහ පුහුණු වැඩසටහන්

වගාකරුවන් විසින් නිර්දේශිත කෘෂිකාර්මික හා පසු අස්වනු පිළිවෙත් කාර්යක්ෂම ලෙස අනුගමනය කරනු ලබන බව සහතික කිරීම සඳහා දෙපාර්තමේන්තුව පුළුල් ව්‍යාප්ති හා උපදේශන ජාලයක් පවත්වාගෙන යනු ලබයි. 2025 වර්ෂය තුළ, කුරුඳු වගා භූමි සහ පැළ තවාන් 95කට ක්ෂේත්‍රගත තාක්ෂණික උපදේශන ලබා දී ඇති අතර, සේවාලාභීන් 850 දෙනෙකුට ආයතනික උපදේශන සේවාවන් ලබා දී ඇත.

දුරකථන සහ මාර්ගගත ක්‍රම ඔස්සේ වගාකරුවන් සහ කර්මාන්ත පාර්ශ්වකරුවන් 2,320 දෙනෙකුට උපදේශන ලබා දී ඇති අතර, එමඟින් සේවාවන්ගේ ප්‍රවේශය සහ කාර්යක්ෂමතාවය පුළුල් කර ඇත.

පුහුණු හා ධාරිතා සංවර්ධනය 2025 වර්ෂයේ ප්‍රමුඛ අංගයක් විය. වාර්ෂික ඉලක්කය වූ වැඩසටහන් 687ට සාපේක්ෂව, පුහුණු වැඩසටහන් 701ක් ක්‍රියාත්මක කර ඇති අතර, එමඟින්:

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP),
- පාංශු පෝෂණ සහ පොහොර කළමනාකරණය,
- ශාක ආරක්ෂණය,
- පසු අස්වනු හැසිරවීම සහ සැකසුම

  යන ක්ෂේත්‍රවල වගාකරුවන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කර ඇත.

International Finance Corporation (IFC) ආයතනය සමග එක්ව, කාන්තා කුරුඳු සැකසුම්කරුවන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, කාන්තා ආර්ථික සවිබලගැන්වීම ද ප්‍රවර්ධනය කර ඇත.

### iii. අගය දාම සංවර්ධනය, සැකසුම් හා වෙළඳපොළ ප්‍රවේශය

වගාකරුවන්ගේ ආදායම වැඩිදියුණු කිරීම සඳහා, ප්‍රාථමික නිෂ්පාදනයට පමණක් සීමා නොවී අගය දාම සංවර්ධනයට ද දෙපාර්තමේන්තුව අවධානය යොමු කර ඇත. අපනයන අභිමුඛ වැඩසටහන් යටතේ:

- කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන 34ක් සහ තෙල් නිස්සාරණ ඒකක 11ක් ස්ථාපිත කර ඇත,
- වියළන යන්ත්‍ර, කුඩු කිරීමේ යන්ත්‍ර, පොලිතින් සීලර්, වර්ණ වර්ගීකරණ යන්ත්‍ර ඇතුළු නවීන උපකරණ බෙදා හැර ඇත.

තත්ත්ව සහතිකකරණ ක්ෂේත්‍රයේ:

- GI සහතික 5ක්,
- GMP සහතික 1ක්,
- ISO 22000 සහතික 3ක්

  ලබා දීම හරහා ජාත්‍යන්තර වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීම ශක්තිමත් කර ඇත.

අගය දාම සංවර්ධනය සහ වෙළඳපළ ප්‍රවේශය වැඩිදියුණු වීමේ ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂයේ අවසානය වන විට කුරුඳු අපනයන මගින් ලැබූ විදේශ විනිමය වන ඇ. ඩො. මි. 226.00 ක අපනයන වටිනාකම 2025 වර්ෂය අවසානයේ දී ඇ. ඩො. මි. 260.00 ක් දක්වා වර්ධනය වී ඇත.

### iv. පර්යේෂණ, නව්‍යකරණය සහ තාක්ෂණික සානුබලය

වගාකරුවන්ට සහාය සැපයීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා, ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මඟින් පර්යේෂණ වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කර ඇත. එමඟින්:

- පර්යේෂණ ප්‍රකාශන 13ක්,
- කුරුඳු කර්මාන්තය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 53කට දායකත්වය,
- කුරුඳු කර්මාන්තය පිළිබඳ පුහුණු වැඩසටහන් 75ක් (ප්‍රතිලාභීන් 1,461) සම්පූර්ණ කර ඇත.
- රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව දෙපාර්තමේන්තුවේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම.

- "කුරුඳු අත්පොත" (Cinnamon Handbook) සංශෝධිත දෙවන මුද්‍රණය ලෙස සිංහල පිටපත් 1,000ක් සහ දෙමළ පිටපත් 500ක් DevPro Guarantee Ltd ආයතනයේ මූල්‍ය දායකත්වයෙන් මුද්‍රණය කිරීම.

එසේම, නව කුරුඳු ප්‍රභේදවල පැළ නිෂ්පාදනය කර තෝරාගත් වගාකරුවන් අතට පත්කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. කුරුඳු ආශ්‍රිත නව ආහාර නිෂ්පාදන 2ක් සංවර්ධනය කර ඇති අතර, ජාත්‍යන්තර ප්‍රතීතන සහිත විද්‍යාගාර දෙක මඟින් විද්‍යාගාර වාර්තා 241ක් නිකුත් කර ඇත.

### v. සමස්ත බලපෑම

2025 වර්ෂය තුළ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ඒකාබද්ධ වගාකරුවන්ට සහාය, පුහුණු, ව්‍යාප්ති, සැකසුම් සහ පර්යේෂණ වැඩසටහන් මඟින්, කුරුඳු කර්මාන්තයේ ඵලදායීතාවය, ආදායම, රැකියා අවස්ථා සහ අපනයන තරගකාරීත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කර ඇත.

මෙම දායකත්වය ජාතික මට්ටමින් දරිද්‍රතාවය අවම කිරීම, තිරසාර කෘෂිකර්මය, සුදුසු රැකියා සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීම වැනි තිරසාර සංවර්ධන අරමුණු ඉටු කිරීම සඳහා වැදගත් දායකත්වයක් සපයා ඇත.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් වැඩසටහන්

- International Finance Corporation (IFC) ආයතනයේ සහයෝගයෙන් GAP සහ GI සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- රජයේ ඩිජිටල්කරණ වැඩසටහන්ට අනුකූලව, දෙපාර්තමේන්තුවට සිදුකරන ගෙවීම් GovPay පද්ධතියට ඒකාබද්ධ කිරීම.
- චීන කුරුඳු අපනයන වැඩසටහන යටතේ අපනයනකරුවන් 15 දෙනෙකු ලියාපදිංචි කිරීම.
- GCF - Knuckles ව්‍යාපෘතිය යටතේ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
- International Finance Corporation (IFC) ආයතනය සමග එක්ව කාන්තා කුරුඳු සැකසුම්කරුවන් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඡායාරූප අංක 35

## 05. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය (NIPHM)

වර්ෂ 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික ව්‍යවස්ථා පනතෙහි ප්‍රතිපාදනයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2000 වර්ෂයේ ජූනි 19 වැනි දින පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය පිහිටුවන ලදී. 2018.10.27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2093/26 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ආයතනයේ නම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය ලෙස වෙනස් කරන ලදී. ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ කෘෂිකාර්මික බෝගයන්ගේ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සහ කෘෂි ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පුහුණු, ව්‍යාප්ති, තාක්ෂණික උපදේශන සේවා හා රසායනාගාර සේවා සිදු කිරීමයි.

### 5.1. මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 33.00 | 19.25 | 58 |
| 2 | පුනරාවර්තන | 164.10 | 158.36 | 97 |
| | සංවර්ධන වැඩසටහන් | 26.20 | 21.66 | 83 |

### 5.2. භෞතික ප්‍රගතිය

- **පර්යේෂණ ව්‍යාපෘතීන්වල ප්‍රගතිය** (වැය විෂය -118-02-03-073-2201)

පසු අස්වනු හානිය අවම කිරීම, ආහාර සැකසීම හා අගය එකතු කිරීම සහ සුරක්ෂිත ආහාර සහ පෝෂණය යන ප්‍රධාන තේමා 3 යටතේ 2025 වර්ෂයේ දී පර්යේෂණ ව්‍යාපෘතීන් 15ක් ක්‍රියාත්මක කෙරිනි (මෙයින් පර්යේෂණ 3 ක් 2026 වර්ෂයේදීද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට තිබුණි). මේ සඳහා වෙන් කළ මුදල රු. මි. 11.23 කි. 2025.12.31 වන විට වියදම රු. මි. 6.83 කි. මෙම පර්යේෂණ ව්‍යාපෘති අතරින් ව්‍යාපෘතීන් 3ක අධ්‍යයන කටයුතු අවසන් කළ අතර අවසන් වාර්තා සකසමින් පවතී. 2025.12.31 දිනට අවසන් කිරීමට යෝජිතව, පසු අස්වනු ජීව කාලය නිර්ණය කෙරෙමින් අවසන් අදියරේ පැවැති පර්යේෂණ 9ක නියැදීන් 2025.11.28 වන දින ඇතිවූ ගංවතුර තත්ත්වය හේතුවෙන් මුළුමනින්ම විනාශ වූ අතර එම අදාළ පරීක්ෂණ නැවත සිදු කළ යුතුව ඇත. මේ අනුව පර්යේෂණ ව්‍යාපෘතීන් 12 ක් 2025 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා දීර්ඝ කිරීමට සිදු විය.

- **සංවර්ධන ව්‍යාපෘතීන් වල ප්‍රගතිය (වැය විෂය -118-02-03-020-2202)**

**i. ග්‍රාමීයව ගෘහස්ථ මට්ටමේ සහල් සැකසුම් කර්මාන්ත ඇති කිරීම**

ගොවියා සිය වී අස්වැන්න අලෙවි නොකර ඒ සඳහා අගය එකතු කිරීමක් කොට සහල් ලෙස වෙළඳපලට එක් කිරීම මඟින් ඔහුගේ ආර්ථිකය සවිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ දිස්ත්‍රික්ක 11ක සහල් සැකසුම් ඒකක 87ක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරිනි. 2025.12.31 වන විට, නිවැරදි ලෙස සහල් සැකසීම පිළිබඳව ප්‍රතිලාභින් 507ක් පුහුණු කළ අතර සහල් සැකසුම් ඒකක 85ක් ස්ථාපිත කෙරිනි.

මෙම වැඩසටහන සඳහා වෙන් කළ මුදල රු.මි. 5.92 කි. 2025.12.31 වන විට වියදම් කර ඇති මුදල රු.මි. 5.27 කි.

**ii. ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීම සඳහා සහල්, බඩඉරිඟු හා ධාන්‍ය වර්ග ගබඩාකිරීමට ගෘහස්ථ ගබඩා වැඩි දියුණු කිරීම**

ධාන්‍ය ගබඩාකරණයේදී සිදු වන පසු අස්වනු හානිය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු. මි. 5.05 කි. මේ යටතේ දිස්ත්‍රික්ක 11ක ගෘහස්ථ ගබඩා 108 ක් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරිනි. 2025.12.31 වන විට, නිවැරදි ගබඩාකරණය පිළිබඳව ගොවීන් 545 ක් පුහුණු කළ අතර ඒකක 105 ක් වැඩිදියුණු කර ඇත. මේ සඳහා වියදම් කර ඇති මුදල රු.මි. 4.64 කි.

### iii. ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් හඳුන්වා දීම

ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් 10 දෙනෙකු බිහිකිරීමේ අරමුණින් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.1.71 කි. 2025.12.31 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 1.64 කි. ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභින් 425 ක් කුළුබඩු සැකසීම පිළිබඳව පුහුණු කොට ඇති අතර කුළු බඩු සැකසීමේ ඒකක 10 ක් ස්ථාපිත කරන ලදී.

### iv. කෘෂි සැපයුම් දාමයේ පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම සඳහා දිවයිනේ එක් එක් ප්‍රදේශ වල විභවය පදනම් කොට ගත් පසු අස්වනු සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම

මෙම ව්‍යාපෘතිය මඟින් එක් එක් පෙදෙස්වල වැවෙන බෝග හා ඒ පෙදෙස්වල පවතින වෙළඳපල විභවය අධ්‍යයනය කොට කෘෂි ආශ්‍රිත ව්‍යවසායකයින් 10 දෙනෙකු සවිබල ගැන්වීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදු කෙරිනි. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි. 2.5කි. 2025.12.31 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 2.45 කි. ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභින් 574 ක් විවිධ කෘෂි ආශ්‍රිත කර්මාන්ත සඳහා පුහුණු කොට ඇත. පසු අස්වනු සැකසීමේ ඒකක 10ක් ස්ථාපිත කරන ලදී.

### v. කෘෂි බෝගයන්ගේ නිවැරදි පසු අස්වනු කළමනාකරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා අගය එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතිය මඟින් දිවයින පුරා රාජ්‍ය නිලධාරීන්, පළාත් පාලන ආයතන නියෝජිතයින් සහ කෘෂි ව්‍යවසායකයින් 1,000ක් දැනුවත් කිරීමට හා කෘෂි ආශ්‍රිත නිෂ්පාදන ඒකක 4ක් (විජලන ඒකක 2ක් හා පල්ප කිරීමේ ඒකක 2ක්) ස්ථාපිත කිරීමට අපේක්ෂිතව 'අස්වැන්නට අරුනැල්ලක්' ලෙස වැඩසටහන් මාලාවක් දියත් කෙරිනි. මේ සඳහා වෙන් කළ මුදල රු.මි. 4.12 කි. 2025.12.31 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 1.48 කි. විජලන ඒකක 2 ස්ථාපිත කළ අතර පල්ප කිරීමේ යන්ත්‍ර 2 දෙසැම්බර් මස ලැබීමට නියමිතව තිබුණද, අදාළ සැපයුම්කරුගේ කර්මාන්තශාලාව දිට්වා සුළිකුණාටුව හේතුවෙන් හානියට පත්ව ඇති බවත් යන්ත්‍ර සැපයීම ප්‍රමාද වන බවත් එම සැපයුම්කරු විසින් දන්වා ඇත. එසේ වුවද, මෙම යන්ත්‍ර ස්ථාපිත කිරීමට අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් අදාළ ප්‍රතිලාභීන් විසින් සම්පූර්ණ කොට ඇති බැවින් යන්ත්‍ර මිළදී ගැනීම අත් හිටුවිය නොහැකිය. මේ නිසා, පල්ප කිරීමේ යන්ත්‍ර 2 සඳහා ගෙවිය යුතු මුදල වන රු.මි. 1.50 ක් බැදිම් වටිනාකමක් ලෙස පවතී. ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභින් 714 ක් පසු අස්වනු තාක්ෂණය පිළිබඳව දැනුවත් කොට ඇත. ජාතික රූපවාහිනිය ඔස්සේ නිවැරදි පසු අස්වනු තාක්ෂණය පිළිබඳව වැඩසටහන් 2ක් විකාශය කරන ලදී.

### vi. නියමු ව්‍යාපෘතියක් ලෙස එළවළු පලතුරු සඳහා ශීත දාමයක් ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතිය මඟින් නුවර එළිය හා අනුරාධපුර දිස්ත්‍රික්කයන් කේන්ද්‍ර කොට ගෙන අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙහිදී, තෝරාගත් ශීත දාමයන්ට අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කොට ශීත දාමයක් ස්ථාපිත කිරීමේදී ඇති වන ප්‍රායෝගික ගැටළු හඳුනා ගෙන ඇත. මෙම තෝරාගත් පාර්ශ්වකරුවන් හට ශීත දාමයේ පරිහරණය සඳහා ඇසුරුම් 80 ක් මිළදී ගන්නා ලදී. තවද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ එළවළු පලතුරු සේදුම් ඒකකයක් ස්ථාපිත කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි. 1.00 කි. 2025.12.31 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 0.63 කි.

### vii. එළවළු, පලතුරු ප්‍රවාහනයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සුරක්ෂිත ඇසුරුම් හඳුන්වා දීම

එළවළු, පලතුරු පසු අස්වනු හානිය වැඩි වශයෙන්ම සිදු වන්නේ ප්‍රවාහනයේදීය. මෙසේ සිදු වන හානිය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතිය තුළින් එළවළු හා පලතුරු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් ඇසුරුම් 1,513 ක් (ජම්බෝ-725, ලාජ්- 788) මිළදී ගන්නා ලදී. මේ සඳහා වෙන් කළ මුදල රු.මි. 5.90 කි. 2025.12.31 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 5.55 කි.

**5.3. පුනරාවර්ථන වියදම් (වැය විෂය - 118-02-03-073-1509) යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය**

**3.1 තාක්ෂණ ප්‍රචාරණ කටයුතු**

නිවැරදි පසු අස්වනු තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලා (නේවාසික හා ක්ෂේත්‍ර වැඩසටහන් ලෙස) 100 ක් පැවැත්වීම හරහා ප්‍රතිලාභීන් 2,000 ක් පුහුණු කිරීම ඉලක්ක කොට ගෙන තාක්ෂණ ප්‍රචාරණ කටයුතු සිදු කෙරිනි. මේ හරහා නේවාසික හා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 167 ක් පවත්වා පුද්ගලයින් 4,312 ක් පුහුණු කරන ලදී. මෙම පුහුණු වැඩසටහන් හරහා නව ව්‍යවසායකයින් 51 ක් ක්ෂේත්‍රයට හඳුන්වා දීමට හැකි විය.

**3.2 උපදේශක සේවා ,ඉංජිනේරු සේවා හා විද්‍යාගාර සේවා**

පසු අස්වනු සැකසුම් යන්ත්‍ර භාවිතය හා නඩත්තු කිරීම සහ ඒ ආශ්‍රිත තාක්ෂණයන්ට අදාළව උපදේශන සේවා 20 ක් ලබා දී ඇති අතර 2025.12.31 වන විට, රසායනාගාර අංශය මඟින් ආහාර නියැදින් 1,950ක් විශ්ලේෂණය කොට විශ්ලේෂණ වාර්තා අදාළ පාර්ශ්වයන් වෙත ලබා දී ඇත.

ඡායාරූප අංක 36 - 37

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

## 06. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI)

### 6.1. හැඳින්වීම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) 1972 අංක 05 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධිත ව්‍යවස්ථාපිත ආයතනයකි. ගොවි කටයුතු සහ ග්‍රාමීය සංවර්ධනයට අදාළ සමාජ ආර්ථික පර්යේෂණ සිදුකිරීම සහ එම පර්යේෂණයන්හි සොයා ගැනීම්, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරයකි. සමාජ ආර්ථික හා ග්‍රාමීය සංවර්ධනයේ කෘෂිකාර්මික පැතිකඩ පිළිබඳ විමර්ශනය කිරීමට බලය පැවරී ඇති එකම ආයතනය ද වේ. වසර 52 ක ඉතිහාසය පුරා රාජ්‍ය සහ පුද්ගලික අංශ, පර්යේෂකයන් සහ පොදු ජනතාව වෙනුවෙන් උසස් තත්ත්වයේ දත්ත හා තොරතුරු ලබා දීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. වැඩමුළු සංවිධානය කිරීම තුළින් සියලුම පාර්ශ්වකරුවන්ට පර්යේෂණවල සොයා ගැනීම් හුවමාරු කිරීම සඳහා පහසුකම් සැපයීම අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ. එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව සංවිධානය කෙරෙන පුහුණු වැඩසටහන් තුළින් ආකල්ප සංවර්ධනය, ගොවීන්, නිලධාරීන් ඇතුළු අනෙකුත් පාර්ශවයන්ගේ කුසලතා සහ දැනුවත්භාවය ඉහළ නැංවීම අප ආයතනයෙන් ඉටු කෙරෙන තවත් වැදගත් කාර්යභාරයන් වේ.

### 6.2. දැක්ම

තිරසර ගොවිජන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය කර බෙදාහැරීමේ ප්‍රමුඛයා වීම.

### 6.3. මෙහෙවර

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම.

### 6.4. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 246.80 | 242.41 | 98 |
| ප්‍රාග්ධන | 38.00 | 26.40 | 69.5 |

* පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 191.67 ක් ලැබූ අතර වෙනස ආයතනයේ ආදායමෙන් පියවා ගන්නා ලදී.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2025 ක්‍රියාකාරී සැලැස්ම යටතේ ක්‍රියාත්මක කළ මුළු පර්යේෂණ අධ්‍යයන සංඛ්‍යාව 12ක් වේ. ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම සහ අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත වගුවේ සවිස්තරාත්මක ව දක්වා තිබේ.

### 6.5. පර්යේෂණ හා පුහුණු වැඩටහන්

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ඉලක්කය | ළඟාකරගත් ඉලක්කය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | |
|---|---|---|---|---|---|
| | | | වෙන් වූ මුදල | ප්‍රගතිය | % |
| **<u>පර්යේෂණ</u>**<br>01. ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා පවතින ප්‍රතිපත්ති සහ ආයතනික සැකසුම පිළිබඳ සමාලෝචන අධ්‍යයනය | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | කෙටුම්පත් වාර්තාව | 0.50 | 0.32 | 63 |
| 02. ගොවීන්ගේ සංජානනය සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) තාක්ෂණයන් අනුගමනය කිරීම | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | වාර්තා ලිවීම | 1.50 | 0.61 | 41 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03. ශ්‍රී ලංකාවේ එළවළු වගාවේ පරිසර හිතකාමී පළිබෝධ කළමනාකරණය: භාවිතය, අභියෝග සහ විභවයන් පිළිබඳ අධ්‍යනය | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | කෙටුම්පත් වාර්තාව | 1.50 | 0.99 | 66 |
| 04. තිරසාර නිෂ්පාදනය සඳහා පශු සම්පත් ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීම: ආයතනික රාමු, සේවා කාර්යයන් සහ ධාරිතා සංවර්ධන උපාය මාර්ග විශ්ලේෂණය කිරීම | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | කෙටුම්පත් වාර්තාව | 1.90 | 1.68 | 88 |
| 05. උඩරට එළවළු වගාවේ භාවිතා කරන පාංශු පෝෂණ කළමනාකරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමේ බාධක සහ විභවයන් | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | කෙටුම්පත් වාර්තාව | 1.50 | 0.80 | 53 |
| 06. ශ්‍රී ලංකාවේ රනිල කුලයට අයත් බෝග නිෂ්පාදනය සහ අලෙවිකරණයේ ප්‍රවණතා සහ අභියෝග: වටිනාකම් දාම විශ්ලේෂණය | අතුරු වාර්තාව | අතුරු වාර්තාව | 2.40 | 2.30 | 96 |
| 07. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක වියදම (Cost of Healthy Diet – CoHD) සහ එහි මිලදී ගැනීමේ හැකියාව (Affordability) පිළිබඳ විශ්ලේෂණය | දත්ත විශ්ලේෂණය | දත්ත විශ්ලේෂණය | 0.72 | 0.45 | 63 |
| 08. ශ්‍රී ලංකාවේ ආරක්ෂිත කෘෂිකර්මාන්තය: තත්ත්වය, අභියෝග සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | වාර්තා ලිවීම | 2.30 | 1.95 | 85 |
| 09. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයනික කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය සඳහා වන ආනයන බදු පිළිබඳ සමාලෝචනය. | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | කෙටුම්පත් වාර්තාව | 1.00 | 0.64 | 64 |
| 10. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කාන්තාවන් සවිබල ගැන්වීම කෙරෙහි කාන්තා සංවිධානවල බලපෑම: සීමාවන්, අවස්ථා සහ උපාය මාර්ග | ප්‍රතිපත්ති පත්‍රිකාව හා කෙටුම්පත් වාර්තාව | කෙටුම්පත් වාර්තාව | 1.70 | 0.92 | 54 |
| 11. ශ්‍රී ලංකාවේ වී මෝල් පිළිබඳ සංගණනය 2025 | වාර්තාව | වාර්තාව කැබිනට් මණ්ඩලයට යොමු කර ඇත | 4.45 | 4.42 | 99 |
| 12. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වායු රයිෆල් බෙදා දීමේ වැඩසටහනේ මධ්‍ය කාලීන ඇගයීම | දත්ත විශ්ලේෂණය | දත්ත විශ්ලේෂණය | 1.77 | 1.62 | 92 |
| **පුහුණු**<br>01. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම | වැඩසටහන් 30 | වැඩසටහන් 30 | 2.00 | 1.99 | 99 |
| 02. කෘෂි සංචාරක කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන | වැඩසටහන් 5 | වැඩසටහන් 3 | 1.50 | 0.64 | 43 |
| **03**. ග්‍රාමීය තරුණ තරුණියන් කෘෂි ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය වීමට පෙළඹවීම" යන මැයෙන් නේවාසික පුහුණු වැඩසටහන | වැඩසටහන් 3 | දිස්ත්‍රික්ක 3 ක් සඳහා වැඩසටහන් 3 ක් පවත්වා ඇත. | 1.50 | 0.95 | 63 |
| **වෙනත්**<br>**01**. සම්මන්ත්‍රණ, දේශන, ප්‍රසිද්ධ දේශන | - | - | 3.10 | 0.54 | 17 |
| **02**. ආයතන ප්‍රකාශන | - | ශාස්ත්‍රීය ප්‍රකාශන | 1.20 | 1.20 | 100 |
| **03**. මාධ්‍ය වැඩසටහන් | - | වීඩියෝ වැඩසටහන් හා ඡායාරූප පුස්තකාලය | 1.60 | 0.76 | 48 |

## 6.6. භෞතික ප්‍රගතිය

ආයතනය 2025 වසරේ දි සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාවට අමතරව අධ්‍යාපන සහ පුහුණු අංශය විසින් 2025 වසර තුළ පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් 2ක් සිදු කරන ලදි. එම ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සහ ග්‍රාමීය සංවර්ධන අංශය සමග ඒකාබද්ධව සංවිධානය කරන ලද කෘෂිකාර්මික සංචාරක ව්‍යාසාය සංවර්ධනය යන පුහුණු වැඩසටහන් ද්විත්වයයි.

ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ පුහුණු වැඩසටහන් ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශ 30ක එක් දින පුහුණු වැඩසටහන් මාලාවක් ලෙස 2025.06.10 සිට 2025.11.14 දක්වා කාලය තුළ පවත්වන ලදී. ඒ සඳහා සහභාගී වූ ගොවි සංවිධාන සාමාජිකයින් සහ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සංඛ්‍යාව 1,653. මෙම ගොවි සංවිධාන ශක්තිමත්කිරීමේ පුහුණු වැඩසටහන මගින් ගොවි සංවිධාන නායකයින්, සාමාජිකයින් සහ කෘ.ප.නි.ස. නිලධාරීන් ගොවි සංවිධාන නීතිය පිළිබඳ දැනුවත් කිරීම, ගොවි සංවිධාන පවත්වාගත යුතු පොත්පත් සහ ගිණුම් පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම ඔවුන්ට ගොවි සංවිධානයන් ගොවිජන ප්‍රජාව සංවර්ධනය සඳහා යොදා ගත හැකි ආකාරය පිළිබඳව දැනුවත් කිරීම ද සිදු කරන ලදී.

තවද, අධ්‍යාපන සහ පුහුණු අංශය සහ ග්‍රාමීය සංවර්ධන අංශය විසින් කෘෂිකාර්මික සංචාරක ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් 3ක් පවත්වන ලද අතර එම වැඩසටහන් හම්බන්තොට, කළුතර සහ මහනුවර යන දිස්ත්‍රික්කයන් කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදී. කෘෂිකාර්මික සංචාරක ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන කෘෂි සංචාරක ක්ෂේත්‍රයේ දැනටමත් නියැලෙන ව්‍යවසායකයින් සහ කෘෂිකර්ම උපදේශකවරුන් සංචාරක ක්ෂේත්‍රයේ විභවතාවයන් සහ ව්‍යවසාය අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම සහ එම දිරිගැන්වීම අරමුණු කරගනිමින් සංවිධානය කරන ලදි. එමෙන්ම, අධ්‍යාපන සහ පුහුණු අංශය, බාහිර ආයතනයන්ගේ ඉල්ලීම් අනුව ද එකී ආයතන සඳහා පසුගිය වසරේ පුහුණු වැඩසටහන් කිහිපයක් සංවිධානය කර පවත්වන ලදී.

මීට අමතරව කෘෂි ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් මොණරාගල, නුවර එළිය සහ කළුතර යන දිස්ත්‍රික්කයන් තුළ පැවැත්විය. අදාළ ප්‍රදේශ සඳහා ෆේස්බුක් දැන්වීමක් හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු 61 දෙනෙකු සහභාගී විය. මාර්ගගතව ලැබුණු අයදුම්පත් 143 න්, පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා සහභාගිවන්නන් තෝරා ගන්නා ලදී.

මීට අමතරව ආයතනයේ වීඩියෝ ඒකකය විසින් 2025 වසරේ සෑම සතියකම කෘෂි, කෘෂි ව්‍යවසාය හෝ කෘෂි සංචාරක ව්‍යාපාරය සංවර්ධනය අරමුණු කරගත් අවම වශයෙන් එක් වීඩියෝවක්වත් ආයතනයේ YouTube නාලිකාවට උඩුගත කිරීම සිදු විය. එමෙන්ම, යාපනය, මුලතිව්, මඩකලපුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හී කෘෂි, කෘෂි ව්‍යවසාය හෝ කෘෂි සංචාරක ව්‍යාපාරය සංවර්ධනය අරමුණු පදනම් කරගත් වීඩියෝ රූපගත කිරීම් ද සිදු කරන ලද අතර ඒ අනුව, 2025 වසර තුළ ආයතනයේ වීඩියෝ ඒකකය මගින් මෙරට කෘෂි ප්‍රජාවට මෙන්ම ආයතනයේ ප්‍රගමණයටද විශාල දායකත්වයක් සිදු විය.

ඡායාරූප අංක 38 - 39

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

## 07. වී අලෙවි මණ්ඩලය (PMB)

### 7.1. දැක්ම
වී සහ සහල් මිලට ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අලෙවි කිරීම පිළිබඳ ප්‍රමුඛ රාජ්‍ය මැදිහත්කරු වශයෙන් කටයුතු කිරීම.

### 7.2. මෙහෙවර
නිෂ්පාදකයා හා පාරිභෝගිකයා යන දෙපාර්ශවයම තෘප්තිමත් වන අයුරින් වී සහ සහල් මිලට ගැනීමේ, ගබඩා කිරීමේ, සැකසීමේ හා අලෙවි කිරීමේ ක්‍රියාවලිය දැනුමෙන් හා කුසලතාවයෙන් පරිපූර්ණ වූ කාර්ය මණ්ඩලයක් තුළින් සාර්ථකව ඉටු කිරීම.

### 7.3. අරමුණු
i.) වී සඳහා වෙළඳපොළෙහි ස්ථාවර ඉහළ මිලක් ලබා දීම
ii.) සාධාරණ මිලකට සහල් ලබාදීම
iii.) සහල් කෙටීම හා ගබඩා කිරීම විධිමත් කිරීම
iv.) ගබඩා ධාරිතාව වැඩි කිරීම
v.) භාවිතා නොකරන ලද ගබඩා නැවත ප්‍රතිසංස්කරණය කිරීම
vi.) විද්‍යාත්මකව වී ගබඩා කළ හැකි නවීන තාක්ෂණයෙන් යුත් ගබඩා ඉදි කර ගැනීම
vii.) ආරක්ෂිත තොගය සුරක්ෂිතව තැන්පත් කිරීමට සුදුසු ගබඩා බවට පත් කිරීම

### 7.4. කාර්යයන්
i.) වී ගොවීන්ගේ අලෙවි මිල සහතික කිරීම සඳහා සහතික මිලට වී මිලදී ගැනීම
ii.) වී සහ සහල් වෙළෙඳපොළ මිල ස්ථාවරව පවත්වා ගැනීම
iii.) ශ්‍රී ලාංකිකයන් සඳහා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම
iv.) වී තොග හා සහල් තොග පවත්වා ගැනීම

### 7.5. ආයතනය මගින් ළඟා කරගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු
- අරමුණ 2 - සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
- අරමුණ 5 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.
- අරමුණ 12 - තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

### 7.6. මූල්‍ය හා භෞතික ප්‍රගතිය
- **මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | | වෙන්කළ මුදල (රු.මි ) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන | | 7,808.50 | 6,029.20 | 77 |
| පුනරාවර්තන | 2025 අයවැය වෙන් කිරීම් | 185.00 | 210.60 | 100 |
| | ආයතන අරමුදල් | 25.60 | | |

- **භෞතික ප්‍රගතිය**

i. වී අලෙවි මණ්ඩලයේ ප්‍රධානම මෙහෙයුම් කාර්යය වන වී මිලදී ගැනීම 2024/25 මහ කන්නය සහ 2025 යල කන්නය යන කන්න දෙකේදීම සිදු කර ඇත. මේ සඳහා රු.මි. 6,308.50 ක මුදල් ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

| කන්නය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි) | මිලදී ගත් වී ප්‍රමාණය (මෙ.ටො.) | ගොවීන් ගණන |
|---|---|---|---|
| 2024/25 මහ කන්නය | 8.10 | 59.60 | 56 |
| 2025 යල කන්නය | 6,300.40 | 49,552.40 | 13,821 |

වී මිලදී ගැනීම් වෙනුවෙන් ලබා ගත් මුදල මෙම වර්ෂය තුළදීම නැවත සාර්ථකව පියවීමට ද වී අලෙවි මණ්ඩලය විසින් කටයුතු කර ඇත.

ii. මෙම වර්ෂයේදී 2024 යල කන්නයට අයත් කිරි සම්බා වී කි.ග්‍රෑ. 118,265 ක තොගයක් වී අලෙවි මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින මෝල් හිමියන් වෙත සීමිත ලංසු කැඳවීමකින් නිකුත් කරන ලදී.

iii. 2025 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය විසින් ව්‍යාපෘති කිහිපයක්ම සිදු කරන ලද අතර ඉන් පළමු සහ දෙවන අදියර ගබඩා අලුත්වැඩියා කිරීම් සඳහා සුළු අලුත්වැඩියාවන් පමණක් සිදු කරන ලදී. එම ගබඩා අලුත්වැඩියා කිරීම් ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ලබා දී ඇත. 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් Maintaining a Buffer Stock of Paddy වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වැය ශීර්ෂ 118-02-03-094-2509 යටතේ ලබා දුන් ප්‍රතිපාදන රු.මි. 6,212.00 ක මුදල යොදා ගෙන වී අලෙවි මණ්ඩලය මඟින් ගබඩා අලුත්වැඩියා කිරීම් ඇතුළු ව්‍යාපෘති කිහිපයක් සිදු කිරීමට කටයුතු කර ඇත. ඊට අදාළ විස්තර පහතින් දක්වා ඇත.

- වී අලෙවි මණ්ඩලය සතු ගබඩා අලුත්වැඩියා කිරීම්

| අදියර | අනුමත වූ මුදල (රු.මි.) | වියදම් වූ මුදල (රු.මි) | අලුත්වැඩියා කරන ලද මුළු ගබඩා සංඛ්‍යාව | ප්‍රතිපාදන ලැබී ඇති ආකාරය |
|---|---|---|---|---|
| 01 | 9.99 | 9.74 | 39 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් |
| 02 | 5.97 | 4.19 | 33 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් |
| 03 | 124.70 | 89.75 | 76 | 2025 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රතිපාදන වෙන් කිරීම් (වැය ශීර්ෂ 118-02-03-094-2509) |

- 2025 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම මඟින් රු.මි 19.12 ක ප්‍රතිපාදනයක් වී වියළීමේ යන්ත්‍ර සවි කිරීම සඳහා වෙන් කරන ලදී. ඒ අනුව අනුරාධපුර තලාව පරිශ්‍රයේ ආදර්ශ වී වියළීමේ යන්ත්‍ර 02 ක් සහ වී පිරිසිදු කිරීමේ යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

| | | **පිරිවැය (රු.මි.)** |
|---|---|---|
| වී වියළීමේ යන්ත්‍රය II (NCD-54SAX) | - | 13.22 |
| වී පිරිසිදු කරන යන්ත්‍ර II (TQLZ125) | - | 5.90 |

- කාර්යාල ඉලෙක්ට්‍රොනික උපකරණ මිලදී ගැනීම

2025 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම මඟින් රු. මි. 3.15 ක ප්‍රතිපාදනයක් කාර්යාල ඉලෙක්ට්‍රොනික යන්ත්‍ර මිලදී ගැනීම සඳහා වෙන් කරන ලද අතර ඉන් රු. මි. 2.02 ක් වියදම් කරමින් ඡායා පිටපත් යන්ත්‍ර 07 ක් මිලදී ගැනීමට කටයුතු කර ඇත.

- තෙත මාපක යන්ත්‍ර අලුත්වැඩියා කිරීම

2025 ක්‍රියාකාරී සැලැස්ම මඟින් රු. මි. 3.06 ක ප්‍රතිපාදනයක් තෙත මාපක යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා වෙන් කරන ලද අතර එම මුදලින් තෙත මාපක යන්ත්‍ර 138 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත.

iv. වී ගබඩාවල තොගය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවය හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මෙන් අනුමත වූ රු.මි 1.04 ක මුදල වියදම් කර ඇක්ටලික් බෝතල් 238 ක් (200 ml) මිලදී ගන්නා ලදී.

v. 2025 ක්‍රියාකාරී සැලැස්ම මඟින් රු. මි. 0.39 ක ප්‍රතිපාදනයක් සේවකයින්ගේ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා වෙන් කර තිබූ අතර රු. මි. 0.13 ක් වියදම් කරමින් සේවක ධාරිතා පුහුණු වැඩමුළුවක් දින 02 කදී වී අලෙවි මණ්ඩල නිලධාරීන් වෙත ලබා දීමට 2025 වර්ෂය තුළදී කටයුතු කර ඇත.

vi. Digital Rice Value Chain Traceability System වැඩසටහනට අදාළ පාර්ශවකරුවන් සමඟ උපදේශන රැස්වීමක් 2025 වසර තුළ ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) ආයතනය සමඟ සිදු කරනු ලැබීය.

ඡායාරූප අංක 40 - 41

## 08. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB)

### 8.1. දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම.

### 8.2. මෙහෙවර

කෘෂි අවදානම් කළමනාකරණය සහ ආර්ථික හා සමාජමය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීම සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළිගත හැකි විශිෂ්ට කෘෂිකාර්මික රක්ෂණ හා සමාජ ආරක්ෂණ සේවාවක් සැපයීම.

### 8.3. පරමාර්ථ - (දිගු කාලීන අරමුණු)

- කෘෂිකාර්මික අවදානම් සහ සමාජ ආරක්ෂණ කළමනාකරණය ශක්තිමත් කිරීම
- ආයතනික ගුණාත්මකභාවය, නීතිමය අනුකූලතාවය හා පරිපාලනය ශක්තිමත් කිරීම
- මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය හා දිස්ත්‍රික් මට්ටමේ සේවා සැපයුම් ශක්තිමත් කිරීම
- උපායමාර්ගික සැලසුම්කරණය, මානව සම්පත් හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ආයතනික ධාරිතා වර්ධනය
- ආයතනික තිරසාර මූල්‍ය ස්ථායිතාව හා ආර්ථික වර්ධනය සහතික කිරීම
- තොරතුරු තාක්ෂණය හා GIS ක්‍රමවේද මගින් ඩිජිටල් පරිවර්තනය ප්‍රවර්ධනය කිරීම

### 8.4. කාර්යයන්

#### i.) කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් අවදානම් කලමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට බෝග, පශු, හා සාමාන්‍ය රක්‍ෂණ යන අංශ යටතේ කෘෂි රක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මගින් කෘෂිකාර්මික අවදානම් කළමනාකරණ සඳහා දායක වීම, හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික බිඳවැටීම් අවම කර ගැනීම සඳහා සහය වීම හා කෘෂිකාර්මික ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට සිය මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වේ.

**මණ්ඩලය මගින් හඳුන්වා දී ඇති රක්ෂණ යෝජනා ක්‍රම.**

- වගා රක්‍ෂණ යෝජනා ක්‍රම (වී හා අනෙකුත් බෝග)
- පශු සම්පත් රක්‍ෂණ යෝජනා ක්‍රම
- කෘෂි උපකරණ රක්‍ෂණ යෝජනා ක්‍රමය
- ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය
- රෝද 2, රෝද 4 ට්‍රැක්ටර් සහ අනෙකුත් තෙවන පාර්ශවීය රක්‍ෂණ යෝජනා ක්‍රම
- ආරක්ෂිත ගෘහ හා හරිතාගාර රක්ෂණ යෝජනා ක්‍රමය

#### ii.) සමාජ සුබසාධනය

සමාජ ආරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම මගින්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධව සිටින ගොවීන්ගේ විශ්‍රාමික දිවිය සුරක්ෂිත කිරීමට දායක වීම හා වෛද්‍යාධාර යෝජනා ක්‍රම හරහා රෝහල් ගත වීමකදී ගොවීන් හට මූල්‍යමය සහනයන් ලබා දීම සිදු කෙරේ.

**මණ්ඩලය මගින් හඳුන්වා දී ඇති සමාජ ආරක්ෂණ යොජනා ක්‍රම.**

- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය
- ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය

## 8.5. ආයතනය මගින් ළඟා කරගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු

- කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත් කරගැනීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම
- දේශගුණික වෙනස්වීම් හා එහි බලපෑම් වැලැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම

## 8.6. මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන** | | | |
| 1. | * අනිවාර්ය රක්ෂණ (118-02-03-43-2202) | 1,500.00 | 626.00 | 42 |
| 2. | ** ගොවි හා ධිවර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා (118-02-03-049-1509) | 5,635.00 | 5,323.87 | 94 |

* 2025/26 මහ කන්නයේ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ වගා හානි සඳහා රජයේ මැදිහත් වීමෙන් අදාළ ගෙවීම් සිදු වූ හෙයින්, එම කන්නයට අදාළව ජාතික වගා රක්ෂණය යටතේ වන්දි ගෙවීම් සිදු නොවිණි. තවද, මෙම වියදම් හි ප්‍රගතිය කාලගුණික හා වෙනත් හේතූන් මත වගාවන්ට සිදුවන හානි මත පදනම් වේ.

** මෙම වියදම් ප්‍රගතිය වයස අවුරුදු 60 සම්පූර්ණ වී, විශ්‍රාම වැටුප් සඳහා ඉල්ලුම් කරන ලද ප්‍රමාණය මත පදනම් වේ.

## 8.4. භෞතික ප්‍රගතිය

**i. ගොවි/ ධිවර විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.**

ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීම යන අරමුණින් ක්‍රියාත්මක ගොවි/ධීවර විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවේදය යටතේ 2025 වර්ෂය සඳහා ධීවර හා ගොවි විශ්‍රාම වැටුප් ලාභීන් 185,357 ක් සඳහා විශ්‍රාම වැටුප් රු. මි. 5,323.87 ක් ගෙවීම් සිදු කර ඇත.

2022 ඔක්තොම්බර් 31 දින සිට හඳුන්වා දෙනු ලැබූ නව ගොවි විශ්‍රාම යෝජනා ක්‍රමයෙහි දැනට මුළු දායකයින් ගණන 13,910 ක් වන අතර, එයින් 2025 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා දායකයින් 8,754 දෙනෙකු මෙම නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායක කරගෙන ඇත.

2025 නොවැම්බර් මාසයේදී පැවති Aqua Planet 2025 ප්‍රදර්ශනයට සමගාමීව නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, ධීවර ප්‍රජාව සඳහා හඳුන්වා දීම සිදු කෙරිණි. එහිදී මෙම නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා මූලික වශයෙන් දායකයින් 42ක් බඳවා ගන්නා ලදි.

නව ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කෘෂිකාර්මිකයින් බඳවා ගැනීමේ කටයුතු මුළු දිවයිනම ආවරණය වන පරිදි 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ අතර, එම කටයුතු 2026 වර්ෂය තුළද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඡායාරූප අංක 42 - 43

**ii. බෝග 6 ක් සඳහා ගොවීන් හට නොමිලේ ක්‍රියාත්මක අනිවාර්ය වගා රක්‍ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකාව තුළ ප්‍රශස්ත කෘෂි අවදානම් කළමණාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රාජ්‍ය දායකත්වය යටතේ බෝග 6 ක් සඳහා ගොවීන් හට වාරික අය කිරීමෙන් තොරව, ජාතික වගා රක්‍ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක වේ. ඒ අනුව, 2025 වර්ෂය තුළ මුළු දිවයිනම ආවරණය වන පරිදි, 2023 යල, 2023/24 මහ, 2024 යල, 2024/25 මහ, 2025 යල කන්නවලට අදාළව වගා හානි සඳහා (අභියාචනා ද ඇතුළුව) ගොවීන් 85,319 ක ගේ අක්කර 101,983.69 ක් සඳහා රු.මි. 1,755.20 ක වන්දි මුදලක් ලබා දෙන ලදී. මෙම ජාතික වගා රක්ෂණ යෝජනා ක්‍රමය 2025 වර්ෂය තුළ ප්‍රධාන වගා කන්නයන් දෙක මුල් කරගනිමින් දිවයින පුරා ක්‍රියාත්මක වූ අතර විවිධ හේතූන් මත හානියට පත්වූ වගාබිම් සඳහා වන්දි ගෙවීම් කටයුතු ද දිවයින පුරා ක්‍රියාත්මක විය. 2026 වර්ෂය තුළද මෙම රාජ්‍ය දායකත්ව වගා රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඡායාරූප අංක 44

**iii.) විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම.**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින්,2025 වර්ෂය තුළ විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදි. ඒ අනුව තල්, පොල්, කිතුල් හා කුරුඳු කර්මාන්තවල නියැලෙන කෘෂිකාර්මිකයන් හා කරදිය හා මිරිදිය ධීවර ප්‍රජාව සඳහා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදි. තවද පොල්, රබර්, මඤ්ඤොක්කා ඇතුළු වගාවන් සඳහා යාවත්කාලීන රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදි. සූකර පාලනයට අදාළව නව රක්ෂණ යෝජනා ක්‍රමයක් හා බීජ ගොවිපළ රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට අදාළව මූලික කටයුතු ද 2025 වර්ෂය තුළ සිදු කරන ලදි. මෙම නව වගා රක්ෂණ යෝජනා ක්‍රම 2026 වර්ෂය තුළ ඒ සඳහා විභවයන් සහිත ප්‍රදේශ ඉලක්ක කරගනිමින් ක්ෂේත්‍රය වෙත හඳුන්වා දීමට සැලසුම් කර ඇත.

ඡායාරූප අංක 45

**iv.) ඩිජිටල්කරණය**

මණ්ඩලීය සියළුම මෙහෙයුම් හා රක්ෂණ ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීමට අදාළව ERP පද්ධතිය සංවර්ධනය හා හඳුන්වාදීමේ කටයුතු 2025 වර්ෂය පුරා සිදු විය. මෙහි වගා රක්ෂණ, තෙවන පාර්ශවීය රක්ෂණය, හදිසි අනතුරු හා මානව සම්පත් ආදී මොඩියුලයන් කාර්ය මණ්ඩලය වෙත හඳුන්වාදීමේ කටයුතු සිදුවිය. 2025 වර්ෂය තුළ මීට අදාළව සියළුම දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමේ හා පුහුණු කිරිම් වැඩසටහන් ක්රියාත්මක විය. මෙම පද්ධතියෙහි සංවර්ධන කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතින අතර, 2026 වර්ෂය තුළ මෙය ක්ෂේත්‍රය වෙත පූර්ණ වශයෙන් හඳුන්වාදීමට සැලසුම් කර ඇත.

ඡායාරූප අංක 46

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

## 09. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP)

### 9.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික සංවර්ධනය සහතික කරනු ලබන උද්දීප්ත සහ තිරසාර කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන සහ නව්‍යකරණ පද්ධතියක් ඇති කිරීම.

### 9.2. මෙහෙවර

ප්‍රතිපත්ති සම්පාදන පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම් තුළින් කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන සහ නව්‍යකරණ ජාතික සංවර්ධන අභිමතාර්ථ කරා යොමු කිරීම සහතික කිරීම.

### 9.3. අරමුණු

i.) කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන සහ නව්‍යකරණ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම
ii.) ජාතික සංවර්ධන වැඩසටහන සාක්ෂාත් කර ගැනීම උදෙසා කෘෂිකාර්මික පර්යේෂණ සහ නව්‍යකරණ දිශානතිය කිරීම
iii.) ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සහ නව්‍යකරණ පද්ධතියෙහි (විද්‍යාත්මක සහ තාක්ෂණික ) ධාරිතාව වර්ධනය කිරීම
iv.) කෘෂිකාර්මික සංවර්ධනයන්ට සහය දැක්වීම සඳහා උසස් තත්ත්වයේ ඉල්ලුම් මත දිවෙන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
v.) ලෝක තත්ත්වයේ පර්යේෂණ, සංවර්ධන සහ නව්‍යකරණය සාක්ෂාත් කර ගැනීම සඳහා අන්තර්ජාතික, කලාපීය සහ ජාතික මට්ටමේ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම
vi.) ජාතික පර්යේෂණ, සංවර්ධන සඳහා නව්‍යකරණ වැඩසටහන්වල සහ ආයතනවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම
vii.) ජාතික පර්යේෂණ, සංවර්ධන සහ නව්‍යකරණ වැඩසටහන් ව්‍යාප්ත කිරීම, දැනුවත්භාවය ඇති කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
viii.) ජාතික සංවර්ධන වැඩසටහන් සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම

### 9.4. ප්‍රධාන කාර්යයන්

i.) කෘෂිකාර්මික පර්යේෂණ කලමනාකරණය, පර්යේෂණ පසු විපරම හා පර්යේෂණ ප්‍රගතිය ඇගයීම
ii.) කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා සකස් කිරීම
iii.) කෘෂිකාර්මික පර්යේෂණ අභිප්‍රේරණය කිරීම
iv.) කෘෂිකාර්මික පර්යේෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම
v.) කෘෂිකාර්මික මානව සම්පත් සංවර්ධනය

### 9.5. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන් කළ මුදල (රු. මි. ) | වියදම් කළ මුදල (රු. මි. ) |
|---|---|---|
| ප්‍රාග්ධනය | 75.00 | 41.41 |
| පර්යේෂණ සඳහා | 62.35 | 37.41 |
| පුනරාවර්තන | 93.00 | 60.74 |

### 9.6. විශේෂිත ක්ෂේත්‍රය

| ක්‍රියාකාරකම් | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 2025 සඳහා ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතිය (NARS) ඇතුළත් ආයතනවලින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම සහ කෙටි හා මධ්‍යකාලීන පර්යේෂණ ප්‍රමුඛතා මත පදනම්ව ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම | ආයතන 25 කින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම | ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියේ (NARS) ආයතන 25 ක දත්ත එක් රැස් කර ඇත. |
| රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ | එක් ප්‍රතිපත්ති | ප්‍රතිපත්ති සංක්ෂිප්ත කෙටුම්පත සකස් කර |

| ක්‍රියාකාරකම් | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
| --- | --- | --- |
| උපදෙස් දීම | සංක්ෂිප්තයක් සැකසීම | ඇත. |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය (NARP) / අන්තර් ආයතනික පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ක්‍රමය (IIMDRGS) යන සංකල්ප පත්‍රිකා ඇගයීම | ලැබෙනා සංකල්ප පත්‍රිකා සියල්ල | 2025 වසර සඳහා නව පර්යේෂණ සංකල්ප පත්‍රිකා 164 ක් ලැබී සමාලෝචනය කර ඇත. |
| ජාතික කෘෂි පර්යේෂණ ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා සැකසීම | ආහාර බෝග, වැවිලි භෝග, මල් වගා, වන වගා, ධීවර හා ජලජ සම්පත්, සත්ව යන අංශ ආවරණය කිරීම | ආහාර බෝග සඳහා පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම සඳහා වැඩමුළු පවත්වන ලදී. |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය (NARP) / අන්තර් ආයතනික පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ක්‍රමයේ (IIMDRGS) යෝජනා ඇගයීම | 2026 වසර සඳහා ලැබෙනා ව්‍යාපෘති සියල්ල | 2026 සඳහා ව්‍යාපෘති යෝජනා 125 ක් ලැබුණු අතර ඒවා බාහිර විමර්ශකයින් වෙත යොමු කර ඇත. |
| පර්යේෂණ පරතරය විශ්ලේෂණය/පර්යේෂණ ප්‍රතිදාන සමීක්ෂණය (වැඩමුළු/සමීක්ෂණ) | වැඩමුළු 03 ක් පැවැත්වීම | කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව ලද නිලධාරීන්ගේ නව සොයා ගැනීම් හඳුන්වාදීමේ වැඩමුළු 03 ක් පවත්වන ලදී. |
| කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු (INFORM) සඳහා වූ දත්ත සමුදාය කළමනාකරණය | තොරතුරු ලබා දිය යුතු ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියේ (NARS) ආයතන සංඛ්‍යාව 30 | පුහුණු වැඩමුළුව පවත්වා, 2024 වර්ෂයට අදාළ දත්ත සමුදායන් එකතු කරන ලදී. |
| ආයතනවල බාහිර සමාලෝචනය | ආයතන 05 ක් තෝරා ගන්නා ලදී. | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, බීජ සහතික කිරීමේ සේවය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, බාහිර සමාලෝචනය කරන ලදී. |
| සමාලෝචනය කරන ලද ආයතනවල පසු විපරම් ක්‍රියාකාරකම් | ආයතන 02 ක් තෝරා ගන්නා ලදී. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා තේ පර්යේෂණ ආයතනයේ පසුවිපරමක් සිදුකිරීමට පියවර ගන්නා ලදී. |
| ජාතික සම්මාන උළෙල | 2023 හා 2025 වසර දෙකෙහි ජාතික සම්මාන උළෙලවල් පැවැත්වීමට සැලසුම් කරන ලදී. | 2023 හා 2025 වර්ෂ දෙකෙහි ජාතික සම්මාන උළෙල 2025 වසරේ 23-10-2025 අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. |
| වාර්ෂික සංවාද වැඩමුළුව | වාර්ෂික සංවාද වැඩමුළුව පැවැත්වීමට සැලසුම් කරන ලදී | 2025 වසරේ වාර්ෂික සංවාද වැඩමුළුව දෙසැම්බර් මස සැලසුම් කර තිබුණද ස්වාභාවික ව්‍යවසනය (දිත්වා සුළි කුණාටුව) නිසා එය පැවැත්වීමට නොහැකි විය. |
| අන්තර් ආයතනික පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමයේ (IIMDRGS)- අරමුදල් | අන්තර් ආයතනික බහු-විනය පර්යේෂණ සඳහා අරමුදල් ලබා දෙන ලදී (05 ක්‍රියාත්මක වෙමින් පැවති පර්යේෂණ ව්‍යාපෘති සහ 15 - නව පර්යේෂණ ව්‍යාපෘති) | අන්තර් ආයතනික බහු-විනය පර්යේෂණ 15 ක් සඳහා අරමුදල් ලබා දෙන ලදි. පවත්වා ගෙන යන පර්යේෂණ ව්‍යාපෘති වල ප්‍රගතිය ලබා ගන්නා ලදි, |
| ශ්‍රී ලංකා ආහාර සහ කෘෂිකර්ම සඟරාව (Sri Lanka Journal of Food and Agriculture) | වෙලුම් 02 ක් | 8.1 සහ 2 වෙළුම සම්පාදනය කරන ලදී |
| SLCARP පුවත් පත්‍රිකාව (News Letter) | වෙලුම් 1 ක් | සම්පාදනය අවසන් කරන ලදී. |
| Agrinet සහ පුස්තකාලය | KOHA මෘදුකාංගය සමඟ පුස්තකාලය වැඩිදියුණු කිරීම, දැනුවත්කිරීමේ වැඩමුළුව | KOHA මෘදුකාංගය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු නිමකර ඇත. Agrinet පිළිබඳ දැනුවත්කිරීමේ වැඩමුළුව 04 ක් සහ රැස්වීම් 02 ක් පවත්වා ඇත |

| ක්‍රියාකාරකම් | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| | සහ රැස්වීම් 01 | |
| ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම. ආසියා පැසිෆික් කෘෂිකර්ම පර්යේෂණ ආයතන සංගමය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම | වැඩමුළු 02ක්,<br>නිලධාරීන් 10 දෙනකු පුහුණු කිරීම | චීන නිවර්තන කෘෂිකර්ම විද්‍යා ඇකඩමියේ (CATAS) මඟින් NARS විද්‍යාඥයින් 60 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.<br>APAARI ගෙවීම් සිදු කිරීම.<br>නේපාල කෘෂිකර්ම අමාත්‍යවරයාගේ පැමිණීම.<br>චීන විද්වතුන්ගේ පැමිණීම.<br>KOICA ආයතනය විසින් නිලධාරීන් 20 දෙනකු පුහුණු කරන ලදි. |
| කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර් ආයතනික ගැටලු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම | ජාත්‍යන්තර වැඩමුළු 1ක් සහ ජාතික සම්මන්ත්‍රණ 02ක් | NARP - NUS සහ IIMDRGS ප්‍රදාන ප්‍රදානෝත්සවය,<br>DOA පර්යේෂකයින් සඳහා යෝජනා ලිවීමේ වැඩමුළුව,<br>Clean Sri Lanka රැස්වීම,<br>NARP පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම සඳහා ජාතික කෘෂිකාර්මික නවෝත්පාදන සමුළුව (NAIC 2025), හා<br>හරිතයෙන් හරිතයට ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (GtoG – 2025) පවත්වන ලදී.<br>උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සමග එක්ව විසිතුරු මල් වගාව පර්යේෂණ පිළිබඳ සම්මන්ත්‍රණයක් ( 2025-12-19) පවත්වන ලදී. |
| කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සහ විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමඟ විද්‍යාඥයින් හුවමාරු කර ගැනීම සඳහා කටයුතු කිරීම | නිලධාරීන් 10 | අඛණ්ඩ දිගුකාලීන පුහුණු සිසුන්ගෙන් ප්‍රගතිය එකතු කර ඇත. |
| කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන සහ අංශවල කාර්ය සාධනය කලින් කලට සමාලෝචනය කිරීම. | පර්යේෂණ ව්‍යාපෘති 89 ක ප්‍රගතිය සමාලෝචනය කිරීම. | 2025 වසරේ පවත්වන ලද පර්යේෂණ ව්‍යාපෘතිවල අර්ධ වාර්ෂික වාර්තා 89ක් එක් රැස් කර ඇත.<br>පර්යේෂණ ව්‍යාපෘති 34 ක ස්ථානීය ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.<br>පර්යේෂණ ව්‍යාපෘති 30 ක ප්‍රගතිය මාර්ගගතව සමාලෝචනය කරන ලදී. |

ඡායාරූප අංක 47 - 50

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

# 10. ගොවීන්ගේ භාරකාර අරමුදල (FTF)

## 10.1. හැඳින්වීම

1994 දී ස්ථාපිත භාරකාර ඔප්පුවේ සඳහන් වන ආකාරයට හා 2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අරමුණු පුළුල් කිරීම මගින් ගොවීන්ගේ භාරකාර අරමුදල පහත අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා ගොවි ජනතාවගේ සුබසාධනය වැඩි දියුණු කිරිම.
- සුළු ගොවීන්ට කෙටිකාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම.
- සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය.
- සුළු ගොවීන්ගේ මූල්‍ය දුෂ්කරතාවයන් මඟහරවා ගැනිම සඳහා සුළු ගොවියාට වෙළෙඳපල ණය පහසුකම් සැපයිම.
- සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- බෝග හා සත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම සඳහා සුළු ගොවීන්ට අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබා දීම.
- කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැලසිම සඳහා විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

## 10.2. ගොවි භාරකාර අරමුදලේ ප්‍රධාන කාර්යයන්

### i.) ප්‍රදාන

ගොවි භාරකාර අරමුදලේ ප්‍රතිපාදන යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

### ii.) ණය

- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ක්‍රියාත්මක කරන කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ණය ලබාදීම.
- ගොවි බැංකු සඳහා අමතර ප්‍රාග්ධනය ලබාදීම

සුළු ගොවීන් සඳහා කෙටි කාලීන ණය පහසුකම් සැලසීමේ අරමුණින් ගොවි භාරකාර අරමුදලේ ප්‍රතිපාදන යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක වේ.

- වෙනත් ණය

කෘෂිකාර්මික හදිසි අවශ්‍යතා සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වෙත ණය මුදල් ලබා දීම. (උදා - වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය වෙත)

### iii.) අත්තිකාරම්

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා වසරක කාලසීමාවක් තුළ ගෙවා අවසන් කිරීමේ පදනම මත පොලී රහිතව ණය අත්තිකාරම් ලබාදීම.

## 10.3. ක්‍රියාත්මක ක්‍රමවේදය

එක් එක් වර්ෂය සඳහා සියලු පළාත් සභා හා දිස්ත්‍රික් ලේකම්වරුන්, කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන රජයේ දෙපාර්තමේන්තු හා ආයතන මඟින් ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා ගොවීන්ගේ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සිදු කරන අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ ව්‍යාපෘති සලකා බලා අනුමැතිය ලබා දෙනු ලැබේ. එසේ අනුමැතිය ලබා දෙන ව්‍යාපෘති ගොවීන්ගේ භාරකාර අරමුදල් අයවැය වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 10.4. ප්‍රදානයන් යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති

| අ/අ | ව්‍යාපෘතිය | අරමුණ | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| i. | හදිසි ගංවතුර තත්ත්වය මත සිදුවී ඇති ආපදා සඳහා සහන සැපයීම - 2023 අච්චේද (ගො.සං.දෙ) | හානි සඳහා අලුත්වැඩියාව | 20.00 | 3.62 | 18 |
| ii. | කාන්තා ගොවි සංවිධාන සම්බන්ධීකාරක නිලධාරින් හා කාන්තා ගොවි සංවිධාන සභාපතිනියන් සඳහා මූල්‍ය කළමනාකරණ සඳහා වන පාඨමාලා ගාස්තු ගෙවීම. | අදාළ ක්ෂේත්‍රය පිළිබඳ නිපුනතාවයෙන් යුතු සංචිතයක් දිවයින පුරා බිහි කිරීම සඳහා | 10.00 | 7.04 | 70 |
| iii. | අතරමැදි කන්නයේ මුං වගා කිරීමේ ව්‍යාපෘතිය -2024 | ගොවීන් 10,903 දෙනකු සඳහා අක්කර 18,063 වගා වපසරියක් තුළ මුං වගාව ක්‍රියාත්මක කිරීම සඳහා බීජ සඳහා සහනාධාර ලබා දී ඇත | 100.00 | 100.00 | 100 |
| iv. | මධ්‍ය පරිමාණ කුකුළු පාලන ඒකක පිහිටුවීමේ ව්‍යාපෘතිය. (ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය) | බිත්තර ප්‍රශ්නයට විසඳුමක් ලෙස, දරුවන්ගේ මෙන්ම ගර්භනී මවුවරුන්ගේ මන්දපෝෂණය තුරන් කිරීම හා ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය | 32.80 | 23.51 | 72 |
| v. | ජාතික අලුත් සහල් මංගල්‍යය - 2025 | සංස්කෘතික උත්සවයකි | 3.00 | | |

## 10.5. කෘෂිකාර්මික ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| අ/අ | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය% | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| i. | කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය. (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ) | 300.00 | 11.85 | 4 | ගොවීන් 24 දෙනකු සඳහා ණය ලබා දීම |
| ii. | සුළු ගොවීන්ට කෙටිකාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම. (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව) | 100.00 | 60.00 | 60 | |

ඡායාරූප අංක 51 - 54

## 11. ජාතික පොහොර ලේකම් කාර්යාලය (NFS)

### 11.1. හැඳින්වීම

1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනතේ නෛතික කටයුතු සහ ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සිදු කිරීම.

### 11.2. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

ශ්‍රී ලංකාවේ වගා කරන සියලු බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අකාබනික හා කාබනික පොහොර නියමිත ප්‍රමිතියෙන් යුක්තව සම්පාදනය හා භාවිතය තහවුරු කිරීම ආයතනයේ දැක්ම වන අතර පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන අනුව අදාළ සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විද්‍යානුකූල නිර්දේශයන් මත පොහොර අවශ්‍යතාවය තක්සේරු කිරීම, පොහොර ආනයනය හා තොග පාලනය, නිසි ගුණත්වයෙන් යුතු පොහොර බෙදා හැරීම හා අලෙවිය තහවුරු කිරීම, කාබනික හා අකාබනික පොහොර භාවිතයේ දී පරිසර හිතකාමී ලෙස පොහොර භාවිතය වැඩිදියුණු කිරීම, ගොවි ප්‍රජාවගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොහොර සහනාධාර යෝජනා ක්‍රමය මෙහෙයවීම හා පොහොර භාවිත ක්ෂේත්‍රයේ අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම මෙහෙවර වේ. 1988 අංක 68 දරණ පොහොර පනත විධිමත්ව ක්‍රියාත්මක කිරීම ආයතනයේ මූලික කාර්යභාරය වේ.

### 11.3. ආයතනය මගින් ළඟා කරගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු

- අරමුණ 2 - සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කරගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
- අරමුණ 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

### 11.4. මූල්‍ය ප්‍රගතිය (2025.12.31.දිනට)

| විස්තරය | වෙන්කළ මුදල (රු.මි ) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය % |
|---|---|---|---|
| පුනරාවර්තන | 3.55 | 2.98 | 84 |

## 11.5. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර අංශයන්හි ප්‍රගතිය

| බලපත්‍ර අංශය | | | | | |
|---|---|---|---|---|---|
| අ/අ | ප්‍රධාන වැඩසටහන්/ව්‍යාපෘති | මූල්‍ය ඉලක්කය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
| 1 | කාබනික පොහොර නිෂ්පාදන බලපත්‍ර ලබාදීම (නව) | 0.04 | 0.42 | 2 | 21 |
| 2 | කාබනික පොහොර නිෂ්පාදන බලපත්‍ර ලබා දීම (යාවත්කාලීන කිරීම ) | 0.81 | 0.21 | 54 | 14 |
| 3 | පොහොර ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම (නව) | 0.30 | 9.60 | 2 | 64 |
| 4 | පොහොර ආනයනය සඳහා බලපත්‍ර ලබා දීම (යාවත්කාලීන කිරීම) | 17.6 | 10.30 | 176 | 103 |
| 5 | කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම (නව) | - | 0.15 | - | 1 |
| 6 | කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර ලබා දීම (යාවත්කාලීන කිරීම) | 0. 80 | 0.20 | 8 | 2 |
| 7 | පොහොර සකස් කිරීම සඳහා බලපත්‍ර ලබා දීම (නව) | - | 4.65 | - | 31 |
| 8 | පොහොර සකස් කිරීම සඳහා බලපත්‍ර ලබා දීම (යාවත්කාලීන කිරීම) | 5.80 | 2.70 | 58 | 27 |
| **එකතුව** | | **25.35** | **28.23** | 300 | 263 |

| තාක්ෂණික අංශය | | | | | |
|---|---|---|---|---|---|
| අ/අ | ප්‍රධාන වැඩසටහන්/ව්‍යාපෘති | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
| 1 | ආනයනික රසායනික පොහොරවල තත්ත්ව පරීක්ෂාව සඳහා නියැදි ලබා ගැනිම | මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය නොවේ | | 1900 | 1,382 |
| 2 | දේශීය වශයෙන් නිෂ්පාදිත පරිසර හිතකාමී පොහොර නියැදි ලබා ගැනීම | | | | 129 |
| 3 | දේශීය වශයෙන් දෙමුහුම් පොහොර නිෂ්පාදකයින්ගේ පොහොර නියැදි ලබා ගැනීම | | | | 417 |
| 4 | දිස්ත්‍රික් මට්ටමින් වෙළඳසැල්වලින් ලබාගත් පොහොර නියැදි රසායනාගාර පරීක්ෂණ සඳහා වන ගාස්තු | 2.62 | - | | 264 |
| **එකතුව** | | - | - | 1900 | **2,192** |

| පොහොර ආනයන අංශය | | | | | |
|---|---|---|---|---|---|
| අ/අ | ප්‍රධාන වැඩසටහන්/ව්‍යාපෘති | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
| 1 | රසායනික පොහොර ආනයනයට අදාළ ලේඛන හා වාර්තා පරීක්ෂණයට ලිපිගොනු සැකසීම (Oder Approval) | මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය නොවේ | | 1,200 | 1,169 |
| 2 | ආනයනයෙන් අනතුරුව රේගු නිෂ්කාශන කටයුතු සඳහා නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම | | | 1,200 | 1,579 |
| 3 | රසායනාගාර වාර්තා පරීක්ෂා කොට පොහොර වර්ගයන් සඳහා තීරණ ලබා දීමට නිර්දේශ ඉදිරිපත් කිරීම. | | | 1,200 | 1,528 |
| **එකතුව** | | - | - | **3,600** | **4,276** |

| විමර්ශන අංශය | | | | | |
|---|---|---|---|---|---|
| අ/අ | ප්‍රධාන වැඩසටහන්/ව්‍යාපෘති | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ඉලක්කය (හෙක්.) | භෞතික ප්‍රගතිය (හෙක්) |
| 1 | ප්‍රමිතියෙන් තොර කාබනික පොහොර සම්බන්ධව විමර්ශනය | මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය නොවේ | | | 37 |
| 2 | නීති විරෝධීව සඟවා තිබූ පොහොර තොග පිළිබඳව විමර්ශන | | | | - |
| 3 | නීති විරෝධී පොහොර අලෙවිය/බෙදාහැරීම සම්බන්ධව විමර්ශන | | | | 63 |
| 4 | පොහොර සහනාධාර ගැටළු සම්බන්ධව විමර්ශන | | | | 5 |
| 5 | පොහොර නිෂ්පාදන ව්‍යාපෘති සම්බන්ධ විමර්ශන | | | | 3 |
| 6 | වගාවන් සඳහා පොහොර නොලැබීම් විමර්ශන | | | | - |
| 7 | පොහොර තොග අත්අඩංගුවට ගැනීම සම්බන්ධව විමර්ශන | | | | 5 |
| 8 | පොදු පොහොර ගැටළු | | | | 13 |
| 9 | පොහොර සම්බන්ධ ආයතනික නිලධාරීන්ගේ ගැටලු විමර්ශනය කිරීම | | | | 1 |
| **එකතුව** | | - | - | - | **127** |

| නිෂ්පාදන ප්‍රවර්ධන අංශය | | | | | |
|---|---|---|---|---|---|
| අ/අ | ප්‍රධාන වැඩසටහන්/ව්‍යාපෘති | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
| 1 | පොහොර බෙදාහැරීම පිළිබඳ දිස්ත්‍රික් පරීක්ෂණ | මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය නොවේ | | 12 | 10 |
| 2 | නිෂ්පාදනය පිළිබඳ සමාගම් පරීක්ෂණ | | | 12 | 20 |
| 3 | ක්ෂේත්‍ර නියැදි එකතු කිරීම | | | 12 | 264 |
| **එකතුව** | | | | **424** | **294** |

| මූල්‍ය අංශය | | | | | |
|---|---|---|---|---|---|
| අ/අ | ප්‍රධාන වැඩසටහන්/ව්‍යාපෘති | මූල්‍ය ඉලක්කය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
| 1 | කාලීන ණය (Term Loan) | 8,663.62 | 8,663.62 | - | - |
| **එකතුව** | | **8,663.62** | **8,663.62** | **-** | **-** |

| ආයතන අංශය | | | | | |
|---|---|---|---|---|---|
| අ/අ | ප්‍රධාන වැඩසටහන්/ව්‍යාපෘති | ප්‍රගතිය | | | |
| | | මූල්‍ය (රු. මි.) | | | භෞතික ප්‍රගතිය |
| | | ගෙවන ලද බිල්පත් | අත ඇති බිල්පත් | බැදීම් | |
| 1 | කාර්යාලීය දුරකතන බිල් | 0.29 | 0.03 | | |
| 2 | විදුලි බිල් | 2.06 | 0.17 | | |
| 3 | කාර්යාලීය කුලී වියදම් | 17.73 | 1.61 | | |
| | පිරිසිදු කිරීමේ සේවා | 0.26 | 0.02 | | |
| **එකතුව** | | **20.34** | **1.84** | - | - |

ආයතනයේ සැලසුම් අංශයේ සහ දත්ත කළමනාකරණ අංශයේ සියළුම කටයුතු අදාළ ඉලක්ක අනුව 2025 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදි.

## 11.6. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘතිය/ වැඩසටහන | මූල්‍ය | | | භෞතික | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | කෘෂිකර්ම ක්ෂේත්‍රයට සිදුවූ ඵලදායී දායකත්වය | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කළ මුදල (රු. මි.) | වියදම් කළ මුදල (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | භෞතික ප්‍රගතිය (%) | | | |
| (i) කාබනික පොහොර නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම (නව) | 3.55 | 2.98 | 84 | 2 | 21 | 1,050 | ශ්‍රී ලංකාවේ වී ඇතුළු අනෙකුත් බෝග වගාවන් කරන ගොවීන් | ශ්‍රී ලංකාවේ ඇතුළු අනෙකුත් බෝග වගා කරන ගොවීන් වෙත ගුණාත්මකභාවයෙන් යුතු පොහොර ලබා දීම | දිවයින පුරා |
| (ii) කාබනික පොහොර නිෂ්පාදන බලපත්‍ර (යාවත්කාලීන කිරීම) | | | | 54 | 14 | 26 | | | |
| (iii) පොහොර ආනයන බලපත්‍ර නිකුත් කිරීම (නව) | | | | 2 | 64 | 3,200 | | | |
| (iv)පොහොර ආනයන බලපත්‍ර (යාවත්කාලීන කිරීම) | | | | 176 | 103 | 59 | | | |
| (v) කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම (නව) | | | | 0 | 1 | 0 | | | |
| (vi) කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර (යාවත්කාලීන කිරීම) | | | | 8 | 2 | 25 | | | |
| (vii) පොහොර සකස් කිරීම සඳහා බලපත්‍ර ලබා දීම (නව) | | | | 0 | 31 | 0 | | | |
| (viii) පොහොර සකස් කිරීම සඳහා බලපත්‍ර ලබා දීම (යාවත්කාලීන කිරීම) | | | | 58 | 27 | 47 | | | |

## 12. ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්

### 12.1. හැඳින්වීම

"ලක්පොහොර" හා "කොමර්ෂල් පොහොර" සන්නාමයන් පිළිබඳ ශ්‍රී ලාංකීය ගොවිජනතාව අතර කීර්ති නාමයක් ඇති බැවින්, කාබනික හා රසායනික පොහොර ඇතුළු අනෙකුත් කෘෂි යෙදවුම් හා සේවා සපයන ලාභදායී ව්‍යාපාරික ඒකක ලෙස පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් 21/0118/323/005 දරණ හා 2021.02.01 දිනැති හා අංක CP/22/0706/514/001 සහ 2022/05/30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සීමාසහිත ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කරමින් 2024.07.11 දින State Fertilizer Co.Ltd. ආයතනය පිහිටුවන ලදී.

### 12.2. දැක්ම

තිරසාර සහ උසස් තත්වයෙන් යුත් පරිසර ආරක්ෂිත නවීණ කෘෂිකාර්මික විසඳුම් ලබාදීම තුළින් ප්‍රශස්ථ අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගොවි ජනතාව සවිබල ගැන්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛයා වෙමින් අනාගත පරපුර සඳහා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

### 12.3. මෙහෙවර

ශ්‍රී ලාංකීය කෘෂිකර්මාන්තයේ උන්නතිය උදෙසා ඉහළ ගුණාත්මයෙන් යුත් පොහොර සහ යෙදවුම් ලබාදීම තුළින් කෘෂි නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම අපගේ මෙහෙවර වන අතර, ප්‍රමිතියෙන් උසස් කෘෂි යෙදවුම් අවශ්‍ය තාක්ෂණික මඟ පෙන්වීම සමඟ ගොවිජනතාව වෙත ලබාදීම සඳහා අප නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු.

### 12.4. අරමුණු

නිසි ප්‍රමිතියෙන් යුතු පොහොර නිසි කලට ගොවියාට අලෙවි කිරීම.

### 12.5. කාර්යයන්

පොහොර ආනයනය, ගබඩා කිරීම, මිශ්‍ර කිරීම හා අලෙවි කිරීම.

### 12.6. මූල්‍ය ප්‍රගතිය (මාස 09ක් සඳහා ප්‍රගතිය)

| විස්තරය | වෙන්කළ මුදල (රු.මි.) (A) | වියදම් කළ මුදල (රු.මි.) (B) | මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය (%) (C) |
|---|---|---|---|
| ඍජු හා මිශ්‍ර පොහොර අලෙවි කිරීම. | 7,516 | 4,718 | 64 |

### 12.7. භෞතික ප්‍රගතිය (මාස 09ක් සඳහා ප්‍රගතිය)

| විස්තරය | භෞතික ඉලක්කය (මෙ.ටො.) | සත්‍ය විකුණුම් (මෙ.ටො.) | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| ඍජු හා මිශ්‍ර පොහොර අලෙවි කිරීම. | 64,735 | 41,206 | 64 |

** මෙම ආයතනය ස්වයං මූල්‍ය ආයතනයක් වන බැවින්, 2025 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදල (A) මඟින් ද 2025.12.31 දිනට සත්‍ය විකුණුම් මූල්‍ය අගය (B) මඟින් ද සත්‍ය විකුණුම්වල ප්‍රතිශතය (C) මඟින් ද ඉදිරිපත් කර ඇත.

** මෙම ආයතනයේ මුදල් වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වන බැවින්, අවසන් අලෙවි ඉලක්කයන් ළඟාකර ගැනිමට කාර්තුවක කාලයක් ඉදිරියට පවතී.

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

## 13. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)

### 13.1. හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය හෙවත් ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත අනුව ස්ථාපිත කර ඇත.

### 13.2. දැක්ම

ග්‍රාමීය ජනතාවගේ සහ අඩු වරප්‍රසාදලාභී ජනතාවගේ අභිමානය ස්ථාපිත කිරීම සඳහා අදාළවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ආත්ම විශ්වාසය සහ ආර්ථික ස්වාධීනත්වය තහවුරු කිරීම.

### 13.3. මෙහෙවර

ජනතාව යැපුම් සංස්කෘතියෙන් මුදවා ආර්ථික ස්වාධීනත්වය ඇතිකිරීම උදෙසා කෘෂිකර්ම, පශු සම්පත් සහ අදාළ වෙනත් ක්ෂේත්‍රයන්හි නිපුණත්වයක් ඇති කිරීම පිණිස වැදගත් වන සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම

### 13.4. අරමුණු

i. රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩපිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යත්ව වල ආධාර ලබා ගැනීම.
ii. මහජනෝපකාර, සාමාජීය හා ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම.
iii. කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
iv. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යත්ව උනන්දු කිරීම.
v. ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම.

### 13.5. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන්කළ මුදල ( රු.මි ) | වියදම් කළ මුදල (රු .මි .) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 40.00 | 66.07 | 165 |

- **සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/ අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු. මි) | වියදම් කළ මුදල (රු. මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | පොලිතින් දවටන වෙනුවට කෙසෙල් කොළ පත්‍රවලින් ඇසුරුම් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය | 6.18 | 0.09 | 1 |
| 2 | සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය | 0.18 | 0.11 | 61 |
| 3 | නාරාහේන්පිට පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 10.96 | 12.60 | 115 |
| 4 | දෙහිවල ඇග්‍රෝ ෆ්‍රෙෂ් සුපර් අලෙවිසැල | 43.33 | 45.10 | 104 |
| 5 | දෙහිවල පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 6.92 | 9.30 | 134 |
| 6 | I. සත්ත්ව ආහාර සඳහා බඩඉරිගු මෙ.ටො. 50,000 ක් ආනයනය කිරීම | 6,604.23 | 123.55 | 2 |
| | II. දේශීය බඩ ඉරිගු මිලදී ගැනීම | 2,101.38 | 1.04 | 0 |
| 7 | සහල් සබලකරණ ව්‍යාපෘතිය | 1,047.23 | 103.52 | 10 |
| 8 | ඉඩම් අක්කර 15 සහ 10 සඳහා තණමල්විල සහ බුත්තල ගොවිපළවල ඉඩම් සංවර්ධනය කිරීම | 1.96 | 1.94 | 99 |
| 9 | මැද කන්නයේ මුං ඇට වගා කිරීමේ ව්‍යාපෘතිය | 1.66 | 95.03 | 5,725 |

## 13.6. භෞතික ප්‍රගතිය

### i. කෙසෙල් කොළ දවටන නිෂ්පාදන ව්‍යාපෘතිය

මේ වනවිට ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය යටතේ පවත්නා දෙහිවල පිහිටි අලෙවි සැලෙහි දී ආහාර දවටන ලෙස ජෛව දවටන නිෂ්පාදනය කර ප්‍රචලිත කිරීම සිදු කෙරේ. ඒ සඳහා ස්ථාපිත කර ඇති විදුලි බලයෙන් ක්‍රියා කරවන යන්ත්‍රයක් මගින් කෙසෙල් කොළ යොදාගනිමින් ආහාර දවටන සකස් කෙරේ. මෙම යන්ත්‍රය මගින් පැයකට දවටන 150 ක් පමණ අවම වශයෙන් සකස් කළ හැකි වේ. එක් දවටනයක අලෙවි මිල රු. 10.00 ක් පමණ වනු ඇත. මේ වන විට කෙසෙල් කොළ දවටන 2,520 ක් නිපදවා ඇත.

ඡායාරූප අංක 55

### ii. සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

ජනතාව අතරට සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීමේ දෙවන අදියර ලෙස "සුගුණ සප්පායම" Torrington, Good Market - Saturday special වශයෙන් ආරම්භ කරන ලදී. කොළඹ විශ්ව විද්‍යාලය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යායතනයේ සිසුන් කණ්ඩායමක් විසින් මෙම අලෙවි කුටිය ආරම්භ කර 2025 මැයි 03 දින සිට 2025 ජූලි 05 දක්වා සෑම සෙනසුරාදා දිනකදීම පවත්වන ලදී. එය කොළඹ නගරයේ ජනතාවගේ ප්‍රතිචාර පිළිබඳව අවබෝධයක් ලබාගැනීම පිණිස ආරම්භ කරන ලද ශක්‍යතා අධ්‍යයනයක් විය. එහිදී රැස් කරගත් තොරතුරු සහ දත්ත පාදක කරගනිමින් කොළඹ කොටුව පිහිටි ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ප්‍රධාන කාර්යාලයේ "සුගුණ සප්පායම" සඳහා පුද්ගලික අංශයේ දායකත්වය යටතේ 2025 සැප්තැම්බර් පළමු සතියේ ආරම්භ කෙරුණි.

ඡායාරූප අංක 56

- **සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය - කොළඹ ටෙලිකොම් ආයතනය**

අප මණ්ඩලය මගින් පෝෂ්‍යදායි ආහාර වේලක් සහන මිලකට පාරිභෝගිකයන් වෙත ලබාදීමේ ව්‍යාපෘතියක් සුගුණ සප්පායම නමින් ක්‍රියාත්මක වේ. එම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ භෝජනාගාරයක් තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කළද එහි සේවය කිරීම සඳහා අප ආයතනයේ ප්‍රමාණවත් තරම් සේවකයන් නොමැති බැවින් බාහිර ආයතනයක් මගින් එම කටයුතු ඉටු කිරීමට සිදු වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සුගුණ සප්පායම් ආපනශාලා 3 ක් පිහිටුවා ඇත.

ඡායාරූප අංක 57

### iii. පැල අලෙවිසැල සහ ගෙවත්ත - නාරාහේන්පිට

ග්‍රාමීය ජනතාවට මෙන්ම නාගරික වැසියන්ටද තම ගෙවත්තේ තමාට අවශ්‍ය දෑ හැකි අයුරින් වගා කර පරිභෝජනයට ගැනීමට පෙළඹීම මත නාගරික වැසියන්ට ගෙවතු වගාව සඳහා අවශ්‍ය වන්නා වූ සියලුම වර්ගයේ එළවළු පැළ ඇතුළු සහනදායී මිලකට ලබාදීම පෙරදැරිව ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් ලෙස නාරහේන්පිට පැළ තවාන හඳුන්වා දිය හැක. ඖෂධීය පැල, මල් පැල හා පලතුරු පැල (විශේෂයෙන් ඌන භාවිත පලතුරු) හා පලතුරු හා එලවලු බීජ, එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැකි අතර මෙම ස්ථානයෙන් බෝග වගා පිළිබඳ උපදෙස් ද නොමිලේ ලබා ගත හැක. මේ වන විට පැල 30,000 ක් අලෙවි කර ඇත.

ඡායාරූප අංක 58

### iv. පැල අලෙවිසැල - දෙහිවල

නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබන සියලුම අලෙවි කාර්යයන් දෙහිවල මධ්‍යස්ථානය මගින් ද සිදු කෙරේ. ආදායම ලෙස රු. මි. 7.85 මුදලක් උපයා ඇති අතර මේ වසරේ වියදම රු. මි. 9.30 කි. මෙම ව්‍යාපෘතිය මඟින් පැල 28,000 ක් පමණ අලෙවි කර ඇත.

**v. ගොවි නිෂ්පාදන හා ආහාර අලෙවි සැල - දෙහිවල**

මෙම ව්‍යාපෘතියේ මෙම වසරේ වියදම රු. මි. 45.10 ක් වූ අතර ආදායම රු. මි. 43.33 කි.

ඡායාරූප අංක 59

**vi. බඩ ඉරිඟු ව්‍යාපෘතිය**

- **බඩ ඉරිඟු ආනයනය ව්‍යාපෘතිය**

කුකුළු පාලනය සඳහා ප්‍රධාන ආහාර ද්‍රව්‍යයක් ලෙස බඩ ඉරිගු භාවිතා කරන බැවින් ඒ සඳහා ශ්‍රී ලංකාවේ කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදකයින්ගේ ඉහළ ඉල්ලුමක් පවතී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු මෙ. ටො. 200,000 ක් නිෂ්පාදනය කරනු ලැබේ. නමුත් වාර්ෂික අවශ්‍යතාවයෙන් 50% කට පමණක් එය ප්‍රමාණවත් වේ.

වර්තමානයේ, පෞද්ගලික සමාගම් විසින් බඩ ඉරිඟු ආනයනය සිදු කරනු ලබන බැවින්, ඔවුන් ඒකාධිකාරයක් පවත්වාගෙන යයි. එම නිසා කුකුළු ආහාර මිල ඉහළ යාමක් සිදුවන අතර කුකුළු පාලන ගොවියන් සඳහා දැඩි දුෂ්කරතා ඇති කරයි. ඒ අනුව, පුද්ගලික අංශයේ සහය ඇතිව බඩඉරිඟු මෙ. ටො. 50,000 ක් ආනයනය කිරීමට බලපත්‍ර නිකුත් කිරීම සිදුකරන ලදී . එම ආනයනය කිරීමේදී පරිපාලන ගාස්තු වශයෙන් රු.මි. 512.90 ක ශුද්ධ ආදායමක් ආනයනය මගින් ලැබී ඇත.

- **දේශීය බඩඉරිඟු මිලදී ගැනීම**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත කිලෝග්‍රෑම් 6955 ක දේශීය බඩඉරිගු ප්‍රමාණයක් පුද්ගලික අංශය හා සම්බන්ධව ලබාදෙන ලදී . බඩඉරිගු සඳහා ස්ථාවර මිලක් වෙළඳපොළේ ඇතිකිරීම වෙනුවෙන් මිල පාලන කටයුතු සිදුකිරීම සඳහා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මැදිහත්වී කටයුතු කරන ලදී . එහෙත් 2025 වසර සඳහා දේශීය බඩඉරිගු අස්වැන්න වෙනුවෙන් ඉහළ මිලක් ගොවින් හට ලද බැවින් අප මණ්ඩලයේ මැදිහත් වීමක් අවශ්‍ය නොවිණි .

**vii. සහල් සබලකරණ ව්‍යාපෘතිය**

ප්‍රාථමික පාසල් ශිෂ්‍යයන් සඳහා දිවා ආහාර සැපයීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂයේ පාසල් සිසුන් 500,000 ක් සඳහා දිවා ආහාර සැපයීමට සබලකෘත සහල් සැකසීමේ කර්යය අප මණ්ඩලයේ කලන්කුට්ටිය කර්මාන්තශාලාවේ සිදු කෙරෙන අතර ලෝක ආහාර වැඩසටහනේ දායකත්වයෙන් සිදුකරයි. මෙම ව්‍යාපෘතියේ වියදම රු. මි. 103.52 කි. රු. මි. 202.47 ක මුදලක ආදායමක් උපයා ඇත. සබලකෘත සහල් මෙ.ටො. 347 ක් බෙදා හැර ඇත.

ඡායාරූප අංක 60

**viii. ඉඩම් අක්කර 15 සහ 10 සඳහා තණමල්විල සහ බුත්තල ගොවිපළවල ඉඩම් සංවර්ධනය කිරීම**

බුත්තල ගොවිපළ තුළ සත්ත්ව ආහාර සඳහා බඩ ඉරිඟු අක්කර 6 ක වපසරිය තුළ වගාකර ඇති අතර මෙ. ටො. 16 ක බඩ ඉරිගු සත්ත්ව ආහාර සඳහා අඹේවෙල ගොවිපළ වෙත ලබා දී ඇත.

ඡායාරූප අංක 61

**ix. මැද කන්නයේ මුං ඇට වගාකිරීමේ ව්‍යාපෘතිය**

මේ වනවිට ලංකාවේ මුං භෝගයේ වගා වපසරිය ආසන්න වශයෙන් හෙක්ටයාර 9100 පමණ වන අතර වාර්ෂික නිෂ්පාදනය මෙ. ටො. 13000 පමණ වේ. එහෙත්, වාර්ෂික අවශ්‍යතාවය මෙ. ටො. 20,000 පමණ වේ. එමෙන්ම, අස්වැන්න හෙක්ටයාරයට මෙ. ටො. 1.1 - 2 දක්වා වෙනස් වේ. මේ වන විටත් මුං ඇට ආනයනය කෙරෙන අතර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මැද කන්නයේ වගාවද යම් තරමකින් දායක කරගත හැකිය.

මුං ඇට මිලදී ගැනීමේදී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අස්වැන්නක් ගොවින් විසින් අප මණ්ඩලය වෙත ලබා දීමට කටයුතු කරන ලදී . ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය විසින් මිලදී ගත් මුං ඇට

නැවත වෙළඳපොළ වෙත විකිණීමෙන් ලැබුණු ආදායම රු. මි. 63.50 කි. එම මුදල කෘෂිකර්ම අමාත්‍යංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත බැර කරන ලදී.

ඡායාරූප අංක 62

**සටහන - මෙම ආයතනය විසින් වාර්ෂිකව විගණනය කරන ලද වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.**

## 14. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය)

### 14.1. දැක්ම

තිරසර ඉඩම් හා ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා වන සේවා විශිෂ්ඨත්වයක් තුළ හරිත වූ පරිසරයක් සරු ඵල සපිරි රටක්.

### 14.2. මෙහෙවර

ඵලදායී ඉඩම් කළමනාකරණය, විධිමත් ජල සංරක්ෂණයක් හා උසස් මානව සම්පත් උපයෝජනය තුළින් පාරිසරික සම්පත් සංරක්ෂණය හා කෘෂි ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම.

### 14.3. අරමුණු

i. කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ ආණ්ඩුවේ නැතහොත් ආණ්ඩුවේ නොවන නියෝජිත ආයතන මඟින් හෝ සැලසුම් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.
ii. සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියළු ඉඩම්, උපරිම ඵලදාව, පරිසරය රැකීම, ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය සහ ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම.
iii. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම.
iv. කෘෂිකාර්මික විවිධාංගීකරණය සහ ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
v. (1) වන ඡේදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ දිය බෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියළු පියවර ක්‍රියාත්මක කිරීම.
vi. වාණිජ කෘෂිකාර්මික වගාව හෝ වෙනත් යම් කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි දේශීය සහ විදේශීය කෘෂිකර්මාන්ත ආයෝජන සඳහා දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සහය ලබාදීම.
vii. අධිකාරිය සමඟ හවුල්කාරිත්වයක් ඇතිව හෝ නැතිව රාජ්‍ය නොවන නියෝජිත ආයතන, පුද්ගලික අංශය හෝ ගොවීන් විසින් භාර ගන්නා ලද එවැනි කෘෂිකර්මාන්ත ආයෝජනය ඇති කිරීම සඳහා සැලසුම් කිරීම සහ එම සැලසුම් ක්‍රියාත්මක කිරීම, සේවාවන් සැපයීම සහ විශේෂඥ දැනුම ලබා දීම.

vii. (අ)"කෘෂිකර්මාන්තය " යන්නෙන් වගා අංශය වෙත භෞතික යෙදවුම් සැපයීම සහ දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ ඉල්ලුම ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික අමුද්‍රව්‍ය පරිවර්තනය, බෙදා හැරීම හෝ අන්‍යාකාරයෙන් ඒ සඳහා වටිනාකමක් එකතු කරන ඕනෑම ව්‍යාපාරයක් හෝ ආයතනයක් අදහස් වේ.

(ආ)" වාණිජ වගාව " යන්නට වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් කරනු ලබන බෝග වගාව, පශු සම්පත් පාලනය, උද්‍යාන විද්‍යාව, මල් වගාව සහ පටපණු වගාව ඇතුලත් වේ.

(ඇ) වෙනත් කෘෂිකාර්මික ව්‍යවසායයන් යන්නට පටක රෝපණය, කාබනික පොහොර නිෂ්පාදනය, ආහාර හා ආහාරයට සුදුසු තෙල් සැකසීම, ඖෂධ බෝග උපයෝගී කර ගනිමින් ඖෂධ නිෂ්පාදනය, කෘෂිකාර්මික සංචාරක ව්‍යාපාරය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ ඒ හා

සම්බන්ධිත වෙනත් උපාංග නිෂ්පාදනය සහ කෘෂිකර්මය උද්‍යාන විද්‍යාව සහ වැවිලි බෝග මත පදනම් වූ එවැනි වෙනත් කර්මාන්ත ඇතුළත් වේ.

### 14.4. මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන | 338.00 | 243.75 | 72 |
| 02 | පුනරාවර්තන | 172.00 | 153.51 | 89 |

### 14.7. භෞතික ප්‍රගතිය

**විෂය පථය 01 : ඉඩම් ඵලදායිතාවය උපරිම මට්ටමකට ගෙන ඒම.**

### 1.1. පාංශු ඛාදනය හා හායනය අවම කිරීම උදෙසා කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම.

මධ්‍යම කඳුකරය ආශ්‍රිත කෘෂිකාර්මික ඉඩම් අධික වර්ෂාපතනය, වනාන්තර විනාශය, ඉඩම් පරිහරණ රටාවේ වෙනස්වීම සහ නාගරීකරණය වීම හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඛාදනයට හා හායනයට ලක්වී ඇත. පාංශු ඛාදනය වීම නිසා ඇති වන අතුරු ප්‍රතිඵලය වන්නේ සෝදා යන පාංශු අංශු ජලය සමඟ ගසාගෙන ගොස් ජලාශවල තැන්පත් වීමයි. මේ හේතුවෙන් ජලාශ වල ජලය ගබඩා කළ හැකි ධාරිතාවය පහළ යාම හේතුවෙන් ජල විදුලි උත්පාදනය සඳහා ගැටළු ඇති වේ. එමෙන්ම නාය යෑම් ඇති වීම, ගංගා ඉවුරු ඛාදනය වීම, වාරි මාර්ග අවහිර වීම සහ නියඟය වැනි අහිතකර ප්‍රතිඵල පාංශු ඛාදනය හරහා ඇති වේ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාවය පහළ යාම සඳහා බලපාන ප්‍රධානම හේතුව වන්නේ පාංශු ඛාදනයයි. එම නිසා පාංශු සංරක්ෂණය කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.
කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සංරක්ෂණය ක්‍රම 3ක් හරහා සිදු කෙරේ.

| | | |
|---|---|---|
| I. | යාන්ත්‍රික සංරක්ෂණය | - ගල් වැටි, පස් වැටි, කුට්ටි කාණු, හෙල්මළු, සමෝච්ච වේදිකා |
| II. | ජීව විද්‍යාත්මක සංරක්ෂණය | - සැවැන්දරා වැටි, ආවරණ වගා, තෘණ වැටි, දෙවැටි, වන වගා, සුළං බාධක වැටි, බහු වාර්ෂික බෝග වගාව |
| III. | ශෂ්‍ය විද්‍යාත්මක සංරක්ෂණය | - සමෝච්ච බිම් සැකසීම, කාබනික පොහොර යෙදීම, වසුන් යෙදීම, අවම බිම් සැකසීම හා අතුරු බෝග වගාව |

කෘෂිකාර්මික ඉඩම් වල බෑවුම හා ස්වභාවය හඳුනා ගනිමින් මෙම පාංශු සංරක්ෂණ ක්‍රම එකක් හෝ කිහිපයක් යොදා ගනිමින් පාංශු ඵලදායීතාවය ඉහළ නංවා ගත හැක.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ප්‍රධානතම අරමුණ වන්නේ ඉඩම් ඵලදායිතාව ඉහළ නැංවීමයි. ඒ අනුව යාන්ත්‍රික, ජීව විද්‍යාත්මක සහ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මඟින් ඉඩම් ඵලදායිතාව ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා තෝරා ගත් ජල ප්‍රදේශ වල ගොවි ජනතාව සමඟ ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

2025 වර්ෂයේ දී කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සංරක්ෂණ ව්‍යුහ හෙක්. 800 ක් සංරක්ෂණය කිරීමට සැලසුම් කොට තිබූ අතර ප්‍රතිලාභීන් වෙත දිරි දීමනා ලබා දීම සඳහා රු.මි. 28.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කොට තිබිණි. 2025 වර්ෂය අවසානයේ දී හෙක්ටයාර 771.14 ක කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් සංරක්ෂණය කරන ලද අතර ඒ සඳහා රු.මි.26.99 වැය කරන ලදී.

ඡායාරූප අංක 63

### 1.2 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම

පාංශු සංරක්ෂණ සිදුකරන ලද කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාව තවදුරටත් ඉහළ නැංවීම මඟින් සාරවත් පසක් නිර්මාණය කර ගැනීමේ අරමුණු සහිතව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන ගොවීන් සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම, එම

කාබනික පොහොර නිෂ්පාදනය සාර්ථකව සිදුකරනු ලබන ගොවීන් දිරි ගැන්වීම සඳහා කෘෂි උපකරණ කට්ටල ලබාදීම සහ ගුණාත්මක කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රොක් පොස්පේට් ලබාදීමට සැලසුම් කරන ලදී.

2025 වර්ෂයේ දී කාබනික පොහොර මෙ. ටො. 2,600 ක් නිෂ්පාදනය වෙනුවෙන් කෘෂි උපකරණ කට්ටල 2600ක් ලබා දීමට ඉලක්ක ගත විය. ඒ අනුව උදළු තලයක්, උදළු මුල්ලුවක්, තාච්චියක්, සවලක් හා මල් බාල්දියකින් සමන්විත උපකරණ කට්ටලයක් ලබා දීමට සැලසුම් කරන ලදී. ඒ අනුව, මේ සඳහා රු. මි. 26.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. එමෙන්ම එම පොහොර නිෂ්පාදනයේ ගුණාත්මක බව තවදුරටත් ඉහළ නැංවීම සඳහා එප්පාවල රොක් පෝස්පේට් කි.ග්‍රෑ. 130,000 ලබාදීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා රු. මි. 3.25 වෙන් කරන ලදී. ඒ අනුව, 2025 වසර අවසන් වන විට කාබනික පොහොර නිෂ්පාදන වෙනුවෙන් ලබාදෙන උපකරණ කට්ටල 2600ක් ප්‍රතිලාභීන්ට ලබා දී ඇති අතර රොක් පොස්පේට් කි.ග්‍රෑ 130,000 ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. ඒ අනුව කෘෂි උපකරණ කට්ටල සඳහා රු.මි. 10.43 ක් සහ රොක් පොස්පේට් සඳහා රු.මි. 3.06 ක් වැය කරන ලදී.

ඡායාරූප අංක 64

**1.3. පාංශු සංරක්ෂණය සඳහා තාක්ෂණික උපකරණ භාවිතය ප්‍රචලිත කිරීම.**

පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ කෘෂිකාර්මික ඉඩම් වල සමෝච්ච රේඛා හඳුනා ගැනීම ඇතුළු සිදු කරනු ලබන කාර්යයන් සඳහා නවීන තාක්ෂණික මෙවලම් (රෝඩරේසර්/බෑවුම් මාන/ පාංශු පරික්ෂණ කට්ටල) භාවිතය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන සැලසුම් කරන ලදී. ඒ අනුව රු. මි. 0.99 ක මුදලක් වැය කරමින් පාංශු සංරක්ෂණය සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගන්නා ලදී.

**විෂය පථය 02 : සුරක්ෂිත ජල සම්පත**

**2.1 ජල මූලාශ්‍ර සංරක්ෂණය සහ ජල මූලාශ්‍රය ආශ්‍රිත පහසුකම් සැපයීම.**

විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් හානියට පත්ව ඇති ජල මූලාශ්ර හා ඒ අවට පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම, ජලකාමී පැල රෝපණය හරහා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, එම ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීම හා කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම අරමුණු කොට ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

2025 වර්ෂය සඳහා තෝරා ගත් ජල පෝශක ප්‍රදේශ තුල පවතින ජල මූලාශ්‍ර 52ක් සංරක්ෂණය කිරීමට සැලැසුම් කරන ලදී. ඒ සඳහා රු. මි. 62.40 ක් මෙම සංවර්ධන වැඩසටහන සඳහා වෙන් කරන ලද අතර 2025 වර්ෂය අවසානයේ දී ජල මූලාශ්‍ර 52ක් රු.මි. 52.60ක් වැය කරමින් සංරක්ෂණය කරන ලදී.

ඡායාරූප අංක 65

**2.2. ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය**

ජල පෝෂක ප්‍රදේශ තිරසාරව භාවිත කිරීම සහ ආරක්ෂා කිරීම උදෙසා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. ඒ සඳහා ජලකාමී පැල 15,000 ක් ලබාදීම සඳහා සැලසුම් කරන ලද අතර ඒ සඳහා රු.මි. 3.00 ක මුදලක් ඇස්තමේන්තුගත කරන ලදී. ඒ අනුව, 2025 වර්ෂය අවසාන වන විට ජලකාමී පැල 13,379ක ප්‍රමාණයක් ජල පෝෂක ප්‍රදේශයන්හි රෝපණය කරන ලද අතර ඒ සඳහා රු.මි. 1.73 ක මුදලක් වැය කරන ලදී.

ඡායාරූප අංක 66

**2.3. ප්‍රජා සහභාගීත්ව ජල මූලාශ්‍ර සංරක්ෂණ සහ පවිත්‍රතා වැඩසටහන.**

ජල මූලාශ්‍ර අවට සංරක්ෂණ කිරීම තුළින් පානීය ජල අවශ්‍යතාවය සඳහා පිරිසිදු ජලය ලබා ගැනීම, විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පරිහානියට පත්ව ඇති ජල මූලාශ්‍ර අවට පරිසරය පවිත්‍ර කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහි මූලික අරමුණයි. ඒ අනුව, 2025 වර්ෂය සඳහා මෙම වැඩසටහන් 52 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ

අතර ඒ සඳහා රු.මි. 1.56 ක මුදලක් ඇස්තමේන්තුගත කර ඇත. ඒ අනුව, 2025 වර්ෂය අවසාන වන විට පවිත්‍රතා වැඩසටහන් 48ක් තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු.මි. 1.53 ක මුදලක් වැය කරන ලදී.

ඡායාරූප අංක 67

**විෂය පථය 03 : ආහාර සුලභතාවය සහ සුරක්ෂිතතාව තහවුරු වූ නිරෝගිමත් සමෘද්ධිමත් ප්‍රජාවක්**

## 3.1 ගෙවතු වගා ප්‍රවර්ධනය

### 3.1 වාණිජ ගෙවතු වගා ප්‍රවර්ධනය

2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් සඳහා තෝරා ගත් ජල පෝෂක ප්‍රදේශ තුල ආහාර සුරක්ෂිතතාවය, වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම හා ගොවීන් වෙළඳපොල මත යැපීම අවම කරමින් ආර්ථික තත්වය ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් ගෙවතු වගාව සඳහා ගොවීන් දිරිගැන්වීමේ වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.ඒ අනුව තෝරා ගත් ප්‍රතිලාභින් දිරි ගැන්වීම උදෙසා ගෙවතු පැල කට්ටල ලබාදීම, ගෙවතු වගා කෘෂි උපකරණ කට්ටල, කාබනික දියර නිස්සාරකය ලබාදීමට සැලසුම් කරන ලදී. මෙහිදී වාණිජ මට්ටමේ ගෙවතු වගාවන් සඳහා බටු ,මිරිස්, මාළු මිරිස් ,තක්කාලි හා නයි මිරිස් ආදී වර්ග වලින් බෝග එකක් හෝ දෙකක් හෝ වගා කිරිමට අපේක්ෂා කරන අතර ලද අතර , එක් ගොවියෙකුට පැළ 300 ක් පමණ අන්තර්ගත පැල බඳුන් 30ක් හා කාබනික දියර නිස්සාරකය බෝතල් 2ක් බැගින් ලබාදීමට අපේක්ෂා කරන ලදී.

ඒ අනුව, 2025 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 52ක් ආවරණය වන පරිදි ගෙවතු 1700ක් සඳහා රෝපණ ද්‍රව්‍ය සහ කෘෂි උපකරණ කට්ටල ලබා දීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා රු.මිලි 25.50ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී. ඒ අනුව කෘෂි උපකරණ කට්ටලය සඳහා ලීටර් 16 ස්ප්‍රේ යන්ත්‍රයක්, මීටර් 30 හෝස් බටයක්, වගා තැටියක්, වගා මළු 84ක් අන්තර්ගත වේ. 2025 වර්ෂය අවසානයේදී කෘෂි උපකරන කට්ටල 1700 ක් රෝපණ ද්‍රව්‍ය එනම් ගෙවතු පැල 61,567ක් සහ කාබනික දියර නිස්සාරකය ප්‍රතිලාභින්ට ලබා දී ඇති අතර ඒ සඳහා රු.මිලි 21.10ක මුදලක් වැය කරන ලදී.

ඡායාරූප අංක 68

### 3.2. ආර්ථික බෝග වගා ප්‍රවර්ධනය

පොල්, පුවක්, ගම්මිරිස්, වැනිලා, බුලත්, කුරුඳු, කෝපි සහ දෙහි යන ආර්ථික බෝග ලබාදීම මඟින් ආර්ථික බෝග වගාව සිදු කරනු ලබන ගොවීන් සඳහා සහය ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව ආර්ථික බෝග පැල 93,000 ක් ලබාදීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා රු.මි. 10.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කොට තිබිණි. ඒ අනුව 2025 වර්ෂය අවසානයේදී පැල 61,567 ක් ලබාදී ඇති අතර ඒ සඳහා රු.මි. 4.87 ක ප්‍රතිපාදන මුදලක් වැය කරන ලදී.

ඡායාරූප අංක 69

### 3.4. අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනය

ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම උදෙසා සහ ගොවීන් වෙත අතිරේක ආදායම් මාර්ග උත්පාදනය ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම උදෙසා මෙන්ම ගොවීන් වෙත අතිරේක ආදායම් මාර්ග උත්පාදනය අරමුණු කොට ගෙන අතිරේක ආහාර බෝග ප්‍රවර්ධන වැඩසටහනක් 2025 වර්ෂය සඳහා සැලසුම් කරන ලදී. එමඟින් හෙක්ටයාර 300 ක අතිරේක ආහාර බෝග වගා කිරීම සඳහා කව්පි, මුං ඇට, රට කජු, කුරක්කන්, මිරිස් සහ බඩ ඉරිඟු ගොවීන් වෙත ලබාදීමට සැලසුම් කරන ලදී

ඒ සඳහා රු.මි. 9.00 ක් වෙන් කරන ලද අතර මාතලේ, අනුරාධපුරය, බදුල්ල, කුරුණෑගල හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තෝරාගත් ගොවීන්

සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති අතර 2025 වර්ෂය අවසාන වන විට හෙක්ටයාර 185.36 ක අතිරේක ආහාර භෝග වගා කොට ඇති අතර මේ සඳහා වෙන් කරන ලද මුදලින් රු.මි. 8.34 ක් වැය කරන ලදී.

ඡායාරූප අංක 70

**3.4. සුහුරු කෘෂි තාක්ෂණය උපයෝගී කොට ගනිමින් දෙමුහුන් මිරිස් වගාව ප්‍රචලිත කිරීමේ නියමු ව්‍යාපෘතිය**

නවීන තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුකූලව දෙමුහුම් මිරිස් වගාව ප්‍රචලිත කරමින් මිරිස් වගා ව්‍යවසායකයින් 10ක් බිහි කිරීමට මෙම වැඩසටහන මගින් අපේක්ෂා කරන ලදී. ඒ අනුව රු.මිලි 5.00ක් ප්‍රතිලාභින් 10කු සඳහා වෙන්කරන ලද අතර 2025 වර්ෂය අවසානයේදී රු.මිලි 0.09ක් වැය කර මිරිස් බීජ මිලදී ගැනීම් සිදු කර ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. නමුත් දිවයින පුරා පැවැති අයහපත් කාළගුණික තත්වය හේතුවෙන් මෙම නියමු ව්‍යාපෘතියේ ඉතිරි වැඩකටයුතු 2026 වසරේදී නිම කිරීමට සැලැසුම් කරන ලදි.

ඡායාරූප අංක 71

**3.5. වගාවන් සඳහා වන සතුන්ගෙන් සිදුවන හානිය අවම කිරීම (50% දායකත්වය මත)**

ශ්‍රී ලංකාවේ වන සතුන් නිසා සිදුවන වාර්ෂික වගා හානිය 40% බව පර්යේෂණ වාර්තා මඟින් සනාථ කොට ඇත. ඒ හේතුවෙන් වන සත්ව හානිය වලක්වා ගැනීම උදෙසා ගොවීන් වෙත යටිතල පහසුකම් සැපයීම මූලික අරමුණ කර ගනිමින් ගොවීන් බෝග වගාව සහ අනෙකුත් වගාවන් සඳහා සේවාවන් සැපයීම ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මඟින් සංවර්ධන වැඩසටහනක් ලෙස 2023 වර්ෂයේ ආරම්භ කරන ලදී. ඒ අනුව 2025 වර්ෂයේදී ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රතිලාභින්ගෙන් 50% ක දායකත්වයක් ලබාගෙන විදුලි වැට සහ වායු රයිෆල් ලබාදීමට සැලසුම් කරන ලදී. 2025 වර්ෂයේදි වායු රයිෆල් 1,000 ක් ලබා දීම සඳහා රු.මි. 26.00 ක්, විදුලි වැට 100 ක් ලබාදීම සඳහා රු.මි. 10.00 ක් වෙන් කරනු ලැබූ අතර වායු රයිෆල් 998 ක් සඳහා ප්‍රතිලාභින් විසින් 50% දායකත්වය යටතේ මුදල් අධිකාරිය වෙත ලබා දී ඇත. 2025 වසර අවසන් වන විට වායු රයිෆල් 370ක් ප්‍රතිලාභින් වෙත බෙදා දී අවසන් කර ඇත. ඉතිරි වායු රයිෆල් 628 සංඛ්‍යාව 2026 වසරේදී මිලදී ගැනීම සඳහා සැලසුම් කොට ඇත. විදුලි වැට සඳහා මුදල් ගෙවන ලැබූ ප්‍රතිලාභින් 43 දෙනෙකු සඳහා අවශ්‍ය මිලදී ගැනීම් සිදුකර ඇත.

**විෂය පථය 04 : තෝරා ගත් ජල ප්‍රදේශ ආශ්‍රිතව ප්‍රශස්ථ යටිතල පහසුකම් ප්‍රවර්ධිත දැනුමින් හා තාක්ෂණයෙන් සවිබල ගැන්වූ නව කෘෂි ව්‍යවසායකයින් බිහිකිරීම.**

**4.1. වාණිජ මට්ටමේ මීමැසි පාලනය සඳහා දිරි ගැන්වීම (50% දායකත්වය මත)**

මීමැසි පාලනය සඳහා වාණිජ මට්ටමින් සිදු කරනු ලබන ගොවි ප්‍රජාව තවදුරටත් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ යෙදවුම් ලබාදීම අරමුණු කොට ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ප්‍රතිලාභීන්ගේ ව්‍යාපෘති යෝජනා මත පදනම්ව ශක්‍යතාවයෙන් ඉහල තිරසර ව්‍යාපෘති 113 ක් හඳුනා ගන්නා ලදී. මේ සඳහා රු.මි. 2.50ක ප්‍රතිපාදන මුදලක් වෙන්කරනු ලැබූ අතර ඒම මුදලෙන් රු.මි 2.49 ක් වැය කොට අවශ්‍ය යෙදවුම් ප්‍රතිලාභීන් වෙත ලබා දෙන ලදි.

ඡායාරූප අංක 72

**4.2. බිම්මල් නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරීම (50% දායකත්වය මත)**

වාණිජ මට්ටමින් බිම්මල් නිෂ්පාදන සිදුකරනු ලබන ව්‍යවසායකයින් හඳුනා ගනිමින් 50% ප්‍රජා දායකත්වය යටතේ තවදුරටත් ඔවුන් සවිබල ගැන්වීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ඒ අනුව, රු.මි. 12.50 ක් මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඒ අනුව නුවරඑළිය, ගම්පහ, කොළඹ, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මාතලේ හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වල ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිලාභීන්113 ක් සඳහා රු.මි 9.27 ක් වැය කොට ප්‍රතිලාභ ලබාදෙන ලදී.

### 4.3. අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරීම (50% දායකත්වය මත)

කෘෂි නිෂ්පාදන අගය එකතු කිරීමේ නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබන ව්‍යවසායකින් සඳහ 50% ප්‍රජා දායකත්වය යටතේ පහසුකම් සැපයීම මෙම වැඩසටහනේ අරමුණයි. මේ සඳහා රු.මි. 6.25 ක් වෙන් කර ඇති අතර මහනුවර, මාතලේ, ගම්පහ, කොළඹ, කෑගල්ල, රත්නපුර, බදුල්ල, අනුරාධපුර, කුරුණෑගල හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කවලින් ලද ඉල්ලීම් අතරින් නිසි ශක්‍යතා අධ්‍යනයකින් යුතු ව්‍යාපෘති වාර්තා 50 ක් හඳුනාගෙන ඇති අතර ඔවුන්ගෙන් ප්‍රතිලාභින් 05 දෙනෙකු සඳහා රු. 244,150 ක මුදලක් වැය කොට 2025 වර්ෂයේදී ප්‍රතිලාභ ලබා දී ඇත. 2025 වර්ෂයේදී හඳුනාගත් ඉතිරි ප්‍රතිලාභින් 45 දෙනා සඳහා 2026 වර්ෂයේ දී අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට සැලසුම් කොට ඇත.

### 4.4. ව්‍යවසායක මට්ටමින් පළතුරු ගම්මාන ප්‍රචලිත කිරීම

පළතුරු බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම, ගොවි ආදායම් මාර්ග ඉහළ නැංවීම, පළතුරු ආනයනය වියදම අවම කිරීම සහ පළතුරු අපනයනය දිරිමත් කිරීම උදෙසා පලතුරු ගම්මාන සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුකරනු ලැබිණි. ඒ අනුව, පළතුරු ගම්මාන 10 ක් සඳහා රු.මි. 25.00 ක් ඇස්තමේන්තුගත කොට තිබූ අතර 2025 අවසන් වන විට පළතුරු ගම්මාන 17 ක් ස්ථාපිත කර ඇති අතර ඒ සඳහා රු.මි. 22.96 ක් වැය කොට ඇත.

## විෂය පථය 05 : සංරක්ෂණය වූ පරිසරයක්

### 5.1 පාසල් පාදක පාරිසරික වැඩසටහන්

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම තෝරාගත් පාසල්වල සුහුරු ගෙවත්තක් නිර්මාණය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන් ආරම්භ කරන ලදී. ඒ අනුව, වැඩසටහන් 52 ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබූ අතර රු.මි. 1.56 ක ප්‍රතිපාදන ඒ සඳහා වෙන් කරන ලදී. 2025 වර්ෂය අවසාන වන විට වැඩසටහන් 49 ක් සිදුකර ඇති අතර ඒ සඳහා රු.මි. 1.40 ක මුදලක් වැය කොට ඇත.

### 5.2 ප්‍රජා පාදක පාරිසරික වැඩසටහන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා තෝරාගත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රජාව උදෙසා පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. ඒ අනුව, මේ සඳහා රු.මි. 1.04 ක් වෙන්කර ඇති අතර වැඩසටහන් 52 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර 2025 වර්ෂය අවසන් වන විට රු.මි. 1.04 ක් වැය කරමින් වැඩසටහන් 53ක් තොරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හී ක්‍රියාත්මක කර ඇත.

## විෂය පථය 06 : සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක්

### 6.1 අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන.

ප්‍රෝටීන ශක්ති මන්ද පෝෂණය ග්‍රාමීය ජනතාව අතර පවතින උග්‍ර ගැටළුවක් බවට වර්තමානයේ දී පත්ව ඇත. එම නිසා ග්‍රාමීය ප්‍රජාවගේ දෛනික සත්ව ප්‍රෝටීන පරිභෝජනය ඉහල නැංවීම මෙන්ම දේශීය වෙළඳපොලේ බිත්තර මිල උච්චාවචනය අවම කිරීම මෙන්ම ගොවීන්ට අතිරේක ආදායම් මාර්ගයක් උත්පාදනය කර දීමේ අරමුණින් අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහනක්, තෝරා ගත් ජල පෝෂක ප්‍රදේශ තුල ජීවත් වන ග්‍රාමීය ජනතාව වෙත හඳුන්වා දීම මෙම වැඩසටහන හරහා සිදු කරයි. මෙහිදී අදාළ කුකුළු නිවාසය ප්‍රතිලාභියා විසින් ඉදි කර ගත යුතු අතර අප අධිකාරියේ පල්ලේකැලේ ගොවිපොල තුල මසක් ඇතිදැඩි කොට එන්නත්කරණය කරන ලද කුකුළු පැටවුන් අප අධිකාරිය හරහා නොමිලේ ලබා දීමට සැලසුම් කරන ලදී.

2025 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ කුකුළු පැටවුන් 45,000 ක් රු. මි. 38.25 ක මුදලක් වැය කරමින් ලබාදීමට සැලසුම් කරන ලදි. 2025 වර්ෂය අවසානයේදි පැටවුන් 42,130 ක් ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇති අතර ඒ සඳහා රු.මි 35.66 ක මුදලක් වැය කරන ලදී.

**6.2 ග්‍රාමීය ප්‍රජාව අතර බිත්තර දමන කුකුළු පාලනය (Layer Chicks) ප්‍රවර්ධනය කිරීම.**

වෙළඳපොල පවතින බිත්තර ඉල්ලුමෙහි සහ සැපයුමෙහි පවතින අසමතුලිතය හේතුවෙන් වාර්ෂිකව බිත්තර සඳහා වන වෙළඳපොල මිල නිරන්තර වෙනස් වීමට භාජනය වන බැවින් ජාතික මට්ටමින් මේ ගැටළුව අවම කර ගැනීමට දායකත්වයක් ලබාදීමේ අරමුණින් ග්‍රාමීය ප්‍රජාව සඳහා බිත්තර දමන කිකිලියන් (Layer Chicks) ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2025 වර්ෂයේ කුකුළු පැටවුන් 50 බැගින් ප්‍රතිලාභීන් 256 දෙනෙකු වෙත ලබා දීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB) මඟින් ලබා ගනු ලබන කිකිළි පැටවුන් ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ගොවිපොලවල මසක් ඇතිදැඩි කොට ප්‍රතිලාභීන් සඳහා ලබාදීමට සැලසුම් කරන ලදී. එසේම කුකුළු නිවාස සැකසීම සඳහා රු. 45,000 ක ද්‍රව්‍යමය ආධාර එම තෝරාගත් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට සැලසුම් කරන ලදි. මෙම වැඩසටහන 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. 2025 වර්ෂයේදි ප්‍රතිලාභි පවුල් 173 ක් සඳහා රු.මි 17.95 ක් වැය කරමින් ප්‍රතිලාභ ලබා දී ඇත.

ඡායාරූප අංක 73

**විෂය පථය 07 : ගොවි ජනතාව කෘෂි තාක්ෂණික දැනුමෙන් සවිබල ගැන්වීම**

**7.1. ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වා ගොවීන් සවිබල ගැන්වීම.**

මේ යටතේ 2025 සංවර්ධන වැඩසටහන් සඳහා තෝරාගත් ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) මගින් හඳුනාගත් ගොවි ප්‍රජාවගේ තාක්ෂණික කුසලතා වර්ධනය කිරීම සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන්, සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව පැවැත්වීම සිදුකරනු ලැබේ. ඒ අනුව ඒ සඳහා රු.මි. 2.08ක් ඇස්තමේන්තුගත කර ඇති අතර ගොවි පුහුණු වැඩසටහන් 104ක් පැවැත්වීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව 2025.12.31 දිනට ගොවි පුහුණු වැඩසටහන් 95ක් පවත්වා ඇති අතර ඒ සඳහා වෙන් කරන ලද මුදලින් රු.මි. 1.71 ක මුදලක් වැය කොට පුහුණු වැඩසටහන් අවසන් කරන ලදි.

**7.2. සමාජ සජීවීකරණය තුළින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන මගින් ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම.**

මේ යටතේ සමාජ සජීවිකරණ වැඩසටහන් පවත්වා සවිබල ගැන්වීම හා ගොවිතැනට යොමු කිරීම, සමාජ සජීවීකරණය තුලින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) හරහා ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම මඟින් සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව 2025 වර්ෂය සඳහා වැඩසටහන් 52ක් තෝරා ගනු ලැබූ ජල පෝෂක ප්‍රදේශ තුළ පැවැත්වීම සඳහා රු.මි. 1.25ක මුදලක් වෙන් කර තිබූ අතර 2025.12.31 දිනට වැඩසටහන් 52 ම පවත්වා ඇති අතර ඒ සඳහා රු. මි. 1.24ක මුදලක් වැය කොට ඇත. මෙම වැඩසටහන සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ක්‍රියාත්මක කරන ලදී.

**7.3 ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

ප්‍රශස්ත යටිතල පහසුකම් ප්‍රවර්ධිත දැනුමින් හා තාක්ෂණයෙන් සවිබල ගැන්වූ නව කෘෂි ව්‍යවසායකයින් බිහිකිරීමේ වැඩසටහන යටතේ හඳුනාගත් මීමැසි පාලනය, බිම්මල් නිෂ්පාදනය, හා කෘෂි නිෂ්පාදන අගය එකතු කිරීමේ ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව පැවැත්වීමට සැලසුම් කරන ලදි. ඒ අනුව, වැඩසටහන් 5 ක් සඳහා රු.මි. 1.00 ක් වෙන් කරන ලද අතර 2025.12.31 දිනට එක් ගොවි පුහුණු වැඩසටහනක් පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි. 0.23 ක් වැය කොට ඇත.

**7.4 කෘෂිකර්මාන්තයේ දියුණුවෙන් ආර්ථික සංවර්ධනය වූ ගොවි ප්‍රජාව ඇගයීම.**

ගොවි ප්‍රජාව කෘෂිකර්මාන්තය සඳහා යොමු කරවීම දිරිමත් කරවීමේ අරමුණින් 2025 වර්ෂයේ දී ප්‍රතිලාභ ලබා දුන් ගොවී ප්‍රජාව ඇගයීමට ලක් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරන ලදී. මෙම වැඩසටහන සඳහා රු.මි. 1.50ක් වෙන් කරන ලද අතර 2025 නොවැම්බර් මස ඇති වූ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරී වසම් ප්‍රදේශවල වගා

භූමි විනාශ වී ගොස් ඇති බව වාර්තා වීම මත මෙම වැඩසටහන 2025 වර්ෂයේදී ක්‍රියාත්මක නොකරන ලදී.

**විෂය පථය 08: සේවක අභිප්‍රේරණය තුළින් සේවා ඵලදායිතාවය ඉහල නැංවීම.**
මෙම විෂය පථය යටතේ භෞතික සම්පත් සංවර්ධනය යටතේ භෞතික සම්පත් අත්පත් කර ගැනීම සඳහා රු.මි. 5.00 ක් වෙන් කර ඇති අතර 2025 වසර අවසන් වන විට ඉන් රු.මි.4.82 ක් වැය කොට ඇත.

2025 වර්ෂයේදී ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා ආයතනයේ ප්‍රධානින්ගේ ප්‍රධානත්වයෙන් මාසිකව සමාලෝචනය කිරීම සිදු කිරීමට සැලසුම් කර තිබිණි. ඒ අනුව, ප්‍රගති සමාලෝචන රැස්වීම් 12 ක් පැවැත්වීමට සැලසුම් කළ අතර 2025 වර්ෂය අවසාන වන විට ප්‍රගති සමලෝචන රැස්වීම් 12 ක් පවත්වා ඇත. ඒ සඳහා වෙන් කරන ලද රු.මි. 0.96 ක ප්‍රතිපාදනවලින් රු.මි. 0.42 ක් වැය කර ඇත.

එමෙන්ම, ආයතනයේ කාර්යය මණ්ඩලයේ සංකල්පීය, තාක්ෂණික සහ මානව හැකියාවන් ඉහළ නැංවීම සහ යාවත්කාලීන කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය සහ පුහුණු වැඩසටහන් 50 ක් සඳහා රු. මි. 1.00 ක මුදලක් වෙන් කරන ලදි. ඒ අනුව, 2025 වර්ෂය අවසානයේදී පුහුණු වැඩසටහන් 05 ක් රු. මි. 0.29 ක මුදලක් වැය කරමින් අවසන් කොට ඇත.

අධිකාරියේ මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්ම කිරීම සඳහා 2025 වර්ෂයේ දී රු.මි. 1.15ක් වෙන් කරන ලදී. ඒ අනුව, මාධ්‍ය වැඩසටහන් 2 ක් පවත්වන ලද අතර රු. මි. 1.15 ක මුදලක් ඒ සඳහා වැය කර ඇත.

- **2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති**

**i. Clean sri Lanka වැඩසටහන යටතේ තෝරාගත් පාසැල් 50 ක පාසැල් හරිත කලාප 50ක් ස්ථාපිත කිරීමේ සොබා සිප් වදුල ව්‍යාපෘතිය**
ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ 2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදනයන්ට අදාළව දරුවන් අතර සදාචාරාත්මක වටිනාකම් ප්‍රවර්ධනය කිරීම යටතේ ස්වභාවධර්මය සමඟ අධ්‍යාපන පරිසරය සම්බන්ධ කිරීම සඳහා දිවයින පුරා තෝරාගත් පාසැල් 50 ක හරිත කලාප ස්ථාපිත කිරීමේ සොබා සිප් වදුල ව්‍යාපෘතිය ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. 2025 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 29.97 ක මුදලක් වෙන් කරන ලද අතර 2025 වර්ෂය අවසානයේ රු. මි. 10.74 ක මුදලක් ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත. 2025 වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකි වූ කාර්යයන් සඳහා රු.මි 11.63 ක ප්‍රතිපාදන මුදලක් 2026 වර්ෂය සඳහා ලබා ගැනීමට සහ අදාළ කාර්යයන් අවසන් කිරීමට සැලසුම් කොට ඇත.

ඡායාරූප අංක 74

**ii. පල්ලේකැලේ ගොවිපල සමෝධානික ගොවිපලක් වශයෙන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය හරහා ආහාර සුරක්ෂිතතාවය හා තාක්ෂණය වැය ශීර්ෂය මගින් ශ්‍රී ලංකා හදබිම අධිකාරියට අයත් පල්ලෙකැලේ ගොවිපල සමෝධානික ගොවිපලක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා රු. මි. 8.73 ක මුදලක් 2025 වර්ෂය සඳහා වෙන් කරන ලදි. 2025 වර්ෂය අවසානයේදී එම ප්‍රතිපාදන මුදලින් රු. මි. 2.81 ක මුදලක් වැය කරන ලද අතර සම්පූර්ණ කළ නොහැකි වූ කාර්යයන් සඳහා 2026 වර්ෂයේදී රු. මි. 2.43 ක මුදලක් ලබා ගැනීමට සැලසුම් කොට ඇත.

# පශු සම්පත් අංශය

## වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

### 1. සතුන් අභිජනනය කිරීමේ ගොවිපොළ ස්ථාපනය කිරීම වැය ශීර්ෂ අංක 118-2-03-078-2507

#### 1.1. සත්ත්ව අභිජනන ගොවිපළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2025 වර්ෂයේ පශු සම්පත් අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මි. 62.57 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් උතුරු මැද හා නැගෙනහිර යන පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇත. එහි ප්‍රගතිය පහත පරිදි වේ. සමාලෝචිත කාල සීමාව අවසානයේ මෙම ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය 70%කි.

| පළාත | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) |
|---|---|---|---|
| **උතුරු මැද** | තිරප්පනේ ගොවිපොළෙහි අභිජනන ඒකකය සංවර්ධනය | 4.00 | 1.98 |
| **නැගෙනහිර** | සුදු ගව ජාන සංරක්ෂණ වැඩසටහන | 4.00 | 3.97 |
| **ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය** | බෝපත්තලාව හා නිකවැරටිය ගොවිපොළවල ගව නිවාස සංවර්ධනය කිරීම | 12.00 | 12.00 |
| | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් උසස් ආරයේ ගව ශුක්‍ර වඩි ආනයනය කිරීම හා ගව ශුක්‍ර ගබඩා පහසුකම් සැදීම | 38.00 | 27.05 |
| **නිලධාරීන් හා ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම** | | 2.77 | 0.42 |
| **ව්‍යාපෘති අධීක්ෂණය සහ පරිපාලන වියදම්** | | 1.80 | 0.08 |
| **මුළු එකතුව** | | **62.57** | **45.50** |

#### 1.2. මූල්‍ය බැදීම් - 2024

2024 වර්ෂයේ ක්‍රියාත්මක වූ, සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘතිය සඳහා ගෙවීමට තිබූ රු.මි. 6.43ක මුදල මේ හරහා ලබා දී ඇත.

### 2. කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය) වැය ශීර්ෂ අංක 118-2-03-079-2506

#### 2.1. මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවතාව තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මගින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ අර්ධ වශයෙන් ඉදිකළ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාලය සම්පූර්ණ කිරීම වෙනුවෙන් 2025 වසර සඳහා රු.මි. 40.00ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2025 වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කර, ඉදිකිරීම් කටයුතුවලට අදාළ බිල්පත් වෙනුවෙන් රු.මි. 21.79ක් ගෙවා ඇත.

ඡායාරූප අංක 01

#### 2.2. කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන (සාධාරණ මිලට දිනක් වයසැති කිකිළි පැටවුන් ලබාදීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළේ බිත්තර දමන කුකුළු අභිජනන ගොවිපොළ වැඩිදියුණු කිරීම)

දිනක් වයසැති කිකිළි පැටවුන් ගොවීන් වෙත සාධාරණ මිලකට ලබා දීම සඳහා කුකුළු අභිජනන ඒකකයක් ස්ථාපනය කිරීමට රු.මි. 47.60ක් ද, එහි මෙහෙයුම් හා පරිපාලන වියදම් වෙනුවෙන් රු.මි. 1.40ක් ද, වෙන් කර ඇත.

සමාලෝචිත කාල සීමාව තුළ දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් මාරවිල කුකුළු අභිජනන ගොවිපොළේ ධාරිතාව පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් මව් සතුන් 5,500 සඳහා සංවෘත කුකුළු නිවාසය ඉදිකිරීම් කටයුතුවලින් 70%ක් පමණ අවසන් කර ඇති අතර, ඒ සඳහා රු.මි. 32.86ක් වැය වී ඇත.

ඡායාරූප අංක 02

### 2.3. කිරි නිෂ්පාදන සංවර්ධන වැඩසටහන (කිරිවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම)

මෙම ව්‍යාපෘතිය ජාතික ප්‍රතිපත්ති රාමුව හා පශු සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති යෝජනා මාලාවට අනුකූලව ක්‍රියාත්මක වන අතර, ගොවිපොළ මට්ටමේ සංවර්ධන කටයුතු, පුහුණු වැඩසටහන් සහ අධීක්ෂණ ක්‍රමවේදයන් හරහා කිරි අස්වනු වැඩි කිරීම හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම මූලික අරමුණ කරගනිමින් ක්‍රියාත්මක කරන ලදී. බුරුලු ප්‍රදාහය (Mastitis) රෝගය කිරිවල ගුණාත්මකභාවය හා ප්‍රමාණය මත සැලකිය යුතු බලපෑමක් ඇති කරන ප්‍රධාන රෝගයක් වන අතර, මෙම ව්‍යාපෘතිය මඟින් රෝගය වැළැක්වීම හා පාලනය කිරීම තුළින් ගොවිපොළක කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම හා ගොවීන් අතර ගුණාත්මක කිරි නිෂ්පාදනය පිළිබඳ අවබෝධය වැඩිකිරීමෙන් කිරිවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම හරහා ගොවිපොළ මට්ටමින් කිරිවල ගුණාත්මකභාවය හා ප්‍රමාණය සැළකිය යුතු ලෙස ඉහළ නැංවිය හැකිය. ඒ අනුව, බුරුලු ප්‍රදාහ රෝගය හඳුනාගැනීම හා මර්දනය සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීමට මෙම ව්‍යාපෘතිය හරහා මූල්‍ය ප්‍රතිපාදන සපයන ලදී.

මෙම ව්‍යාපෘතිය උතුර, නැගෙනහිර, ඌව, සබරගමුව, දකුණ හා බස්නාහිර යන පළාත් 06කට අයත් දිස්ත්‍රික්ක 13ක් තුළ (යාපනය, වව්නියාව, මුලතිව්, මන්නාරම, කිලිනොච්චිය, මඩකලපුව, ත්‍රිකුණාමලය, මොණරාගල, රත්නපුරය, කෑගල්ල, මාතර, කොළඹ සහ කළුතර) ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ අතර, මෙහි මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම පහත පරිදි විය.

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන වෙන්කිරීම (රු. මි.) |
|---|---|
| බුරුලු ප්‍රදාහ (Mastitis) රෝග පාලන වැඩසටහන | 31.00 |
| පුහුණුව | 3.00 |
| පරිපාලන වියදම් | 1.00 |
| **මුළු එකතුව** | **35.00** |

සමාලෝචිත කාල සීමාව අවසානය වන විට වියදම් වූ මුදල රු.මි.15.42ක් වන අතර, CMT ප්‍රතිකාරක (Reagent), එන්නත් වැනි ඇතැම් ද්‍රව්‍ය සඳහා ලංසුකරුවන් මිල ගණන් ඉදිරිපත් කර නොමැති වීම, එම ද්‍රව්‍යවල පවතින හිඟතාව සහ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම වැනි හේතූන් නිසා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝජනය කිරීමට නො හැකි විය. බස්නාහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය පළාත් අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන බැවින්, අමාත්‍යාංශ ප්‍රතිපාදන අවශ්‍ය නො වන බවට දැනුම් දී ඇත.

ඡායාරූප අංක 03

### 2.4. අපනයන පහසුකරණ ව්‍යාපෘතිය

මේ සඳහා 2025 වර්ෂයේ දී වෙන් කර ඇති ප්‍රතිපාදන රු.මි.10.00කි. විසිතුරු මසුන්, කුකුළුමස් හා බිත්තර, සුරතල් පක්ෂීන්, සජීවී සතුන් සහ අනෙකුත් පශු සම්පත් නිෂ්පාදන අපනයන පහසුකරණය සඳහා රු. මි.9.71ක් ද, අමාත්‍යාංශයේ අධීක්ෂණ, ඇගයුම් හා පරිපාලන වියදම් වෙනුවෙන් රු.මි.0.29ක් ද වෙන් කර ඇත.

රටේ ආර්ථික වර්ධනයට සහ පෝෂණයට දායක වීමටත්, සත්ත්ව නිෂ්පාදන අපනයනය කිරීමෙන් විදේශ මුදල් ගෙන ඒමටත් විශාල ශක්‍යතාවක් පවත්නා ශ්‍රී ලංකාවේ පශු සම්පත් කර්මාන්තය අපේක්ෂිත ඵලදායිතා මට්ටම කරා ළඟා කර ගැනීමට බලපාන ක්ෂේත්‍රයේ ගැටලු නිසි පරිදි විසඳා ගැනීම හා මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම කාලීන හා අත්‍යවශ්‍ය කර්තව්‍යක් ව පවතී. එසේ ම, වර්තමාන

රජයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශයේ පශු සම්පත් හා ජලජ සම්පත් අපනයන ප්‍රවර්ධනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇත.

ඒ අනුව, සතුන් හා සත්ත්ව අපනයන ප්‍රවර්ධනය හා අපනයන ක්‍රියාවලිය විධිමත් කිරීමේ අභිප්‍රාය ඇති ව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ආදී අදාළ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කරගනිමින් අපනයන පහසුකරණය සඳහා සකස් විය යුතු ප්‍රතිපත්ති, මාර්ගෝපදේශයන් සකස් කිරීම සහ අපනයන විභවතාවන්, අවධානය යොමු කළ යුතු අඩුලුහුඩුකම් සහ අපනයනකරුවන්ගේ ගැටලු හා අවශ්‍යතා පිළිබඳ ව අවධානය යොමු කරමින් අපනයනයට සම්බන්ධ ආයතන අතර මනා සම්බන්ධීකරණක් පවත්වා ගනිමින් ක්ෂේත්‍රයේ දී නිලධාරීන් විසින් හඳුනාගත් කරුණු සහ ඉන් අනතුරු ව අපනයනකරුවන් හමුවේ හඳුනා ගන්නා ලද අවශ්‍යතා අනුව අපනයන පහසුකරණ වැඩපිළිවෙළ පෙළගස්වා ගැනීම මෙම ව්‍යාපෘතියෙන් සිදුකර ඇත.

එලෙස හඳුනාගත් ගැටලු පිළිබඳ ව දේශපාලන අධිකාරිය සහ අදාළ ආයතනවල වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු කරවූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම හඳුනාගත් ගැටලු සඳහා විසඳුම් යෙදීම පිණිස අදාළ අමාත්‍යාංශයීය ලේකම්වරුන්ගෙන් සමන්විත අන්තර් අමාත්‍යාංශයීය කමිටුවක් පත් කරන ලදී.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දායකත්වයෙන් චීනයට විසිතුරු මත්ස්‍ය හා පශු සම්පත් නිෂ්පාදන අපනයන බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය සහ අපනයන අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරන ලදී. චීනයට කුකුළු මස් අපනයනය කිරීමට පවත්නා බාධා/ගැටලු නිරාකරණය කිරීම පිණිස චීන රජයේ ඉල්ලීම අනුව අමාත්‍යාංශය, ස.නි. හා සෞ,දෙ. හා අදාළ කර්මාන්තවල පාර්ශ්වකරුවන්ගෙන් යුත් කමිටුවක් පත්කළ අතර, එම කමිටුව විසින් ගැටලු සාකච්ඡා කර මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. සිංගප්පූරුව, තුර්කිය හා ඕමානයට කුකුළු මස් අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කිරීම හා පවත්නා බාධා මඟහරවා ගනිමින් අවශ්‍ය පසුබිම සකස් කිරීමේ කටයුතු ස.නි. හා සෞ,දෙ. සමග එක්ව ක්‍රියාත්මක කර ඇත. එසේ ම, පරිගණක දත්ත පද්ධතිය නිර්මාණය කිරීමේ කටයුතු ස.නි. හා සෞ,දෙ. මැදිහත් වීමෙන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, ඉදිරියේ දී එය ක්‍රියාත්මක වනු ඇත.

විසිතුරු මසුන් සහ පශු සම්පත් නිෂ්පාදන අපනයනයට පවතින නීතිමය හා නියාමන ගැටලු, තාක්ෂණික හා නියාමන ගැටලු, ජාත්‍යන්තර නියාමන ගැටලුවලට විසඳුම් යෙදීමේ ක්‍රියාවලිය වසර පුරා ම ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය යටතේ වියදම් කර ඇති මුදල රු.මි.0.31කි.

ඡායාරූප අංක 04

### 2.5. ධාරිතා සංවර්ධන වැඩසටහන

2025 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.5.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වී ඇත. නිලධාරීන්, ගොවීන් හා තරුණ ව්‍යවසායකයන්ගේ ධාරිතා සංවර්ධනය හා පශු සම්පත් ප්‍රතිපත්ති සම්පාදනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට රු.මි.0.34ක් වැය කර ඇත.

### 2.6. මූල්‍ය බැදීම් - 2024

2024 වර්ෂයේ ක්‍රියාත්මක වූ, සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘතිය සඳහා ගෙවීමට තිබු රු. මි.11.00ක මුදල මේ හරහා ලබා දී ඇත.

## 3. කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන සහායන්)
වැය ශීර්ෂ අංක 118-2-03-079-2202

### 3.1. කිරි සංවර්ධන ව්‍යාපෘතිය

කිරි ගවයින්ගේ පෝෂණය වැඩිදියුණු කිරීමේ අරමුණින් කිරිගව සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි.72.00ක් වෙන් කර ඇති අතර, මෙම ව්‍යාපෘතිය යටතේ උපව්‍යාපෘතීන් තුනක් (03ක්) ක්‍රියාත්මක කරන ලදී.

- **කිරි ගවයින්ගේ පෝෂණය වැඩිදියුණු කිරීම (තෘණ සංවර්ධන වැඩසටහන)**

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද " ගුණාත්මක තෘණ ප්‍රභේද හඳුන්වා දීම සහ වැඩිදියුණු කළ පෝෂණ කළමනාකරණ භාවිතයන් මගින් සුළු පරිමාණ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ " ප්‍රතිලාභීන් අතුරින් තෝරා ගත් ප්‍රතිලාභීන් 16ක් වෙත විසිරි ජලසම්පාදන පද්ධති සහ අදාළ උපකරණ, සයිලේජ් නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආදි යෙදවුම් ලබා දීමට සැලසුම් කරන ලදී. මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය විසින් දරන උපරිම දායකත්වය රු.150,000ක් වන අතර, එය අදාළ ව්‍යාපෘති පිරිවැයෙන් 50%ක් වේ. ඉතිරි 50% දායකත්වය ප්‍රතිලාභියා විසින් දරනු ලැබේ. 2025 වර්ෂය අවසාන වන විට ප්‍රතිලාභීන් 15 දෙනෙකු සඳහා රු.මි. 2.18ක් වටිනා යෙදවුම් ලබා දී ඇත.

- **කිරිගව සංවර්ධන වැඩසටහන (තෘණ සංවර්ධන වැඩසටහන)**

ගුණාත්මක සත්ත්ව ආහාර සුලබ කිරීම, කිරි ගවයින්ගේ පෝෂණ මට්ටම නංවාලීම සඳහා වැඩිදියුණු කළ තෘණ ප්‍රභේද වගා කිරීම දිරිමත් කිරීම, ආදායම් උත්පාදන ක්‍රියාකාරකමක් ලෙස තෘණ සහ සයිලේජ් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ජලය කාර්යක්ෂම ව භාවිත කිරීම වැඩිදියුණු කිරීම උදෙසා තෘණ වගාව සඳහා නව තාක්ෂණයන් හඳුන්වා දීම උදෙසා මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 269 දෙනෙකු වෙත බිම් සකස් කිරීම, තෘණ වගාව ස්ථාපිත කිරීම, මායිම් වැට සකස් කිරීම යනාදී කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීමට සැලසුම් කරන ලදි. මෙම ව්‍යාපෘතිය පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කළ අතර, මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය විසින් දරන උපරිම දායකත්වය රු.150,000ක් වන අතර, එය අදාළ ව්‍යාපෘති පිරිවැයෙන් 50%ක් වේ. ඉතිරි 50% දායකත්වය ප්‍රතිලාභියා විසින් දරන ලදී. 2025 වර්ෂය අවසානය වන විට ප්‍රතිලාභීන් 264 දෙනෙකු සඳහා රු.මි. 38.25ක් වටිනා යෙදවුම් ලබා දී ඇත.

ඡායාරූප අංක 05 - 06

- **උතුරු පළාතේ දිත්වා සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ සතුන්ට ගව ආහාර ලබා දීම**

2025 වර්ෂයේ නොවැම්බර් මාසයේ දිවයිනට බලපෑ දිත්වා සුළි කුණාටුව සහ ගංවතුර තත්ත්වය හේතුවෙන් උතුරු පළාතේ පිහිටි ස්වභාවික තෘණ භූමි සහ වගා කළ තෘණ භූමි විශාල ප්‍රමාණයක් විනාශ වීම නිසා අවදානමකට ලක් වූ සතුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම උදෙසා සාන්ද්‍ර ආහාර ලබා දීමට සැලසුම් කරන ලදී. 2025 වර්ෂය අවසානය වන විට මෙම වැඩසටහන යටතේ බලපෑමට ලක් වූ ගොවිපොළ 4,749ක සතුන් සඳහා රු.මි.28.00ක වටිනාකමින් යුතු සාන්ද්‍ර ආහාර කි.ග්‍රෑ.266,650ක් බෙදා හැර ඇත.

### 3.2. සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

2025 වර්ෂය සඳහා සෞඛ්‍යාරක්ෂිත ව පවත්වාගෙන යනු ලබන තිරසාර කුඩා පරිමාණ බිත්තර දමන කුකුළු ඒකක පිහිටුවීම වෙනුවෙන් රු.මි.9.71ක් ද, අමාත්‍යාංශයේ හා පළාත්වල අධීක්ෂණ, ඇගයීම හා පරිපාලන වියදම් වෙනුවෙන් රු.මි.0.29ක් ද වෙන් කර ඇත.

මේ යටතේ, ග්‍රාමීය ප්‍රජාව තුළ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම හා ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් ජීවන තත්ත්වය නඟා සිටුවීම අරමුණු කරගෙන කුඩා පරිමාණ බිත්තර දමන ඒකක පිහිටුවීම අපේක්ෂා කරන ලදි. එහිදී සෞඛ්‍යාරක්ෂිත ව පැටවුන් රැකබලා ගැනීම තුළින් තිරසාර ව මෙම ව්‍යාපෘතිය වසර කිහිපයක් පවත්වා ගැනීම සඳහා එක් ප්‍රතිලාභියකු වෙත මසක් වයසැති ගම් කිකිළි පැටවුන් 25ක් ලබා

දීම සිදු විය. මෙම පැටවුන් 25 අවශ්‍යතාව මත උපරිම පිරිමි කුකුළු පැටවුන් 3ක් ලබා දීමේ හැකියාව ඇත. ප්‍රතිලාභියාගේ 50% දායකත්වය යටතේ කූඩුව සාදා ගැනීම සහ කෑම සපයා ගැනීම හා නඩත්තුව සිදු කළ යුතු වේ.

උතුර, උතුරු මැද, නැගෙනහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය යටතේ ගොවිපොළවල් 448 ක් ස්ථාපනය කර ඇති අතර, මේ සඳහා රු.මි.9.86 ක් වැය වී ඇත.
ඡායාරූප අංක 07

### 3.3. සූකර සංවර්ධන වැඩසටහන

පාරිසරික ගැටලු අවම කර, පරිසර හිතකාමී සූකර ගොවිපොළ සංවර්ධනය සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර, සූකර ගොවිපොළවල් 61ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි.12.60ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

එහෙත්, අප්‍රිකානු සූකර උණ වෛරස් රෝගය හේතුවෙන් කඩා වැටී ඇති සූකර කර්මාන්තය නඟා සිටුවීම සඳහා වූ ජාතික කාර්ය සාධන බලකා කමිටු තීරණය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රු.මි.12.60 ක ප්‍රතිපාදන අප්‍රිකාණු සූකර උණ රෝගය හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ කට්ටල මිලදී ගැනීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලදී. සූකර උණ රෝගය නිර්ණය කිරීම හා ආවේක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන 02 ක් සිදු කරන ලදී. නමුත් අමාත්‍යාංශ ප්‍රතිපාදන ඒ සඳහා උපයෝජනය නොවුනි.

### 3.4. මුල්‍ය බැදීම් - 2024

2024 වර්ෂයේ ක්‍රියාත්මක වු, කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධන වැඩසටහන සඳහා ගෙවීමට තිබු රු.මි.5.40ක මුදල මේ හරහා ලබා දී ඇත.

## 4. එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධනය ව්‍යාපෘතිය (සංවර්ධන සහායන්) වැය ශීර්ෂ අංක 118-02-03-080-2202

2025 වසරේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පශු සම්පත් සංවර්ධන අංශය විසින් එළු කිරි හා එළු මස් සුලබ කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.91.85 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, එළු ගොවිපොළ ඒකක වැඩිදියුණු කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය යටතේ එළු ගොවිපොළ 445ක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙහිදී දැනටමත් පිහිටුවා ඇති එළු ගොවිපොළ සඳහා සතුන් ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරන ලද අතර, එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය විසින් දරන උපරිම දායකත්වය යටතේ සතුන් 10 ක් මිලදී ගැනීමට (ගැහැණු සතුන් 09ක් හා පිරිමි සතුන් 01ක්) රු. 300,000ක් හෝ සතුන් 05ක් මිලදී ගැනීමට (ගැහැණු සතුන් 04ක් හා පිරිමි සතුන් 01ක්) රු.150,000ක් ලබා දෙන අතර, එය අදාළ ව්‍යාපෘති පිරිවැයෙන් 50%ක් වේ. ඉතිරි 50% දායකත්වය ප්‍රතිලාභියා විසින් දරනු ලැබේ. 2025 වර්ෂය අවසානය වන විට සතුන් 05ක ඒකක 253ක් වැඩිදියුණු කිරීම සඳහා රු.මි. 38.47ක් ද, සතුන් 10 ඒකක 94ක් වැඩිදියුණු කිරීම සඳහා රු.මි. 28.58ක් ද ප්‍රතිපාදන වැය කර ඇත.

ඡායාරූප අංක 08 - 09

## 5. එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධනය ව්‍යාපෘතිය (යටිතල පහසුකම් සංවර්ධනය) වැය ශීර්ෂ අංක 118-02-03-080-2506

2025 වසර සඳහා එළු කිරි හා එළු මස් සුලබ කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා වෙන් කරන ලද මුදල රු.මි.108.15 කි. රට තුළ පවතින එළු මස් අවශ්‍යතාවයට දායක වීම සඳහා මස් නිෂ්පාදනය අරමුණු කරගෙන බෝයර් එළුවන් හඳුන්වා දීම, බෝයර් එළුවන් ඇති කිරීම

ප්‍රවර්ධනය කිරීම සහ බෝයර් එළු ගොවිපොළ ආරම්භ කිරීම සඳහා ගොවීන් වෙත අභිජනන ද්‍රව්‍ය ලබා දීම අරමුණු කර ගෙන මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ බෝපත්තලාව ගොවිපොළෙහි, එළු අභිජනන ගොවිපොළ පිහිටුවීම සඳහා බෝයර් එළුවන් 100ක් ආනයනය කිරීමට සැලසුම් කරන ලදී. මෙහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර සැපයුම්කරුවෙක් තෝරා ගන්නා ලද අතර, එළුවන් ආනයනයට අදාළව සත්ත්ව සෞඛ්‍ය ක්‍රමවේදය ( Animal Health Protocol) සම්බන්ධව ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට එකඟතාවයට එළඹීමට නොහැකි වීම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

මෙයට අමතරව මෙම ව්‍යාපෘතිය යටතේ අභිජනන ගොවිපොළ සහ අභිජනන ද්‍රව්‍යවල නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි කිරීම, ගොවිපොළෙහි යටිතල පහසුකම් වැඩි කිරීම සහ තෘණ වගාවේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීම උදෙසා උතුරු පළාතේ, වවුනියාව, වෙක්කඩිපුලාවු ප්‍රාදේශීය පශු සම්පත් ගොවිපොළෙහි ස්ථාපිත කර ඇති පළාත් එළු අභිජනන ගොවිපොළ වැඩිදියුණු කිරීමට සැලසුම් කරන ලදී. 2025 වර්ෂය අවසාන වන විට රු.මි. 18.87ක ප්‍රතිපාදන මඟින් ගොවිපොළ වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර ඇත.

ඡායාරූප අංක 10 - 11

**2025 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය**

### 1. අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය - සංරචක II (Inclusive Connectivity Development Project – ICDP)

ලෝක බැංකු ණය ආධාර යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලබාදී ඇති මෙම ව්‍යාපෘතියේ කෘෂිකර්මයට අදාල සංරචක II කොටස පශු සම්පත් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. එමගින් දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික්ක 12ක "කිරි ගොවීන් සංවිධානගත කර බලගැන්වීම මඟින් ඔවුන්ගේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම සහ කිරි අගයදාමය වැඩිදියුණු කිරීම" වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

මෙහිදී කිරි අගයදාමය වැඩිදියුණු කිරීම සහ සැපයුම්දාමය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මූලික යෙදවුම් වන ගොවිපළවල නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමෝපායික ප්‍රවේශයන් හඳුන්වා දීම තුළින් ක්‍රමවත් නිෂ්පාදන සැලැස්මක් ඇති කිරීම සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණය සහ යෙදවුම් හඳුන්වා දීම, විකල්ප බලශක්ති ප්‍රභවයන් ලෙසින් සූර්ය බලශක්තිය උපයෝගී කර ගනිමින් කිරි ශීතකළ හැකි උපකරණ හඳුන්වා දීම, තෘණ වගාකරුවන් බිහි කිරීම සහ ඔවුන් ව්‍යවසායකයින් බවට පරිවර්තනය කිරීම, සවස කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කිරීම සඳහා කිරි ශීතකිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම මෙන්ම බුරුළු ප්‍රදාහය ඇතුළු ආර්ථිකව වැදගත්වන රෝග පාලනය කිරීමට මෙන්ම ව්‍යාප්ති සේවාවන් ක්‍රමානුකූල කිරීමටද අදහස් කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.3,000ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර සමාලෝචිත කාල සීමාව අවසන් වන විට කිරි අගයදාම සංවර්ධන ක්‍රියාකාරකම් හා ආශ්‍රිත පුනරාවර්තන වියදම රු.මි.7.94 ක් විය.

මෙලෙස ක්‍රියාත්මක වූ අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතියේ සංරචක II ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2025 වසරේ අගභාගයේදී දිවයිනට බලපෑ දිට්වා සුලිකුණාටු තත්ත්වය හේතුවෙන් මහා මාර්ග වලට සිදුවූ හානි පූරණය කිරීම වෙනුවෙන් ICDP II සංරචකයට වෙන් කර තිබූ මුදලද සම්පූර්ණයෙන් ICDP I සංරචකය යටතට ලබා දෙමින් මෙම ව්‍යාපෘතිය ප්‍රති ව්‍යුහගත කිරීමක් සිදුකරන ලදී.

## පශු සම්පත් අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

## 01. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

### 1.2. මෙහෙවර

නිරෝගිමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

### 1.3. අරමුණු

- සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවලිත කිරීම.
- තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- පශු එන්නත්සාර සහ අනෙකුත් පශු ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පරීක්ෂණාගාර සේවා සම්මත පරීක්ෂණාගාර තුළදී ඉටුකර දීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පනත් සහ රෙගුලාසි අවශ්‍ය විටදී සංශෝධනය කිරීම, ඒ සඳහා උපදෙස් ලබාදීම හා නිරීක්ෂණය කිරීම.
- තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය.
- කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- පරිසර හිතකාමී, විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම.
- සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.

### 1.4. කාර්යයන්

- ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජාතික කෘත්‍රිම සිංචන වැඩසටහන මෙහෙයවීම.
- පෝෂ්‍ය තෘණ හා සයිලේජ් නිෂ්පාදනය සහ තෘණ අලෙවිකරණය ප්‍රවලිත කිරීම.
- රෝග වැළැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- දේශීය ව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශුව, රැනිකට්) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- බුරුලු ප්‍රදාහය වැළැක්වීම, සුව කිරීම සහ බුරුලු නික්ෂේපණ නිෂ්පාදනය.
- සැල්මොනෙල්ලෝසිස් හා රැනිකට් රෝග පාලනය.

- අතිව්‍යාධිජනක කුරුලු උණ රෝගයට එරෙහි ව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ශන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.
- කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම.
- පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවන් සැපිරීම.
- කිරි තාක්ෂණ පරීක්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම.
- පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම.
- ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම.
- දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ත්ව ආහාර සුලබ කිරීම තහවුරු කිරීම.
- පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය.
- කුකුළු පාලනයට අදාළ නියාමන කටයුතු.
- සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු.
- අන්තර්ජාතික වෙළෙඳාම් පහසුකරණය.
- නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරික්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම.
- පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල/ සීප්පුකුලම) පවත්වාගෙන යාම.
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.
- ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මඟින් තොරතුරු බෙදාහැරීම.
- ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන පැවැත්වීම.
- පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයන සිදුකිරීම.
- පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම.
- පරිසර හිතකාමී පශු සම්පත් ගොවිපොළ පහසුකරණය.
- ව්‍යාප්ති සේවාවන් සැපයීම.

## 1.5. ආයතනය මගින් ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසාර සංවර්ධන අරමුණු

- අරමුණ 01 - සියලු තැන්හි පවතින සෑම ආකාරයක ම දුගී බව අවසන් කිරීම
- අරමුණ 02 - සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාව හා යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
- අරමුණ 08 - ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීම

## 1.6. ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 95.00 | 38.58 | 40.61 |
| 2 | පුනරාවර්තන | 938.38 | 929.85 | 99.09 |
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| 1 | සත්ත්ව සෞඛ්‍ය හා පශු පර්යේෂණ | 262.00 | 175.34 | 67 |
| 2 | පශු සම්පත් සංවර්ධන සහ පුහුණු | 360.00 | 233.19 | 65 |
| | **විදේශ ව්‍යාපෘති** | | | |

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ගුණාත්මක තෘණ/පෝෂ්‍ය ආහාර ප්‍රභේද හඳුන්වාදීම සහ වැඩිදියුණු කළ පෝෂණ කළමනාකරණ පුරුදු තුළින් කුඩා පරිමාණ කිරි ගොවීන්ගේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- FAO | 0.11 | 0.06 | 57 |
| 2 | ඉස්සන් ආශ්‍රිත රෝග ආවේක්ෂණ වැඩසටහන - FAO | 0.59 | 0.36 | 60 |
| | **විශේෂ ව්‍යාපෘති** | | | |
| 1 | ආපදා සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ | 2,200.00 | 2,200.00 | 100 |

**සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.**

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| 1 | සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | 185.00 | 133.35 | 72.08 |
| 2 | පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | 85.00 | 57.97 | 68.20 |
| 3 | උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීය ව නිෂ්පාදනය කිරීම | 24.00 | 18.64 | 77.67 |
| 4 | කුර හා මුඛ රෝග එන්නත දේශීය ව නිෂ්පාදනය | 38.00 | 12.20 | 32.11 |
| 5 | සතුන්ගේ බෝවන රෝග වැළැක්වීමේ වැඩසටහන | 45.00 | 43.77 | 97.27 |
| 6 | බූරුලු ප්‍රදාහ පාලන වැඩසටහන | 22.40 | 9.56 | 42.68 |
| 7 | සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම | 25.00 | 24.90 | 99.60 |
| 8 | සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | 20.00 | 7.33 | 36.65 |
| 9 | වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන | 2.00 | 0.86 | 43 |
| 10 | පශු විමර්ශණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්‍ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම | 5.00 | 4.13 | 82.60 |
| 11 | තත්ත්ව ආරක්ෂණ වැඩසටහන, සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන, පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන, පොත් හා ප්‍රකාශන වැඩසටහන | 22.00 | 4.35 | 19.78 |
| 12 | ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණයට සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම | 40.00 | 28.18 | 70.45 |
| 13 | පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | 15.00 | 12.90 | 86 |
| 14 | කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | 10.00 | 8.66 | 86.60 |
| 15 | පුහුණු ධාරිතාව ඉහළ නැංවීම | 10.00 | 7.65 | 76.50 |
| 16 | සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය | 5.00 | 0.32 | 6.40 |
| 17 | කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදාහැරීම ඉහළ නැංවීම | 100.00 | 45.72 | 45.72 |

## 1.7. 2025.12.31 වන විට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

### 1. මානව සම්පත් සංවර්ධන අංශය

#### 1.1. සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම

සමාලෝචිත කාලසීමාව අවසන් වන විට කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ පශු සම්පත් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 6) සඳහා සිසුන් 46ක් පුහුණුව ලබන අතර, එම සිසුන්ගේ විභාග පැවැත්වීම හා ගොවිපොළ අලුත්වැඩියාව සඳහා භාණ්ඩ/සේවා මිලදී ගැනීමේ කටයුතු 2025.12.31 වන විට සම්පූර්ණයෙන් අවසන් කර ඇත. සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ නේවාසික ව සිසුන් 25ක් සිටින අතර මුළු සිසුන් 45ක් (NVQ 04) පාඨමාලාව හදාරනු ලැබේ.

ඡායාරූප අංක 12 - 14

#### 1.2 පුහුණු ධාරිතාව ඉහළ නැංවීම

2025.12.31 දින වන විට මේ යටතේ පුහුණු වැඩසටහන් 38ක් පවත්වා ඇති අතර, කාර්යක්ෂමතා කඩඉම් විභාග I /II/ III යටතේ විභාග 06ක් පවත්වා ඇත. පශු පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමේ විභාග 01ක් පවත්වා ඇත.

#### 1.3 පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන

මේ යටතේ සමාලෝචිත කාලසීමාව අවසන් වන විට ගුවන්විදුලි ප්‍රචාරක වැඩසටහන් 75ක් සහ රූපවාහිනී හා වීඩියෝ වැඩසටහන් 138ක් ඉදිරිපත් කිරීමට හැකි වී ඇති අතර, පශු සම්පත ප්‍රචලිත කිරීමේ මාධ්‍ය වැඩසටහනට සමගාමී ව පොත් 12ක් මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කර ඇත.

#### 1.4 පොත් හා ප්‍රකාශන

2025.12.31 වන විට Dairy Hub ව්‍යාපෘතියට සමගාමී ව එහි ප්‍රචාරණ කටයුතු සඳහා ලිපිගොනු කවර 5,000ක් සහ අත් පත්‍රිකා 2,000ක් මුද්‍රණය කර ඇත.

### 2. පශු අණපනත් හා නිතී අංශය

#### 2.1. සතුන් හඳුනා ගැනීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාපෘති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදු කරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සතුන් 15,236 දෙනෙකුගේ කන් සලකුණු සවි කර ඇති අතර, බෙදා හරින ලද කන් සලකුණු ප්‍රමාණය 46,376කි. එසේම කන් සලකුණු, Marker Pens, Tag Pinsහි ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන ඒකකයට යවා ඇති අතර, රු.මි.7.00ක උප ලේබන මුද්‍රණය කර අවසන් වී ඇත.

#### 2.2. සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.05ක් වෙන් ව තිබුණ ද, ඉඩමෙහි අයිතිය පිළිබඳ ගැටලුවක් මත කොළඹ සත්ත්ව නිරෝධායන කාර්යාලයේ අලුත්වැඩියා කිරීමේ කාර්යය ප්‍රමාද වී ඇත. එසේ ම එහි ඇති දාහකය (Incinerator) පුරාවිද්‍යා ස්මාරකයක් බැවින් එම නිර්ණායක යටතේ අදාළ කාර්යය සිදු කිරීමට උපදෙස් දී ඇත.

#### 2.3 තත්ත්ව ආරක්ෂණ වැඩසටහන

"තත්ත්ව ආරක්ෂණ හා නිරෝධායන කටයුතු" වැඩසටහන යටතේ සිදු කරනු ලබන කාර්යයන් සඳහා හඳුනා ගත් ඉලක්ක වන සත්ත්ව ආහාර සම්බන්ධ කටයුතු, පශු ඖෂධ අධිකාරියේ කටයුතු, සත්ත්ව හා සත්ත්ව නිෂ්පාදන ආනයන හා අපනයන සඳහා පූර්ව නිෂ්කාශන නිකුත් කිරීම සහ නිරෝධායන

කටයුතු ආවේක්ෂණය කිරීම යන කාර්යයන් සඳහා සමාලෝචිත කාල සීමාව තුළ සමස්ත වශයෙන් 98%ක පමණ ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

**3 සත්ත්ව සෞඛ්‍ය අංශය**

**3.1 සතුන්ගේ බෝවන රෝග වැළැක්වීමේ වැඩසටහන**

මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුදල රු.මි. 45.00ක් වන අතර, මේ යටතේ කිරි නිෂ්පාදන කර්මාන්තය සඳහා බලපාන හඳුනාගත් ප්‍රධාන රෝග 05ක් සඳහා එන්නත්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙම එන්නත්කරණ වැඩසටහන් රෝගය අනුව පහත ප්‍රදේශවල ක්‍රියාත්මක වේ.

| # | රෝගය | බෙදාහරින ලද එන්නත් වඩි ප්‍රමාණය | එන්නත් කරන ලද සතුන් ගණන | පළාත්/ප්‍රදේශ |
|---|---|---|---|---|
| 1. | කුර හා මුඛ රෝගය (FMD) | 300,660 | 254,204 | මුළු දිවයින පුරා |
| 2. | ගව රක්තාශ්‍රව රෝගය (HS) | 125,040 | 155,252 | උතුරු මැද, උතුරු හා නැගෙනහිර පළාත් |
| 3. | කාල ගාත්‍ර රෝගය (BQ) | 101,937 | 97,899 | උතුරු, උතුරු මැද හා වයඹ පළාත් |
| 4. | සමේ ගැටිති රෝගය (LSD) | 41,780 | 5,885 | උතුරු මැද, ඌව, මධ්‍යම, වයඹ, සබරගමු, උතුරු, නැගෙනහිර හා දකුණු පළාත් |
| 5. | බෲසෙල්ලෝසිස් (Bovine Brucellosis) | 10,200 | 6,468 | අම්පාර, අනුරාධපුර, මඩකලපුව, පුත්තලම, මොණරාගල, වව්නියා, නුවරඑළිය, පොලොන්නරුව, හම්බන්තොට, බදුල්ල, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, කුරුණෑගල හා මන්නාරම යන දිස්ත්‍රික්ක |

පසුගිය වසරට සාපේක්ෂ ව කුර හා මුඛ රෝගය වාර්තා වීම 33%කින් අඩු වී ඇති අතර, කාලගාත්‍ර රෝග තත්ත්වය 100%ක් පාලනය කිරීමට හැකි වී ඇත. මෙම වැඩසටහන සඳහා වෙන් කළ මුදල සම්පූර්ණයෙන් වැය වී ඇති අතර, 2025.12.31 වන විට 100%ක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට හැකි වී ඇත.

**3.2. වනජීවී රෝග ආවේක්ෂණ මඟින් මිනිසාට හා ගොවිපොළ සතුන්ට වනජීවීන් හරහා රෝග සම්ප්‍රේෂණය අවම කිරීමේ ව්‍යාපෘතිය**

මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි.02.00ක මුදලක් වෙන්කර ඇති අතර, වනජීවීන් මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයට බලපෑ හැකි රෝග හඳුනා ගැනීම සිදු කරයි. මෙම වැඩසටහන අම්පාර, දඹුල්ල, අනුරාධපුර, හම්බන්තොට, හෝමාගම, කුණ්ඩසාලේ, මාන්කුලම්, පොළොන්නරුව හා රත්නපුර යන ප්‍රදේශවල ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ දැනට පශු විමර්ශණ මධ්‍යස්ථානවල පශ්චාත් මරණ පරීක්ෂණ 63ක් සිදුකර ඇති අතර, සූකර කර්මාන්තයට වැදගත් වන සූකර උණ රෝගය වනාශ්‍රිත ඌරන් තුළ ද පවතින බව හඳුනාගෙන ඇත. 2025.12.31 දිනට මෙම ව්‍යාපෘතිය 70%ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

**3.3. කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම**

මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි.05.00ක මුදලක් වෙන් කර ඇති අතර, මත්ස්‍ය අපනයන කටයුතුවල දී අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදුකර ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම හා මත්ස්‍ය අපනයන ගොවිපොළවල් ලියාපදිංචිය සඳහා ජෛව ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරලීම මෙන් ම ලියාපදිංචියට අවශ්‍ය නිර්දේශයන් ලබා දීම මෙමඟින් සිදු කරයි.

මෙම ව්‍යාපෘතිය මත්ස්‍ය අපනයන ගොවිපොළ පිහිටීම අනුව බස්නාහිර පළාත, උතුරුමැද පළාත සහ මාතර, කෑගල්ල, හලාවත, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කෙරේ. ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානය හා එක් ව PVS Aquatic Animal Health

Mission නම් වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, මෙමගින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය කර්මාන්ත හා මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබා ගැනීම සිදු කෙරිණි.

රටේ ඇති වූ අප්‍රිකානු සූකර උණ වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් ගත් විශේෂ තීරණයකට අනුව එම රෝගී තත්ත්වය පාලනය සඳහා අවශ්‍ය යෙදැවුම් මෙම වැඩසටහන යටතේ ලබාදීමට පියවර ගත් අතර, ඒ අනුව එම යෙදැවුම් දිවයින පුරා ඇති හඳුනාගත් ගොවිපොළ වෙත බෙදාහැරීම ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මඟින් සිදුකරන ලදී.

මෙම වැඩසටහන මගින් මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන අපනයන මත්ස්‍ය ගොවිපොළ 115ක ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හැකි වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2025.12.31 වන විට රු.මි.4.13ක මුදලක් වැය කර ඇති අතර, 95%ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

### 3.4. කුකුළු රෝග කළමනාකරණය හරහා කුකුළු මස් හා බිත්තර අපනයනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය හරහා මුළු දිවයින ම ආවරණය වන පරිදි කුරුලු උණ, රැනිකට් හා සැල්මොනෙල්ලා යන රෝග තත්වයන් පාලනය සිදුකරයි.

ඒ අනුව අභිජනන ගොවිපොළ, බීජ රක්කනාගාර හා බිත්තර අපනයන ගොවිපොළවල ජෛව ආරක්ෂණ ක්‍රමවේදයන් අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබන අතර, වාර්ෂික ලියාපදිංචිය සඳහා නිර්දේශයන් ලබා දේ. වාණිජමය බිත්තර අපනයන කුකුළු ගොවිපොළ වෙත ආර්ථිකමය වශයෙන් වැදගත් වන කුකුළු රෝග සඳහා පරීක්ෂා කර බිත්තර අපනයනයට අවශ්‍ය සෞඛ්‍ය සහතික නිකුත් කිරීමෙන් අපනයනය ප්‍රවර්ධනය කිරීමට හැකි වී ඇත.

රැනිකට් රෝග පාලනය සඳහා අදාළ එන්නත් දිවයින පුරා පශු වෛද්‍ය කාර්යාල හා පශු විමර්ශන මධ්‍යස්ථාන මඟින් බෙදා හැරීම සිදු කරන අතර, 2025.12.31 වන විට රැනිකට් එන්නත් වඩි 4,485,200ක් බෙදාහැර ඇත. මෙම එන්නත් සුළු පරිමාණ ගොවිපොළ සඳහා නොමිලේ ලබාදෙන අතර, මෙමගින් වසංගත රෝගී තත්ත්වයක් ඇති නොවන මට්ටමට රෝගය පාලනය වී ඇත.

සැල්මොනෙල්ලා රෝග පාලන වැඩසටහන යටතේ සමාලෝචිත කාල සීමාව අවසන් වන විට කුකුළු අභිජනන ගොවිපොළ නිරීක්ෂණ 93ක් සහ බීජ රක්කවනාගාර නිරීක්ෂණ 111ක් සිදුකර ඇත. කුරුලු උණ ආවේක්ෂණ කටයුතු යටතේ රුධිර සාම්පල 3,442ක් හා වසුරු සාම්පල සහ Cloacal swabs 22,492ක් රෝග පරීක්ෂාව සඳහා යොමුකර ඇත. අභිජනන ගොවිපොළ හා බීජ රක්කනාගාරවල සැල්මොනෙල්ලා රෝග තත්ත්වයන් පාලනය කිරීමෙන් වාණිජ ගොවිපොළ සඳහා එම රෝගය පැතිරීයාම පාලනය කර ඇත. තව ද, කුරුලු උණ ආවේක්ෂණය මඟින් කුරුලු උණෙන් තොර රටක් පවත්වා ගැනීමට හැකි වී ඇත. 2025.12.31 දිනට මෙහි භෞතික ප්‍රගතිය 95%කි.

## 4. පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය

### 4.1. සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන

මේ යටතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන දත්ත, සත්ත්ව ගහණය, සත්ත්ව ගොවිපොළ ලියාපදිංචි සංඛ්‍යාව මාසික ව හා කාර්තුමය වශයෙන් දත්තයන් ලබා දෙන අතර, පශු වෛද්‍ය කාර්යාලවල මානව හා භෞතික සම්පත්වල තොරතුරු එකතු කරනු ලැබේ. එම තොරතුරු ආශ්‍රිත ව Livestock Statistical Bulletin, Livestock Outlook, වාර්ෂික වාර්තාව වැනි ප්‍රකාශන ප්‍රකාශයට පත් කරනු ලබයි. එසේ ම ක්ෂේත්‍රයේ ව්‍යාවසායකයින්ගේ සහ නිෂ්පාදකයින්ගෙන් ලබා ගන්නා දත්ත පදනම් කර ගනිමින් Poultry Forecast, Poultry Monthly Bulletin, Dairy Bulletin ප්‍රකාශයට පත් කරයි. 2025.12.31 වනවිට Poultry Forecast, Livestock Statistical Bulletin, Livestock Outlook සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික වාර්තාව යන ප්‍රකාශන සකස්කර අවසන් ව ඇත.

තව ද ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහනට අදාළ පෝරම හා නාමලේඛන පොත් මුද්‍රණය කර පළාත් මට්ටමින් නිකුත් කිරීම සඳහා පළාත් 09 වෙත බෙදා හැරීමේ කාර්යය සිදුකර ඇත. සමාලෝචිත

කාල සීමාව අවසන් වන විට ලියාපදිංචි වී ඇති මුළු ගොවිපොළ සංඛ්‍යාව 46,009ක් වේ. මෙම අංශය වෙත පශු වෛද්‍ය කාර්යාල හරහා ලැබෙන දත්තවල ප්‍රශස්ත බව වැඩි කිරීමේ අරමුණින් මේ වන විට දිවයින පුරා පළාත් 09 ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු පවත්වනු ලැබේ.

### 4.2. පශු වෛද්‍ය ක්ෂේත්‍රයේ සේවා සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම

2023 සිට සතුන් සහ සත්ත්ව නිෂ්පාදන ආනයනය හා අපනයනය සම්බන්ධ ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය සහ ජාලකරණය කිරීම සඳහා VRRAS ව්‍යාපෘතිය ආරම්භ කිරීම තුළින් ආනයන හා අපනයන කටයුතුවලට ගතවන කාලය අවම කිරීම සහ ජාත්‍යන්තර වෙළෙඳාමේ නියැලී සිටින ප්‍රජාවගේ ක්‍රියාවලීන් පහසු කිරීම සඳහා දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ. එය පශු අණ පනත් සහ නීති අංශය, පශු පර්යේෂණ ආයතනය සහ සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානවල කටයුතු ඩිජිටල්කරණ සහ ජාලකරණ ක්‍රියාවලියකි.

එහි සංවර්ධන කටයුතු සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් බාහිරින් සේවා ලබා ගනී. පශු පර්යේෂණ ආයතනයෙහි උප පද්ධතිවලට අදාළ විවිධ වර්ගයේ මොඩියුල පවතින අතර ඒවා දැනටමත් සංවර්ධනය කර සහ පරිශීලක ප්‍රතිග්‍රහණ පරීක්ෂණයට (User Acceptance Test) ද භාජනය වී ඇත. පශු අණ පනත් සහ නීති අංශයට සහ නිරෝධායන කාර්යාලවලට අදාළ උප පද්ධති තවමත් සංවර්ධනය වෙමින් පවතින අතර, මෙම වසර තුළ සමස්ත පද්ධතිය ම ක්‍රියාත්මක වීමට අපේක්ෂිත ය.

## 5. පශු පර්යේෂණ ආයතනය

### 5.1. උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීය ව නිෂ්පාදනය කිරීම

මෙම ව්‍යාපෘතිය මඟින් උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීය ව නිෂ්පාදනය තවදුරටත් පුළුල් කිරීම සිදු කෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ ගව රක්තාශ්‍රව, කාලගාත්‍රා, රැනිකට් එන්නත් දේශීය ව නිපදවීම වැඩි දියුණු කර ඇත. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සමස්ත වශයෙන් 91% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

| එන්නත් වර්ගය | වාර්ෂික ඉලක්කය | 2025.12.31 වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය |
|---|---|---|
| ගව රක්තාශ්‍රව (OAV) | 125,000 | 125,040 |
| ගව රක්තාශ්‍රව (APV) | 20,040 | 20,040 |
| කාලගාත්‍රා (BQ) | 90,000 | 110,517 |
| බෲසෙල්ලා (Brucella S19) | 10,000 | 15,600 |
| රැනිකට් (Primary) | 2,874,000 | 3,000,800 |
| රැනිකට් (Secondary) | 2,521,000 | 3,042,600 |
| පෞද්ගලික ආයතන සඳහා ඉල්ලුම අනුව එන්නත් නිෂ්පාදනය කිරීම | | |
| කුකුළු කොළරා (FC) | 400,000 (ඉල්ලුම පරිදි) | 348,840 |
| සූකර පැස්චරෙල්ලෝසිස් (SP) | 3,000 | ඉල්ලුම පරිදි |
| රැනිකට් (primary) | 1,500,000 | 2,894,600 |

### 5.2. පශු සම්පත් පර්යේෂණ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ව්‍යාපෘති 23ක් දැනට ක්‍රියාත්මක වේ. ඉල්ලුම පරිදි සාම්පල පරීක්ෂාව සහ ජෛවීය නිෂ්පාදනයන් සිදු කිරීම මේ මඟින් ඉටු කරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 100%කි.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2025.12.31 වන විට ප්‍රගතිය |
|---|---|---|
| ජෛවීය නිෂ්පාදන | ඉල්ලුම පරිදි | |
| විශ්ලේෂණ වාර්තා | | 54,789 |
| පරීක්ෂණ වාර්තා | | 2,574 |
| රෝග නිරීක්ෂණ වාර්තා | | 2,037 |
| CMT ප්‍රතික්‍රියාකාරකය | | ලීටර් 17 |

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2025.12.31 වන විට ප්‍රගතිය |
|---|---|---|
| Pullorum ප්‍රතිදේහජනක මාත්‍රා | | 109,500 |
| RBPT ප්‍රතිදේහජනක මාත්‍රා | | 12,000 |
| MRT ප්‍රතිදේහජනක මාත්‍රා | | 9,200 |
| බුරුලු ගිල්වනු ලබන ද්‍රාවණය (Teat dip solution) | | ලීටර් 46.765 |

### 5.3. කුර හා මුඛ රෝග එන්නත දේශීය ව නිෂ්පාදනය

මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ව කුර හා මුඛ රෝග එන්නත් සකස් කිරීම සිදු කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා එන්නත් වඩි 450,000 නිෂ්පාදනයට සැලසුම් කර ඇති අතර, දෙපාර්තමේන්තුවේ සත්ත්ව සෞඛ්‍ය අංශයට එන්නත් මාත්‍රා 326,100ක් නිකුත් කර ඇත. 2025.12.31 වන විට ආසන්න වශයෙන් 100,000කට ප්‍රමාණවත් කුර හා මුඛ රෝග ප්‍රතිදේහජනක නිෂ්පාදනය කර ඇත. මෙම ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 72%කි.

### 5.4. බුරුලු ප්‍රදාහ පාලන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ බුරුලු ප්‍රදාහ නික්ෂේපණ 30,000ක් සෑදීමට ඉලක්ක කර ඇති අතර, සමාලෝචිත කාල සීමාව තුළ 33,671 නිෂ්පාදනය කර ඇත. බුරුලු ප්‍රදාහ නික්ෂේපණ 27,373 ක්ෂේත්‍රයට නිකුත් කර ඇති අතර, භෞතික ප්‍රගතිය 77%කි.

### 5.5. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම

2018 වසරේ දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම මඟින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්‍ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ මෙම වසර සඳහා 2025.12.31 වන විට සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 9,988ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත. සමස්ත භෞතික ප්‍රගතිය 92%කි.

## 6. සත්ත්ව අභිජනන අංශය

### 6.1. සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය

#### 6.1.1. අධිශීත ගව ශුක්‍ර ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම හා දිවයින පුරා බෙදා හැරීම

මේ සඳහා සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය මඟින් රු.මි. 27.31ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2025.12.31 වන විට G to G ක්‍රමවේදය යටතේ Milking Gir ගව ශුක්‍ර වඩි 20,000ක් ද, තරඟකාරී ලංසු ක්‍රමය යටතේ Jersey - 4,000, Boer - 2,000, Nili Ravi - 2,000, Brazilian Milking Gir - 10,000 වශයෙන් ශුක්‍ර වඩි මිල දී ගැනීමට අදාළ ව ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. එහි දී Jersey, Nili -Ravi සහ Milking Gir ගව ශුක්‍ර වඩි මිල දී ගැනීමට අදාළ ටෙන්ඩර් ප්‍රදානය සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සිදුකර ඇති අතර, Boer එළු ශුක්‍ර වඩි මිලදී ගැනීමට එවා තිබූ මිල පත්‍රිකා පිරිවිතරවලට අනුකූල නො වූ බැවින් එම මිලදී ගැනීම 2026 වර්ෂයේ සිදුකිරීමට තීරණය විය.

එසේ ම කුණ්ඩසාලේ මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයෙන් දේශීය ව හා ආනයනික පුං ගවයින්ගෙන් ලබා ගන්නා ගව ශුක්‍ර වඩි පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් ගබඩා කරමින් පළාත් මට්ටමින් දීපව්‍යාප්ත ව බෙදා හැරීමේ කටයුතු සිදු කරගෙන යනු ලබයි. එසේ ම මේ වන විට ශුක්‍ර වඩි 334,796 නිෂ්පාදනය කර ඇති අතර, බෙදා හැරීම් හා තොග ශේෂයන් පහත පරිදි වේ.

| ගව ශුක්‍ර වඩි වර්ගය | බෙදා හැරීම | තොග ශේෂය |
|---|---:|---:|
| දේශීය | 231,019 | 678,239 |
| ආනයනික | 3,652 | 58,824 |
| ලිංග නිර්ණය කරන ලද | 133 | 3,008 |
| **මුළු එකතුව** | **234,804** | **740,071** |

### 6.1.2. කෘත්‍රිම සිංචන පුහුණු වැඩසටහන්

එසේ ම මෙම අංශය මඟින් ජාතික කෘත්‍රිම සිංචන වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා කෘත්‍රිම සිංචන පුහුණු කටයුතු අඛණ්ඩ ව සිදු කරගෙන යනු ලබන අතර, සමාලෝචිත කාල සීමාව අවසන් වන විට පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදිවේ.

| පුහුණු වැඩසටහන | ප්‍රමාණය |
|---|---|
| පශු සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා වන දින 14 පුහුණු වැඩසටහන් | 02 |
| පුද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් සඳහා වන දින 24 පුහුණු වැඩසටහන් | 01 |
| ප්‍රායෝගික පරීක්ෂණ ( සහභාගිවන්නන් 33න් සමන්විත) | 05 |
| කෘත්‍රිම සිංචන ශිල්පීන්ගේ දැනුම යාවත්කාලීන කරන පුහුණු වැඩසටහන් (සහභාගි වන්නන් 20න් සමන්විත) | 02 |

ජාතික කෘත්‍රිම සිංචන වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා පශු වෛද්‍ය කොට්ඨාස මට්ටමින් කෘත්‍රිම සිංචන උපකරණ බෙදා හැරීමේ කටයුතු ද අඛණ්ඩ ව සිදු කෙරේ. ඒ සඳහා මෙම වසරේ දී කෘත්‍රිම සිංචන උපකරණ මිල දී ගැනීමට රු.මි.11.00ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, 2025.12.31 වන විට කෘත්‍රිම සිංචන උපකරණ මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට අධි ශීත ගව ශුක්‍ර වඩි සඳහා අවශ්‍ය දියර නයිට්‍රජන් ලීටර් 188,546 ප්‍රමාණයක් පළාත් මට්ටමින් බෙදා හැරීම සිදු කර ඇත.

### 6.1.3. ඉදිකිරීම් කටයුතු

සමාලෝචිත කාල සීමාව අවසන් වන විට කුණ්ඩසාලේ හා පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානවල ගවගාල්, නිල නිවාස, මාර්ග, ගොඩනැගිලි ආදිය අලුත්වැඩියා කිරීම් හා අලුතින් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් සිදු කර අවසන් කර ඇත.

පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ ඉදිකිරීම්, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයට අයත් ඉදිකිරීම් කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික සේවා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුකිරීම සඳහා ඇස්තමේන්තු කිහිපයක් ම සකස් වූ අතර ඒ සඳහා මුදල් වෙන් කිරීම ද සිදුවිය. 2025.12.31 දින වන විට මෙම කාර්යය සිදුකළ නො හැකි වූ අතර මෙම අලුත්වැඩියාවන්, 2026 වර්ෂයේ සිදු කිරීමට නියමිත ය.

කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ සතුන් සඳහා ලැගුම් තටාක ඉදිකිරීම සඳහා ටෙන්ඩර් විවෘත කිරීම 2025 දෙසැම්බර් 30 දින සිදු වූ අතර, 2025.12.31 වන විට ටෙන්ඩර් ප්‍රදානය සිදුවී ඇත.

සමාලෝචිත කාල සීමාව අවසන් වන විට කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ කාර්යාලය සහ රසායනාගාරය සඳහා විදුලිය ලබාදෙන විදුලි සැපයුම අළුත්වැඩියා කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලැයිස්තුව මිලදී ගත් අතර, එය 2026 වර්ෂයේ දී සිදුකිරීමට නියමිත ය.

### 6.1.4. අභිජනන ගොවිපොළ ලියාපදිංචිය

අංක 59, 1992 සත්ත්ව රෝග පනතට අනුව සකස් කරන ලද නිර්ණායකයන් පදනම් කරගනිමින් තෝරා ගත් ගොවිපොළවල්, අභිජනන ගොවිපොළ ලෙස සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු සලසා ඇත. ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ, මාර්ගෝපදේශ සංග්‍රහයන් හා ක්‍රියාපටිපාටීන් සකස් කර අවසන් කර ඇත.

ගව, එළු, බැටළු හා සූකර ගොවිපොළ මේ යටතේ ලියාපදිංචි කිරීමට නියමිත අතර, සත්ත්ව සෞඛ්‍ය අංශයේ නිර්ණායක අනුව රෝගවලින් තොර නිසි ජෛව ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කරන ගොවිපොළ මේ සඳහා ලියාපදිංචි කිරීමට නියමිත ය. මෙසේ අභිජනන ගොවිපොළ ලෙස ලියාපදිංචි කරන ගොවිපොළවලින් පමණක් සතුන් ක්ෂේත්‍රයට නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී කටයුතු කරනු ඇත. 2025.12.31 වන විට ගව ගොවිපොළ 02ක් හා සූකර ගොවිපොළ 04ක් අධීක්ෂණයට භාජනය කර ඇත.

### 6.1.5. කිරි ගව රැලේ කාර්ය සාධන ඇගයීම් වාර්තාව

මෙම ව්‍යාපෘතිය දිවයිනේ උතුරු මැද හා වයඹ පළාත්වල දියත් කර ඇති අතර, මෙමඟින් උසස් ආරයක් සහිත සතුන් තෝරා ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි කරනු ලැබේ. ඒ අනුව 2025.12.31 වන විට සතුන් 924ක් හඳුනාගෙන ලියාපදිංචි කර ඇති අතර, ඔවුන් අතරින් 785ක් මව් දෙනුන් වේ. දෛනික ව ගොවිපොළ හිමිකරුගෙන් ලබා ගන්නා දත්ත අනුව ඉහළ කිරි නිෂ්පාදන විභවතාවක් සහිත සතුන් හඳුනාගෙන ගොවිපොළ හිමියා දැනුවත් කරන අතර, එහි දී හඳුනාගන්නා දුර්වලතා සඳහා අවශ්‍ය පශු වෛද්‍ය සේවය සපයා දෙනු ලබයි. එසේ ම ආරයෙන් උසස් පිරිමි සතුන් කුණ්ඩසාලේ හා පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය මඟින් මිල දී ගෙන ගව ශුක්‍ර නිපදවීමේ ක්‍රියාවලියට දායක කරගනු ලබයි.

### 6.1.6. සත්ත්ව ආහාර සංවර්ධන වැඩසටහන

සත්ත්ව ආහාර සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ 2025.12.31 වන විට නව තෘණ හා රනිල ප්‍රභේද වර්ග 03ක් හඳුන්වා දී ඇත. එනම්, *CO-6, Mulato -ii* හා *Stylosanthas* වේ. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට මාතෘ තෘණ තවාන් 03ක් හා ගුණනය කිරීමේ තෘණ තවාන් 41ක් සංවර්ධනය කර ඇත.

එසේ ම නව තෘණ ප්‍රභේද පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වා නිලධාරීන් 789ක් දැනුම්වත් කර ඇත. 2025.12.31 වන විට තෘණ ව්‍යවසායකයින් 49ක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. කුණ්ඩසාලේ මධ්‍යම කෘතිම සිංචන මධ්‍යස්ථානයේ අක්කර 02ක නේපියර් තෘණ වගා භූමියක විසිරි ජල සම්පාදන ක්‍රමයක් ස්ථාපිත කර ඇති අතර, අක්කර 02ක *Mulato -ii* වගාවක් ස්ථාපිත කර ඇත.

ඡායාරූප අංක 15 - 16

## 6.2. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (රු.මි.100.00)

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.100.00 වෙන් කර තිබූ අතර, මේ යටතේ පකිස්ථානයෙන් ශුක්‍රදායක පුංගවයින් ආනයනය කිරීමට රු.මි.75.00ක් වෙන් කරන ලදී. සමාලෝචිත කාල වකවානුව අවසන් වන විට සතුන් තෝරා ගැනීම් කටයුතු අවසන් කර ඇති අතර, 2026 පෙබරවාරි මාසයේ දී සතුන් ආනයනය සිදුකිරීමට නියමිත ව ඇත.

එසේ ම මෙම ව්‍යාපෘතිය යටතේ රු.මි.14.80ක් වැය කරමින් ආනයනය කිරීමට නියමිත Brazilian Milking Gir අධිශීත ගව ශුක්‍ර වඩි 20,000ක්, ආනයනට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර තාක්ෂණික කමිටු නිර්දේශය ටෙන්ඩර් අනුමැතිය සඳහා යොමුකර ඇත. එසේ ම එම ව්‍යාපෘතිය යටතේ ම රු.මි.10.20ක් වැය කොට කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැටෙහි වැඩ සම්පූර්ණයෙන් අවසන් කර ඇත.

ඡායාරූප අංක 17

## 7. විදේශ ව්‍යාපෘති

### 7.1. ගුණාත්මක තෘණ/පෝෂ්‍ය ආහාර ප්‍රභේද හඳුන්වාදීම සහ වැඩිදියුණු කළ පෝෂණ කළමනාකරණ පුරුදු තුළින් කුඩා පරිමාණ කිරි ගොවීන්ගේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය මගින් **CO 6 , Mullato ii , Stylosanthus** යන තෘණ ප්‍රභේද ආනයනය කරන ලදී.

i. **CO 6** - දඬු කි. ග්‍රෑ30ක් ආනයනය කරන ලද අතර, එයින් දඬු කැබලි 22,200ක් ගොවීන් වෙත බෙදා දෙන ලදී. එමෙන්ම 2025.12.31 වන විට අක්කර 06ක තෘණ වගාවක් ව්‍යාප්ත කර ඇත.
ii. **Stylosanthus-** බීජ කි. ග්‍රෑ.50ක් ආනයනය කරන ලද අතර, එයින් කි.ග්‍රෑ.35ක් ගොවින් හට බෙදා දෙන ලදී. අක්කර 10ක තවාන් දැමීම සිදුකර ඇත.
iii. **Mullato ii- බීජ** කි. ග්‍රෑ.100ක් ආනයනය කරන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට මෙම බීජ නිරෝධායන කාල සීමාව පසුකරමින් සිටින අතර ඉදිරියේ දී ගොවීන් වෙත බෙදා දීමට බලාපොරොත්තු වේ.

### 7.2. ඉස්සන්ගේ රෝග ආවේක්ෂණ වැඩසටහන

මෙය ඉස්සන්ගේ රෝග සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පළමු ආවේක්ෂණ වැඩසටහන යි.

පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව (PCR) භාවිතයෙන් පරීක්ෂා කරන ලද රෝග වූයේ එන්ටරොසයිටොසූන් හෙපටොපීනෙයි (EHP), සුදු ලප සින්ඩ්‍රෝම් වෛරසය (WSSV), උග්‍ර හෙපටොපැන්ක්‍රියෝටික් නෙක්රෝසිස් රෝගය (APHND) සහ බෝවන හයිපොඩර්මල් සහ රක්තපාත නෙක්රෝසිස් වෛරසය (IHHNV) ය. ශ්‍රී ලංකාවේ වාර්තා වී නොමැති රෝග තත්ත්වයන් සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම මෙම නිරීක්ෂණවල අරමුණ විය.

2025 ජූලි සිට නොවැම්බර් දක්වා සාම්පල එකතු කරන ලදී. වයඹ පළාතේ ගොවිපල 18කින් ඉස්සන් සාම්පල ලබා ගන්නා ලදී. පේරාදෙණියේ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අණුක ජීව විද්‍යාගාරයේ ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානයේ (WOAH) ප්‍රමිතීන්ට අනුව DNA නිස්සාරණ 1,155ක් සහ පොලිමරේස් දාම ප්‍රතික්‍රියා 3,038ක් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් සියලු ම ගොවිපොළවල EHP හඳුනාගෙන ඇති අතර, කිසිදු ගොවිපොළක APHND සහ IHHNV අනාවරණය වී නොමැත. ගොවිපොළ 2ක WSSV හඳුනාගෙන ඇත. භෞතික ප්‍රගතිය 100%කි.

## 8. විශේෂ වැඩසටහන්

### 8.1. ආපදා සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ

2025.12.31 වන විට දිත්වා කුණාටුවේ ආපදාවෙන් හානි නො වූ දකුණු පළාත හැර සෙසු සියලු පළාත්වල දිස්ත්‍රික්ක 21ක, ගොවිපොළ 9,622ක් සඳහා රු.මි. 2,200.00ක ආපදා සහන දීමනා ගෙවා ඇත.

## 02. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

### 2.1. දැක්ම
ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම පෝෂ්‍යදායී ආහාරපාන සපයන සමාගම බවට පත්වීම.

### 2.2. මෙහෙවර
දේශීය කිරි ගොවියා ශක්තිමත් කරමින් නැවුම් කිරි නිෂ්පාදනයේ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාකාරී පාර්ශ්වකරුවකු වීම සහ පාරිභෝගිකයන් හට දැරිය හැකි මිලකට පෝෂ්‍යදායී ආහාරපාන සපයනු වස්, නවීන තාක්ෂණයෙන් හෙබි අඛණ්ඩ අභිවෘද්ධි ප්‍රවේශයන් අනුගමනය කිරීම.

### 2.3. අරමුණු
i.) ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු කිරි හා ඒ ආශ්‍රිත ආහාරපාන සැපයීම.
ii.) නැවුම් කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා දායක වීම.
iii.) දේශීය කිරි ගොවීන් ශක්තිමත් කිරීම.
iv.) දේශීය කිරි කර්මාන්තයේ සහ ආයතනයේ පැවැත්ම හා වර්ධනය සහතික කිරීම.
v.) මෙහෙවරට දායකවන්නන්ගේ තෘප්තිමත්භාවය සහතික කිරීම.

### 2.4. කාර්යයන්
- ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් ඔස්සේ මෙහෙයුම් ක්‍රියාවලිය දියත් කරනු ලබයි.
- දේශීය කිරි ගොවීන්ගේ කිරි අස්වනු එකතු කිරීම.
- කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීම.
- එකී නිෂ්පාදන " හයිලන්ඩ්" වෙළෙඳ නාමය යටතේ දිවයින පුරා බෙදාහැරීම.

### 2.5. ආයතනය මගින් ළඟා කරගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු
- අභිමතාර්ථ 1 : සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හි ම දුරු කිරීම.
- අභිමතාර්ථ 2 : කුසගින්න දුරුලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩි දියුණුව ලබා ගැනීම හා තිරසර කෘෂිකාර්මික ප්‍රවර්ධනය.
- අභිමතාර්ථ 8 : සියලු දෙනා සඳහා පූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

### 2.6. මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 1,239.00 | 381.00 | 31 |
| පුනරාවර්තන | 24,936.00 | 17,846.00 | 72 |

### 2.7. භෞතික ප්‍රගතිය

#### i.) හරිත තෘණ ව්‍යාපෘතිය.
කිරි ගවයින්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා රට තුළ ඒකාකාරී ආහාර නිෂ්පාදන රටාවක් ඇති කිරීමත්, ඉහළ පෝෂණ අගයකින් යුත් තෘණ සපයාදීමත් අරමුණු කරගනිමින් මෙම ව්‍යාපෘතිය හඳුන්වාදුන් අතර, ඒ යටතේ 2025 වර්ෂය තුළ දිවයින පුරා අක්කර 575ක භූමි ප්‍රමාණයක් වගා කිරීමට සැලසුම් කර තිබිණි. ඒ අනුව, වර්ෂය අවසාන වනවිට මිල්කෝ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මඟපෙන්වීම හා තාක්ෂණික සහාය මත අක්කර 434ක් වගා කර ඇත. මේ සඳහා වූ වියදම අදාළ ගොවි මහතුන් විසින් දරන ලදි.

ඡායාරූප අංක 18

#### ii.) කිරි ගවයින් සඳහා අඛණ්ඩව පානීය ජලය සැපයීම.
ඉහළ කිරි නිෂ්පාදනයක් ලබා ගැනීම සහ ඒකාකාරී නිෂ්පාදන රටාවක් පවත්වා ගැනීම සඳහා කිරි ගවයින්ට පෝෂණය සැපයීමේ දී අඛණ්ඩ පානීය ජල සැපැයුමක් තිබීම අත්‍යාවශ්‍ය ය. එම අවශ්‍යතාව

ප්‍රචලිත කිරීම සහ දිරිගැන්වීම සඳහා 2025 වර්ෂය තුළ පිරිවැයෙන් අඩක් අයකර ගැනීමේ පදනම මත ගොවීන් වෙත ජල බඳුන් 800ක් සැපයීමට සැලසුම් කළ අතර, වර්ෂය අවසාන වනවිට උතුර, මධ්‍යම, උතුරු මැද, වයඹ, දකුණ හා නැගෙනහිර යන පළාත් ආවරණය වන පරිදි පානීය ජල බඳුන් 230ක් නිෂ්පාදනය කර ගොවීන් වෙත බෙදාදෙන ලදී. මේ සඳහා මිල්කෝ සමාගම විසින් රුපියල් මිලියනයකට වැඩි මුදලක් වියදම් කර ඇත.

ඡායාරූප අංක 19

### iii.) ගොවි පුහුණු වැඩමුළු පැවැත්වීම.

කිරි නිෂ්පාදනය කාර්යක්ෂම ව, ඵලදායී ව හා අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා කිරි ගව පාලනය හා කළමනාකරණය මූලික කරගත් ප්‍රයෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදීම පුහුණු වැඩමුළු හරහා සිදු වේ. මිල්කෝ ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය හරහා මෙය සිදුකරන අතර 2025 වසර තුළ දිවයින පුරා කිරි ගොවීන් 11,150ක් පුහුණු කිරීම ඉලක්කය විය. ඒ අනුව, වර්ෂය අවසාන වනවිට කිරි ගොවීන් 7,425ක් පුහුණු කර ඇත. මේ සඳහා මිල්කෝ සමාගම දැරූ වියදම රු. මි. 5.94කි.

ඡායාරූප අංක 20

### iv.) සත්ත්ව අභිජනනය කාර්යක්ෂම කිරීම.

ගුණාත්මකභාවයෙන් යුත් ඉහළ කිරි නිෂ්පාදනයක් සඳහා සතුන්ගේ සෞඛ්‍ය කළමනාකරණය අත්‍යවශ්‍ය වන අතර ගොවිපොළ තුළ දී ම ස්ථානීය වශයෙන් කිරි ගවයින්ගේ රෝග හඳුනාගැනීම, ප්‍රතිකාර කිරීම, රෝග වළක්වා ගැනීමේ උපදෙස් ලබාදීම සහ නියමිත කාල පරාසය තුළ කෘත්‍රිම සිංචනය සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ඒ යටතේ 2025 වසරේ සැලසුම් කළ ජංගම පශු වෛද්‍ය සායන 1,819න් සායන 800ක් වසර අවසානය වනවිට පවත්වා ඇති අතර, ඒ සඳහා මිල්කෝ සමාගම වැය කළ මුදල රු.මි.4.23කි.

ඡායාරූප අංක 21

### v.) කුඩා පරිමාණ, කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP).

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP), මිල්කෝ ආයතනය හා අනුබද්ධිත ව කිරි ගොවීන් 3000කගේ සංවර්ධනය අරමුණු කරගනිමින් ඌව, මධ්‍යම, වයඹ, උතුරු මැද හා දකුණු පළාත් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.

මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂය අවසන් වනවිට ගවගාල් 2165ක්, වගා ළිං 51, ඇසොල්ලා පොකුණු 760ක් සහ ජීව වායු ඒකක 04ක් ඉදිකිරීමට කටයුතු සම්පාදනය කර ඇති අතර, තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර 975ක්, කිරි දෙවීමේ යන්ත්‍ර 27ක්, කිරි සිසිලක 115ක්, ලීටර් 20 කිරි කෑන් 364, ලීටර් 10 කිරි කෑන් 712ක් ලබා දී ඇත. තව ද, කිරි ගොවීන් 529 දෙනෙකුට ණය පහසුකම් ලබා දී ඇත. මේ යටතේ සිදු කළ ගොවි පුහුණු කටයුතු සඳහා 2025 වසරේ දී මිල්කෝ සමාගම විසින් රු.මි.0.49ක වියදමක් දරා ඇත.

ඡායාරූප අංක 22

### vi.) ගොවි සුභසාධන වැඩසටහන්.

ශ්‍රී ලාංකික කිරි නිෂ්පාදකයාගේ සාමාජීය හා ආර්ථික ප්‍රවර්ධනය ඇති කරලීම සහ ඔවුන්ගේ පවුල් සංස්ථාව තුළ ඇති වන හදිසි හා අත්‍යවශ්‍ය කටයුතුවල දී සහය වීම වෙනුවෙන් 2003 වසරේ දී 'මිල්කෝ කිරි ගොවි සමාජ ආරක්ෂණ අරමුදල' පිහිටුවන ලදී. ඒ යටතේ 2025 වර්ෂය තුළ දී පමණක් ප්‍රතිලාභීන් 7,140 දෙනෙකු වෙත රු.මි.35.00කට අධික වටිනාකමකින් යුත් ප්‍රතිලාභ ලබා දී ඇත. තව ද, දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවටපත් කිරි ගොවීන් 2,822 දෙනෙකු වෙනුවෙන් රු.5,000.00 බැගින් වූ සහනදායී වවුචර්පත් සතොස ආයතනය හරහා දිවයින පුරා බෙදාදීමට ද පියවර ගැනුණි.

ඡායාරූප අංක 23

### vii.) සුපිරි වෙළඳසැල් සඳහා අධිශීතකරණ ලබාදීම.

සුපිරි වෙළෙඳසැල් ජාලයන්හි අයිස්ක්‍රීම් අලෙවිය වර්ධනය කරගැනීමේ අරමුණින්, තෝරාගත් සුපිරි වෙළෙඳසැල් වෙත ලබාදීම සඳහා අධිශීතකරණ 100ක් 2025 වර්ෂයේ ප්‍රාග්ධන අයවැය මඟින් වෙන්කරගත් මිල්කො ප්‍රතිපාදන මඟින් මිලදී ගත් අතර, තෝරාගත් සුපිරි වෙළෙඳසැල් වෙත එම අධිශීතකරණ ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී.

ඡායාරූප අංක 24

### viii.) නව වරලත් අලෙවිසැල් ආරම්භ කිරීම

මිල්කො බෙදාහැරීමේ ජාලය පුළුල් කරමින් 2025 වර්ෂය අවසන් වනවිට වරලත් අලෙවිසැල් 132ක් පමණ ආරම්භ කරන ලද අතර, අලෙවිසල් ආරම්භ කිරීමට අදාළ සියලු වියදම් අලෙවිසල් හිමිකරුවන් විසින් දරන ලදී. අලෙවිසල් ආරම්භ කිරීමට ඉල්ලුම්පත් යොමු කරන ලද ඉල්ලුම්කරුවන් බැංකු ණය ලබා ගැනීමේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) මඟින් අපේක්ෂිත නිර්ණායක සපුරාලීමට නො හැකි වීම මත හා ඉල්ලුම්කරුවන්ට ණය පහසුකම් ලබා ගැනීමේ දී බලපාන නීතිරීති සම්බන්ධ ගැටලු හේතුවෙන්, අලෙවිසල් ආරම්භ කිරීම ප්‍රමාද විය. කෙසේ නමුත්, 2026 වර්ෂයේ දී තවත් වරලත් අලෙවිසල් 300ක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

ඡායාරූප අංක 25

### ix.) බෙදාහරින්නන්ගේ අලෙවි සුපරීක්ෂකවරුන් සඳහා දිරිදීමනා ක්‍රමයක් හඳුන්වා දීම.

ආයතනයේ අලෙවිය ප්‍රවර්ධන කිරීම සඳහාත්, මාසික අලෙවි ඉලක්කයන් සපුරාලීම සඳහාත් දීර්ඝ කාලයක් තුළ පත්කර ගැනීමට නො හැකි වූ අලෙවි නියෝජිත අලෙවි සුපරීක්ෂකවරුන් (DSR) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත පත් කිරීමට කටයුතු යෙදූ අතර, මේ වනවිට එසේ පත්කර ගත් අලෙවි නියෝජිත අලෙවි සුපරීක්ෂකවරුන් 64 දෙනෙකු අලෙවි නියෝජිතයින් සමග කටයුතු කරනු ලබයි. ඔවුන්ගේ අලෙවි ඉලක්කයන් සපුරාලීම මත ඔවුන් වෙත දිරිගැන්වීමේ දීමනාවක් ආයතනය විසින් ගෙවනු ලැබේ. තව ද, ඔවුන්ගේ සේවාව වඩාත් ඵලදායී කිරීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට ද කටයුතු යොදන ලදී.

ඡායාරූප අංක 26

## 03. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

### 3.1. දැක්ම:

තිරසර ගොවිපොළ සත්ත්ව නිෂ්පාදනයේ පුරෝගාමියා වීම.

### 3.2. මෙහෙවර:

සත්ත්ව නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත වීමේ ජාතික අවශ්‍යතාවට දායක වීම.

### 3.3. අරමුණු:

- දේශීය ගොවීන් සඳහා අභිජනනය සඳහා සතුන් නිකුත් කිරීම.
- පශු සම්පත් හා කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි නිෂ්පාදනය වැඩි කිරීම
- පශු සම්පත් අංශයේ නියුතු ගොවීන්, සිසුන් , ඩිප්ලෝමාධාරීන් , පශු සම්පත් අංශයේ රැකියාවන් බලාපොරොත්තු වන්නන් හට හා අයෝජකයන් සඳහා පශු සම්පත් පුහුණු වැඩසටහනක් පැවැත්වීම
- අලෙවි ජාලය විධිමත් කිරීම.
- මණ්ඩලය සතු ඉඩම්වල පළතුරු හා අනෙකුත් ආර්ථික බෝග වගා කිරීම තුළින් අදායම ඉහළ නැංවීම.

### 3.4. කාර්යයන්

- පශු සම්පත් අභිජනනය හා වර්ධනය.
- අභිජනනය සඳහා හොඳ තත්වයේ සතුන් සාධාරණ මිලකට ගොවීන්ට නිකුත් කිරීම.
- ජනතාවට අවශ්‍ය ගුණාත්මක කිරි, මස්, බිත්තර, පොල්, එළවළු නිෂ්පාදනය හා සාධාරණ මිලට අලෙවි කිරීම.
- තිරසරභාවය සහ ප්‍රශස්ත ඉඩම් පරිහරණය සඳහා ගොවිපොළවල පශු සම්පත් බෝග ඒකාබද්ධ කෘෂිකාර්මික ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- පොල් වගාවෙන් ලැබෙන අතිරික්ත මුදල් භාවිතා කරමින් තිරසර බව සඳහා ප්‍රශස්ත මට්ටමකින් ගොවිපොළ ක්‍රියාකාරකම් නඩත්තු කිරීම.
- පිරිවැය අඩු කිරීම සහ නිෂ්පාදන තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා නව තාක්ෂණය, විශේෂඥතාව සහ ප්‍රාග්ධනය හඳුන්වා දීම.
- ලාභදායී ව්‍යාපාර සඳහා වඩා හොඳ අලෙවිකරණ උපාය මාර්ග සමඟ නව වෙළඳපොළ අවස්ථා ගවේෂණය කිරීම.

### 3.5. ආයතනය මගින් ළඟා කර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු

- අරමුණ 1 : සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හි ම දුරු කිරීම.
- අරමුණ 2 : කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩි දියුණුව ලබා ගැනීම හා තිරසර කෘෂිකාර්මික ප්‍රවර්ධනය.
- අරමුණ 15 : ගොඩබිම මත ජීවය

### 3.6 ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන් | වෙන් කළ මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 629.63 | 169.69 | 27 |
| 2 | පුනරාවර්තන | 1,534.59 | 1,319.55 | 86 |

### 3.7ආයතනයේ වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම් | ඒකකය | 2025/12/31 දිනට ඉලක්කය | 2025/12/31 දිනට සත්‍ය අගය | ළඟා කරගත් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| එළ කිරි නිෂ්පාදනය | ලීටර් | 6,869,748 | 4,508,176 | 66 |

| ක්‍රියාකාරකම් | ඒකකය | 2025/12/31 දිනට ඉලක්කය | 2025/12/31 දිනට සත්‍ය අගය | ළඟා කරගත් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| මී කිරි නිෂ්පාදනය | ලීටර් | 933,922 | 721,300 | 77 |
| එළු කිරි නිෂ්පාදනය | ලීටර් | 25,914 | 15,935 | 61 |
| පොල් නිෂ්පාදනය | ගෙඩි සංඛ්‍යාව | 18,574,830 | 9,380,460 | 51 |
| බ්‍රොයිලර් කුකුලු පැටවුන් නිෂ්පාදනය | සංඛ්‍යාව | 4,080,518 | 3,133,786 | 77 |
| බිත්තර දමන කිකිළි පැටවුන් නිෂ්පාදනය | සංඛ්‍යාව | 2,340,337 | 1,511,736 | 65 |
| වාණිජමය බිත්තර නිෂ්පාදනය | සංඛ්‍යාව | 6,685,868 | 4,848,184 | 73 |
| බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය | සංඛ්‍යාව | 22,800 | 25,279 | 111 |
| **සතුන් නිකුත් කිරීම** | | | | |
| එළ ගව - පිරිමි | සංඛ්‍යාව | 1,088 | 571 | 52 |
| එළ ගව - ගැහැණු | සංඛ්‍යාව | 165 | 47 | 28 |
| මී ගව - පිරිමි | සංඛ්‍යාව | 470 | 199 | 42 |
| මී ගව - ගැහැණු | සංඛ්‍යාව | 30 | 15 | 50 |
| එළුවන් | සංඛ්‍යාව | 311 | 157 | 50 |
| බැටළුවන් | සංඛ්‍යාව | 1,147 | 629 | 55 |
| **අගය එකතු කළ නිෂ්පාදන** | | | | |
| යෝගට් | මිලි ලීටර් 80 | 1,230,674 | 857,291 | 70 |
| මුදවපු මී කිරි | ලීටර් 1 | 807,053 | 407,477 | 50 |
| කිරි ටොෆි | පැකට් | 583,981 | 163,973 | 28 |
| UHT කිරි පැකට් | පැකට් | 931,500 | 124,266 | 13 |
| යෝගට් පානය | මිලි ලීටර් 200 | 210,000 | 173,062 | 82 |
| අයිස් ක්‍රීම් | ලීටර් 1 | 25,561 | 12,321 | 48 |
| | කෝන් | 160,500 | 94,158 | 59 |
| රබර් ෂීට් | කි/ග්‍රෑ. | 29,296 | 14,263 | 49 |
| ගොවි පුහුණු වැඩසටහන් | සංඛ්‍යාව | 104 | 20 | 19 |

### 3.7.1. UHT ලීටර 1 කිරි පැකට්ටුව නැවතත් වෙළෙඳපොළට නිකුත් කිරීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් තාවකාලිකව නිෂ්පාදනය නතර කර තිබූ UHT ලීටර් 1 කිරි පැකට්ටුව නැවතත් වෙළෙඳපොළට නිකුත්කිරීම ආරම්භ කරන ලදී. මෙම අවස්ථාව සඳහා ගරු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යතුමා සහභාගි වූ අතර, ජාතික කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ දේශීය කිරි කර්මාන්තය ශක්තිමත් කිරීමට දායකත්වයක් ලබා දීම මෙහි අරමුණකි.

### 3.7.2. ලෝක කිරි දිනය සැමරීම

ජූනි මස 01වන දිනට යෙදුණු ලෝක කිරි දිනය නිමිති කරගෙන, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් විශේෂ උත්සවයක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ දියර කිරි පරිභෝජනය ජනතාව අතර ප්‍රචලිත කිරීම සහ එහි සෞඛ්‍යමය වාසි පිළිබඳ ව ජනතාව දැනුම්වත් කිරීම යි. මෙම උත්සවය අතරතුර, ආයතනය විසින් නොමිලේ දියර කිරි ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා විශාල පිරිසක් සහභාගී වූ අතර, දියර කිරි පානය කිරීමේ වැදගත්කම පිළිබඳ ව ඔවුන් දැනුම්වත් කිරීමට මෙහි දී අවස්ථාව සැලසිණි.

ඡායාරූප අංක 27

### 3.7.3. අලෙවිසල් ජාලය පුළුල් කිරීම

දියර කිරි ප්‍රවර්ධනය කිරීම හා ගුණාත්මක බවින් ඉහළ ගොවිපොළ ආශ්‍රිත නිෂ්පාදන පාරිභෝගිකයින් වෙත ලබා දීමේ අරමුණින්, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් මාලාව යටතේ 2025 වර්ෂයේ දී නව ගොවිපොළ අලෙවිසල් 05ක් ඉදිකරන ලදී. එම

අලෙවිසල් මාරවිල බණ්ඩාර බෙදුමේ, රුක්කත්තන, මරඳවිල, හොරකැලේ සහ මැල්සිරිපුර වල්පොළයාය බෙදුමේ ස්ථාපිත කර ඇත.

තවද, සිරිංගපාත හා මාවත්ත ගොවිපොළවල අලෙවිසල් නවීකරණය කර ඇති අතර, මරදාන දුම්රිය ස්ථානයේ පිහිටි අලෙවිසල එම පරිශ්‍රය තුළ ම වෙනත් ස්ථානයක නව මුහුණුවරකින් ඉදිකර ඇත. තව ද, අපගේ නවතම අලෙවිසල කොළඹ මහනගර සභා පරිශ්‍රයේ ස්ථාපිත කර ඇත.

මෙම වැඩසටහන හරහා ජනතාවට ගුණාත්මක බවින් ඉහළ කිරි, මස් සහ අනෙකුත් ගොවිපොළ ආශ්‍රිත නිෂ්පාදන රැසක් මෙම අලෙවිසල් මඟින් පහසු ලෙස මිල දී ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

ඡායාරූප අංක 28

### 3.7.4. සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක වන ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් නාරංගල්ල ගොවිපොළ තුළ අක්කර 20ක් ආවරණය වන සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක වන ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කරන ලද අතර, එය ගරු කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණි. මේ යටතේ වර්ෂයක දී කන්න 4ක් වගා කරමින් බඩඉරිගු ගස් හා ඇට සමඟ එකතුව වර්ෂයක දී ටොන් 1,600ක අස්වැන්නක් ලබා ගැනීමට අපේක්ෂිත ය. මෙම බඩඉරිගු අස්වැන්න මඟින් මෙම ගොවිපොළට වර්ෂයක දී සාන්ද්‍ර ආහාර සඳහා වැයවන ලක්ෂ 80කට ආසන්න මුදලක් ඉතිරි කර ගැනීමට හා කිරි අස්වැන්න වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ.

ඡායාරූප අංක 29

### 3.7.5. කෘත්‍රිම බුද්ධිය මඟින් (AI) පොල් ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු පොල් අක්කර 11,000කින් යුතු පොල් වගාව අධීක්ෂණය කිරීම, වගාවේ දත්ත එක්රැස් කිරීම හා පුරෝකථනය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) හා ඩ්‍රෝන තාක්ෂණය (Drone technology) මුසු කළ යෙදැවුමක් හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

මෙමඟින් පොල් ගස්වල වර්ධන තත්ත්වය, රෝග හා පළිබෝධ ආක්‍රමණ, ජල අවශ්‍යතා සහ පෝෂක හිඟතාවයන් හඳුනාගැනීමට හැකි වන අතර, මේ හරහා මණ්ඩලය, සුහුරු කෘෂිකර්මාන්තය (Smart Agriculture) වෙත යොමු වෙමින් වඩා වේගවත් හා නිවැරදි දත්ත මත නිවැරදි හා කාලීන තීරණ ගැනීම අපේක්ෂා කරන අතර, ඒ තුළින් පොල් වගාව සඳහා අවශ්‍ය යෙදැවුම් කළමනාකරණය කිරීම හරහා වර්තමාන පොල් වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

ඡායාරූප අංක 30

### 3.7.6. පෝෂ්‍ය තෘණ වගා කිරීම

මේ යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළවල කිරිගව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පෝෂ්‍ය තෘණ වගා කිරීම සිදු වූ අතර, 2025 වර්ෂයේ දී බඩඉරිඟු සහ සෝගම් අක්කර 1,600ක් පමණ වගා කරන ලදී. මෙමඟින් සතුන්ට ගුණාත්මක බවින් ඉහළ පෝෂ්‍ය තෘණ ලබාදීම සිදු වූ අතර එමඟින් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට හැකිවිය.

ඡායාරූප අංක 31

### 3.7.7. මී කිරි යෝගට් වෙළෙඳපොලට හඳුන්වා දීම

දේශීය පාරිභෝගිකයින්ගේ පෝෂණ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ප්‍රථම වරට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් මී කිරි යෝගට් නිෂ්පාදනයක් වෙළඳපොළට හඳුන්වා දී ඇත. උසස් තත්ත්වයේ මී කිරි භාවිතයෙන් නිමවන මෙම යෝගට්, රසයෙන් සහ පෝෂණයෙන් යුතු ව ස්වභාවික රසය සහ ගුණාත්මකභාවය පවත්වා ගනිමින් නිෂ්පාදනය කර ඇත. මෙම මී කිරි යෝගට් මණ්ඩලයට

අයත් අළෙවිසල් හා සුපිරි වෙළෙඳසල් හරහා පාරිභෝගිකයින් වෙත ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.

ඡායාරූප අංක 32

**මේ වන විට අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

| # | සංවර්ධන වැඩසටහන | වෙන් කල මුදල (රු. මි.) | 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | බෝයර් වර්ගයේ එළුවන් ආනයනය කිරීම | 85.00 | සතුන් ආනයනය කිරීමට අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශය ලබා ගැනීමේ ගැටලු මතු වූ හෙයින් 2026 වසරේ දී ආනයනය කිරීමට අපේක්ෂිත ය. |
| 2 | ලිංග නිර්ණය කරන ලද ගව ශුක්‍රාණු මාත්‍රා 5,000ක් ආනයනය කිරීම | 38.00 | ආනයනය කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින අතර, 2026 වසරේ මුල්භාගයේ දී ආනයනය කිරීමට බලාපොරොත්තු වේ. |
| 3 | නිකවැරටිය සහ බෝපත්තලාව ගොවිපොළවල ගවගාල් දෙකක් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම | 12.36 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. |
| 4 | මාරවිල ගොවිපොලේ සංවෘත කුකුළු නිවාසයක් ඉදිකිරීම | 47.00 | ඉදිකිරීම් කටයුතුවලින් 60%ක පමණ ප්‍රමාණයක් අවසන් කරන ලදි. |

- “2025 අයවැය යෝජනා යටතේ ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන එම ඉඩම්වල යෝග්‍යභාවය පිළිබඳ සැලකිල්ලට ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඇතුළත් පුද්ගලික ආයෝජන සඳහා යොමු කිරීමට කටයුතු කිරීම” යන යෝජනාවට අදාළව,

| # | සංවර්ධන වැඩසටහන | වෙන් කළ මුදල (රු. මි.) | 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 1. | මණ්ඩලය සතු ඌන උපයෝජිත ඉඩම් ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයන් වෙත ලබාදීම | 63.80 | අපේක්ෂිත ප්‍රමාණයෙන් 55% පමණක් සිදු කරන ලදී. නිකවැරටිය ගොවිපොළ සඳහා අවශ්‍ය අනුමැතින් ලබා ගැනීමට ඇති වූ ප්‍රමාදයත්, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්වය නිසා කැලෑ එළි කිරිමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීමට ඇති වූ අපහසුතාවත් මීට හේතු විය. |

## 04. සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම

### 4.1. දැක්ම
දිනක් වයසැති උසස් තත්ත්වයේ බ්‍රොයිලර් කුකුළු පැටවුන් සහ බ්‍රොයිලර් කුකුළු මස් දේශීය වෙළෙඳපොළේ සාධාරණ මිලට සපයන ප්‍රමුඛ නිෂ්පාදකයෙකු වීම.

### 4.2. මෙහෙවර
අන්තර්ජාතික තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල ව නවීන තාක්ෂණය භාවිත කර දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් සහ බ්‍රොයිලර් කුකුළු මස් ගුණාත්මක තත්ත්වයෙන් වැඩිදියුණු කිරීම.

### 4.3. අරමුණු
වෙළෙඳපොළ මිල සමතුලිතතාව පවත්වාගෙන යාම අරමුණු කරගෙන මිනිස් පරිභෝජනය සඳහා අවශ්‍ය කරන කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය කිරීම සහ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් අභිජනනය කිරීම.

මහවැලි “එච්” කලාපයේ ගොවීන් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතු සඳහා උනන්දු කරවීම මඟින් ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම, රැකියා අවස්ථා ඇති කිරීම සහ සුභසාධනය ඇති කිරීම

### 4.4. ප්‍රධාන ක්ෂේත්‍ර
උසස් තත්ත්වයේ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් නිෂ්පාදනය සහ බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනය.

### 4.5. කාර්යයන්
I.) ආනයනය කරන ලද හෝ දේශීය ව මිල දී ගත් සතුන්ගෙන් සමන්විත මව් කුකුළු ඒකකයක් පවත්වාගෙන යාම

II.) අර්ධ ස්වයංක්‍රීය බිත්තර රක්කනාගාරයක් පවත්වාගෙන යාම

III.) වාණිජ බ්‍රොයිලර් ඒකකයක් පවත්වාගෙන යාම

IV.) සෞඛ්‍යාරක්ෂිත ව හා ප්‍රමිතිගත ව කුකුළු මස් නිෂ්පාදනය කිරීම සඳහා අර්ධ ස්වයංක්‍රීය මස් සැකසුම්හලක් පවත්වාගෙන යාම

V.) සමාගමේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවිසල් පවත්වාගෙන යාම.

### 4.6. ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන් | 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තු කල මුදල (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 175.51 | 201.09 | 114.57 |
| 2 | පුනරාවර්තන | 238.94 | 334.18 | 139.86 |

# පරිච්ඡේදය 03

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | තත්‍ය 2025 | තත්‍ය 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 1,443,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 1,939,987,603 | 86,430,015 | ඒසීඒ-1 |
| 1,443,000,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **1,939,987,603** | **86,430,015** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 36,319,927,056 | 22,762,348,930 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 1,560,218,838 | 96,911,906 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 199,548,906 | 108,271,180 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **38,079,694,800** | **22,967,532,016** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **40,019,682,403** | **23,053,962,031** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **2,566,748,234** | **159,254,397** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **37,452,934,169** | **22,894,707,634** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 3,250,950,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 3,223,052,555 | 2,540,698,945 | ඒසීඒ-2(ii) |
| 696,800,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 508,428,281 | 656,110,596 | ඒසීඒ-2(ii) |
| 49,523,900,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 48,853,904,632 | 48,459,517,438 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 1,350,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 426,458 | 183,374 | ඒසීඒ-2(ii) |
| **53,473,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **52,585,811,926** | **51,656,510,353** | |
| | **මූලධන වියදම්** | | | | |
| 6,701,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 2,898,750,681 | 56,441,952 | ඒසීඒ-2(ii) |
| 53,642,213,093 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 32,015,726,471 | 4,112,529,144 | ඒසීඒ-2(ii) |
| 25,011,850,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 17,781,152,264 | 8,811,486,846 | ඒසීඒ-2(ii) |
| 1,730,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 1,463,676,399 | 1,947,579,800 | ඒසීඒ-2(ii) |
| 37,500,000 | හැකියා වර්ධනය | 14 | 25,490,468 | 5,034,812 | ඒසීඒ-2(ii) |
| 15,754,150,000 | වෙනත් මූලධන වියදම් | 15 | 11,734,321,850 | 10,212,201,739 | ඒසීඒ-2(ii) |
| **102,877,313,093** | **මුළු මූලධන වියදම් (උ)** | | **65,919,118,133** | **25,145,274,293** | |
| | තැන්පතු ගෙවීම් | | 591,718,713 | 89,778,157 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 252,911,897 | 219,295,950 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **844,630,610** | **309,074,107** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **119,349,560,668** | **77,110,858,753** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(81,896,626,499)** | **(54,216,151,119)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **(81,896,626,499)** | (54,218,905,365) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | 2,754,245 | ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තතය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 129,158,836,914 | 4,111,761,351 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 390,829,393 | 337,466,402 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 2,754,245 |
| **මුළු වත්කම්** | | **129,549,666,307** | **4,451,981,998** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (837,117,180) | 206,093,422 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 129,158,836,914 | 4,111,761,351 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | 63,000,000 | 63,000,000 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,164,946,573 | 68,372,979 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 2,754,245 |
| **මුළු වගකීම්** | | **129,549,666,307** | **4,451,981,997** |

පිටු අංක..07.....සිට ..49.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..50.. සිට ..216.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : | දිනය : | දිනය : 2026.02.26 |

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, ''ගොවිජන මන්දිරය''
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඩී.කේ.ටී. සමන්මලී
ප්‍රධාන ගණකාධිකාරි
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
(කෘෂිකර්ම අංශය)
අංක. 80/5, ''ගොවිජන මන්දිරය''
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, ''ගොවිජන මන්දිරය''
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-සී**

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සත්‍ය 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 561,411,246 | 192,983,847 |
| අග්‍රිම ලැබීම් | 36,319,927,056 | 22,762,348,930 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 245,469,771 | 88,551,601 |
| තැන්පතු ලැබීම් | 1,560,218,838 | 96,911,906 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **38,687,026,911** | **23,140,796,284** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,637,629,588 | 2,553,780,522 |
| සහනාධාර සහ මාරුකිරීම් | 2,600,816,082 | 15,176,218,129 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 234,171,203 | 58,871,340 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,566,748,234 | 159,254,397 |
| අත්තිකාරම් ගෙවීම් | 263,725,680 | 146,641,299 |
| තැන්පතු ගෙවීම් | 591,718,713 | 89,778,157 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **8,894,809,500** | **18,184,543,844** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **29,792,217,411** | **4,956,252,440** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 29,792,217,411 | 4,953,498,195 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **29,792,217,411** | **4,953,498,195** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(29,792,217,411)** | **(4,953,498,195)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | **2,754,245** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | - | **2,754,245** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

### 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ඒසිඊ - 1

### 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරි : ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විෂයදම් ශීර්ෂ අංකය : 118

රු.

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | සටහන | ආදායම් ඇස්තමේන්තුව (1) | | ආදායම් රැස්කිරීම් (2) | | | (3) | ආදායමෙන් ආපසු ගෙවීම් (4) | | | (5) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මූලික ඇස්තමේන්තුව 1(i) | සංශෝධිත ඇස්තමේන්තුව 1(ii) | අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම් 2(i) | වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් (SA-21-1) 2(ii) | එකතුව 2(iii)=2(i)+2(ii) | හිඟ ආදායම් රැස්කිරීම් (3) | මුදලින් 4(i) | වැරදි නිවැරදි කිරීම් 4(ii) | එකතුව 4(iii)=4(i) + 4(ii) | ශුද්ධ ආදායම 5=2(iii)+ (3)-4(iii) |
| 2003.07.00 | රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන | | 110,000,000 | 110,000,000 | | 68,273,002 | 68,273,002 | | | | | 68,273,002 |
| 2003.08.00 | ජල විදුලිය විකිණීම | | 1,333,000,000 | 1,333,000,000 | - | 1,871,714,601 | 1,871,714,601 | | - | - | - | 1,871,714,601 |
| | **මුළු බඳු නොවන ආදායම (මුළු ආදායම)** | 4 | **1,443,000,000** | **1,443,000,000** | **-** | **1,939,987,603** | **1,939,987,603** | **-** | **-** | **-** | **-** | **1,939,987,603** |

2026-02-26.

දිනය

..............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි
/මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

..............................................

ආදායම් ගණන්දීමේ නිලධාරි නම, තනතුර සහ අත්සන

* තමන්ට අදාළ ආදායම් සංකේතය පමණක් ඇතුළත් වන පරිදි ආකෘති පත්‍රය සංශෝධනය කර ගත යුතු ය.

ඩී.කේ.ටී. සමන්මලී
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
(කෘෂිකර්ම අංශය)
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඒසිජ - 1(i)

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරි : ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය　　　　වියදම් ශීර්ෂ අංකය : 118

| පූර්ව මුදල් වර්ෂ 3 සඳහා ශුද්ධ ආදායම් රැස්කිරීම | | | |
|---|---|---|---|
| | වර්ෂය 1 | (2022) | රු. 1,379,145,061 |
| | වර්ෂය 2 | (2023) | රු. 2,076,755,010 |
| | වර්ෂය 3 | (2024) | රු. 1,617,286,539 |

රු.

| කාල පරිච්ඡේදය | ආදායම් සංකේතය | ආදායම් විස්තරය | වර්ෂ ආරම්භක ශේෂය (1) | වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් (2) | අයකර ගැනීම් (3) | කපා හරින ලද හිඟ ආදායම් (4) | වර්ෂ අවසාන ශේෂය 5=(1)+(2)-[(3)+(4)] |
|---|---|---|---|---|---|---|---|
| (1) වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල් | 2003.07.00 | රජයේ වි මිලදී ගැනීමේ වැඩසටහන | | - | - | - | - |
| | 2003.08.00 | ජල විදුලිය විකිණීම | | 1,848,535,046 | 1,436,959,970 | - | 411,575,077 |
| උප එකතුව | | | - | 1,848,535,046.28 | 1,436,959,969.60 | - | 411,575,076.68 |
| (2) පසුගිය වසරට අදාළ හිඟ මුදල් | 2003.07.00 | රජයේ වි මිලදී ගැනීමේ | - | | - | - | - |
| | 2003.08.00 | ජල විදුලිය විකිණීම | 434,406,815 | | 434,406,039 | - | 775.58 |
| උප එකතුව | | | 434,406,815.00 | - | 434,406,039.42 | - | 775.58 |
| (3) පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල් | 2003.07.00 | රජයේ වි මිලදී ගැනීමේ වැඩසටහන | 717,052,154 | | 68,273,002 | - | 648,779,153 |
| | 2003.08.00 | ජල විදුලිය විකිණීම | 11,224,725 | | - | - | 11,224,725 |
| උප එකතුව | | | 728,276,880 | - | 68,273,002 | - | 660,003,878 |
| එකතුව | | | 1,162,683,695 | 1,848,535,046 | 1,939,639,011 | - | 1,071,579,730 |

2026.02.26.
දිනය

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි /මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

ඩී.කේ.ටී. සමන්මලී
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
(කෘෂිකර්ම අංශය)
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

## සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි : ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය                    වියදම් ශීර්ෂ අංකය : 118

රු.

| ආදායම් සංකේතය | විස්තරය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | සත්‍ය ආදායම | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනස | වෙනස සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|
| 2003.07.00 | රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන | 110,000,000 | 68,273,002 | (41,726,998) | -38% | අපේක්ෂිත අදායම රැස්කරගැනීමට නොහැකි විය. |
| 2003.08.00 | ජල විදුලිය විකිණීම - 2025 | 1,333,000,000 | 1,871,714,601 | 538,714,601 | 40% | රු 348,591.94 මුදලක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 206 ශීර්ෂය යටතේ 2003.08.00 වෙත බැර කර ඇත. තවද කාලගුණික වෙනස්වීම් මත ජලය වැඩිවීම නිසා නිෂ්පාදනය ඉහළ යාම අනුව ආදායම් උත්පාදනය වර්ධනය වී ඇත. |

2026.02.26.
දිනය

.......................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන
ඩී.කේ.ටී. සමන්මලී
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
(කෘෂිකර්ම අංශය)
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

.......................................
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:
ඩී.පී. වික්‍රමසිංහ
ලේකම
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ඒසීඒ -2

### 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 118

අමාත්‍යාංශයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තුගත පතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත පතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 3,858,000,000 | - | 64,300,000 | 3,922,300,000 | 3,713,929,252 | 208,370,748 |
| | (2) ප්‍රාග්ධන | 273,000,000 | - | 6,000,000 | 279,000,000 | 114,777,341 | 164,222,659 |
| | උප එකතුව | **4,131,000,000** | **-** | **70,300,000** | **4,201,300,000** | **3,828,706,593** | **372,593,407** |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | 47,781,000,000 | 1,840,000,000 | (70,300,000) | 49,550,700,000 | 48,871,882,673 | 678,817,327 |
| | (2) ප්‍රාග්ධන | 101,507,000,000 | 1,091,313,093 | - | 102,598,313,093 | 65,804,340,792 | 36,793,972,301 |
| | උප එකතුව | **149,288,000,000** | **2,931,313,093** | **(70,300,000)** | **152,149,013,093** | **114,676,223,465** | **37,472,789,628** |
| | මුළු එකතුව | **153,419,000,000** | **2,931,313,093** | **-** | **156,350,313,093** | **118,504,930,058** | **37,845,383,035** |

..............................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2026. 02. 26

ඩී.කේ.ටී. සමන්මලී
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
(කෘෂිකර්ම අංශය)
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

## 3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

ඊසීඒ - 2(i)

වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 118

අමාත්‍යාංශයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | |
| | (1) | (2) | (3) | (4)=(1)+(2)+(3) | (5) | (6) | (7) | (8) | (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| පුනරාවර්තන වියදම් | | | | | | | | | | | |
| <u>පුද්ගල පඩිනඩි</u> | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | 1,638,000,000 | - | 403,186,085 | 2,041,186,085 | 2,034,611,999 | 116,000,000 | - | 35,000,000 | 151,000,000 | 149,160,968 | 2,183,772,967 |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | 48,000,000 | - | (11,750,000) | 36,250,000 | 33,606,236 | 10,000,000 | - | - | 10,000,000 | 8,496,567 | 42,102,803 |
| 1003 වෙනත් දීමනා | 1,212,000,000 | - | (270,686,085) | 941,313,915 | 926,442,822 | 85,200,000 | - | (14,000,000) | 71,200,000 | 70,733,963 | 997,176,785 |
| <u>ගමන් වියදම්</u> | | | | | | | | | | | |
| 1101 දේශීය | 23,500,000 | - | (2,550,000) | 20,950,000 | 13,738,719 | 15,000,000 | | | 15,000,000 | 13,730,892 | 27,469,611 |
| 1102 විදේශීය | 19,500,000 | - | (4,500,000) | 15,000,000 | 6,214,114 | - | - | - | - | - | 6,214,114 |
| <u>සැපයීම්</u> | | | | | | | | | - | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 37,000,000 | - | (3,015,000) | 33,985,000 | 25,034,960 | 5,000,000 | - | - | 5,000,000 | 4,889,517 | 29,924,477 |
| 1202 ඉන්ධන | 171,784,000 | - | (26,552,000) | 145,232,000 | 93,678,373 | 21,200,000 | - | (3,300,000) | 17,900,000 | 13,065,672 | 106,744,045 |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | 666,000 | - | - | 666,000 | 448,000 | 200,000 | - | - | 200,000 | 156,000 | 604,000 |
| 1205 වෙනත් | 1,600,000 | - | - | 1,600,000 | 1,083,306 | - | - | - | - | - | 1,083,306 |
| <u>නඩත්තු වියදම්</u> | | | | | | | | | - | | |
| 1301 වාහන | 135,400,000 | - | (1,000,000) | 134,400,000 | 107,443,654 | 5,000,000 | - | - | 5,000,000 | 3,052,113 | 110,495,767 |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 10,800,000 | - | 272,000 | 11,072,000 | 10,053,331 | 1,400,000 | - | - | 1,400,000 | 335,869 | 10,389,200 |
| 1303 ගොඩනැඟිලි සහ ඉදිකිරීම් | 6,800,000 | - | - | 6,800,000 | 3,290,587 | 2,000,000 | - | 1,000,000 | 3,000,000 | 2,831,423 | 6,122,010 |
| 1304 මෘදුකාංග නඩත්තු | 6,800,000 | - | 15,000 | 6,815,000 | 3,262,350 | - | - | - | - | - | 3,262,350 |
| <u>සේවා</u> | | | | | | | | | | | |
| 1401 ප්‍රවාහන | 43,250,000 | - | (9,000,000) | 34,250,000 | 29,229,439 | 600,000 | - | (500,000) | 100,000 | - | 29,229,439 |
| 1402 තැපැල් හා සන්නිවේදන | 36,000,000 | - | (2,000,000) | 34,000,000 | 28,509,770 | 4,000,000 | - | - | 4,000,000 | 2,692,871 | 31,202,641 |

# වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 118

අමාත්‍යාංශයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරුකිරීම් (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | (5) | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7) | මු.රෙ. 66/69 මාරුකිරීම් (8) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| 1403 විදුලිය හා ජලය | 64,500,000 | - | (4,500,000) | 60,000,000 | 46,774,569 | 3,600,000 | - | - | 3,600,000 | 1,635,739 | 48,410,308 |
| 1404 බදු කුලී සහ මලාත් පාලන ආයතන බදු | 25,000,000 | - | - | 25,000,000 | 21,523,273 | 100,000 | - | - | 100,000 | 92,944 | 21,616,217 |
| 1405 පිරිසිදු කිරීම හා සනීපාරක්ෂක සේවා | 31,750,000 | - | (500,000) | 31,250,000 | 19,338,830 | - | - | - | - | - | 19,338,830 |
| 1407 ආරක්ෂක සේවා | 29.000.000 | - | (11.000.000) | 18.000.000 | 15.892.550 | - | - | - | - | - | 15.892.550 |
| 1409 වෙනත් | 59,600,000 | - | (7,120,000) | 52,480,000 | 32,050,573 | 9,000,000 | - | 1,000,000 | 10,000,000 | 8,378,844 | 40,429,417 |
| <u>මාරුකිරීම්</u> | | | | | | | | | | | |
| 1503 රාජ්‍ය ආයතන | - | - | - | - | - | 3,975,000,000 | - | 260,833,000 | 4,235,833,000 | 4,213,787,200 | 4,213,787,200 |
| 1504 සංවර්ධන සහනාධාර | - | - | - | - | - | 37,005,000,000 | 1,840,000,000 | (320,465,000) | 38,524,535,000 | 38,258,366,385 | 38,258,366,385 |
| 1505 සම්මාදම් සහ දායක මුදල් | 200,000,000 | - | - | 200,000,000 | 197,555,885 | - | - | - | - | - | 197,555,885 |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 10,800,000 | - | (1,000,000) | 9,800,000 | 8,182,452 | 1,000,000 | - | (600,000) | 400,000 | 299,708 | 8,482,160 |
| 1508 වෙනත් | 45,000,000 | - | 16,000,000 | 61,000,000 | 55,537,002 | - | - | - | - | - | 55,537,002 |
| 1509 රාජ්‍ය ආයතන (වෙනත් මෙහෙයුම් වියදම්) | - | - | - | - | - | 6,521,000,000 | - | (28,668,000) | 6,492,332,000 | 6,120,176,000 | 6,120,176,000 |
| <u>වෙනත් පුනරාවර්තන වියදම්</u> | | | | | | | | | | | |
| 1703 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 1,250,000 | - | | 1,250,000 | 426,458 | 700,000 | | (600,000) | 100,000 | - | 426,458 |
| මුළු එකතුව | 3,858,000,000 | - | 64,300,000 | 3,922,300,000 | 3,713,929,252 | 47,781,000,000 | 1,840,000,000 | (70,300,000) | 49,550,700,000 | 48,871,882,673 | 52,585,811,926 |
| මූලධන වියදම් | | | | | | | | | | | |

## වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 118

අමාත්‍යාංශයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන් තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | |
| | (1) | (2) | (3) | (4)=(1)+(2)+(3) | (5) | (6) | (7) | (8) | (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම</u> | | | | | | | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 19,500,000 | - | 1,600,000 | 21,100,000 | 15,681,165 | 6,565,000,000 | - | - | 6,565,000,000 | 2,839,765,659 | 2,855,446,823 |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 12,000,000 | - | - | 12,000,000 | 2,899,922 | 3,000,000 | - | - | 3,000,000 | 1,332,974 | 4,232,895 |
| 2003 වාහන | 77,500,000 | - | 6,000,000 | 83,500,000 | 22,477,492 | 17,000,000 | - | - | 17,000,000 | 16,593,470 | 39,070,962 |
| <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | | | | | | | | |
| 2102 ගෘහභාණ්ඩ හා | 22,500,000 | - | (1,600,000) | 20,900,000 | 14,180,907 | 2,000,000 | - | - | 2,000,000 | 1,452,344 | 15,633,251 |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 6,500,000 | - | - | 6,500,000 | 988,980 | 2,000,000 | 96,313,093 | - | 98,313,093 | 20,665,686 | 21,654,666 |
| 2105 ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | - | - | - | - | - | 55,760,000,000 | - | (2,248,000,000) | 53,512,000,000 | 31,978,438,555 | 31,978,438,555 |
| 2106 මෘදුකාංග සංවර්ධනය | 500,000 | - | - | 500,000 | - | 2,000,000 | - | - | 2,000,000 | - | - |
| <u>ප්‍රාග්ධන මාරු කිරීම්</u> | | | | | | | | | | | |
| 2201 රාජ්‍ය ආයතන | - | - | - | - | - | 4,084,000,000 | - | - | 4,084,000,000 | 3,614,538,500 | 3,614,538,500 |
| 2202 සංවර්ධන සහායන් | - | - | - | - | - | 21,501,000,000 | - | (573,150,000) | 20,927,850,000 | 14,166,613,764 | 14,166,613,764 |
| <u>මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | | | | | | | | |
| 2302 ණයදීම | - | - | - | - | - | 1,780,000,000 | - | (50,000,000) | 1,730,000,000 | 1,463,676,399 | 1,463,676,399 |
| <u>හැකියා වර්ධනය</u> | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | 34,500,000 | - | - | 34,500,000 | 23,200,142 | 3,000,000 | - | - | 3,000,000 | 2,290,325 | 25,490,468 |
| <u>වෙනත් මූලධන වියදම්</u> | | | | | | | | | | | |

ජසිජ - 2(i)

## වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 118

අමාත්‍යාංශයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | මුළු වියදම |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන් තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | |
| | (1) | (2) | (3) | (4)=(1)+(2)+(3) | (5) | (6) | (7) | (8) | (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| 2506 යටිතල පහසුකම් සංවර්ධනය | - | - | - | - | - | 2,070,000,000 | - | 156,150,000 | 2,226,150,000 | 1,439,051,347 | 1,439,051,347 |
| 2507 පර්යේෂණ සහ සංවර්ධන | - | - | - | - | - | 2,660,000,000 | 995,000,000 | 787,297,793 | 4,442,297,793 | 3,606,354,363 | 3,606,354,363 |
| 2509 වෙනත් | 100,000,000 | - | - | 100,000,000 | 35,348,733 | 7,058,000,000 | - | 1,927,702,207 | 8,985,702,207 | 6,653,567,406 | 6,688,916,140 |
| මුළු එකතුව | 273,000,000 | - | 6,000,000 | 279,000,000 | 114,777,341 | 101,507,000,000 | 1,091,313,093 | - | 102,598,313,093 | 65,804,340,792 | 65,919,118,132 |
| මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව | 4,131,000,000 | - | 70,300,000 | 4,201,300,000 | 3,828,706,593 | 149,288,000,000 | 2,931,313,093 | (70,300,000) | 152,149,013,093 | 114,676,223,465 | 118,504,930,058 |

* අදාළ වැය විෂයයන් පමණක් ඇතුළත් කර ආකෘතිය සංශෝධනය කර ගත යුතු ය.

..........................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026.02.26

ඩී.කේ.ටී. සමන්මලී
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
(කෘෂිකර්ම අංශය)
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

ඒසීඒ-6

### මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය - 2025

ACA-6 ආකෘතිය වෙනුවට නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව මෙහි අමුණා තිබිය යුතු ය. (SA-82)

Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2025

| | | | |
|---|---|---|---|
| **Land-9153:** | 98,336,423,393.74 | **Table:** | SA 82 |
| **Building- 9151:** | 8,358,678,262.70 | **Year:** | 2025 |
| **Machinary-9152:** | 22,460,126,135.64 | **Rpt Date** | 2/16/2026 10:26 |
| **WIP-9160:** | 0 | **Head** | 118 |
| **Intangible-9154:** | 3,609,121.50 | | |
| **Lease-9180:** | **0** | | |

NEW CIGAS FINAL 2025 REPORTS

| Ledger | category | Item | Code | Opn Bal | Opn Bal Add | TransferIn | Purchase | Disposal | Balance |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9151 | 1.2-Non Residential Building | | 61112 | 8,358,678,262.70 | 0 | 0 | 0 | 0 | 8,358,678,262.70 |
| | | Office Building | ****6111201 | 8,358,678,262.70 | 0 | 0 | 0 | 0 | 8,358,678,262.70 |
| 9152 | 2.1-Transport Equipment | | 61121 | 13,468,947,330.00 | 5,002,270,000.00 | 22,500,000.00 | 0 | 829,192,800.00 | 17,664,524,530.00 |
| | | Passenger vehicle | ****6112101 | 13,453,633,570.00 | 5,002,270,000.00 | 22,500,000.00 | 0 | 827,360,000.00 | 17,651,043,570.00 |
| | | Motor cycle | ****6112109 | 15,313,760.00 | 0 | 0 | 0 | 1,832,800.00 | 13,480,960.00 |
| 9152 | 2.2-Other Machinary & Equipment | | 61122 | 4,599,111,269.59 | 117,069,124.00 | 0 | 158,150,198.45 | 78,728,986.40 | 4,795,601,605.64 |
| | | Defence Equipment | ****6112215 | 0 | 0 | 0 | 286,600.00 | 0 | 286,600.00 |
| | | Office Equipment | ****6112201 | 280,421,508.70 | 751,400.00 | 0 | 131,129,966.00 | 2,819,557.11 | 409,483,317.59 |
| | | Broadcasting Equipment | ****6112214 | 200,000.00 | 0 | 0 | 0 | 0 | 200,000.00 |
| | | Communication Equipment | ****6112204 | 467,439,214.72 | 4,334,000.00 | 0 | 1,043,520.00 | 3,924,951.00 | 468,891,783.72 |
| | | Construction Eqipment | ****6112213 | 125,039.92 | 0 | 0 | 0 | 0 | 125,039.92 |
| | | Computer Equipment | ****6112202 | 1,601,502,097.72 | 55,491,524.00 | 0 | 11,880,289.36 | 19,181,170.50 | 1,649,692,740.58 |
| | | Furniture | ****6112205 | 1,811,023,070.77 | 45,783,000.00 | 0 | 6,676,927.50 | 23,854,970.01 | 1,839,628,028.26 |
| | | Agricultural & Dairy Farm Equipment | ****6112216 | 15,695,417.50 | 0 | 0 | 0 | 0 | 15,695,417.50 |
| | | Musical Instruments | ****6112206 | 204,000.00 | 0 | 0 | 0 | 0 | 204,000.00 |
| | | Electrical Equipment | ****6112203 | 421,404,120.26 | 10,709,200.00 | 0 | 7,132,895.59 | 28,948,337.78 | 410,297,878.07 |
| | | Paintings Sculptures & other Antiques | ****6112209 | 1,096,800.00 | 0 | 0 | 0 | 0 | 1,096,800.00 |
| 9154 | 5.3 Other Non Finacial-Intangible | | 61133 | 4,176,121.50 | 0 | 0 | 0 | 567,000.00 | 3,609,121.50 |
| | | Computer Software | ****6113301 | 4,176,121.50 | 0 | 0 | 0 | 567,000.00 | 3,609,121.50 |
| 9153 | 4.1-Land | | 61410 | 180,575,194,260.00 | 0 | 0 | 42,805,880,603.02 | 131,471,845,733.02 | 91,909,229,130.00 |
| | | Land | ****614100 | 180,575,194,260.00 | 0 | 0 | 42,805,880,603.02 | 131,471,845,733.02 | 91,909,229,130.00 |
| 9153 | Water | | 61414 | 11,166,994,435.00 | 0 | 0 | 0 | 4,739,800,171.26 | 6,427,194,263.74 |
| | | Reservoirs | ****6141403 | 11,166,994,435.00 | 0 | 0 | 0 | 4,739,800,171.26 | 6,427,194,263.74 |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. ඒආර්අයි/ඒ/එමඕඒ/02/2026/04/07 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

**ශීර්ෂය 118 - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 118 - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධිත) පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

(අ) ඒසීඒ-1 ආකෘතියට සහ CIGAS පරිගණක පද්ධතියට අනුව සමාලෝචිත වර්ෂය තුළ 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව රැස්කරගෙන ඇති ආදායම රු.68,273,002 ක් ලෙසද, ඒසීඒ-1(i) ආකෘතියට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව තවදුරටත් අයකර ගතයුතු හිඟ ආදායම රු.648,779,153ක් ලෙසද ගිණුම්ගතකර තිබුණු අතර ගිණුම් අංශයේ ලිපිගොනු වලට අනුව සමාලෝචිත වර්ෂය තුළ උක්ත වැඩසටහනට අදාළව රැස්කරගෙන ඇති ආදායම රු.61,894,276 ක් ද, තවදුරටත් අයකර ගතයුතු හිඟ ආදායම රු.655,157,879 ක් ද විය. ඒ අනුව වර්ෂයේ රැස්කරන ලද අදායම හා වර්ෂය අවසාන දිනට හිඟ ආදායමෙහි රු.6,378,726 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ඒසීඒ-1(i) ආකෘතියට අනුව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙලකර ඇති හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් සහ වර්ෂය අවසාන ශේෂය ගිණුම්ගතකර නොතිබුණි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දිනට 2003.07.00 දරන ආදායම් සංකේතයේ හිඟ ආදායමේ සම්පූර්ණ වටිනාකම හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ගිණුම් අංශයේ ලිපිගොනු වලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, පොළොන්නරුව හා පුත්තලම යන දිස්ත්‍රික්ක වලින් තවදුරටත් අයකර ගතයුතු හිඟ ආදායම රු.579,246,258 ක් වන අතර ලංකා සතොස ආයතනය මඟින් ලබාදුන් තොරතුරු වලට අනුව තවදුරටත් එම දිස්ත්‍රික්ක වලින් අයවිය යුතු හිඟ ආදායම රු.24,780,679 ක් වේ. ඒ අනුව රු.544,465,579 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශන වල ඒසීඒ - 1(iii) ආකෘතිය ප්‍රකාරව වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මොරගහකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය මඟින් 2025 වර්ෂය සඳහා ජලවිදුලිය විකිණීම වෙනුවෙන් ලද තත්‍ය ආදායම රු.1,436,959,970 ක් ලෙස සඳහන් කර තිබුණද අදායම් ප්‍රකාශය අනුව (ඒසීඒ-1) 2025 වර්ෂය සඳහා ලැබී තිබුණු තත්‍ය ආදායම රු.1,871,366,009 ක් වූයෙන් ඒ අතර රු.434,406,039 ක වෙනසක් විය. එසේම එම බලාගාර ව්‍යාපෘති ආදායම ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද ආදායම රු.1,871,714,601 ක් වුවද සිගැස් පරිගණක යෙදවුමෙන් යාවත්කාලීන වූ ආදායම රු.1,872,063,193 ක් වූයෙන් ඒ අතර රු.348,592 ක වෙනසක්ද විය.

(ඉ) මොරගහකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ අදායම් ලැබීම් විස්තරවලට අනුව ජල විදුලිය විකිණීම වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් නොමැති වුවද මූල්‍ය ප්‍රකාශයෙහි හිඟ ආදායම් ප්‍රකාශයේ (ACA-1(i)) 2023 වර්ෂයට අදාළව රු.11,224,726 ක් හිඟ හිටි ලෙස දක්වා තිබුණි.

### 1.6.2 මූලධන වියදම්

කෘෂිකර්ම අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ 2103 වැය විෂයය සඳහා 240 ශීර්ෂය මඟින් රු.73,489,136 ක ප්‍රතිපාදනයන් යටතේ කෘෂි උපකරණ 05ක් සහ අනෙකුත් උපකරණ කට්ටලයක් විදේශ ප්‍රදාන ලෙස ලැබී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට භාර දී තිබුණද, අදාළ ප්‍රදානයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 625(1) ප්‍රකාරව ගිණුම් කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් මූලධන වියදම් අවතක්සේරු වී තිබුණි. තවද ප්‍රදානයන් ලෙස ලැබී තිබුණු මෙම උපකරණ මු.රෙ.625 (ආ) සහ (ඉ) පරිදි ඉන්වෙන්ට්‍රි ලේඛනයක ඇතුළත්කර නොතිබුණි.

### 1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA-06/SA 82 ආකෘතියෙහි) මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම්වල එකතුව රු.129,158,836,914 ක් වන අතර අමාත්‍යාංශයෙහි එක් එක් අංශය විසින් පිළියෙළකර තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයන්හි එකතුව රු.4,391,348,967 ක් විය. ඒ අනුව රු.124,767,487,947 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ අනෙකුත් ආයතන වලින් මාරුකරගෙන ඇති මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම රු.22,500,000ක් වුවද අමාත්‍යාංශයෙහි එක් එක් අංශ විසින් ලබාදුන් තොරතුරු වලට අනුව මාරුකරගෙන ඇති වත්කම්හි වටිනාකම රු.4,500,000 ක් විය. ඒ අනුව රු.18,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ එක් එක් අංශය විසින් මිලදී ගෙන ඇති මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම රු.42,964,030,801 ක් වුවද අමාත්‍යාංශයෙහි එක් එක් අංශ විසින් ලබාදුන් තොරතුරු වලට අනුව වර්ෂය තුළ මිලදීගෙන ඇති වත්කම්හි වටිනාකම රු.9,549,976,058 ක් විය. ඒ අනුව රු.33,414,054,743 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ එක් එක් අංශය විසින් අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම රු.137,120,134,690 ක් වුවද අමාත්‍යාංශයෙහි එක් එක් අංශ විසින් ලබාදුන් තොරතුරු වලට අනුව වර්ෂය තුළ අපහරණය කරන ලද වත්කම්හි වටිනාකම රු.29,744,688,323 ක් විය. ඒ අනුව රු.107,375,446,368 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අංක 2412/08 හා 2024 නොවැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ග්‍රාමීය ආර්ථික අංශය වෙළඳ, වාණිජ,ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරා තිබුණද 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 ප්‍රකාරව ග්‍රාමීය ආර්ථික අංශය සතු වටිනාකම රු.109,748,677 ක් වූ මූල්‍ය නොවන වත්කම් නව අමාත්‍යාංශය වෙත මාරු කිරීමකින් තොරව තවදුරටත් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනයවී තිබුණි.

(ඊ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය හා පශු සම්පත් අංශය විසින් පරිහරණය කරනු ලබන වාහන සම්බන්ධයෙන් 2025 දෙසැම්බර් 31 දිනට සිදුකල ලේඛන හා CIGAS පරිගණක පද්ධතිය පරීක්ෂාවේදී පහත කරුණු විගණනයට නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශයට අයිතිය නොමැති සහ භාවිතයේ නොපවතින වටිනාකම රු.88,692,820ක් වූ වාහන 07ක් CIGAS පරිගණක පද්ධතියේ සහ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්කර තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අධිතක්සේරුවී ඇති බව නිරීක්ෂණය විය.

(ii) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු වුවත් වෙනත් ආයතනයන් වෙත නීත්‍යානුකූල හිමිකාරීත්වය පවතින කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාවිතයේ ඇති වටිනාකම රු.7,600,000 ක් වූ වාහන 03 ක් CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත්කර ඇති බව නිරීක්ෂණය විය.

(iii) අමාත්‍යාංශය භාවිතා කරන ලියාපදිංචි අයිතිය අමාත්‍යාංශය සතු එකතුව රු.303,980,000 ක් වටිනා වාහන 24ක් හා වටිනාකම සඳහන් නොකළ වාහන 01 ක් CIGAS පරිගණක පද්ධතියේ සහ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි.

(iv) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය පවතින වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාවිතා කරන වටිනාකම රු.138,700,000 ක් වූ වාහන 13 ක් සහ වටිනාකම සඳහන් නොකරන ලද වාහන 10ක් පැවරුම්ලාභී අමාත්‍යාංශය නමින් ලියාපදිංචිය සිදු නොකර තවදුරටත් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වූ අතර මෙම වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී ඇති බව නිරීක්ෂණය විය.

(උ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 13,770.22 ක පිරිවැයක් දරන ලද එහෙත් 2025 දෙසැම්බර් 31 දින දක්වා නිමවී නොමැති වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මකවන දේශීය අරමුදල් ව්‍යාපෘති 06 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ (SA 82) ගිණුම් ගත කර නොතිබුණි. තවද මෙම එක් එක් ව්‍යාපෘති වෙනුවෙන් කෙරීගෙන යන වැඩ වාර්තා හෝ විස්තරාත්මක වියදම් විස්තරද සකස් කර නොතිබුණි.

(ඌ) වාරිමාර්ග අංශය විසින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ වාහන 118 ක වටිනාකම රු.1,120,129,125 ක් ලෙස දක්වා තිබුණද යාන්ත්‍රික අංශය විසින් ලබාදුන් තොරතුරු අනුව අමාත්‍යාංශ ලේකම් නමින් ලියාපදිංචි අමාත්‍යාංශය සතු කැබ් රථ, කාර් රථ, මෝටර් රථ ඇතුළුව වාහන 178 ක් ගිණුම් ගත කර නොතිබුණි. තවද මෙම අංශයට අයත් යන්ත්‍රෝපකරණ 48 ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර එහි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) එවකට පැවති වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති 5 ක ඉදිකිරීම් පවත්වාගෙන ගොස් තිබුණු අතර එම ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට සිදුකර ඇති මුළු වියදම රු.9,679,003,446 ක් විය. එහෙත් එම දිනෙන් පසු මෙම ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා කිසිදු මුදලක් වියදම් කිරීමකින් තොරව අත්හැර දමා ඇතත් ඒ සඳහා දැරූ වියදම් සඳහා විස්තරාත්මක වියදම් විස්තරයක් සකස් කර නොතිබුණි. එහෙත් විධිමත් අනුමැතියකින් තොරව ව්‍යාපෘති ගණකාධිකාරිගේ 2025 දෙසැම්බර් 11 දිනැති අංක MI/F/15/Project Gen/2025 දරන ලිපිය මගින් මෙම ව්‍යාපෘති වියදම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පවරන ලද බවට සඳහන් කර පොත්වලින් ඉවත් කර තිබුණත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එම වියදම් හෝ වත්කම් භාරගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඇති බවට අමාත්‍යාංශයට දැනුම් දීමක් සිදුකර නොමැති අතර ඉහත ලිපිය ප්‍රකාර එම වියදම් මහවැලි අධිකාරියේ පොත් වලට ගැනීමක්ද සිදුකර නොමැති බව අනාවරණය විය.

### 1.6.4 මූල්‍ය වත්කම්

(අ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.511,340 ක් වූ අතර එම ණය ශේෂ වර්ෂ 1-3 ත් අතර කාලපරිච්ඡේදයට අයත් ඒවා විය.

(ආ) ග්‍රාමීය ආර්ථික අංශයේ වැඩ තහනම් කළ නිලධාරියෙකු ගෙන් අයවිය යුතු වර්ෂ 5-10 ත් අතර කාලපරිච්ඡේදයකට අදාළ රු.175,714 ක ණය ශේෂයක් වූ අතර සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5-10ත් අතර කාලපරිච්ඡේදයට අයත් ණය ශේෂය රු.249,535 ක් විය.

(ඇ) පශු සම්පත් අංශයේ සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකු ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.338,927 ක් වූ අතර ඉන් එකතුව රු.286,408 ක් වූ දෙදෙනෙකුගේ ශේෂ වර්ෂ 1-3 ත් අතර කාලපරිච්ඡේයට අයත් වූ ශේෂයක් වූ අතර රු.62,519 ක ශේෂය වර්ෂ 10 -20 ත් අතර කාලපරිච්ඡේදයට අයත් විය.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති ප්‍රකාරව ඉඩම් අංශයේ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකරගත යුතු වර්ෂ 01 – 03 ත් අතර කාලපරිච්ඡේදයකට අදාළ රු.226,024 ක අයකර නොගත් පැරණි ණය ශේෂයක් පැවතුණි.

(ඉ) 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 262/2017 අනුව අයකරගත යුතු 2025 දෙසැම්බර් 31 දින වන විට මියගොස් ඇති ඉඩම් අංශයේ නිලධාරිනියකගෙන් අයවීමට තිබෙන වසර 1–3 ත් අතර කාලපරිච්ඡේදයකට අදාළ රු.236,802ක ණය ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. ඒ අනුව 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වාරිමාර්ග අංශයෙහි මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.222,545 ක් විශ්‍රාම ගිය නිලධාරීන් සිව් දෙනෙකුගෙන් අයවිය යුතු රු.359,364 ක් සේවය අත හැර ගිය නිලධාරීන් සිව්දෙනෙකුගෙන් අයවිය යුතු රු.801,408 ක්, වෙනත් ආයතන වෙත ස්ථාන මාරු වී ගිය සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.80,511 ක් හා හඳුනා නොගත් ණය ශේෂය රු.431,666 ක් වශයෙන් එකතුව රු.1,895,494 ක ණය ශේෂයක් අයකර ගැනිමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල පැවතුණි. මෙම ශේෂ තුළ වර්ෂ 1ට අඩු රු.1,015,749 ක ශේෂයක් ද වර්ෂ 1ත් 3ත් අතර රු.359,122 ක්ද වර්ෂ 10ත් 20ත් අතර රු.520,623 ක් ද විය.

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශයෙහි කෘෂිකර්ම අංශය විසින් පහත ලේඛන විධිමත්ව හා යාවත්කාලීනකර පවත්වාගෙන ගොස් නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | හානි හා පාඩු ලේඛනය | මු.රෙ. 104 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ආ) | වැය ලෙජරයන් | මු.රෙ. 447 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදේශ ප්‍රදාන උපකරණ සඳහා වූ ඉන්වෙන්ට්‍රි ලේඛනය | මු.රෙ. 625 (ආ) සහ (ඉ) | පවත්වා නොතිබුණි. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| | ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| | කෘෂිකර්ම අංශය | | |
| (අ) | 4.9 | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. | 4.6 |
| (ආ) | 1.6.2.2 (ඉ) | අළුත්වැඩියා සිදුකර වාහනය භාවිතයට ගතයුතුය. | 4.7(ආ) |
| (ඇ) | 4.10 | තැන්පතු මුදල අයකර ගත යුතුය. | 4.7(අ) |
| | වාරිමාර්ග අංශය | | |
| (ඇ) | 1.6.1 (ආ) I | 2024 හා 2025 යන වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමකින් තොරව ඉදිකිරීම් නවතා දමා ඇති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවැති ව්‍යාපෘති වියදම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ (SA 82) ගිණුම් ගත කල යුතුය. | 1.6.3 (උ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 අග්‍රිම කළමනාකරණය

පෙර පැවති රජයේ පොහොර සමාගම් වන සී/ස ලංකා පොහොර සමාගම හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් 2018,2019,2020 හා 2021 වර්ෂයන්හිදී ආනයනය කරන ලද පොහොර සඳහා වූ ණයවර ලිපි කල්පිරෙන අවස්ථාවේදී අදාළ සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමට අවශ්‍ය මුදල් එම අවස්ථාවේදී භාණ්ඩාගාරයෙන් නොලැබීම මත රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු කාලීන ණය මුදල වන රු.47,465,632,771 කට අදාළව 2025 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් රු.8,784,284,850 ක ප්‍රාග්ධන වටිනාකමක් ගෙවා තිබුණු අතර රු.1,443,211,932 ක පොලී වියදමක් දරා තිබුණි. ඒ අනුව තවදුරටත් ගෙවීමට ඇති ණය ශේෂ වටිනාකම රු.8,993,745,673ක් බව නිරීක්ෂණය විය.

### 3.2 ආදායම් කළමනාකරණය

(අ) මු.රෙ.128(2)(ඇ), මු.රෙ.176(1), අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව අංක 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ කෘෂිකර්ම අංශයේ අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා එකී කාල සීමාව අවසන්වී මසක් ඇතුළත රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂවරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවද, 2025 මූල්‍ය වර්ෂයට අදාළව එකී වාර්තා කිසිවක් අදාළ කාල සීමාව අවසන්වී මසක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) ඒසීඒ-1(iii) ආකෘතියෙහි රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළ සංශෝධිත ආදායම් ඇස්මේන්තුව හා සත්‍ය ආදායම අතර විචලතාවය සියයට 38 ක් ලෙස දක්වා විචලතාවයට හේතු වශයෙන් අපේක්ෂිත ආදායම රැස්කර ගැනීමට නොහැකි වූ බව දක්වා තිබුණද, එසේ වීමට අදාළ නිශ්චිත හේතු දක්වා නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකරගතයුතු හිඟ ආදායම රු.648,779,153ක් වන අතර එය සමස්ථ හිඟ ආදායමෙන් සියයට 90ක් ගෙන තිබූ අතර වර්ෂ 03කට වඩා පැරණි ණය ශේෂයක් විය. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ආදායම් රැස් කිරීම හා හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව අමාත්‍යාංශයේ අධීක්ෂණය ඉතා දුර්වල මට්ටමක පැවතිණි.

(ඈ) වාරිමාර්ග අංශයට අයත් කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමණාකරනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයෙහි කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා සපයනු ලබන නේවාසික පහසුකම් සඳහා ආයතනය විසින් අයකරනු ලබන ගාස්තු හා ආයතනය විසින් සපයනු ලබන අනෙකුත් පහසුකම් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු තීරණය කිරීමට අදාල නිර්ණායකයන් නිශ්චය කර ඒ සඳහා අමාත්‍යාංශ අනුමැතියක් ලබා ගෙන නොතිබූ අතර එම පුහුණු ආයතනය 2024 වර්ෂය තුළදි කෙටි කාලීන පුහුණු වැඩසටහන් 18ක් පවත්වා එමගින් ආයතනයට රු.4,435,871 ක ආදායමක් ලබාගෙන තිබුණු අතර එයින් වියදම අඩුකල පසු රු.2,222,241 ක අතිරික්ත මුදලක් පැවැතියද රු.1,573,127 ක් මුදලක් පමණක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. ඒ අනුව රු.649,114 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.

### 3.3 වියදම් කළමනාකරණය

(අ) කෘෂිකර්ම අංශයේ මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් යටතේ වන පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් වෙනුවෙන් 2025 අංක 03 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව වැය ශීර්ෂ අංක 240 මගින් වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදනයන්ගෙන් වැය විෂයයන් 03 කට අදාළව සියයට 16 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. එමගින් අමාත්‍යාංශයේ වාර්ෂික වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ ඌනතාවයන් මෙන්ම සැලසුම්ගත ප්‍රාග්ධන ව්‍යාපෘතීන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සහ අවශ්‍යතාවය ඉක්මවා ප්‍රතිපාදන වෙන්කර ගැනීම කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මූලධන වැය විෂයයන් යටතේ කෘෂි අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 80, 93 හා 94 ට අදාළව මූලධන වැය විෂයය අංක 2506 හා 2509 වෙත ලබාගෙන තිබුණු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 22 සිට සියයට 83 දක්වා පරාසයකද, කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ මූලධන වැය විෂයය අංක 2003 සඳහා ලබාගෙන තිබුණු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 15 ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වෙනත් වැය විෂයයන් සඳහා අතිරික්ත ප්‍රතිපාදන මාරුකර යැවීමෙන් පසුවද, කෘෂි අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 47, 66, 80 සහ 95 ට අදාළව මූලධන වැය විෂයයන් යටතේ වූ අයවැය ප්‍රතිපාදන සියයට 25 සිට සියයට 77 දක්වාද, කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා වෙන්කර තිබුණු අයවැය ප්‍රතිපාදනයන්ගෙන් එම වැය විෂයයන් තුළ සියයට 16 සිට සියයට 95 දක්වාද, කෘෂි අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 73 හා 91 ට අදාළ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා වෙන් වී තිබුණු අයවැය ප්‍රතිපාදනයන්ගෙන් පිළිවෙලින් සියයට 14 ක හා සියයට 31 ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි.

(ඈ) විසර්ජන පනත මඟින් කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ පුනරාවර්තන වැය විෂයය අංක 1101,1102 හා 1201 වෙනුවෙන් වෙන් වී තිබුණු අයවැය ප්‍රතිපාදනයන්ගෙන් සියයට 23 සිට සියයට 45 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඉ) කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ මූලධන වැය විෂයය අංක 2001,2002, 2103 හා සංවර්ධන වැඩසටහන් යටතේ වූ මූලධන වැය විෂයය අංක 2002 සඳහා වෙන් වී තිබුණු රු.310,500,000 ක අයවැය ප්‍රතිපාදනද, සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 64 ට අදාළව පුනරාවර්තන වැය විෂයය අංක 1509 ට වෙන් වී තිබුණු රු.39,000,000 න් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයකට රු.16,668,000 ක ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසු ඉතිරි ප්‍රතිපාදනද, කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ පුනරාවර්තන වැය විෂයය අංක 1405 සඳහා වෙන් වූ ප්‍රතිපාදනයෙන් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයකට රු.500,000ක ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසු ඉතිරි ප්‍රතිපාදනද සියයට 100 ක් ඉතිරි වී තිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි 622 ප්‍රකාරව කෙටුම්පත් ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේ අපේක්ෂා නොකළ විදේශ ප්‍රදාන/ත්‍යාග සඳහා වීරමොං ක්‍රියාපටිපාටිය හෝ පරිපූරක හරහා ප්‍රතිපාදන ලබාගතයුතු වුවද, කෘෂිකර්ම අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ 2103 වැය විෂයයට අදාළව 240 ශීර්ෂය මඟින් රු.73,489,136 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණද එම ලැබී ඇති විදේශ ප්‍රදානය හදිසි ප්‍රදානයක් නොව 2025 වර්ෂයට පෙර සිට අපේක්ෂාකර ඇති විදේශ ප්‍රදානයක් බව ලිපිගොනු පරීක්ෂාවේදී විගණනයට නිරීක්ෂණය විය.

(උ) මූල්‍ය ප්‍රකාශන තුළ ඒසීඒ 2(ii) ආකෘතිය යටතේ දක්වා ඇති සංවර්ධන වියදම් යටතේ වන වැය විෂයය අංක 2103 හි ප්‍රතිපාදන ඉතිරිය සියයට 79 ක් වී තිබුණු අතර ඉතිරියට හේතුව ලෙස ලැප්ටොප් සහ ස්කැනර් යන්ත්‍ර මිලදී ගැනීම ප්‍රතික්ෂේප වීම දක්වා තිබුණද, මෙම ප්‍රතිපාදන ඉතිරියෙන් සියයට 94 ක් ම විදේශ ප්‍රදාන ලෙස ලැබෙන කෘෂි උපකරණ වෙනුවෙන් ශීර්ෂ 240 මඟින් වෙන්කරවාගත් ප්‍රතිපාදන බව නිරීක්ෂණය විය.

(ඌ) ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 50 ප්‍රකාර හා අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම හා සැලසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම නිසා 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අංශය යටතේ මූලධන වියදම් වැය විෂය 04 ක් සඳහා වෙන් කරන ලද සහ පුනරාවර්තන වියදම් වැය විෂය 02 ක් සඳහා වෙන්කරන ලද රු.15,500,000 න් රු.200,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. තවද වැය විෂයන් 26 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.51,247,720,000 ක ශුද්ධ ප්‍රතිපාදයෙන් එකතුව රු.23,180,545,846 ක් ඉතිරිවි තිබුණ අතර එම ඉතිරිය සියයට 30 ත් සියයට 93ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(එ) 2025 වර්ෂයේ දී අමාත්‍යාංශයේ ඉඩම් අංශයෙහි වැඩසටහන් 01 හි වැය විෂයයන් 03 ක් සඳහා රු.11,900,360 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම ප්‍රතිපාදන වලින් රු.7,529,617 ක් එනම් සියයට 60 ත් සියයට 100 ත් අතර ප්‍රමාණයකින් ඉතිරිවී තිබුණි. තවද තවත් වැය විෂයන් 07 කට වෙන් කරන ලද රු.31,130,339 ක ප්‍රතිපාදනයෙන් රු.11,000,869 ක මුදලක් එනම් සියයට 25 ත් සියයට 50 ත් අතර ප්‍රමාණයක් ඉතිරිවී තිබුණි.

(ඒ) අමාත්‍යාංශයේ වැඩසටහන් 02 හි වැය විෂයන් අංක 2105 හා 2509 යටතේ ඉඩම් අංශයේ ප්‍රතිපාදන වෙන් කිරීමේදී අදාළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ හැකිද යන්න විධිමත් අධ්‍යයනයකින් තොරව වෙන්කළ මුල් ප්‍රතිපාදනය වූ රු.5,000,000,000 න් රු.1,282,297,793 ක ප්‍රතිපාදන නැවත වෙනත් වැය විෂයයන් වෙත මු.රෙ 66 යටතේ මාරු කර තිබුණු අතර අනතුරුව රු.1,258,279,779 ක් එනම් සියයට 34 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ඔ) මුදල් රෙගුලාසි 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ වගකීම, තම දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වග බලාගැනීම හා ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. එසේ වුවද ඉඩම් අංශයෙහි වැය විෂයයයන් 09 ක් වෙනුවෙන් සිදු කරනු ලැබූ මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු.4,054,000,000 ක් පසුකාලීනව සියයට 30 ක ප්‍රමාණයකින් එනම් එකතුව රු.1,220,265,000 කින් අඩුවී තිබුණු බව නිරීක්ෂණය වේ.

**3.4 බැරකම් හා බැදීම්වලට එළඹීම**

(අ) අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට රු.4,272,613 ක් වූ බැදීම් හා බැරකම් කෘෂිකර්ම හා පශු සම්පත් අංශය විසින් බැදීම් හා බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබිණි.

(ආ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම හා පශු සම්පත් අංශයට අයත් රු.17,127,988ක බැරකම් මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇමුණුම අංක iii යටතේ ඇතුළත් කර නොතිබුණි.

## 3.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.11 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය වෙත නිකුත් කරන ලද විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| භාණ්ඩාගාර ලේකම්ගේ 2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන චක්‍රලේඛය වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | අපහරණය කිරීමට යෝජිත අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය සතු වාහන 41 ක් සහ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ 2024 මැයි 20 දිනැති අංක CGO/NFAMS/01/03 දරන ලිපිය ප්‍රකාරව එහි සඳහන්කර ඇති වාහන 05ක්ද සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අපහරණය කිරීමට කටයුතුකර නොමැතිබව නිරීක්ෂණය විය. |

## 3.7 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ PF-8350 දරන රථයේ රියදුරු මහතෙකු 2025 ජූලි මස අග සිට සැප්තැම්බර් මස අග දක්වා පෞද්ගලික හේතූන් මත නිවාඩු ලබාගෙන සේවයට වාර්තා නොකළද එම මාස සඳහාවූ මාසික වැටුප ලෙස රු.110,955 ක මුදලක් ඔහුගේ බැංකු ගිණුමට බැරකර තිබුණි. ඒ අනුව සේවයේ නොයෙදුණු කාලයකට ගෙවීම් කිරීම සම්බන්ධයෙන් හා මුලාශ්‍ර ලේඛන නොමැති ගෙවීමක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 ප්‍රකාරව බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම සිදුකළ ආකාරය සම්බන්ධයෙන් විගණනයට ගැටලුකාරී විය.

## 3.8 බැංකු ගිණුම් මෙහෙයවීම

අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ බලතල යටතේ මෙහෙයවීම සිදුවන බත්තරමුල්ල ලංකා බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය හා සභාපති, ගොවීන්ගේ භාරකාර අරමුදල නමින් වූ නිල බැංකු ගිණුම් දෙකක් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඇමුණුම (viii) මඟින් ඉදිරිපත්කර නොතිබුණි.

### 3.9 තැන්පතු

2025 දෙසැම්බර් 31 දිනට වසර 02 ක් ඉක්ම වූ ඉඩම් අංශයට අදාළ රු.426,593 ක ඉකුත් තැන්පතු ශේෂය රාජ්‍ය ආදායමට බැර නොකර එම ගිණුමේ රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය විය.

### 3.10 අවිධිමත් ගනුදෙනු

2024 වර්ෂයේ පැවැත් වූ ලෝක ඉඩම් සමුළුව සඳහා ඉඩම් අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයා හා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති) යන නිලධාරීන් දෙදෙනා සඳහා නවාතැන් පහසුකම් හා ආහාර පාන ලබාදෙන බවට ලෝක බැංකුවේ ශ්‍රී ලංකා හා මාලදිවයින් කළමනාකරුගේ 2024 මාර්තු 13 දිනැති ලිපියෙහි සඳහන් වී තිබියදීත් ඔවුන්ට සංයුක්ත දීමනාව ලෙස රු.714,980 ක් ගෙවා ඇති අතර 2026 මාර්තු 27 දිනට උක්ත නිලධාරීන් දෙදෙනාගෙන් තවදුරටත් අයවිය යුතු මුදල රු.640,419 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ඉඩම් අංශය විසින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා රු.1,656,654,840 ක මුදලක් ගෙවීම් කර මනින ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 2,134,429ක් වූ අතර ඉන් ලබා දී තිබූ හිමිකම් සහතික ප්‍රමාණය 482,139 ක් පමණක් බව නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ බිම්සවිය වැඩසටහන සඳහා 2018 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී රු.276,510,197 ක ප්‍රතිපාදන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. මෙම වැඩසටහන ආරම්භ වූ 1998 වර්ෂයේ සිට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත හිමිකම් සහතික පත්‍ර පිළියෙළ කිරීම සඳහා උපලේඛන යවන ලද බිම් කැබලි සංඛ්‍යාව 864,960 ක් ලෙසත්, එම ප්‍රමාණයෙන් ලියාපදිංචි වී ඇති හිමිකම් සහතික ප්‍රමාණය 474,518 හෝ සියයට 54 ක් බව නිරීක්ෂණය විය.

#### 4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) පසු අස්වනු බෝග හානි අවම කිරීම හා ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමකින් තොරව 2023, 2024 හා 2025 වර්ෂවලදී රු.47,289,222 ක් වැයකර හම්බන්තොට දිස්ත්‍රික්කයේ කච්චිගල්ආර ග්‍රාම නිලධාරී වසමේ වී අළෙවි මණ්ඩලයට අයත් ගබඩා පරිශ්‍රයක අපනයනය සඳහා වූ ඇඹුල් කෙසෙල් සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණු අතර ඉදිකිරීමේ කටයුතු අවසන්වූ පසු ගොඩනැගිල්ල සහ සවිකිරීම් පවරාදීම පිළිබඳ නිශ්චිත තීරණයක් ගෙන නොතිබුණි. පසුව ගොවි සමාගමක් පිහිටුවා මධ්‍යස්ථානයේ භාරකාරීත්වය එම සමාගමට භාරදීමට යෝජනා වී ගොවි සමාගම ලියාපදිංචි කිරීමට අදාල නෛතික කටයුතු සිදුකිරීම සඳහා තෝරාගත් සේවා සැපයුම්කරු සමඟ රු.500,000 ක ලංසු වටිනාකමක් යටතේ ගිවිසුම්ගත වී තිබුණද, ගොවි සමාගම පිහිටුවීමේ කටයුතු මෙම වාර්තාවේ දිනවන විටද සිදු වී නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත නිමවුම

අපනයනය කිරීම සඳහා කිසිදු අපනයනකරුවෙකු හඳුනාගෙන නොතිබුණු අතර අක්‍රියව පවතින මෙම ව්‍යාපෘතිය සඳහා සිදු කරන ලද වියදම නිෂ්කාර්ය වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පොහොර අවශ්‍යතාවය හා පොහොර සඳහා වන ඉල්ලුම පිළිබඳ ප්‍රාථමික දත්ත නොමැති වීම හේතුවෙන් සිදුවන අපහසුතාවය මගහරවා ගැනීම තුළින් නිවැරදි හා යාවත්කාලීන ඇස්තමේන්තු සකස් කරමින් පොහොර භාවිතය විධිමත් කිරීමේ කාර්යය සිදු කිරීමේ අරමුණින් ජාතික පොහොර ලේකම් කාර්යාලයට තුළ සංවර්ධනය කරන ලද මෘදුකාංග පද්ධතිය ගිවිසුමේ ඇමුණුම C මගින් දක්වා ඇති මොඩියුල 04 ක් යටතේ (පොහොර ඉල්ලුම ඇස්තමේන්තු කිරීම, බෙදා හැරීම සැලසුම් කිරීම, නිෂ්පාදනය/ මිශ්‍ර කිරීම/ ආනයනය නියාමනය කිරීම හා ගුණාත්මක පාලනය සහ අනෙකුත් ක්‍රියාකාරකම්) සංවර්ධනය කිරීමට එකඟ වී තිබුණු නමුත්, පොහොර නිෂ්පාදනය/ මිශ්‍ර කිරීම/ ආනයනය නියාමනය කිරීම හා ගුණාත්මක පාලනය යන කාර්යය පමණක් මෙම පද්ධතිය හරහා සිදුකරමින් පවතින බව 2024 දෙසැම්බර් 13 හා 2026 පෙබරවාරි 02 වන දිනයන්හිදී සිදුකළ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, මෙම පද්ධතිය මගින් සිදු කර ගැනීමට අපේක්ෂා කර තිබුණු අනෙකුත් කාර්යයන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෑතකාලීනව සංවර්ධනය කරන ලද මෘදුකාංග පද්ධති (Agrarian.lk, GeoGoviya සහ FarmerNet.lk) හරහාද සිදු කරමින් පවතින බැවින් තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවන් ද්විකරණය වීම හේතුවෙන් අනාර්ථික වියදම් වැඩසටහන් ජාතික අයවැය තුළට එකතු වීම හා ඒවා බොහොමයක් විදේශ අරමුදල් මගින් මූල්‍යනය කිරීමට සිදුවීම වළක්වා ගැනීමේ ජාතික අරමුණ ව්‍යර්ථ වී ඇති බව නිරීක්ෂණය විය.

### 4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

වාර්ෂික ප්‍රතිපාදන නොලැබීම හෝ වෙනත් කරුණු මත අතරමග නවතා දමන ලද හෝ ඉදිකිරීම් සිදු නොකල වාරිමාර්ග අංශය යටතේ ඇති ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු එනම්, වාරිමාර්ග අංශය යටතේ ඉදිකිරීම් සිදුකරගෙන ගොස් තිබුණු මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, රිදීමාලියද්ද ව්‍යාපෘතිය, වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය, කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය හා ගිංනිල්වලා ව්‍යාපෘතිය යන නිමනොවූ ව්‍යාපෘති විස්තර කිසිවක් 2024 හා 2025 කාර්යසාධන වාර්තාවල දක්වා නොතිබුණි.

## 4.2 විදේශ ආධාර ව්‍යාපෘති

### 4.2.1 විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ දියර කිරි කර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් පශු සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක යුරෝ මිලියන 13.9 ක ප්‍රංශ ජනරජයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගීතාවයෙන් කුඩා පරිමාණ කිරි නිපැයුම් මධ්‍යස්ථාන 06ක් හා කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන 30ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 වෙත රු.500,000,000 බැගින් වූ යන්ත්‍රෝපකරණ ලබා දී එම යන්ත්‍රෝපකරණ ස්ථාපිත කර වසර 02 ක් හෝ 03ක් ඉක්මවුවද හෝමෝජිනයිසර් යන්ත්‍රය මිල දී ගැනීම සඳහා මූල්‍යමය හැකියාවක් නොමැතිවීම හේතුවෙන් අත්තනගල්ල, බණ්ඩාරගම, පොළොන්නරුව, වෙන්නප්පුව හා නාවලපිටිය කිරි සැකසුම් මධ්‍යස්ථාන 05 තුළ නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, එම යන්ත්‍රය නොමැති වීම හේතුවෙන් වෙළඳපොලට නිකුත් කරන ලද දියර කිරි නිෂ්පාදන නරක්වීම හේතුවෙන්, ඉවත් කිරීම සඳහා මිලි ලීටර් 250 කිරි බෝතල් 1940 ක් පමණ නාවලපිටිය කිරි සැකසුම් මධ්‍යස්ථානයේ ගබඩා කර ඇති ආකාරය 2026.03.06 දින සිදු කරන ලද විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එසේම දෛනිකව එකතු කරගන්නා දියර කිරිවල තත්ත්ව

පරීක්ෂා කිරීම සඳහා කිරි සැකසුම් මධ්‍යස්ථාන සඳහා ලබා දී ඇති රු.1,429,698 ක වටිනාකමින් යුත් (යූරෝ 4,084.85) නවීන විද්‍යාගාර උපකරණ කට්ටලය භාවිතා නොකරන අතර සාම්ප්‍රදායික ක්‍රම මගින් කිරි සාම්පලවල තත්ත්ව පරීක්ෂා කටයුතු සිදුකර තිබුණි.

### 4.2.2 ව්‍යාපෘතියේ වත්කම් ඌණ උපයෝජනය/ නිෂ්ක්‍රීයව පැවැතීම

118-2-3-056-2506/12 වැය විෂයය යටතේ වන ඉහත 4.2.1 හි සඳහන් කුඩා පරිමාණ කිරි නිෂ්පාදන සමූපාකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනාව යටතේ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 කට අනුබද්ධව පවතින කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 5 බැගින් 30ක් දිරිගැන්වීමේ අරමුණින් කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ට රු.13,366,593 ක් (යූරෝ 38,190.28) වටිනා කිරි ශීත කිරීමේ ටැංකි සහ ඊට අදාළ සෙසු උපකරණ කට්ටල 05 බැගින් ලබා දී තිබුණු නමුත් එම උපකරණ කට්ටල අදාළ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත ලබාදී නොතිබූ අතර එම කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙතින් කිරි සැකසුම් මධ්‍යස්ථාන වෙත කිරි ප්‍රවාහනය කිරීමේ අරමුණින් පිළිවෙළින් රු.9,131,594 ක (යූරෝ 26,090.27) හා රු.6,048,262 ක (යූරෝ 17,280.75) ක වටිනාකමින් යුතු ට්‍රක් රථ හා කිරි ලබාගැනීමේ ඒකකයන් ලබා දී තිබුණද කිරි සැපයුම්කරුවන් විසින් දෛනිකව කිරි සැකසුම් මධ්‍යස්ථානය වෙත පැමිණ කිරි සැපයීම සිදුකරන බැවින් අදාළ යන්ත්‍රෝපකරණ නිෂ්කාර්යව පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

### 4.3 ප්‍රසම්පාදනයන්

(අ) වාරිමාර්ග අමාත්‍යාංශය විසින් Ameropa Asia Pte Ltd සමාගම සමඟ ගිවිසුම්ගතව මෙරටට ගෙන්වන ලද පොහොර මෙට්‍රික් ටොන් 41,876 ක් 2022 දෙසැම්බර් 02 දින වරාය පරිශ්‍රයට ලැබී වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ 2022 දෙසැම්බර් 05 දිනැති ලිපිය මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත භාර දී තිබුණු අතර මෙම පොහොර තොගයට අදාළ නෞභාර පත්‍රය, වාණිජ ඉන්වොයිස් පත්‍රය, රේගු සටහන්කරය (CusDec) හා පොහොර ගොඩබෑම සම්බන්ධ Daily Cargo Discharge Statement (F7) සහතිකය යන සියලු ලියවිලි මඟින් එම පොහොර තොග ප්‍රමාණයක් සැපයූ බවට තහවුරු වුවද අදාළ පොහොර සමාගම් වෙත ලැබුණු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 41,714.5 වූ බවත්, පොහොර මෙට්‍රික් ටොන් 161.5 ක ඌනතාවයක් පවතින බවත් සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ සභාපති විසින් 2023.01.20 දිනැති CCFL/PS/MOP/MI/02/2023 දරන ලිපිය මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කළමණාකරුටද පිටපතක් සහිතව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී තිබුණි මෙම ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් නිශ්චිතව හඳුනාගෙන රජයට සිදුව ඇති රු.55,769,987 ක පාඩුව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොත්මලේ වාරිමාර්ග හා ජල කලමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වූ ලංසු ලේඛන ප්‍රකාර පසුගිය වර්ෂ 5 තුළ මේ හා සමාන වටිනාකමට හා සංකීර්ණතාවය සහිත අවම වශයෙන් ව්‍යාපෘති 02ක් සාර්ථකව නිම කරන ලද බවට වලංගු සාක්ෂි කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කලයුතු විය. ඒ අනුව ආයතනයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 06ක් සම්බන්ධව ඉදිරිපත් වූ ලංසු ලේඛනයන්හි ඉහත තොරතුරු සඳහා වලංගු සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම තුල 2024 සැප්තැම්බර් 20 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ප්‍රකාරව ප්‍රතිචාර නොදක්වන ලංසුකරුවන්සේ සලකා නැවත මිල කැඳවීම් සිදුකරන ලෙසට නිර්දේශ කර තිබුණද එයට පටහැනිව

ඇස්තමේන්තුගත වටිනාකම රු.21,199,239 වු එම කොන්ත්‍රාත් 06 ම එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත මසක් තුල ඉදිකිරීම් නිම කිරිම සඳහා ප්‍රදානය කිරිමට 2024 ඔක්තෝබර් 01 දින ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

මෙහිදී 2024 වර්ෂයට අදාළ ප්‍රතිපාදන 2024 දෙසැම්බර් 31 දිනට අවසන් වන බැවින් හා මෙම ප්‍රසම්පාදනයට අදාළ බිල්පත් පියවීම 2024 දෙසැම්බර් 31 දිනට පෙර සිදු කල යුතු බැවින්ද, මෙම කොන්ත්‍රාත්කරුගේ CIDA ආයතයේ ලියාපදිංචිය පලපුරුද්දක් ලෙසට පිළිගෙන උක්ත තීරණය ප්‍රසම්පාදන කමිටුව විසින් ගෙන තිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

(අ) කෘෂිකර්ම අංශය සතු JK-0194 හා JK-0188 දරන බස් රථ දෙක වර්ෂ ගණනාවක සිට අමාත්‍යාංශයේ පාලනයෙන් පරිබාහිරව කිසිඳු වගකිව යුතු නිලධාරියෙකුගේ මැදිහත් වීමකින් තොරව කාර්යාල ප්‍රවාහනය සිදු කරනු ලබයි. එහි ගමන් ගන්නා නිලධාරින්ගෙන් වර්ෂ ගණනාවක සිට ප්‍රවාහන ගාස්තු එකතු කර එම මුදල් වලින් අදාළ බස් රථවල ඉන්ධන වියදම් පියවා ගැනීමෙන් අනතුරුව 2025 ජුනි 30 දින පිළිවෙලින් රු.205,840 ක් හා රු.257,111 ක මුදලක් එම නිලධාරීන් අත ඉතිරිව පැවතුණි. කෙසේ වෙතත් මෙම බස් රථයන්ට අදාළ සියලු අලුත්වැඩියා සහ නඩත්තු වියදම් අමාත්‍යාංශය විසින් දරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී, ආදායම් ගණන් දීමේ නිලධාරීගේ හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකුගේ පාලනයෙන් පරිබාහිරව රාජ්‍ය දේපලක් උපයෝජනය කිරීම මඟින් උපයා ගනු ලබන මුදල් අවභාවිතා වන බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය විසින් 2025 අගෝස්තු 20 වන දින කෘෂිකර්ම අංශයට අයත් PF-8350 දරන කැබ් රථයට අදාළව ටයර් 05 ක් සහ ටියුබ්ලස් වැල්ව් 05 ක් මිලට ගෙන තිබුණු අතර ඉන් රු.127,776 ක වටිනාකමින් යුත් ටයර් 04 අමාත්‍යාංශයේ පහත මාලයේ අබලි ද්‍රව්‍ය හා ටයර් ගබඩා කර ඇති දැල් කාමරයේ රඳවා තිබියදී අස්ථානගත වී තිබුණි. මේ පිළිබඳව ඉහළ කළමණාකාරිත්වය අවස්ථා ගණනාවකදීම දැනුවත්කර තිබුණද, ඊට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) වාරිමාර්ග අංශය විසින් භාවිතා කරනු ලබන වාහන අතුරින් වාහන 14ක් අලුත්වැඩියා කල යුතු වාහන ලෙස 2026 මාර්තු 04 දින හඳුනාගෙන තිබුණද 2025 දෙසැම්බර් මස 31 දින වන විටත් ඒවායේ අලුත්වැඩියා සිදු කර නොතිබුණි.

(ඈ) වාරිමාර්ග අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 169 ක් වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, මණ්ඩල හා පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් විසින් පරිහරණය කරනු ලබන අතර වාරිමාර්ග අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘතීන් විසින් වෙනත් ආයතන සතු වාහන 67 ක් පරිහරණය කරනු ලබයි. රජයට අයත් වාහන වල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම මැයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017 දෙසැම්බර් 21 දිනැති අංක MF/CG/02 (cir) දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) වාරිමාර්ග අංශයට අයත් එන්ජින් ධාරිතාවය 1800 ට වඩා වැඩි පෙට්‍රල් වාහන 04 ක් හා එන්ජින් ධාරිතාවය 2300ට වඩා වැඩි ඩීසල් වාහන 11ක් ඇතුලුව වාහන 21ක් භාවිතයෙන් තොරව අමාත්‍යාංශ භූමිය තුල විවෘත පරිසරයට නිරාවරණය වන ලෙස සැලකිය යුතු කාලයක සිට ගාල් කර තිබෙන අයුරු 2026 මාර්තු 26 දින සිදුකල භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම වාහන නැවත භාවිතා කිරිමට හෝ වෙනත් සුදුසු විකල්ප පියවරක් ගැනිම සිදුකර නොතිබුණි.

(ඊ) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සඳහා සඳහා රු.76,876,755,039 ක් වියදමක් දරා 2024 අප්‍රේල් 03 දින ඉදිකිරීම් නිමකර ව්‍යාපෘතිය භාර දී භාරදීමේ සහතිකය ලබාගෙන තිබුණද මෙහි දෝෂ වගකීම් කාලය වූ 2025 මාර්තු 31 දින වන විට සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම තුළ එම කාලය පිළිවෙලින් 2025 සැප්තැම්බර් 30 හා 2026 මාර්තු 31 දක්වා දීර්ඝකර තිබුණි. මීට අමතරව 2025 දෙසැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ව්‍යාපෘතියේ ගිණුම් පියවා අවසන් කිරීමේ සහතිකය නිකුත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයද 2026 මාර්තු 31 දක්වා නැවත පත් කර තිබුණි. එහෙත් එම කාලයද මේ වන විට ඉක්මවා ගොස් තිබුණු අතර ව්‍යාපෘති අවසන් ගිණුම් සකස් කර ගිණුම් පියවා ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. 2024 අප්රේල් 03 දින සිට විදුලිබලය නිපදවන විදුලිබලාගාරය, ජලාශ ඇතුළු අනෙකුත් ව්‍යාපෘති වත්කම් විදුලිබල මණ්ඩලය හා මහවැලි අධිකාරිය විසින් භාවිතා කළද ඒවායේ වියදම හඳුනාගෙන විධිමත් පරිදි අදාළ ආයතන වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

(උ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් කාබනික පොහොර ව්‍යාපෘතියෙහි සිදුවී ඇති අක්‍රමිකතාවයන් සෙවීම සඳහා විශේෂ විමර්ශන කමිටුවක් පත්කර ඇතත්, එම කමිටු වාර්තාව මේ දක්වා නිමකර නොතිබුණි. එම කාබනික පොහොර ව්‍යාපෘතිය යටතේ රු.31,027,575ක වත්කම් අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ගිණුමට ඇතුළත් කර තිබුණු අතර එම වත්කම්වල භෞතික සත්‍යාපනයකින් තොරව, හා වත්කම් පැවරීමේ නිසි ක්‍රමවේදයෙන් පරිබාහිරව 2024 වර්ෂයේ දී පොත්වලින් ඉවත් කර තිබුණි.

(ඌ) 2025 දෙසැම්බර් 31 දින ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව අනුව 2023 වර්ෂයේ සිට ඉඩම් අංශයට අදාළ පනත් හා නීතීන් 12 ක් සංශෝධනය කිරීමට සැලසුම් කලද 2025 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් පනත් 6 කට අදාළ කාර්යයන් අවසන් කර නොමැති අතර ඉඩම් අමාත්‍යාංශයේ 2023 හා 2024 වර්ෂයන්හි ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවෙහි 1979 අංක 43 දරන රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කරන බවට සඳහන් කර තිබූ අතර 2025 වර්ෂයේදී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත මෙම පනත සංශෝධනය කිරීමේ වගකීම පවරා දුන් නමුත් 2026.03.31 දින වන විටත් පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

## 4.5 පාඩු හා හානි

(අ) කෘෂිකර්ම අංශයට අදාළ අලාභ හානි සිදු වී වර්ෂ 02ත් 11ත් අතර කාලයක් ගත වී ඉදිරියට ගෙන එන ලද සිද්ධීන් 44කට අදාළ රු.29,579,093 ක අලාභ සඳහා රක්ෂණ වන්දි මගින් හා වගකිවයුතු නිලධාරීන්ගෙන් අදාළ අලාභ වටිනාකම අයකරගෙන තිබුණද, ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (4) හා මුදල් රෙගුලාසි 109(1) ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර සිද්ධීන් 11කට අදාළ රු.1,788,138ක අලාභ වටිනාකම කපාහැරීම සඳහා මුදල් රෙගුලාසි 104 (4) අවසන් වාර්තාව මගින් අනුමැතිය ලබා දී තිබුණද, මු.රෙ.109 (1) ප්‍රකාරව කටයුතු නොකර තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් ලෙස ඉදිරියට ගෙන ඒම සිදුකර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන්මසක් ඇතුළත පූර්ණ වාර්තාව ඉදිරිපත් කළයුතු වූවද කෘෂිකර්ම අංශයට අදාළ 2013 වර්ෂයේ සිට 2023.12.31 දක්වා සිදු වූ සිද්ධීන් 26 කට අදාළ රු.3,765,406 ක සිදු වූ අලාභ සඳහා අවසන් වාර්තා ඉදිරිපත් කිරීම 2025 වර්ෂය තුළ සිදුකර තිබුණි. එසේම එම අංශයෙහි ඉකුත් වර්ෂවල සිට පැවත එන 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ අවසාන ශේෂ වශයෙන් දක්වා ඇති සිද්ධීන්ට 05 කට අදාළව එකතුව රු.6,185,021 ක අලාභ වටිනාකම් 2025 වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස දක්වා නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම අංශය විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛන අදාළ ආකෘතීන්ට අනුව යාවත්කාලීන කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වන සිද්ධීන් 11ට අදාළ රු.9,970,679 ක අලාභ වටිනාකම හානි හා පාඩු ලේඛනයේ සටහන් කර නොතිබූ අතර එම අංශය විසින් හානි හා පාඩු ලේඛනයේ සටහන් කර තිබුණු සිද්ධීන් 05 ට අදාළ රු.15,120,182ක අලාභ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි.

(ඈ) 2025 වර්ෂය තුළ සිදු වූ සිද්ධීන් 07කට අදාළව මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා සිද්ධිය සිදුවූ වහාම යැවිය යුතු වුවත් කෘෂිකර්ම අංශය විසින් මෙම වාර්තාවේ දින වන විටත් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2025 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව වාරිමාර්ග අංශයෙහි කපා නොහල ඉදිරියට ගෙන ගිය වාහන අනතුරක අලාභය රු.10,482,500 ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සිදුකර නොතිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි. 104(1) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභයක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතුව නිශ්චිත වශයෙන් දැනගැනීමට හා වගකිවයුත්තන් හඳුනා ගැනීම සඳහා පරීක්ෂාවන් වහාම සිදුකළ යුතු වුවත්, විගණිත දින වූ 2026 මාර්තු 26 දින වන විටත් ඉඩම් අංශයෙහි අංක PH-856, හා CAO-8946 දරන රථවල මූලික පරීක්ෂණ සිදුකර නොතිබුණි. ඉහත රථ දෙකට අමතරව 64-3203 දරන රථයේ 2025 මැයි 21 දින හා 2025 ජුනි 24 දින අනතුරු සිදුව ඇති අතර විගණිත දින වන විට මාස 07 කාලයක් ඉකුත්ව තිබුණද, මු.රෙ. 104(4) ප්‍රකාරව අවසන් පරීක්ෂණය සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(උ) ඉඩම් අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් භාවිතා කළ රජය සතු Sony Video Camera Battery Charger නම් අයිතමය භාරදී නොමැති බැවින් රජයට රු.93,750 ක මූල්‍ය අලාභයක් සිදුවී ඇති බව නිරීක්ෂණය වන අතර විගණිත දින වූ 2026 මාර්තු 27 දින වන විට අදාළ සිදුවීම සිදු වී වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද, මු.රෙ 104(4) පරිදි අදාළ අලාභය වගකිව යුත්තන්ගෙන් අය කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452 (1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම් වලින් පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කල යුතු අතර එම විමසුම් වලට වහාම පිළිතුරු ලබා දිය යුතු වුවත් අමාත්‍යාංශය වෙත 2024.07.24 දින සිට 2026.02.27 දක්වා කාල පරිච්ඡේදය තුළදී නිකුත් කරන ලද විගණන විමසුම් 06ක් සඳහා මෙම වාර්තාවේ දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

### 4.7 කළමනාකරණ දුර්වලතා

(අ) 2016 අප්‍රේල් 08 දින සිට 2021 අප්‍රේල් 07 දින දක්වා එනම් වර්ෂ 05 ක කාල සීමාවක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකර ගත් අංක 2178 දරන බදු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, අංක 288 හි පිහිටි DPJ TOWER නැමැති ගොඩනැගිලි පරිශ්‍රය බදු දීමනාකරුට නැවත 2020 ජනවාරි 31 දින භාරදී ඇතත් අමාත්‍යාංශය විසින් එම බදු දීමනාකරු වෙත ගෙවන ලද රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව මේ දක්වා අයකර ගෙන නොතිබුණි. ගිවිසුම් කොන්දේසි අංක 11 අනුව ගිවිසුම අවසන් වී බදු දේපළ භාරදීමෙන් එක් මසක කාලයක් තුළ බදු දීමනාකරු එම ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව බදු ගැණුම්කරු වෙත ලබාදීමට කටයුතු

කළයුතු වේ. ඒ අනුව බඳු දීමනාකාර පාර්ශ්වය විසින් නීතිවිරෝධී ලෙස මෙම ආරක්ෂක තැන්පතුව රඳවා තබාගෙන මේ වන විට ඉක්මවා ගොස් ඇති කාලය වර්ෂ 05ක් විය.

(ආ) එවකට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා වෙත වෙන්කර දී ඇති පොහොර අංශයට අයත් රු.18,000,000 ක් වටිනා අංක KW-8202 දරන වාහනය 2021 මාර්තු 21 දින අනතුර සඳහා රු.7,500,000 ක රක්ෂණ වන්දියක් ගෙවීමට රක්ෂිත ආයතනය එකඟ වී ඒ අනුව වාහනය අලුත්වැඩියාවට 2022 දෙසැම්බර් 12 දින අදාල ගරාජයට භාර දී තිබුණි. 2023 මාර්තු 23 දින රු.5,625,000 ක මුදලක් වාහන අලුත්වැඩියා ආයතනයට රක්ෂණ සංස්ථාව විසින් ගෙවීම්කර තිබුණි. මෙම වාර්තාවේ දින වන විට වර්ෂ 03 ක් ඉක්මගොස් ඇතත් අදාළ අලුත්වැඩියාව සිදුකර නොතිබුණි.

(ඇ) කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණ පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතන මඟින් 2024 වර්ෂයේ රු.125,574,546 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණි. එය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 11.67 ක ප්‍රතිශතයකින් වැඩිවීමක් වුවද, පාඨමාලා සඳහා බඳවා ගන්නා නවක සිසුන් ප්‍රමාණයේ සැලකිය යුතු වැඩිවීමක් සිදු වී නොතිබුණි. ඒ අනුව 2024 හා 2025 වර්ෂයන් තුළ වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගත් නවක ශිෂ්‍යයන් සංඛ්‍යාව පිළිවෙලින් 23 ක් හා 36 ක් වැනි අඩු සංඛ්‍යාවක් විය.

(ඈ) කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමලා පැවැත්වීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 ජූලි මස 18 දිනැති අංක 17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ලැබී තිබුණු නමුත් ආයතනය විසින් මේ දක්වා පවත්වා තිබුණු ජාත්‍යන්තර පුහුණු පාඨමාලා සංඛ්‍යාව 5 ක් පමණක් වූ අතර 2019 වර්ෂයෙන් පසු කිසිදු ජාත්‍යන්තර පුහුණු පාඨමාලාවක් පවත්වා නොතිබුණි.

(ඉ) කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා ප්‍රචාරය කිරීමට ඇති ප්‍රධානතම මාධ්‍යක් ලෙස ආයතනයේ වෙබ් අඩවිය භාවිතා කිරීමට හැකියාව පැවැතුණි. 2024 දෙසැම්බර් මස රු.168,275 ක මුදලක් වැය කර වෙබ් අඩවිය යාවත්කාලීන කළද, පැවැත්වීමට සැලසුම් කරන ලද විදේශ පුහුණු පාඨමාලා, එම පාඨමාලාවල සංයුතිය (Course Contents), ආයතනය විසින් සපයනු ලබන පහසුකම් සහ එහි මිල ගණන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු කිසිවක් විදේශ සිසුන්ව ආකර්ශනය වන ආකාරයේ ප්‍රසිද්ධියක් මෙම වෙබ් අඩවිය මඟින් ප්‍රදර්ශණය කිරීමක් සිදුකර නොතිබුණි.

**4.8 මුල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ නේවාසිකාගාර වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම යටතේ කාන්තා නේවාසිකාගාරයේ වැට මීටර් 200 ක් සහ පිරිමි නේවාසිකාගාරයේ වැට මීටර් 212 ක් ඉදිකිරීම සඳහා ගිවිසුම් ගතවී තිබුණි. 2025 ජූලි 28 දින මෙම ආයතනයේ උපදේශක මහතා සමඟ සිදුකරන ලද විගණන පරීක්ෂණයේදී වැටෙහි දිග මැනීමේදී ඉදි නොකල මීටර් 55 ක් සඳහා රු.529,627 ක් වැඩිපුර ගෙවා ඇති බව අනාවරණය විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 2177 ක් වූ අතර ඉන් තනතුරු 93 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අතුරින් තනතුරු 21ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු බව නිරීක්ෂණය විය. පශු සම්පත් අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 566 ක් වූ අතර ඉන් තනතුරු 45ක් පුරප්පාඩුව පැවතුණි. ඉඩම් අංශයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 01ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 26ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක්ද පුරප්පාඩු පැවතිණි.

(ආ) 2025 ජූලි 14 දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇප මත මුදාහැර ඇති ඉඩම් අංශයේ සහකාර ලේකම්වරියක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදය යටතේ විනයානුකූලව කටයුතු නොකර ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් මෙම නිලධාරිනිය සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීමට නිර්දේශ ලබා දී තිබූ අතර එම නිලධාරිනිය 2025 ජූලි 14 දින අත් අඩංගුවට ගැනීමත් සමඟ ඉහළ තනතුරක රාජකාරි ඉටුකිරීම සඳහා ලබා දී ඇති අනුමැතියද අවසන් කර ඇති බැවින් නිලධාරිනිය වෙත වෙන්කර දී තිබූ වාහනය සහ රියදුරා 2025 අගෝස්තු 01 දින සිට ප්‍රවාහන අංශය වෙත භාරදෙන ලෙස සහකාර ලේකම් (පාලන) 2025.08.01 දිනැති අංක 1/16/35/101 දරන ලිපිය මගින් දන්වා තිබුණි. නමුත් අගෝස්තු මස තුල මෙම වාහනය සහ රියදුරු ප්‍රවාහන අංශය වෙත භාර නොදී වෙන්කල වාහනයක් ලෙස වාහනය භාවිතා කර තිබුණි.

පී.කේ.එම්.පී.නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

# පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 89% - 75% | 74% - 50% |
| **කෘෂිකර්ම අංශය** | | | | |
| වී බෝගයේ ඵලදායීතාවය හා ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම. | | √ | | |
| අනෙකුත් බෝගවල ඵලදායීතාවය ඉහළ නැංවීම. | | √ | | |
| බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ගුණාත්මක බීජ සැපයුම සහතික කිරිම. | | √ | | |
| ශාක ආරක්ෂණ භාවිතාවන් වැඩිදියුණු කිරීම. | | √ | | |
| ඉහළ ගුණාත්මක භාවිතයන් සඳහා කෘෂි පුහුණු සහ ව්‍යාප්ති සේවා වැඩිදියුණු කිරිම. | | √ | | |
| කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා උසස් තාක්ෂණය ප්‍රවර්ධනය කිරිම | | √ | | |
| කෘෂි ක්ෂේත්‍රය යාන්ත්‍රීකරණය කිරීම | | √ | | |
| කෘෂි ව්‍යවසාය හා අලෙවිකරණය ප්‍රවර්ධනය කිරීම | | √ | | |
| පසු අස්වනු ක්ෂේත්‍රයේ පවතින ගැටළු සඳහා තාක්ෂණික විසඳුම් සොයාගැනීම සඳහා පර්යේෂණ සිදු කිරීම | | | √ | |
| පර්යේෂණ ප්‍රකාශන 10 ක් දේශීය/විදේශීය සඟරා වල පළ කිරීම | | √ | | |
| එළවළු හා පලතුරු තෝරා ගත් සැපයුම් දාම කිහිපයක් තුළ නිවැරදි පසු අස්වනු තාක්ෂණයන් භාවිතය/ යෙදවීම | | √ | | |
| එළවළු පලතුරු පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සුරක්ෂිත ඇසුරුම් හා ප්‍රවාහන ක්‍රම හඳුන්වා දීම | | √ | | |
| පසු අස්වනු තාක්ෂණ ප්‍රචාරණය සඳහා පුහුණු පාඨමාලා 100 ක් පැවැත්වීම හරහා ප්‍රතිලාභීන් 2000 ක් පුහුණු කිරීම, පසු අස්වනු ක්ෂේත්‍රය සඳහා නව ව්‍යවසායකයින් බිහි කිරීම | | | √ | |
| නිවැරදි පසු අස්වනු තාක්ෂණයන් ක්ෂේත්‍රයේ භාවිතය සඳහා උපදේශක සේවා, ඉංජිනේරු සේවා හා රසායනාගාර සේවා ලබා දීම | | √ | | |
| ආයතනයේ මානව සම්පත කෘෂිකර්ම ක්ෂේත්‍රයට ගැලපෙන පරිදි වැඩිදියුණු කිරීම. | | √ | | |
| වී ගොවිතැන සඳහා පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ගොවීන් වෙත වවුචර් පත්‍ර ලබාදීම. | | √ | | |
| ප්‍රතිපත්ති සම්පාදනය සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම | ප්‍රාග්ධන අරමුදල් 100% ප්‍රයෝජනයට ගැනීම | √ | | |
| ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 1. එළුවන් ඇති කිරීමේ වැඩසටහන කාර්ය සාධන දර්ශක -<br>• ප්‍රතිලාභී පවුල් ගණන<br>• බෙදාදුන් එළුවන් ගණන | √ | | |
| | 2. භෝග වගා ප්‍රවර්ධන වැඩසටහන කාර්ය සාධන දර්ශක<br>• ප්‍රතිලාභී පවුල් ගණන<br>• බෙදාදුන් බීජ ප්‍රමාණය (කි. ග්‍රෑ.)<br>• වගා කළ භූමි ප්‍රමාණය (අක්කර)<br>• අපේක්ෂිත අස්වැන්න | √ | | |

| විශේෂිත දර්ශක | | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 89% - 75% | 74% - 50% |
| කෘෂි නිෂ්පාදකයාට ඉහළ මිලක් සහ පාරිභෝගිකයාට සාධාරණ මිලකට ගුණාත්මක හා නැවුම් ආහාර ද්‍රව්‍ය පරිභෝජන රටාවක් නිර්මාණය කිරීම | • විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය<br><br>කාර්යසාධන දර්ශක -<br>• ක්‍රියාත්මක ආර්ථික මධ්‍යස්ථාන ගණන<br>• ආර්ථික මධ්‍යාස්ථාන සතු ව්‍යාපාර පරිශ්‍ර (කඩ කාමර) ගණන<br>• ආර්ථික මධ්‍යාස්ථානවල ක්‍රියාත්මක ව්‍යාපාර පරිශ්‍ර (කඩ කාමර) ගණන<br>• අයවැය ප්‍රතිපාදන මගින් ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති ගණන<br>• භාර අරමුදල් මගින් ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති ගණන<br>• මධ්‍යස්ථාන වෙත ලැබෙන කෘෂි නිෂ්පාදන ප්‍රමාණය | √ | | |
| **පශු සම්පත් අංශය** | | | | |
| දේශීය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන / වසරකට) | | √ | | |
| වාර්ෂික බිත්තර නිෂ්පාදනය (බිත්තර මිලියන / වසරකට) | | √ | | |
| වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටොන් / වසරකට) | | √ | | |

# පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

| අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| අරමුණ 02. සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කරගැනීම සඳහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 2.1. 2030 වන විට, සාගින්න නිමා කර, සියලුම මිනිසුන්ට, විශේෂයෙන් දුප්පතුන්ට සහ ළදරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි තත්වයන් තුළ සිටින පුද්ගලයින්ට, වසර පුරා ආරක්ෂිත, පෝෂ්‍යදායී සහ ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීම. | වී බෝගයේ ඵලදායීතාවය 4Mt/ha දක්වා ඉහළ නැංවීම. | | | √ |
| | | බඩ ඉරිඟු බෝගයේ නිෂ්පාදනය මෙ.ටො 3 සිට 4Mt/ha දක්වා ඉහළ නැංවීම. | | | √ |
| | | බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ගුණාත්මක බීජ සැපයුම සහතික කිරීම. | | | √ |
| | | ශාක ආරක්ෂණ භාවිතාවන් වැඩිදියුණු කිරීම. | | | √ |
| | | ඉහළ ගුණාත්මක භාවිතයන් සඳහා කෘෂි පුහුණු සහ ව්‍යාප්ති සේවා වැඩිදියුණු කිරීම. | | | √ |
| | | තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | | | |
| | 2025 වර්ෂය තුළදී කිරි ලීටර මිලියන 412.83ක් දේශීයව නිෂ්පාදනය කිරීම | දේශීය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන/වසරකට) | | | √ |
| | 2025 වර්ෂය තුළදී බිත්තර මිලියන 3817.09 ක් නිෂ්පාදනය කිරීම | වාර්ෂික බිත්තර නිෂ්පාදනය (බිත්තර මිලියන / වසරකට) | | | √ |
| | 2025 වර්ෂය තුළදී කුකුළු මස් මෙ. ටොන්. 290,000ක් නිෂ්පාදනය කිරීම | වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටොන් / වසරකට) | | | √ |
| | 2.3 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආදායම වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් මගින් දෙගුණ කිරීම | <u>**තාක්ෂණික වැඩසටහන්**</u><br>• පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br>• නව උසස් බෝග වගා ක්‍රම හඳුන්වා දීම<br>• රජයේ අනුමත උසස් බීජ ලබා ගැනීම සඳහා ගොවීන් හුරු කිරීම<br>• කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමු කිරීම | | | √ |
| | | ගොවි/ගව පාලන/වනාන්තර ආශ්‍රිත කර්මාන්තයන් පන්තීන්හි විශාලත්වය අනුව ශ්‍රම ඵලදායිතාවය. | | √ | |
| | | ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ සාමාන්‍ය ආදායම. | | √ | |
| | 2.4 2030 වන විට ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ කාලගුණ වෙනස්වීම් වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නාවූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නාවූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | 2.4.1 ඵලදායී සහ තිරසාර කෘෂිකාර්මය සිදු කරන කෘෂිකාර්මික බිම් ප්‍රමාණය. | | √ | |

| අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| අරමුණ 12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම | එළවළු හා පලතුරු බෝග වල සැපයුම් හා අගයදාම කළමනාකරණ ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම | තෝරාගත් පලතුරු වර්ග 15 ක සහ එළවළු වර්ග 10 ක වී හා අනෙකුත් තෝරාගත් කල් තබා ගත හැකි බෝග වර්ග 9 ක පසු අස්වනු හානිය අවම කිරීම සඳහා නිපදවන ලද නව තාක්ෂණ ප්‍රමාණය, ක්ෂේත්‍රයට හඳුන්වා දුන් තාක්ෂණයන් ප්‍රමාණය, පසු අස්වනු හානිය අවම වූ ප්‍රමාණය | √ | - | - |
